

# වාර්ෂික වාර්තාව
# 2017



ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ
ශ්‍රී ලංකාව

# වාර්ෂික වාර්තාව
# 2017

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ
ශ්‍රී ලංකාව

වාර්ෂික වාර්තාව 2017

ISSN: 1012-3954

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

| | | |
|---|---|---|
| ප්‍රකාශනය | : | ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය |
| පිටු සැකසුම | : | ඩබ් එච් ටී සී සිල්වා සහ අයි ඒ ජී එන් අත්තනායක |
| කවර නිර්මාණය | : | ආචාර්ය එම් ඒ විජේරත්න සහ ඩබ් එච් ටී සී සිල්වා |
| ඡායාරූප | : | කේ ජී ආර් නිරෝෂන් |
| මුද්‍රණය | : | නියෝ ග්‍රැෆික් (පෞද්ගලික) සමාගම |


පිටකවරය



නව ප්‍රභේද වල ශාක කායික විද්‍යාත්මක ලක්ෂණ ඇගයීම

# පටුන


| | |
|---|---|
| ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය | 04 |
| දැක්ම හා මෙහෙවර | 04 |
| ආයතනික ව්‍යුහය | 05 |
| කළමනාකරණ මණ්ඩලය | 06 |
| උපදේශන කමිටු | 09 |
| තේ පර්යේෂණ මණ්ඩල සභාපතිතුමාගේ වාර්තාව | 14 |
| තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂතුමාගේ වාර්තාව | 18 |
| තේ පර්යේෂණායතනයේ කාර්යය මණ්ඩලය | 28 |
| පර්යේෂණ කඩඉම් | 44 |
| බෝග වැඩිදියුණු කිරීම | 44 |
| භූමි ඵලදායිතාව වැඩි දියුණු කිරීම සහ බෝග පාලනය | 68 |
| බෝග ආරක්ෂණය | 78 |
| දේශගුණික විපර්යාසයන් හි බලපෑම අධ්‍යයනය | 98 |
| ක්ෂේත්‍ර ක්‍රියා යාන්ත්‍රීකරණය | 101 |
| තේ තවාන් පාලන ක්‍රම | 104 |
| තේ සැකසුම් තාක්ෂණය හා නිපැයුම් වැඩිදියුණු කිරීම | 105 |
| සමාජ ආර්ථික හා සම්පත් කළමනාකරණය | 112 |
| සේවාලාභීන් සඳහා සේවාවන් | 121 |
| තේ පර්යේෂණායතන ප්‍රාදේශීය මධ්‍යස්ථාන | 132 |
| පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 133 |
| මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 136 |
| ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානය | 140 |
| ගාල්ල ව්‍යාප්ති මධ්‍යස්ථානය | 144 |
| දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානය | 149 |
| කළුතර ව්‍යාප්ති මධ්‍යස්ථානය | 152 |
| සම්මාන, ප්‍රතිපාදන, අධ්‍යයන වැඩසටහන්, ප්‍රකාශන, විශේෂ ඉදිරිපත්කිරීම් | 155 |
| තේ පර්යේෂණායතනයේ වතු | 174 |
| ශාන්ත කුම්බ්ස් වත්ත | 174 |
| ශාන්ත ජෝකිම් වත්ත | 177 |
| පරිපාලන සහ මූල්‍ය අංශය - විශේෂ කඩඉම් | 180 |
| මානව සම්පත් සංවර්ධනය සහ කාර්යය මණ්ඩලය සවිබල ගැන්වීම | 180 |
| යටිතල පහසුකම් දියුණු කිරීම සහ පවත්වාගෙන යාම | 183 |
| මූල්‍ය කාර්යය සාධනය | 185 |
| කාලගුණ විද්‍යාත්මක නිරීක්ෂණ | 194 |
| විගණකාධිපති වාර්තාව | 200 |

## ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

වෘත්තීමය තේ පර්යේෂණ මගින් ශ්‍රී ලංකා තේ වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායක සභාවේ සම්මත වූ පනතේ ප්‍රකාරව 1925 දී ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය පිහිටුවන ලදී. වැවිලිකරුවන්ගේ සංගමයේ ශාඛාවක් ලෙස ඇරඹුනු මෙම ආයතනය ක්‍රමික වෙනස්කම්වලට ලක් වී මේ වන විට ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය යටතේ රාජ්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ.

### ආයතනයේ දැක්ම

තේ පර්යේෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ටතමයා වෙමින් ශ්‍රී ලංකා තේ නාමයට තරගකාරී මිලක් ලබා දෙමින් ලොව ප්‍රමුඛත ම තේ නිෂ්පාදනය බවට පත්කිරීම උදෙසා වන තාක්ෂණ උපදෙස් ලබා දීමයි.

### ආයතනයේ මෙහෙවර

තේ නිෂ්පාදනයේ ඵලදායිතාව සහ ගුණාත්මය වඩාත් ලාභදායී ලෙස ඉහළ නැංවීම සඳහා යෝග්‍ය විද්‍යාත්මක දැනුම හා තාක්ෂණය වැඩිදියුණු කිරීම, හඳුන්වා දීම සහ ව්‍යාප්ත කිරීම තේ පර්යේෂණායතනයේ ප්‍රධාන මෙහෙවර වේ.



## ආයතනික ව්‍යුහය


සභාපති - තේ පර්යේෂණ මණ්ඩලය
අභ්‍යන්තර විගණන ඒකකය
පර්යේෂණ සඳහා වන උපදේශන කමිටුව
උපදෙස් සේවා සහ තේ.ප.ආ.වතු පිළිබඳ කමිටුව
විගණන හා කළමනාකරණ කමිටුව
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී
අතිරේක අධ්‍යක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (නිෂ්පාදන)
ශෂ්‍ය විද්‍යා අංශය
කීට විද්‍යා/වටපණු විද්‍යා අංශය
ශාක අභිජනන අංශය
ශාක ව්‍යාධිවේදී අංශය
ශාක කායික විද්‍යා අංශය
පාංශු සහ ශාක පෝෂණ අංශය
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (සැකසුම් තාක්ෂණ)
ජෛව රසායන අංශය
තේ සැකසුම් තාක්ෂණ අංශය
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති)
උපදෙස් හා ව්‍යාප්ති අංශය
ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය
පුස්තකාලය
ඡායාරූප ඒකකය
ප්‍රකාශන හා ප්‍රචාරක ඒකකය
ප්‍රාදේශීය මධ්‍යස්ථාන
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)
පරිපාලන අංශය
ප්‍රසම්පාදන ඒකකය
ප්‍රවාහන ඒකකය
ඉංජිනේරු අංශය
ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී
මූල්‍ය අංශය
තේ ප ආ වතු
කෘෂි ආර්ථික විද්‍යා අංශය
ජෛවමිතික ඒකකය

## ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය

1993 අංක 52 දරණ තේ පර්යේෂණ මණ්ඩල පනත ප්‍රකාරව 1993 නොවැම්බර් මස 12 වන දින ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය පිහිටුවන ලදී. කැබිනට් මණ්ඩල අනුමැතිය සහිත 2006 අංක 43 දරණ පනත මගින් 2007 වසරේ දී තේ පර්යේෂණ මණ්ඩල පනත සංශෝධනය කරන ලදී.

තේ වගාව සහ පිරිසැකසුම් ආශ්‍රිත පර්යේෂණවල නියැලීම සහ දිරිමත් කිරීම, ඒ සඳහා පහසුකම් සැපයීම හා සහයෝගය ලබා දීම ආදී කටයුතුවල නියැලීම තේ පර්යේෂණ මණ්ඩලයේ මූලික කාර්යයභාරය වේ.

## තේ පර්යේෂණ මණ්ඩලයේ විශේෂිත කාර්යයභාරයන්

- තේ වගාවේ රෝග සහ පළිබෝධ වැළැක්වීම සහ මර්ධනය, නිමි තේවල ගුණාත්මය ඉහළ නැංවීම, නිෂ්පාදන විවිධාංගීකරණය ආදී තේ වගාව සහ නිෂ්පාදනය සඳහා බලපාන සියලු ගැටළු සහ කරුණු පිළිබඳව පර්යේෂණ මෙහෙයවීම, සහයෝගය ලබා දීම සහ දිරිමත් කිරීම

- තේ කර්මාන්තයේ ආර්ථික ශක්‍යතාවයන් සහ ගැටළු සම්බන්ධයෙන් මෙන් ම අනාගත ප්‍රවණතා පිළිබඳව පර්යේෂණ මෙහෙයවීම, සහයෝගය ලබා දීම සහ දිරිමත් කිරීම

- ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන් හි පර්යේෂණායතන සමඟ සබඳතා ගොඩනගා ගැනීම සහ පවත්වාගෙන යාම

- ශ්‍රී ලංකාවේ සහ විදේශයන් හි පර්යේෂණ ආයතන සමඟ සහයෝගී අධ්‍යයන වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ සමුළු ආදිය පැවැත්වීම

# තේ පර්යේෂණ මණ්ඩලයේ සාමාජිකයින්



වෛද්‍ය එම් එම් ජේ පී ගවරම්මාන
සභාපති - තේ පර්යේෂණ මණ්ඩලය
තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ
trichairman@yahoo.com



ආචාර්ය අයි සරත් බී අබේසිංහ
අධ්‍යක්ෂ - තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ
isarathb@yahoo.co.uk



කේ එස් විජේකීර්ති මයා
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
11 වන මහල, සෙත්සිරිපාය - 2 වන අදියර
බත්තරමුල්ල
wijayakeerthi@yahoo.co.uk



ඩී එච් එස් පුල්ලේපෙරුම මිය
අධ්‍යක්ෂ - කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය, කාමර අංක 341, 3 වන මහල
භාණ්ඩාගාර ගොඩනැගිල්ල
කොළඹ 01
himalitnp@gmail.com



රොෂාන් රාජදුරෙයි මයා
කළමනාකාර අධ්‍යක්ෂ
කැළණිවැලි වැවිලි සමාගම
400, ඩීන්ස් පාර
කොළඹ 10
roshanr@kvpl.com



විජේරත්න දේවගෙදර මයා
සභාපති - කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත
බත්තරමුල්ල
chtshda@gmail.com



පී එච් සුසන්ත ද සිල්වා මයා
කුඩා තේ වතු හිමියන්ගේ සම්මේලනයේ නියෝජිත
උඩුවිල
බටපොල



ආචාර්ය ඩී එස් ඒ සමරවීර
අංක 1F 20
මත්තේගොඩ නිවාස සංකීර්ණය
මත්තේගොඩ
sarath.samaraweera@hotmail.com



චන්ද්‍රිම වික්‍රමසිංහ මයා
ශ්‍රී ලංකා තේ කර්මාන්තකරුවන්ගේ සංගමයේ නියෝජිත
අංක 90/A
තලවතුගොඩ පාර
පිටකෝට්ටේ
danpahalatea@gmail.com



හරිත් රණසිංහ මයා (2017 ඔක්තෝම්බර් 13 දක්වා)
ශ්‍රී ලංකා තේ කර්මාන්තකරුවන්ගේ සංගමයේ නියෝජිත
තල්ගම්පල තේ පුද්ගලික සමාගම
තල්ගම්පල තේ කර්මාන්ත ශාලාව
උඩුගම පාර, තල්ගම්පල



රොහාන් පෙතියාගොඩ මයා
නිරීක්ෂණ සාමාජික
සභාපති - ශ්‍රී ලංකා තේ මණ්ඩලය
අංක 574, ගාලු පාර
කොළඹ 03
rohanpet@gmail.com



ආර් එස් ජයරත්න මයා (2017 දෙසැම්බර් 20 දක්වා)
වෘත්තීය සමිති නියෝජිත
ජයම්පති සෙවණ
බිලැක්ෆුල්
නුවරඑළිය



එච් එස් ඩී ආර් කරුණාරත්න මයා
වෘත්තීය සමිති නියෝජිත
අංක 21,
විද්‍යාල මාවත
පිලියන්දල
subash.karu@lakehouse.lk

ජී ඒ ජේ ගුරුසිංහ මයා (2017 ජූලි 11 සිට)
අංක 87/1
කාන්ත ගොවිපොල
මාගොඩ, රුවන් එළිය
නුවරඑළිය



ආචාර්ය කේ එම් මොහොට්ටි
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (නිෂ්පාදන)
(කැඳවුම්කරු/ලේකම්)
තේ පර්යේෂණායතනය
තලවාකැලේ
mohottik@yahoo.com

## පර්යේෂණ සඳහා වන උපදේශන කමිටුවේ සාමාජිකයින්

ආචාර්ය ඩී එස් ඒ සමරවීර (කමිටු සභාපති)
අංක 1F20 - මත්තේගොඩ නිවාස සංකීර්ණය
මත්තේගොඩ

ආචාර්ය එම් එම් ජේ පී ගවරම්මාන
සභාපති - තේ පර්යේෂණ මණ්ඩලය
තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ

ආචාර්ය අයි සරත් බී අබේසිංහ
අධ්‍යක්ෂ - තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ

මහාචාර්ය ඩබ්ලිව් ඒ ජේ එම් ද කොස්තා
බෝග විද්‍යා දෙපාර්තමේන්තුව
කෘෂි විද්‍යා පීඨය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පේරාදෙණිය

එන් බී එච් පිලපිටිය මයා
නව විතානකන්ද තේ කම්හල් පුද්ගලික සමාගම
නව විතානකන්ද වත්ත
දෙල්වල උප තැපැල් කාර්යාලය
රත්නපුර 70046

එච් ඩී හේමරත්න මයා
උපදේශක - කොළඹ තේ අලෙවිකරුවන්ගේ සංගමය
තැ පෙ 274, අංක 50, නවම් මාවත
කොළඹ 02

රොෂාන් රාජදුරෙයි මයා
කළමනාකාර අධ්‍යක්ෂ - කැළණිවැලි වැවිලි සමාගම
අංක 400, ඩීන්ස් පාර
කොළඹ 10

එල් පී ජයසිංහ මයා
අධ්‍යක්ෂ - පීයෝටෙක් සමාගම
අංක 13/1, පැපිලියාන මාවත
කොහුවල

ආචාර්ය එල් එස් කේ හෙට්ටිආරච්චි (කැඳවුම්කරු/ලේකම්)
අතිරේක අධ්‍යක්ෂ - තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ

ආචාර්ය කේ එම් මොහොට්ටි
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (නිෂ්පාදන)
තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ

ආචාර්ය ඩබ්ලිව් එස් බොතේජු
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (සැකසුම් තාක්ෂණ)
තේ පර්යේෂණ ආයතනය
තලවකැලේ

ආචාර්ය ඒ සේනාරත්න මයා (2017 මැයි සිට)
පාරිසරික ආර්ථික ඒකකයේ ප්‍රධානී
ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
නිදහස් මාවත
කොළඹ 07

ජී ජී බන්දුල මයා (2017 මැයි සිට)
ප්‍රාදේශීය කළමණාකරු
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අංක 31, කාලිදාස මාවත
මාතර

එන් වි ටී ඒ වේරගොඩ මයා (2017 මාර්තු දක්වා)
සභාපති - රබර් පර්යේෂණ ආයතනය
ඩාර්ටන්ෆීල්ඩ්
අගලවත්ත

එස් කේ එල් ඔබේසේකර මයා (2017 මාර්තු දක්වා)
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි
බලංගොඩ හා මඩුල්සිම වැවිලි සමාගම
තැ පෙ අංක 6, ෆාම් ගාඩ්න් වත්ත
රත්නපුර

එල් ජේ පීරිස් මයා (2017 මාර්තු දක්වා)
කළමණාකාර අධ්‍යක්ෂ
හෙලික්ස් ඉංජිනියරින් පුද්ගලික සමාගම
අංක 17, හෝර්ටන් පෙදෙස
කොළඹ 07

ඉංජිනේරු ජේ කැලිස්ටස් ඊ අලස් (2017 මාර්තු දක්වා)
අංක 120/1, ස්ටැන්ලි තිලකරත්න මාවත
නුගේගොඩ

ආචාර්ය එම් එම් නුගලියද්ද මිය (2017 මාර්තු දක්වා)
අංක 81, සිංහපිටිය  වත්ත
ගම්පොල

ආචාර්ය කේ එස් පී අමරතුංග (2017 මාර්තු දක්වා)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - කෘෂි ඉංජිනේරු දෙපාර්තමේන්තුව
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පේරාදෙණිය

ජී ඩී වී පෙරේරා මයා (2017 මාර්තු දක්වා)
අධ්‍යක්ෂ - ලංකෙම් තේ හා රබර් වැවිලි සමාගම
අංක 53- 1/1, සර් බාරෝන් ජයතිලක මාවත
කොළඹ 01

එන් වී බී ජෝන්පිල්ලෙයි මයා (2017 මාර්තු දක්වා)
නිෂ්පාදන උපදේශක
ජෝන් කීල්ස් පුද්ගලික සමාගම - තේ අංශය
අංක 186, වොක්ෂ්හෝල් වීදිය
කොළඹ 02

ආචාර්ය කේ එම් ඒ බණ්ඩාර (2017 මාර්තු දක්වා)
වන සංරක්ෂක (අධ්‍යාපන)
ශ්‍රී ලංකා වන විද්‍යා ආයතනය
සඳතැන්න
නුවරඑළිය

## වතු හා උපදෙස් සේවා සඳහා වන කමිටුවේ සාමාජිකයින්

රොෂාන් රාජදුරෙයි මයා (කමිටු සභාපති)
කළමනාකාර අධ්‍යක්‍ෂ - කැළණිවැලි  වැවිලි සමාගම
අංක 400, ඩීන්ස් පාර
කොළඹ 10

වෛද්‍ය  එම් එම් ජේ පී ගවරම්මාන
සභාපති - තේ පර්යේෂණ මණ්ඩලය
තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ

ආචාර්ය අයි සරත් බී අබේසිංහ
අධ්‍යක්‍ෂ - තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ

ආචාර්ය එල් එස් කේ හෙට්ටිආරච්චි
අතිරේක අධ්‍යක්‍ෂ - තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ

ආචාර්ය ඩී එස් ඒ සමරවීර
අංක 1F 20 - මත්තේගොඩ නිවාස සංකීර්ණය
මත්තේගොඩ

විරේන් රුබේරු මයා
ප්‍රධාන විධායක නිලධාරි - කහවත්ත වැවිලි සමාගම
අංක 52, මාළිගාවත්ත පාර
කොළඹ 10

ඒ එල් ඩබ්ලිව් ගුණවර්ධන මයා
විධායක අධ්‍යක්‍ෂ - ඇල්පිටිය වැවිලි සමාගම
09 මහල, එයිට්කන් ස්පෙන්ස් කුළුණ 01
305, වොක්ෂ්හෝල් වීදිය
කොළඹ 02

මහාචාර්ය ආර් මහලියනාරච්චි
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
සබරගමුව විශ්ව විද්‍යාලය
බෙලිහුල්ඔය

සී ජේ අයි ටී ප්‍රනාන්දු මයා
සාමාන්‍යාධිකාරි (ව්‍යාප්ති)
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
නො 70, පාර්ලිමේන්තු පාර
බත්තරමුල්ල

එන් රත්නායක මයා (2017 මැයි දක්වා)
සභාපති - සමස්ත ලංකා කුඩා තේ වතු සමිති සම්මේලනය
අංක 70, පාර්ලිමේන්තු පාර
බත්තරමුල්ල

කේ එල් ගුණරත්න මයා (2017 ජූනි දක්වා)
ලේකම් - සමස්ත ලංකා කුඩා තේ වතු සමිති සම්මේලනය
අංක 70, පාර්ලිමේන්තු පාර
බත්තරමුල්ල

ආචාර්ය කේ එම් මොහොට්ටි
නියෝජ්‍ය අධ්‍යක්‍ෂ පර්යේෂණ (නිෂ්පාදන)
තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ

ආචාර්ය ඩබ්ලිව් එස් බොතේජු
නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (සැකසුම් තාක්ෂණ)
තේ පර්යේෂණ ආයතනය
තලවකැලේ

ආචාර්ය වී එස් සිධාකරන් (සම්බන්ධීකරණ ලේකම්)
ප්‍රධාන උපදෙස් නිලධාරි
තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ

## විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්

ඩී එච් එස් පුල්ලේපෙරුම මිය (කමිටු සභාපතිනිය)
අධ්‍යක්ෂ - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
කාමර අංක 341, 3 වන මහල
මහා භාණ්ඩාගාර ගොඩනැගිල්ල
කොළඹ 01

කේ එස් විජේකීර්ති මයා
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ්‍ය
11 වන මහල
සෙත්සිරිපාය - දෙවන අදියර
බත්තරමුල්ල

ආචාර්ය ඩී එස් ඒ සමරවීර
අංක 1F 20 - මත්තේගොඩ නිවාස සංකීර්ණය
මත්තේගොඩ

එස් ඩි කටුවාවලගේ මිය (නිරීක්ෂණ සාමාජික)
විගණක අධිකාරි
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දුව පාර
බත්තරමුල්ල

කේ පී රණසිංහ මයා (කැඳවුම්කරු/ලේකම්) (2017 ජූලි දක්වා)
අභ්‍යන්තර විගණක
තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ

# තේ පර්යේෂණ මණ්ඩල සභාපතිතුමාගේ වාර්තාව

2017 වර්ෂය සඳහා තේ පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මම ඉතාමත් සතුටු වෙමි.



**වෛද්‍ය එම් එම් ජේ පී ගවරම්මාන**
සභාපති - තේ පර්යේෂණ මණ්ඩලය

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය 2017 වසර තුළ විවිධ අභියෝගයන්ට මුහුණ දී තිබේ. ගංවතුර හා නියඟය නිසා ඇතිවූ අහිතකර කාලගුණික තත්ත්වයන්, තේ වගා කරන ප්‍රදේශ බොහොමයකට බලපෑවේය. වල්පැළෑටි කළමනාකරණය සඳහා වූ පිරිවැය ඉහළ මට්ටමක උච්චාවචනය වූ අතර, සාමාන්‍යය ඵලදායිතාවය පසුගිය වසර වලට සාපේක්ෂව පහත වැටුණි. කෘෂි පළිබෝධනාශක නොමැති වීම සහ කම්කරු හිඟය ප්‍රධාන බාධාවන් ලෙස දිගටම පැවතුනි. ඇතැම් රටවල් විසින් තේ ආනයනය සඳහා පැනවූ තීරුබදු නොවන බාධක තවත් ශක්තිමත් කිරීම මෙම වර්ෂය තුළ මුහුණපෑමට සිදුවූ තවත් අභියෝගයක් විය. තේ නිෂ්පාදන පිරිවැය ද වසර අවසාන කාර්තුවේ දී වැඩි විය.

ආයතනය විසින් වල්පැළෑටි කළමනාකරණය සඳහා සුදුසු පියවර නිර්දේශ කිරීම සඳහා විවිධ නව ප්‍රවේශයන් රැසක් ආරම්භකල අතර විකල්ප වල් මර්දනය ක්‍රමවේදයන් සඳහා සහයෝගීතා වැඩ පිළිවෙල රැසක් දියත් කර ඇත.

2017 වසරේදී යටිතල පහසුකම් හා මානව සම්පත් සංවර්ධනය, පර්යේෂණ නිපැයුම් සහ පාර්ශවකරුවන්ට සේවා සැපයීම සම්බන්ධයෙන් තේ පර්යේෂණ ආයතනයට ඉතා ඵලදායී හා වැදගත්වූ වසරක් බව ප්‍රකාශ කිරීමට හැකිවීම ගැන තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් මම සතුටු වෙමි. මෙම වසර තුලදී පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ බව ද සඳහන් කරමි.

(අ) යටිතල පහසුකම් සංවර්ධනය,
(ආ) මානව සම්පත් නංවාලීම; කාර්යය මණ්ඩල පුරප්පාඩු පිරවීම, කාර්යය මණ්ඩලයට දේශීය හා විදේශීය පුහුණු අවස්ථා සැපයීම,
(ඇ) කර්මාන්තයේ ගැටළුවලට ප්‍රමුඛත්වය දීම සඳහා පර්යේෂකයින් දිරිමත් කිරීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු නවීන් දිසානායක මහතා තේ පර්යේෂණ ආයතනයට පැමිණීම මෙම වසරේ ඉතාමත් වැදගත් සිදුවීමක් විය. අතිගරු ජනාධිපතිතුමා විසින් නව තේ ප්‍රභේදයක පැළයක් රෝපණය කරමින් මෙම වසරේදී TRI 5000 වර්ගයේ තේ ප්‍රභේද හතරක් නිකුත් කිරීම සනිටුහන් කරන ලදී.

බෝග හා ඉඩම් ඵලදායිතාව ඉහළ නැංවීම, බෝග ආරක්ෂාව, දේශගුණික විපර්යාසයන්, වගා කටයුතු යාන්ත්‍රීකරණය, තවාන් කළමනාකරණය, තේ සැකසුම් තාක්ෂණය, නිමි තේ වල ගුණාත්මය ඉහළ නැංවීම, නිමි තේ නිෂ්පාදනයන් සංවර්ධනය කිරීම, සමාජ ආර්ථික සහ සම්පත් සැලසුම්කරණය සම්බන්ධ පර්යේෂණයන් අඛණ්ඩව ඉදිරියටත් කරගෙන යනු ලැබේ. මීට අමතරව, ආයතනය උපදේශන හා පුහුණු වැඩසටහන්, විශ්ලේෂණ සේවා අධ්‍යාපනික වැඩසටහන් සහ ප්‍රදර්ශන මගින් කුඩා වතු හා වැවිලි අංශවලට විවිධාකාර සේවාවන් සැපයීමට පියවර ගෙන තිබේ. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, විශ්ව විද්‍යාල සහ විවිධ උසස් අධ්‍යාපන ආයතන විසින් ආරම්භ කරන ලද අධ්‍යයන වැඩසටහන් සඳහා සම්පත් දායකයින් සැපයීම හා වැඩසටහන් පැවැත්වීම මගින් ආයතනය සැලකිය යුතු ලෙස දායකත්වයක් දැක්විය. ආසියානු සංවර්ධන බැංකු අනුග්‍රහය යටතේ ආරම්භ කළ මව් ශාක ව්‍යාපෘතිය මගින් තේ වගාකරුවන්ට වැඩිදියුණු කළ තේ ප්‍රභේදයන් සැපයීම මේ වසර තුල දී ද සිදු විය. ජංගම දුරකථන හරහා තේ වගාකරුවන් වෙත උපදේශාත්මක තොරතුරු කාර්යක්ෂම ලෙස ව්‍යාප්ත කිරීම සඳහා ආයතනය නව කෙටි පණිවුඩ සේවාවක් හඳුන්වා දෙන ලදි.

ආයතනය විසින් වසර 150 ක ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ ප්‍රගතිය සාර්ථකව සැමරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් දැක්වූයේ තේ වගාකරන ප්‍රදේශ හතක පැවැත්වූ අධ්‍යාපනික ප්‍රදර්ශන සහ "පොල්, රබර් සහ තේ" (CRT) යන තේමාව යටතේ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වූ අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනයට සහභාගි වීමෙනි.

මෙම වසර තුළ දී ශාන්ත කූම්බ්ස් වත්ත සැලකිය යුතු කාර්ය සාධනයක් පෙන්නුම් කළේය. බටහිර බෑවුමේ ඉහළ උච්ඡත්ව ඇති ප්‍රදේශයන් හි නිපදවන තේ සඳහා වන සාමාන්‍ය මිලට වඩා සැලකිය යුතු ඉහළ දළ අලෙවි මිලක් පවත්වා ගැනීමට සහ සැලකිය යුතු ලාභයක් පවත්වාගෙන යෑමට ශාන්ත කූම්බ්ස් වතුයායට හැකිවිය. ශාන්ත ජෝකිම් වතුයාය සඳහා නව වතු අධිකාරී වරයෙක් පත් කිරීමට හැකි වූ අතර අමු දළු මිලදී ගැනීම ද සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහල නැංවීමට හැකි විය. තේ කර්මාන්ත ශාලාවේ සංවර්ධන කටයුතු රැසක් ද අවසන් කල අතර, පෙර වසරට සාපේක්ෂව මෙම වසරේදී ශුද්ධ විකුණුම් මිලෙහි සැලකිය යුතු දියුණුවක් ද ළඟා කරගැනීමට හැකි විය.

බොහෝ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදුකළ අතර; නුවරඑළිය/හැටන් ප්‍රධාන මාර්ගයෙන් ආයතනයට පිවිසෙන මාර්ගය කැඩී දුර්වල වීම හේතුවෙන් තේ පර්යේෂණ ආයතන කාර්යය මණ්ඩලයට හා මහජනතාවට දැඩි අපහසුතාවයන්ට මුහුණ දීමට සිදු වූ අතර පළාත් පාලන ආයතන සමඟ සාකච්ඡා කර එම මාර්ගයේ කාපට් ඇතිරීමට මෙම වසරේදී හැකියාව ලැබුණි. නව කැබ් රථ හතරක් කුලී පදනම මත මිල දී ගැනීමෙන් ආයතනයේ වාහන සංචිත ඉහළ නැංවීමට හැකියාව ලැබුණු අතර, 2015 වසරේ දී සිදුවූ හදිසි අනතුර නිසා අබලන් වූ බස් රථය වෙනුවට නව බස් රථයක් සහ නව මගී වෑන් රථයක් මිල දී ගැනීමට ද හැකියාව ලැබුණි. ශාන්ත කූම්බ්ස් වතුයායේ විවිධ සංවර්ධන කටයුතු රැසක් සම්පූර්ණ කරන ලදී. "Save the Children" අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානයේ මූල්‍ය අනුග්‍රහය යටතේ බෙහෙත් ශාලාව, මාතෘ වාට්ටුව, වින්නඹු සේවිකාවන්ගේ නිල නිවාස දෙකක් සහ ළමා සුරැකුම් මධ්‍යස්ථාන දෙකක් ද ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය කිරීමට හැකි විය. ඊට අමතරව, අලුතින් වැසිකිළි 65ක්, කම්කරුවන් සඳහා විවේකාගාරයක් සහ ලැම්ලියර් කොටස සඳහා නව ළමා සුරැකුම් මධ්‍යස්ථානයක් ද සාර්ථකව නිම කරන ලදී. උඩරට නව ග්‍රාමීය ප්‍රජා සහ යටිතල පහසුකම් සංවර්ධන ගරු අමාත්‍යතුමාගේ සහයෝගය ඇතුව, ශාන්ත කූම්බ්ස් වතුයායේ පහළ කොටසෙ හි ජීවත්වන කම්කරුවන් සඳහා සහ ලැම්ලියර් කොටසෙ හි නාය යෑමේ අවදානම සහිත ප්‍රදේශයන් හි දැනට ජීවත්වන කම්කරු පවුල් සඳහා නිවාස ව්‍යාපෘති දෙකක් ආරම්භ කර ඇත. බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ තේ වියලීමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ශාන්ත කූම්බ්ස් තේ කර්මාන්ත ශාලාවට දීර්ඝ කාලීන අවශ්‍යතාවයක්ව පැවති උණුසුම් ජල උත්පාදක යන්ත්‍රය ද ස්ථාපනය කරන ලද අතර ශාන්ත ජෝකිම් වතුයායේ බෙහෙත් ශාලාව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ රජයේ බෙහෙත් ශාලාවක් බවට පත්කරන ලදී.

තේ පර්යේෂණ ආයතනයෙ හි කාර්ය සාධනය වැඩිදියුණු කිරීමේ මූලික ප්‍රවේශය ලෙස මානව සම්පත් සංවර්ධනය පිළිබඳව මණ්ඩලය දැඩි සැලකිල්ලක් දක්වන අතර වර්ෂය තුළ මානව සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කරන ලදී. අතිගරු ජනාධිපතිතුමන් හා ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමන් සහභාගී වූ උත්සවය සංවිධානය කරන ලද්දේ ඉතිහාසයේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය වෙනුවෙන් කැපවූ විද්‍යාත්මක හා සහායක කාර්ය මණ්ඩලය ඇගයීමට සහ උපහාර දැක්වීමටය.

ආයතනයේ වසර ගණනාවක් පුරප්පාඩුව පැවති ප්‍රධාන කාර්යය මණ්ඩල තනතුරු වන නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැකසුම් තාක්ෂණ) මෙන් ම තවත් තනතුරු රැසක් සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීමට මෙම වසරේ දී හැකියාව ලැබුණි. ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීමට කටයුතු කල අතර තාක්ෂණික හා අනුග්‍රාහක කාර්යමණ්ඩලය සඳහා විදේශීය පුහුණු අවස්ථා කිහිපයක් සඳහා ද මණ්ඩලය විසින් පහසුකම් සැලසීය.

ආයතනයේ පර්යේෂණ, සංවර්ධන සහ තාක්ෂණ හුවමාරු ක්‍රියාවලීන්, ශාන්ත කූම්බ්ස් සහ ශාන්ත ජෝකිම් වතු කළමනාකරණය පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සඳහා පර්යේෂණ උපදේශක කමිටුව සහ වතු, උපදෙස් හා ව්‍යාප්ති උපදේශක කමිටු මගින් තේ පර්යේෂණ මණ්ඩලයට මගපෙන්වීම සහ ප්‍රශංසනීය සහයෝගයක් ලබා දුනි. විගණන හා කළමනාකරණ කමිටුවේ මගපෙන්වීම ආයතනයේ මුදල් හා පරිපාලනය අධීක්ෂණය කිරීම සඳහා මණ්ඩලයට විශාල සහයෝගයක් විය.

මෙම වසරේ දී සියලු  ජයග්‍රහණ සහ ප්‍රගතීන් අත්කර ගැනීම සඳහා තේ පර්යේෂණ ආයතනයෙහි අධ්‍යක්ෂක මණ්ඩලය, තාක්ෂණික සහ පරිපාලන කාර්ය මණ්ඩලය සහ අනෙකුත් සේවක සේවිකාවන් විසින් සපයනු ලැබූ සුවිශේෂී සේවාවන් හා සහයෝගය අගය කිරීමට මම මෙය අවස්ථාවක්  කර ගනිමි.

අවසාන වශයෙන්, ගරු අමාත්‍යතුමා, ලේකම්තුමා සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය විසින් තේ පර්යේෂණ මණ්ඩලය වෙත ලබාදුන් සහයෝගය වෙනුවෙන් මගේ කෘතඥතාව පළ කරන අතර මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් සඳහා වටිනා සහයෝගයක් ලබාදීම වෙනුවෙන් තේ පර්යේෂණ මණ්ඩල සාමාජිකයින්ටද මගේ කෘතඥතාව පළ කරමි.



**වෛද්‍ය එම් එම් ජේ පී ගවරම්මාන**
**සභාපති**
**තේ පර්යේෂණ මණ්ඩලය**

## අතිගරු ජනාධිපතිතුමාගේ තේ පර්යේෂණ ආයතන සංචාරය





## අධ්‍යක්ෂතුමාගේ වාර්තාව, තේ පර්යේෂණ ආයතනය



**අචාර්යය අයි එස් බී අබේසිංහ**
අධ්‍යක්ෂ
තේ පර්යේෂණ ආයතනය

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් 2017 ජනවාරි මස 21 වන දින තේ පර්යේෂණායතනය නැරඹීමට පැමිණි අතර මෙම අවස්ථාවට වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු නවීන් දිසානායක සහ වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත ලක්ෂ්මන් පෙරේරා යන මහත්වරු ද සහභාගී විය. අතිගරු ජනාධිපතිතුමා විසින් TRI 5000 කාණ්ඩයේ තේ පැලයක් තේ පර්යේෂණායතන පරිශ්‍රයේ රෝපණය කළ අතර නවීකරණය කරන ලද තේ පර්යේෂණායතන තොරතුරු මධ්‍යස්ථානය සහ නව කෙටි පණිවිඩ පිවිසුම ද අරඹනු ලැබීය.

අතිගරු ජනාධිපතිතුමා තේ කර්මාන්තය වෙනුවෙන් ඉහළ දායකත්වයක් ලබාදුන් ආයතනයේ විද්‍යාඥයන් සහ අනෙකුත් සේවකයින් ලක්කිරමින් පදක්කම් ප්‍රදානය කලේය. අනතුරුව ගරු නවින් දිසානායක මහතා විසින් තේ පර්යේෂණ ආයතනයේ නවීකරණය කරන ලද වෛද්‍ය මධ්‍යස්ථානය හා මාතෘ වාට්ටුව විවෘත කරනු ලැබීය.

ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ 150 වැනි සංවත්සරය සැමරීම සඳහා 2017 අගෝස්තු මස 8 සිට 11 දක්වා ජාත්‍යන්තර තේ සමුළුවක් කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී පවත්වනු ලැබීය. මෙහි සමාරම්භක උළෙලේ ප්‍රධාන අමුත්තා ලෙස ගරු රනිල් වික්‍රමසිංහ මහතා සහභාගි වූ අතර ගෞරවනීය ආරාධිතයා ලෙස ගරු නවින් දිසානායක මහතා සහභාගී විය. මෙම සමුළුව තේ තාක්ෂණයන්, තරගකාරී පාන වර්ග සහ අලෙවිකරණ උපායමාර්ග, මූල්‍ය, වෙළෙඳ හා වාණිජ කටයුතු, සම්පාදන හා කාර්යය සංවිධාන, උරුමයන් සහ ගෝලීය බලවේග යන තේමාවන් යටතේ පවත්වනු ලැබීය.

කොළඹ ජාත්‍යන්තර තේ සමුළුවට සමගාමීව පොල්, රබර් සහ තේ (CRT) වෙළඳ ප්‍රදර්ශනයක් අගෝස්තු මස 11 සිට 23 දක්වා බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වූ අතර අගෝස්තු මස එකොළොස් වන දින සමාරම්භක උළෙල සඳහා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, ගරු නවින් දිසානායක සහ ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා යන මහත්වරුන් ද සහභාගී විය.

තේ පර්යේෂණ ආයතනය විසින් මෙම ප්‍රදර්ශනයේ දී තේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සහ නව සොයාගැනීම් විදහා දක්වන ප්‍රදර්ශන කුටි දහයක් පවත්වාගෙන යනු ලැබීය. CRT ප්‍රදර්ශනයට සමගාමීව පවත්වනු ලැබූ සම්මන්ත්‍රණ මාලාව සඳහා ආචාර්ය කේ. එම්. මොහොට්ටි සහ ආචාර්ය එම්. ඒ. විජේරත්න යන මහත්වරුන් සම්පත් දායකයන් ලෙස සහභාගී වෙමින් පිළිවෙලින්, කරඅඟුරු සහ පසේ කාබනික ද්‍රව්‍ය කළමනාකරණය, තේ කර්මාන්තය සහ දේශගුණික විපර්යාස යන මැයින් දේශන පවත්වනු ලැබීය.

ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ අන්තර් රාජ්‍ය කණ්ඩායමේ (FAO/IGG) අන්තර්වාර කමිටු රැස්වීම අගෝස්තු මස 12 සහ 13 යන දිනයන් හි කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී පවත්වනු ලැබීය. මෙහිදී කෙන්යාවේ පැවැත් වූ අවසන් FAO/IGG රැස්වීමේදී ගත් ක්‍රියා මාර්ගයන්ට අනුව පලිබෝධනාශක අවශේෂ උපරිම මට්ටම (MRLs), තේ වෙළඳාම සහ ගුණාත්මකභාවය, කාබනික තේ, දේශගුණික වෙනස්වීම් සහ කුඩා තේ වතු අංශය යන ක්‍රියාකාරී කණ්ඩායම් පහේ නියෝජිතයින් සිදුකල ක්‍රියාකාරකම් හි ප්‍රගතිය සාකච්ඡාවට භාජනය කරන ලදී.

කොළඹ ජාත්‍යන්තර තේ සම්මේලනය හා FAO/IGG හි අන්තර්වාරික සාකච්ඡාවන් සඳහා සහභාගී වූ බොහෝ නියෝජිතයින් තේ පර්යේෂණායතනය නැරඹීමට ද පැමිණි අතර යුරෝපා ශාකසාර සංගමයේ (THIE) හිටපු මහ ලේකම් ආචාර්ය මොනිකා බියුටිගන් (2005 වසරේදී ඒකාබද්ධ වූ පැරණි යුරෝපා ශාකසාර සංගමය සහ පැරණි ECT හි) THIE අනු කමිටුවේ සභාපති ආචාර්ය තෝමස් හෙන්, ජර්මන් තේ සංගමයේ සාමාජික සැන්ඩ්‍රා නිකොලයි මහත්මිය, ජර්මන් තේ සංගමයේ මහලේකම් ඒම්. විටිග් මහතා ද අගෝස්තු 18 දින තේ පර්යේෂණායතනය නැරඹීමට පැමිණි අය අතර වූහ. පළිබෝධනාශක උපරිම සීමාවන් හා පළිබෝධනාශක ප්‍රවේශමෙන් පරිහරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ගත් ක්‍රියාමාර්ගයන් පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළ අතර ඉන් පසු ඒ පිළිබඳව සාකච්ඡා කරනු ලැබීය.

චීනයේ තේ පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින් වන L Chengyin, CAAS, තේ පර්යේෂණ ආයතන නියෝජ්‍යය අධ්‍යක්ෂක, මහාචාර්ය L Zhi, මහාචාර්ය Z. Li සහ ආචාර්ය Z. Fei යන මහත්වරු ද තේ පර්යේෂණායතනය නැරඹීමට පැමිණියහ. පාර්ශවයන් දෙකම ඔවුන්ගේ ආයතන හා ආයතනවල වැඩකටයුතු පිළිබඳ අදහස් හුවමාරු කරගත් අතර මෙහිදී සහයෝගී වැඩසටහන් සඳහා යෝජිත විෂයයන් වූයේ තේ ජාන ජ්ලාස්මය /තේ ප්‍රභේද හුවමාරු කිරීම, ජාන සලකුණු කාරක ඇසුරින් ප්‍රභේද/ජානමය ද්‍රව්‍ය තේරීම් සිදුකිරීම (MAS), තේ පළිබෝධකයින් සඳහා ජීව විද්‍යාත්මක පාලන ක්‍රම දියුණු කිරීම, පළිබෝධ නාශක අවශේෂ විශ්ලේෂණය සහ දේශගුණික විපර්යාස පිළිබඳ පර්යේෂණ වැඩසටහන් ය.

ඉරාන තේ සංගමයේ සභාපති M Movassaghi මහතාගේ ප්‍රධානත්වයෙන් ඉරාන නියෝජිත කණ්ඩායමක් අගෝස්තු 16 වන දින තේ පර්යේෂණායතනය නැරඹීමට පැමිණි අවස්ථාවේදී ශ්‍රී ලංකා තේ වල ගුණාත්මක බව සහ සෞඛ්‍යආරක්ෂිත බව පවත්වා ගැනීම සඳහා අනුගමනය කරන නිවැරදි කෘෂිකාර්මික කටයුතු සහ නිවැරදි නිෂ්පාදන කටයුතු පිළිබඳව ඔවුන්ව දැනුවත් කරනු ලැබීය.

පාකිස්ථානයේ ජාතික තේ සහ ඉහළ වටිනාකමක් සහිත බෝග සඳහා වන පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය එෆ් එස් හමීඩ් මහතා අගෝස්තු මස 14, 15 යන දිනයන් හි තේ පර්යේෂණායතනය නැරඹීමට පැමිණ තේ පර්යේෂණායතනය සමඟ පර්යේෂණ හා සංවර්ධන කටයුතු පිළිබඳව සහයෝගයෙන් කටයුතු කිරීමට ඔවුන්ගේ ඇති කැමැත්ත ප්‍රකාශ කරනු ලැබීය.

ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, කැනඩාව, රුසියාව, චීනය, සෞදි අරාබිය, තුර්කිය, ඉරානය සහ කුවේට් යන රටවල් නියෝජනය කරමින් පුවත්පත් කලාවේදීන් 14 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය පිළිබඳව විශ්වාසනීය තොරතුරු සහ අත්දැකීම් ලබාගැනීම සඳහා අගෝස්තු 10 වන දින තේ පර්යේෂණායතනය නැරඹීමට පැමිණියේය.

කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව 2017 ජුලි මස 6 වන දින ගරු විජිත හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී රැස්විය. සාකච්ඡාවට ලක් වූ ප්‍රධාන කාරණය වූයේ තේ කර්මාන්තය සඳහා ග්ලයිෆොසේට් භාවිතය ලිහිල් කිරීම සහග්ලයිෆොසේට් භාවිතය පිළිබඳ ප්‍රතිපත්ති සමාලෝචන කමිටුව වෙත ඒ පිළිබඳව වාර්තා කිරීමය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය සමන් කැලේගම මහතා තේ කර්මාන්තයේ තරඟකාරීත්වය හා ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට සහාය වන එක්සත් ජනපදයේ හාවර්ඩ් විශ්ව විද්‍යාලයේ කෙනඩි ආයතනයේ ජ්‍යෙෂ්ඨ අර්ථශාස්ත්‍රඥයින් හය දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සමඟ තේ කර්මාන්තයේ ඵලදායිතාව හා තරඟකාරීත්වය සම්බන්ධයෙන් හා එහි සමකාලීන ගැටළු පිළිබඳ අධ්‍යයනය සඳහා 2017 ජනවාරි 14 වන දින තේ පර්යේෂණායතනයට පැමිණියහ.

පහතරට ප්‍රදේශයේ තේ පඳුරු දුර්වලවීම සහ අස්වැන්න පහත වැටීම වලක්වාගැනීම සඳහා වන ඒකාබද්ධ ප්‍රවේශය යටතේ අනුගමනය කිරීමට සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් ආරම්භ කිරීමේ මූලික වැඩසටහන රත්නපුර තේ පර්යේෂණායතනයේ පහතරට මධ්‍යස්ථානයේ දී කුඩා තේ වතු හිමියන්, තේ සංවර්ධන සමිති නියෝජිතයන්, තේ කර්මාන්තශාලා නිලධාරීන්, තේ පර්යේෂණායතනයේ සහ ශාන්ත ජෝකිම් වතුයායේ නිලධාරීන් ගේ සහභාගීත්වයෙන් 2017 ජනවාරි 8 දින පැවැත්විණි

අක්කර 5 සිට 50 ප්‍රමාණයේ තේ ඉඩම් හිමි වැවිලිකරුවන් නියෝජනය කරන තේ වතු හිමියන්ගේ සංගමයේ (TEOA ගාල්ල - කළුතර) රැස්වීමක් ජූනි මස 1 වන දින පවත්වන ලදී. එහිදී ඔවුන්ගේ ඉඩම්වල ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා තේ පර්යේෂණ ආයතනයේ මැදිහත්වීම හා සහාය මෙන්ම ඔවුන්ගේ ගැටළු සාකච්ඡා කිරීම සඳහා සංසදයක අවශ්‍යතාවද ඔවුන් පෙන්වා දෙනලදී. එහිදී මෙම කණ්ඩායම සඳහා අවම වශයෙන් වසරකට එක් රැස්වීමක් පැවැත්වීමට තේ පර්යේෂණායතනය එකඟ විය.

තේ වල අඩංගු ද්‍රව්‍ය විශ්ලේෂක භාවිතයෙන් තේ කර්මාන්තයේ තරඟකාරීත්වය ශක්තිමත් කිරීම සඳහා ජපන් තාක්ෂණය යොදා ගැනීම පිළිබඳව පුද්ගලික අංශයේ සත්‍යෙක්ෂණ සමීක්ෂණයක් සිදු කිරීම ගැන සාකච්ඡා කිරීමට JICA ආයතනයේ නිලධාරීන්, ජපන් සංවර්ධන සේවා පුද්ගලික සමාගමේ නිලධාරීන් සහ කවාසාකි කිකෝ සමාගමේ නියෝජිතයින් පිරිසක් මාර්තු මස 2 – 3 යන දිනයන්හි දී තේ පර්යේෂණායතනයට පැමිණියහ. 2017 අගෝස්තු මාසයේ දී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර JICA ආයතනය ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ඇත.

**පර්යේෂණ, උපදේශන සහ ව්‍යාප්ති කටයුතු**

කීට විද්‍යා සහ වටපණු විද්‍යා අංශයේ ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පර්යේෂණ සඳහා වන උපදේශන කමිටුවේ රැස්වීමක් 2017 මාර්තු මස 06 වන දින ද, ශාක ව්‍යාධිවේදී අංශයේ ප්‍රගතිය සාකච්ඡා කිරීමේ රැස්වීමක් ඔක්තෝබර් 15 වැනි දින ද ශාක කායික විද්‍යා අංශයේ ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා රැස්වීමක් 2017 දෙසැම්බර් මස 4 වැනි දින ද පවත්වන ලදී.

තේ පර්යේෂණායතනය යටතේ පාලනය වන තේ වතු දෙකෙහි ප්‍රගතිය සහ උපදෙස් හා ව්‍යාප්ති කටයුතුවල ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීමට උපදෙස් ව්‍යාප්ති කටයුතු හා වතු සම්බන්ධ උපදේශන කමිටු රැස්වීම් පෙබරවාරි 27, ජූනි 12, සහ දෙසැම්බර් 10 යන දිනයන් හිදී පැවැත්විණි.

වැඩි දියුණු කළ තේ නිෂ්පාදන තාක්ෂණයන් තුළින් තේ කර්මාන්තයේ තිරසාර බව රැකගැනීම යන තේමාව යටතේ පැවැත්වූ 233 වන පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය 2017 වසරේ ජනවාරි 27 වෙනි දින පැවැත්විණි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් එම්.එම්.ආර්.පද්මසිරි මහතා ආරාධිත දේශකයා වශයෙන් සහභාගී වූ අතර තේ කර්මාන්තයේ තිරසාර බව රැක ගැනීම සඳහා බලශක්ති කළමනාකරණය සහ සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව ඔහුගේ ආරාධිත දේශනය සිදුකරන ලදී.

පහතරට ප්‍රදේශයේ තේ ඉඩම්වල අස්වනු පහත වැටීමේ වර්තමාන තත්වය හා ඒසඳහා ප්‍රතිපත්තිමය සහ තාක්ෂණික මැදිහත්වීම් යන තේමාව යටතේ 234 වෙනි පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය 2017 ජූනි 28 වැනි දින පැවැත්විණ.

පහතරට ප්‍රදේශයේ තේ පඳුරු දුර්වලවීම යන තේමාව යටතේ කුඩා තේ වතු අංශය සඳහා පවත්වනු ලබන පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය 2017 ජූනි මස 20 දින රත්නපුර තේ පර්යේෂණායතන පහතරට මධ්‍යස්ථානයේදි පැවැත්විණ. මේ සඳහා ආරාධිත දේශකයා ලෙස සහභාගි වූ ජේ. එල්. කේ. වීරලාල් මහතා විසින් තේ ඉඩම් හි අපනයන කෘෂි බෝග අතුරු බෝග ලෙස වගා කිරීමේ හැකියාව පිළිබඳ දේශනයක් කරනු ලැබීය.

ශාක අභිජනන අංශයේ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් හි ප්‍රගතිය පිළිබඳව විමර්ශනයක් විද්‍යාත්මක උපදේශක කමිටුව (SAC) විසින් 2017 මැයි 3 වන දින සිදු කළ අතර එයට ආචාර්ය සුමිත් අබේසිරිවර්ධන, ආචාර්ය ලලිත් පෙරේරා සහ ආචාර්ය කුමුදුනී ගුණසේකර මහත්මිය සහභාගී වූහ.

විද්‍යාත්මක උපදේශක කමිටුවේ නිර්දේශයන් 2017 ජුනි 5 වන දින පර්යේෂණ සඳහා වන උපදේශන කමිටුවට ඉදිරිපත් කරනු ලැබීය. තේ ශාකයේ ජාන සංරක්ෂණය සහ සංවර්ධනය යන තේමාව යටතේ වූ ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා විද්‍යාත්මක උපදේශක කමිටුව නැවත ජුනි 2 වන දින රැස්විය.

ශාක ව්‍යාධිවේදී අංශයේ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් හි ප්‍රගතිය පිළිබඳව විමර්ශනයක් විද්‍යාත්මක උපදේශක කමිටුව (SAC) විසින් අගෝස්තු මස 22 වන දින පැවැත්වූ අතර එම කමිටුවට පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය එන්. කේ. බී.අධිකාරම්, රුහුණු විශ්ව විද්‍යාලයේ මහාචාර්ය වසන්ත කුමාර සහ කැලණිය විශ්ව විද්‍යාලයේ ආචාර්ය රේණුකා අත්තනායක මහත්මිය සහභාගි විය.

ශාක කායික විද්‍යා අංශයේ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් හි ප්‍රගතිය පිළිබඳව විමර්ශනයක් නොවැම්බර් 15 වන දින පොල් පර්යේෂණායතනයේ ආචාර්ය එස් රණසිංහ මහත්මිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය කේ. ඩබ්ලිව්. එල්.කේ. වීරසිංහ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්ය එච්.අයි.යූ. කල්දේරා සහභාගී වූ විද්‍යාත්මක උපදේශක කමිටුව (SAC) විසින් සිදුකරන ලදී.

වටපණු හානිය රිස්සීමේ දර්ශකය (Nematode Tolerance Index) පිළිබඳව ගැටලු විසඳීමේ වැඩමුළුවක් තේ පර්යේෂණ ආයතනයේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) ආචාර්ය එන්. ඥානප්‍රගාසම් සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආචාර්ය මීගස්කුඹුර යන මහත්මින්ගේ සහභාගීත්වයෙන් නොවැම්බර් 20 වන දින පැවැත්විණ.

TRI 5000 කාණ්ඩයේ තේ ප්‍රභේද වගාකරුවන් වෙත නිදහස් කිරීම නිර්දේශ කිරීම සඳහා නව තාක්ෂණ නිර්දේශ කිරීමේ කමිටු රැස්වීමක් 2017 දෙසැම්බර් 20 වන දින පැවැත්විණි.

**පර්යේෂණ ප්‍රගතීන්**

**බෝග වැඩිදියුණු කිරීම**

**ඵලදායිතාව සහ ගුණාත්මය ඉහල නැංවීම සහ නව අභියෝගයන්ට මුහුණදීම සඳහා නව තේ ප්‍රභේද අභිජනනය කිරීම**

**නව තේ ප්‍රභේද වැඩිදියුණු කිරීම**

තේ පර්යේෂණායතනය ආයතනයේ තාක්ෂණ නිර්දේශ කිරීමේ කමිටුව විසින් උඩරට ප්‍රදේශය සඳහා නව තේ ප්‍රභේද හතරක් එනම්: TRI 5001, TRI 5002, TRI 5003 සහ TRI 5004 නිර්දේශ කරනු ලැබී ය.

**2017 පිළිමුහුම් අභිජනන වැඩසටහන**

2013 වසරේ අභිජනන වැඩසටහන මගින් නිපදවූ F1 පැළ අතරින් තෝරාගත් පැළ හරිතාගාරයක් තුළ වගාකර මව්පිය සංයෝජන තුනක් යොදා ගනිමින් පිළිමුහුම් වැඩසටහන ආරම්භ කරනු ලැබීය. පාලිත පාරිසරික තත්ත්වයන් යටතේ දී අභිජනන වැඩසටහනක් සිදුකළ පළමුවැනි අවස්ථාව මෙය වේ.

**ද්වි-ප්‍රභේද සහ බහු-ප්‍රභේද බීජ උයන්**

වටවල කැරලිනා වතුයායේ බහු - ප්‍රභේද බීජ උයනක් ස්ථාපනය කරනු ලැබීය. මේ සඳහා DG 7, DUN 7, DEL 40, NAY 3, TRI 2015 සහ TRI 2043 යන ප්‍රභේද සංකලනයන් යොදාගනු ලැබීය

**ශ්‍රී ලංකාවේ බීජ උයන්හි අභිජනන ක්‍රියාපිළිවෙත් සහ ප්‍රජනක ඍතුඑලවේදය අධ්‍යයනය කිරීම**

මෙම අධ්‍යයන මඟින් පෙනී ගොස් ඇත්තේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය බීජ උයන් හි බහුලව මල් හට ගන්නා කාලය බවත් අප්‍රේල් සිට අගෝස්තු දක්වා කාලය බහුලව ඵල හටගන්නා කාලය බවත්ය. මේ අතර මව්පිය ප්‍රභේදයන් හි මල් සහ ඵල හට ගැනීමේ මට්ටම් හි සැලකිය යුතු වෙනස්කම් පෙන්නුම් කර ඇති අතර බහුලව මල් සහ ඵල හටගන්නා ප්‍රභේදයන් ද හඳුනා ගැනීමට හැකි විය. මව්පිය ප්‍රභේදයන් හි පරාගධානි පැළීම/පරාග ජීව්‍යතා මට්ටම් හි වෙනස්කම් ද පෙන්නුම් කළ අතර පරාගවල ජෛව විද්‍යාත්මක සහ මල් හටගැනීමේ මට්ටම් අනුව ඉහළ සහ මධ්‍යස්ථ පරාග දායකයින් ලෙස ප්‍රභේද කාණ්ඩ දෙකකට වෙන් කළ හැකි විය. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල මත බීජ උයන් ස්ථාපනය කිරීම සඳහා යෝග්‍ය ද්වි-ප්‍රභේද සංයෝජන පහක් සහ බහු-ප්‍රභේද සංයෝජන හතරක් හඳුනා ගැනීමට හැකිවිය.

## ජාන ප්ලාස්ම සංරක්ෂණය, ලක්ෂණ නිරූපණය සහ ඇගයීම

### තේ ජාන ප්ලාස්මයේ ලක්ෂණ නිරූපණය සහ පරිවෘත්තීය පැතිකඩ අධ්‍යයනය කිරීම

ශ්‍රී ලංකා තේ ජාන ප්ලාස්මයෙහි පරිවෘත්තීය පැතිකඩ පරීක්ෂා කිරීමේ ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කරන ලදී. මෙම අධ්‍යයනය යටතේ බීමට ගන්නා තේ ප්‍රභේද 87 ක සහ බීමට භාවිතා නොකරන තේ ප්‍රභේද හයක ප්‍රධාන පරිවෘත්තිය ද්‍රව්‍ය හතක් HPLC සහ LC-MS/MS තාක්ෂණයන් භාවිතයෙන් හඳුනාගැනීමට හැකි විය. බීමට ගන්නා ප්‍රභේදයන් හි මෙම පරිවෘත්තීය ද්‍රව්‍ය හත පැතිරුණු පරාසයක් තුළ වෙනස් වෙන බව නිරීක්ෂණය විය. බීමට භාවිතා නොකරන තේ ප්‍රභේද තුළ ගාලික් අම්ලය සහ එපිකැටකින් පමණක් අඩංගු බව හඳුනා ගැනිණි. මෙහි ප්‍රතිඵල මගින් පෙනී ගියේ අමු දලුවල ඉහළ මට්ටම් වලින් EC සහ ECg තිබීම ඉහළ ගුණාත්මයෙන් යුතු කළු තේ නිෂ්පාදනයට යෝග්‍ය ප්‍රභේද හඳුනාගැනීමට ඇති විශ්වාසදායි සලකුණක් බව ය. අමු දළුවල ඉහළ මට්ටම් වලින් EC සහ අඩු මට්ටම්වලින් EGCg පැවතීම බුබුළු අංගමාරය රෝග සඳහා ප්‍රතිරෝධී බව පෙන්වන ලක්ෂණයකි. තේ ජාන ප්ලාස්මාවන් හි තියාබ්‍රෝමීන්, කැෆෙන් සහ සමස්ත පොලිෆීනෝල සංයුතියේ සැලකිය යුතු වෙනස්කමක් පෙන්වීම තුලින් පෙනී ගොස් ඇත්තේ ඒවා ප්‍රධාන තේ තක්සෝන (Taxa) තුනට ඇති සබැඳියාව ය.

### ශ්‍රී ලංකා තේ ජාන ප්ලාස්මයේ පුෂ්පීය විවිධත්වය සහ ජාන සැකැස්ම

තේ ජාන ප්ලාස්මයේ ජාන සැකැස්මේ ස්වභාවය සහ විකසනය නිර්ණය කිරීම සහ ප්‍රභේදයන් ප්‍රධාන තක්සෝනයන්ට වර්ගකිරීම අරමුණු කරගනිමින් තේ ජාන ප්ලාස්මයේ ප්‍රභේද 89 ක පුෂ්ප ලක්ෂණ දහසයක් යොදාගනිමින් පුෂ්පීය විවිධත්වය අනුව වර්ගීකරණය කරනු ලැබීය.

පුෂ්ප ලක්ෂණ අනුව ප්‍රභේදයන් විවිධ කාණ්ඩ පහකට වෙන් කරනු ලැබූ අතර ප්‍රබල වෙනස්කම් ඇති ප්‍රභේදයන්ද හඳුනාගනු ලැබීය. පුෂ්ප ලක්ෂණ අතරින් ජයාංගි ලක්ෂණ අනිකුත් ලක්ෂණයන්ට වඩා පැහැදිලි වෙනස්කම් පෙන්වීය. ජාන ප්ලාස්මාවන් හි ප්‍රභේද අතිප්‍රමුඛ ලෙස කාම්බෝජ වර්ගය (68%) නියෝජනය කරන අතර 20% පමණ ඇසැම් වර්ගය නියෝජනය කරයි. මෙම අධ්‍යයනයේදි ජාන ප්ලාස්මා සංචිතය තුල ඇති අඩුපාඩු ද හඳුනා ගත් අතර රැස් කර ගත් තොරතුරු ඉදිරි කාලයේ ජාන ප්ලාස්ම ගවේෂණයන් පිළිබඳ තීරණ ගැනීමේ දී සහ අභිජනන වැඩසටහන්වල දී ප්‍රයෝජනවත් වනු ඇත.

### ශ්‍රී ලංකාවේ මූලික ජාන ප්ලාස්ම සංචිතයක් එක් රැස් කිරීම

මූලික ජාන ප්ලාස්මා සංචිතයක් එක් රැස් කිරීම සඳහා වඩාත්ම යෝග්‍ය නියැදීම් ක්‍රමවේදය වන්නේ ජෛව රසායන පරාමිතීන් උපයෝගී කරගනිමින් මූලික සංචිතයක් ගොඩ නැංවීමය. සියලුම තේ ජාන ප්ලාස්මාවන් හි ප්‍රවේණි විවිධත්වය නියෝජනය කරමින් තෝරාගත් හැට හතරක අයිතමයන් සහිත මූලික ජාන සංචිතයක් දැනට භාවිතය සඳහා ගොඩනගා ඇත. නිරීක්ෂණය කරන ලද පුෂ්පීය ලක්ෂණ භාවිතයෙන්, ජෛව රසායන පරාමිතීන් ඇගයීමෙන් සහ අණුක ලක්ෂණ පරාමිතීන් භාවිතයෙන් ජාන සංචිතයේ වලංගු භාවය ඇගයීමෙන් ගොනු කර ගත් මූලික ජාන සංචිතය තුල ප්‍රමාණවත් නියෝජනයක් ඇති බව තහවුරු වේ.

### කඳ ගුල්ලා මර්දනය සඳහා  ජෛව රසායනික ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම (*Xyleborus fornicatus*)

ප්‍රධාන පළිබෝධකයින් දෙදෙනෙකු වන කඳ ගුල්ලා සහ පහතරට සජීවී දැව වේයා ගේ හානිය දරා සිටීම හා ප්‍රතිරෝධී බව පෙන්වන ප්‍රභේදයන් හි ව්‍යුහ විද්‍යාත්මක, ජෛව විද්‍යාත්මක, අණුක හා කායික විද්‍යාත්මක පදනම ස්ථාපනය කිරීම.

ජෛව විද්‍යාත්මක විශ්ලේෂණයන් පෙන්වා දී ඇත්තේ සජීවී දැව වේයාගේ හානිය දරාගතහැකි සහ පාත්‍රවන තේ ප්‍රභේදයන් හි අඩංගු කැෆෙන් සංයුතියේ පැහැදිලි වෙනස්කමක් ඇති බවය. කෙසේ නමුත් මුළු කැටකින් ප්‍රමාණය සහ මුළු පොලිපීනෝල මට්ටම්වල පැහැදිලි වෙනස්කම් හානිය දරා සිටින සහ හානියට පාත්‍රවන ප්‍රභේදයන් අතර නොමැත. ඒ අනුව මෙම අධ්‍යයන ප්‍රතිඵල පෙන්වා දී ඇත්තේ පහතරට සජීවී දැව වේයාගේ හානියට දක්වන ප්‍රතිරෝධී බවට ශාකයේ අඩංගු කැෆෙන් ප්‍රමාණය සෘජුවම බලපාන බවයි.

### කඳ ගුල්ලා මර්දනය සඳහා  ජෛව රසායනික ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම.

කඳ ගුල්ලාගේ හානියට ප්‍රතිරෝධී සහ පාත්‍රවන ප්‍රභේදයන් හි වාෂ්පශීලී සංයෝග සංයුතිය විශ්ලේෂණයෙන් පෙනී ගොස් ඇත්තේ ඒවායේ ඇති ලිනලූල්, ට්‍රාන්ස්-2-හෙක්සනාල්, සිස්-3-හෙක්සනාල්, පෙන්ටනාල් සහ මීතයිල් සැලිසිලේට් සංයුතිය TRI 2025 වැනි පාත්‍රවන ප්‍රභේදයන්ට වඩා TRI 2023 වැනි ප්‍රතිරෝධී ප්‍රභේදයන්හි අඩු බවය.

**ඉඩම් ඵලදායිතාව ඉහල නැංවීම සහ බෝග කළමනාකරණය**

**මේරූ තේ සඳහා ශාක පෝෂක ප්‍රභවයක් ලෙස තේ කර්මාන්ත ශාලා දැව අළු භාවිතය සඳහා ඇති හැකියාව සොයා බැලීම**.

තේ ඉඩම්වලට තේ පර්යේෂණායතනය නිර්දේශකරන පොහොර යෙදීමෙන් ලැබෙන අස්වැන්න හා දැව අළු යෙදීමෙන් ලැබෙන අස්වැන්න සමානවන බැවින් දැව අළු මේරූ තේ ඉඩම් සඳහා භාවිතා කිරීමට හොඳ විභවයක් ඇති බව පෙනී යයි.

**ක්ෂේත්‍ර තත්ත්ව යටතේ දී ශාක වර්ධන ප්‍රවර්ධන රයිසෝබැක්ටීරියාවන්ගේ විවිධ කාර්යක්ෂම මාදිලි භාවිතය ඇගයීම.**

පෙර වසරේ දී නිරීක්ෂණය කළ පරිදි මෙම වසරේදී ද (කප්පාදු චක්‍රයේ දෙවෙනි වසර) VP/UP 910 පොහොර යෙදූ තේ පඳුරු සහ එම පාංශු ශ්‍රේණියෙන් ම ලබාගත් බැක්ටීරියා සහ VP/UP 910 පොහොර මිශ්‍රණයෙන් නයිට්‍රජන් 30% ක් සහ පොස්පරස් 50% ක් අඩුකර යෙදූ තේ පඳුරු පරීක්ෂණයට භාජනය කළ සෑම ප්‍රදේශයක දීම සංසන්දනාත්මක අස්වනු ලබා දී ඇති බව පෙනේ.

**විවිධ තේ වගාකරන ප්‍රදේශයන්හි ක්ෂුද්‍ර පෝෂක තත්ත්වයන් පදනම් කර ගනිමින් ක්ෂුද්‍ර පෝෂක පිරිපුන් දියර පොහොර මිශ්‍රණ හඳුන්වාදීම**.

සින්ක් සහ මැංගනීස් (Zn + Mn), සින්ක්, මැංගනීස් හා බෝරෝන් (Zn + Mn + B) අඩංගු දියර පොහොර යෙදීමෙන් පාලකයට සාපේක්ෂව පිළිවෙලින් 22% හා 18% ක අස්වැන්න වැඩිවීමක් නිරීක්ෂණය කල අතර, තේ පර්යේෂණායතනය දැනට නිර්දේශ කරන සින්ක් සල්ෆේට් දියර පොහොරට වඩා ඉහත දියර පොහොර පිළිවෙලින් 12.4% හා 8.84% ක අස්වැන්න වැඩි වීමක් ලබා දී ඇත.

**බෝග ආරක්ෂණය**

තේ ඉඩම්වල වටපණු ගහනය ඉහළ යෑම වළක්වා ගැනීම සඳහා තේ වලවල්වල පස් සමග මිශ්‍ර කිරීමට සහ කප්පාදුවෙන් පසු පූර්ව ආරක්ෂණ ප්‍රතිකාරයක් වශයෙන් පසට මිශ්‍ර කිරීමට Fluopyram 400 SC (Velum) යොදාගත හැක.

සියලුම ප්‍රදේශවල භාවිතා කල හැකි පූර්ව-නිර්ගමන වල් නාශකයක් ලෙස Oxyfluorfen SC (ගෝල් 4F) (ලීටරයට ග්‍රෑම් 480 සාන්ද්‍රනය) යෙදීම සාර්ථක ප්‍රතිඵල පෙන්වා ඇති අතර, එය හෙක්ටයාරයට මිලිලීටර් 700 ක ප්‍රමාණයෙන් යෙදිය යුතුය. ඒවායේ අවශේෂ පිළිබඳ පර්යේෂණ ශාන්ත කුම්බිස් වතුයායේ මෙන්ම රත්නපුර, හන්තාන සහ පස්සර යන තේ පර්යේෂණායතන ප්‍රාදේශීය මධ්‍යස්ථානයන් හීදී සිදුකරමින් පවතී.

**කාලගුණ වෙනස්වීම්වල බලපෑම ඇගයීම**

**කාලගුණ විපර්යාස පළිබෝධක හානි කෙරෙහි බලපෑම**

රූපීයව වෙනස් වූ සහ අණුක වශයෙන් විෂම වූ ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණුවන්ගේ ව්‍යාධි කාරක හැකියාව සහ හැකියාවේ ශක්තිමත් බව සැලකිය යුතු මට්ටමින් වෙනස් වටපණු ගහණයන් වාර්තාවී ඇත. මේ අනුව වටපණු ගහනයන්ගේ දේහලීය අගයන් මෙන්ම වටපණු ඇස්තමේන්තු සකස්කිරීම සඳහා එක් එක් ස්ථානයන්හි නියැදි ලබා ගත යුතු විශේෂිත කාල පරිච්ඡේද පිළිබඳ ද වාර්තා විය.

**තේ පිරිසැකසුම් තාක්ෂණය හා නිෂ්පාදන වැඩිදියුණු කිරීම**

**තත්‍යකාල තාප හා ස්කන්ධ හුවමාරු ගණිතමය ආකෘතියක් භාවිතයෙන් ද්‍රෝණිකා මැලවීම් ක්‍රියාවලියේ විද්‍යුත් බලශක්ති කාර්යක්ෂමතාවය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම**.

වියළි බල්බ උෂ්ණත්වය සෙන්ටිග්‍රේට් අංශක 25 සහ 28 සමග විවිධ සාපේක්ෂ ආර්ද්‍රතා අගයන් විචලනය පෙන්වන පයිතන් පරිගණක භාෂාවෙන් ලියනලද අනුකරණ මොඩලයක් භාවිතයෙන් සම්මත මැලවීමේ ප්‍රස්ථාර ස්ථාපනය කරන ලැබීය.

ඇනලොග් ඩිජිටල් පරිවර්තකයක් හරහා රාස්ප්බෙරි පයි බි මොඩලය (ADC Pi Plus) භාවිතයෙන් උෂ්ණත්ව හා සාපේක්ෂ ආර්ද්‍රතා දත්තයන් ලබා ගැනීම සඳහා පයිතන් පරිගණක භාෂාවෙන් ලියන ලද සමීකරණ ස්ථාපනය කල අතර අදාළ විද්‍යුත් ඒකකයන් ද සකසනු ලැබීය.

උෂ්ණත්ව හා සාපේක්ෂ ආර්ද්‍රතා දත්ත භාවිතයෙන් තත්‍යකාල තෙතමන මිනුම් මගින් පයිතන් පරිගණක වැඩසටහනෙහි නිරවද්‍යතාවය ස්ථිර කරනු ලැබීය.

තව් මැරීමේ වායුධාරාව පාලනය කිරීම සඳහා පංකා මෝටරයේ විචල්‍යය වේග ධාවකයට ප්‍රතිදාන වෝල්ටීයතාව සැපයීම සඳහා ස්පන්දන-විතර මූර්ජනය මගින් ඉලෙක්ට්‍රොනික පරිපථයක් සකසනු ලැබීය.

තව් මැරීම සඳහා යොදා ගන්නා වායුධාරාවේ උෂ්ණත්වය පාලනය සඳහා වායු තාපක යතුරු විද්‍යුත් පිළියවනයන් හරහා පාලනය සඳහා අවශ්‍ය වැඩසටහන් පයිතන් භාෂාව මගින් සකසනු ලැබීය. අවශ්‍ය විද්‍යුත් මුහුණත් ඒකකයන් ද ප්‍රධාන පාලක ඒකකයන් ගෙන් සමන්විතය. කාර්යක්ෂමතාවය සහ නඩත්තු කිරීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා ප්‍රධාන පයිතන් වැඩසටහන් මොඩියුලගත කරනු ලැබීය.

**ද්‍රෝණිකා තව් මැරීමේ දී යොදා ගන්නා VSD හා සම්බන්ධ විදුලිපංකා මෝටරයේ ක්‍රියාකාරිත්වය ස්වයංක්‍රීය කිරීම සඳහා MODBUS ප්‍රොටකෝලය භාවිතයෙන් අඩු වියදම් පාලන තාක්ෂණයක් දියුණු කිරීම.**

පීඩන විචලනය අධීක්ෂණය කිරීම සඳහා සංවේදී සංවේදක හා පීඩන සංවේදක යොදාගනිමින් පාලන ඒකකයක් සකසා සාර්ථකව අත්හදා බලනු ලැබීය. මෙම පාලන ඒකකය Atmel-AVR ක්ෂුද්‍රපාලකයක් හරහා මැලවුම් ද්‍රෝණිකාවේ VSD ට සම්බන්ධ කර ඇත. තේ වියළීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම සඳහා PLC පදනම් කරගත් අධීක්ෂණ හා පාලන පද්ධතියක් සැලසුම් කර වියලන යන්ත්‍රයට සවි කරනු ලැබීය.

**ඕතඩොක්ස්-රොටෝවේන් තේ නිෂ්පාදනයේ දී තරල-පත්ල වියළීම (FBD) සඳහා කාර්යක්ෂම අධීක්ෂණ හා පාලන පද්ධතියක් සංවර්ධනය කිරීම.**

ප්‍රමාණවත් තරම් ඩුල් නිෂ්පාදනය කර ගැනීම සඳහා, අධීක්ෂණ හා පාලන පද්ධතිය යොදා ගනිමින් අත්හදා බැලීම් සිදු කිරීමේ දී බාධාවකින් තොරව වියළීමේ කටයුතු කරගෙන යෑම සඳහා අමතර රොටෝවේනයක්, බීටර් පෙට්ටියක් සහ රෝල් බ්‍රේකරයක් කර්මාන්තශාලාවේ ඇඹරුම් කාමරය තුල සවිකරනු ලැබීය. තව ද, වියළීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා 2017 අගෝස්තු මස කර්මාන්ත ශාලාව තුළ ස්ථාපනය කරන ලද උණු ජල උත්පාදකය FBD යන්ත්‍රයට සම්බන්ධ කරනු ලැබිය.

FBD යන්ත්‍ර මගින් තේ වියලීම අධ්‍යයනය සඳහා සහ අධීක්ෂණය හා පාලන පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා අත්හදා බැලීම් 12 ක් සිදු කල අතර අවසානයේ ලැබිය යුතු 3% ක තෙතමන ප්‍රතිශතය දක්වා තේ වියලීම සඳහා පාලක පද්ධතිය කාර්යක්ෂමව ක්‍රියා කරන බව පෙනී ගොස් ඇත.

**අගය එකතු කල නිෂ්පාදන**

**ඉවතලන තේ රොඩුවලින් ප්‍රෝටීන් නිස්සාරණය කර ගැනීම.**

ඉවතලන තේ රොඩුවලින් නිස්සාරණය කරගත් ප්‍රෝටීන් වල ප්‍රතිඔක්සිකාරක සහ ප්‍රති-ක්ෂුද්‍ර ජීවක ලක්ෂණ පරීක්ෂා කළ අතර ප්‍රතිඵලවලින් පෙන්වා දුන්නේ මෙම ප්‍රෝටීන ප්‍රබල ප්‍රතිඔක්සිකාරක මෙන් ම ප්‍රති-ක්ෂුද්‍ර ජීවක ලෙස ක්‍රියා කරන බව ය. 0.05% දී නිස්සාරණය කරගත් ප්‍රෝටීන බියුටිලේටඩ් හයිඩ්රොක්සයිල් ටොලුයින් (BHT) සඳහා විකල්ප ප්‍රතිඔක්සිකාරකයක් ලෙස භාවිතා කළ හැකිය.

**සමාජ ආර්ථික සහ සම්පත් සැලසුම්කරණය**

**ශ්‍රී ලංකාවේ විශාල තේ වතුවල කම්කරු හිඟයේ බරපතලකම හඳුනා ගැනීම**

මෙම අධ්‍යයනයෙන් පෙන්වා දුන්නේ වතුවල සාමාන්‍ය කම්කරු අවශ්‍යතාවයෙන් 50% – 75% ක් අතර ප්‍රමාණයක කම්කරු සංඛ්‍යාවක් පමණක් දැනට ඇති බවත්, පහතරට හා මැදරට ප්‍රදේශයන් හි වතුවලින් 20% හා 25% අයත් වන්නේ "ප්‍රබල" කම්කරු හිඟතාවයක් ඇති කාණ්ඩයට බවත් ය. හෙක්ටයාරයක් සඳහා කම්කරු හිඟතාවය උච්චත්වය අනුව වෙනස් වන අතර එය උඩරට 0.8, මැදරට 0.7, පහතරට 0.9 සහ ඌව 0.6 කි.

**සේවක නොපැමිණීම සහ තේ වගාවන් හි පිරිවැටුම පිළිබඳ විමර්ශනය**

සමීක්ෂණයෙන් හෙලි වී ඇත්තේ උඩරට ප්‍රදේශයේ නියැදියෙන් 12% ක් අයත්වන්නේ 50% කට වඩා නොපැමිණෙන්නන් ඇති කාණ්ඩයටය. 30% කම්කරුවන් අයත් වන්නේ 50-26% ක් අතර නොපැමිණෙන්නන් ඇති කාණ්ඩයට වන අතර 43% ක් අයත් වන්නේ 25-11% අතර කාණ්ඩයට ය. 15% පමණ කම්කරුවන් පිරිසක් පමණක් 10% ට වඩා අඩුවෙන් නොපැමිණෙන්නන් අතරට අයත් ය. වතු කම්කරු ජනගහනයේ වයස් ව්‍යුහය මගින් පෙන්වා දුන්නේ 50% කම්කරු ප්‍රතිශතයක් අවුරුදු 40 ට වඩා වැඩි වයස් කාණ්ඩයට අයත් වන අතර ඔවුන් අතරින් 16% ක් වයස අවුරුදු 50-59 ක් අතරට අයත්වන බවත් 0.7% පමණක් වයස අවුරුදු 60 ට වඩා වැඩි කාණ්ඩයට අයත්වන බවත් ය. තව ද, අවුරුදු 30-39 වයස් කාණ්ඩයට අයත් කම්කරුවන් ප්‍රමාණය 39.9% ක් වන අතර 10.4% අවුරුදු 19-24 වයස් කාණ්ඩයට අයත් වේ.

වතු කම්කරුවන්ගේ සාමාන්‍ය වයස අවුරුදු 40.18 කි. අවම වයස අවුරුදු 19 ක් වන අතර උපරිම වයස අවුරුදු 70 කි.

**පහතරට කුඩා තේ වතු හිමියන්ගේ ඵලදායිතා විචලනයේ සහ තාක්ෂණික කාර්යක්ෂමතාවයේ නිර්ණායකයන්**

කුලියට ගත් ශ්‍රමය, පවුල් ශ්‍රමය, රසායන ද්‍රව්‍ය සහ පොහොර යන කරුණු නිෂ්පාදන ඵලදායිතාවය තීරණය කිරීම සඳහා සෘජු බලපෑම් කරන අතර, පහතරට කුඩා තේ වතුවල මධ්‍යයන තාක්ෂණික කාර්යක්ෂමතාව 68.81% කි. එම නිසා, යෙදවුම් වැඩි නොකර 31% කින් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා හැකියාවක් පවතී. මේ අතර අකාර්යක්ෂමතාවයට හේතුවන වැදගත් සාධක වූයේ ගොවීන්ගේ අත්දැකීම්, අධ්‍යාපනය, රැකියාව, තේ ප්‍රභේද හා අතුරු බෝග වගාවයි.

**සම්මාන සහ පිළිගැනීම්**

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ආචාර්ය එම්. ඒ. බී. රණතුංග, ධනංජය කොට්ටාව ආරච්චි සහ ආචාර්ය අයි. එස්. බී. අබේසිංහ යන මහත්වරුන් විසින් ඉදිරිපත් කරන ලද "ශ්‍රී ලංකා තේ ජාන ප්ලාස්මයේ රසායනික පරිවෘත්තීය සංඝටක පැතිකඩකරණය" යන තේමාවෙන් යුත් පර්යේෂණ ප්‍රකාශනය සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් පවත්වන කෘෂි පර්යේෂණ සම්මාන ප්‍රදානෝත්සවයේ දී 2017 වසරේ කෘෂි පර්යේෂණ අංශයේ පළමු ස්ථානය දිනා ගන්නා ලදී. මෙම පර්යේෂණ කණ්ඩායමට ආචාර්ය පී. ඒ. එන්. පුණ්‍යසිරි, බී. ජෙගනාදන් මිය, ආචාර්ය එම්. ටී. කේ. ගුණසේකර සහ මහාචාර්ය බී. එම්. ආර්. බණ්ඩාර යන පර්යේෂකයන් ද ඇතුළත් විය.

ආචාර්ය එම්. ඒ. බී. රණතුංග හා ජේ. ඩී. කොට්ටාව ආරච්චි යන මහත්වරුන් 2015 වර්ෂයේ රසායන විද්‍යාව සඳහා වූ විශ්ලේෂණ ක්‍රමවේදය පිළිබඳ ජර්නලයේ ප්‍රකාශයට පත් වූ විද්‍යාත්මක ප්‍රකාශනය සඳහා ජාතික පර්යේෂණ සභාව පිරිනමන ලද කුසලතා සම්මානයක් දිනා ගන්නා ලදී.

කුඩා තේ වතු හිමියන් අතර නව තේ ප්‍රභේදයන්ගේ ගුණාත්මක ද්‍රව්‍ය ගුණනය හා වැඩිදියුණු කළ බීජ ව්‍යාප්ත කිරීම වෙනුවෙන් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා 2017- 2021 කාලය දක්වා වැවිලි කර්මාන්ත අමාත්‍යංශය මගින් මිලියන 86.5 ක අරමුදලක් ලබා දෙන ලදී.

2018 - 2020 දක්වා "තේ ශාකයේ වැදගත් ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ හඳුනා ගැනීම සහ ජානමය චරිතායනය කඩිනම් කිරීම සඳහා අධිතාක්ෂණික ප්‍රවේණිකරණය" ව්‍යාපෘතිය වෙනුවෙන් ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන යටතේ විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය විසින් රුපියල් මිලියන 5.85 ක මුදල් ප්‍රදානය කරන ලදී. කැලණිය විශ්ව විද්‍යාලය, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යංශය හා ඉන්දියාවේ හිමාල ජෛව සම්පත් තාක්ෂණික ආයතනයේ සහයෝගීතාවයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙයි.

කෘෂිකර්ම අමාත්‍යංශයේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් "තේ ජානමය විශ්ලේෂණය සහ තේ පත්‍රවල අඩංගු වර්ණක පිළිබඳ ජාන සිතියම්කරණය" වෙනුවෙන් රුපියල් මිලියන 2.08 ක ප්‍රතිපාදන මුදල් ලබා දෙන ලදී. මෙම පර්යේෂණය කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය හා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ සහයෝගීත්වයෙන් සිදු කෙරෙයි.

"තේ පත්‍රවල ජෛව රසායනික පරාමිතීන් භාවිතයෙන් තේවල ගුණාත්මකභාවය පුරෝකථනය සඳහා NIR වර්ණාවලිය යොදා ගැනීම" පිළිබඳ පර්යේෂණය සඳහා ජපානයේ එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාලය යටතේ කිරින් පර්යේෂණ අධිශිෂ්‍යත්ව වැඩ සටහන මගින් ආචාර්ය එම්. ඒ. බී. රණතුංග මහතාට 2017 - 2019 කාලය තුළ ජපන් යෙන් මිලියන 1 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 1.5 ක මුදලක්) පර්යේෂණ ප්‍රතිපාදන ලබා දී ඇත.

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් "විකල්ප රසායනික ධූමකාරක ලෙස ක්ෂුද්‍ර තරංග අධෝරක්ත කිරණ, කාබන් ඩයොක්සයිඩ් සහ වියලි අයිස් ප්‍රතිකාරක භාවිතා කිරීම" යන ව්‍යාපෘති යෝජනාව සඳහා රුපියල් 1,000,000 ක ප්‍රදානයක් වසර 2 ක කාල සීමාවක් සඳහා ලබාදෙන ලදී.

ශාක ව්‍යාධිවේදී අංශයේ පර්යේෂණ නිලධාරී එම්. නිරංජන් මහතාට දකුණු කොරියාවේ ජේජු විශ්ව විද්‍යාලයෙ හි පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලබා දෙන ලදී.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසින් "ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය : වසර 150 ක් සහ ඉන් ඔබ්බට" යන මැයෙන් ප්‍රකාශයට පත් කල කෘතියෙහි "තේ පර්යේෂණ ආයතනය හා තේ පර්යේෂණ සඳහා දායකත්වය: බලාපොරොත්තු සහ අභියෝග", සහ "දේශගුණික විපර්යාසයන් හා තේ කර්මාන්තයට එහි ඇති බලපෑම" යන මැයෙන් පරිච්ඡේද දෙකකට දායකත්වය ලබා දීම පිණිස ආචාර්ය අයි. එස්. බී. අබේසිංහ හා ආචාර්ය එම්. ඒ. විජේරත්න මහත්වරුන්ට ආරාධනා කරන ලදී.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද 2017 වාර්ෂික පර්යේෂණාත්මක සම්මන්ත්‍රණයේ (ASDA) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශිෂ්ටතම කෘෂිකාර්මිකයා හා විද්‍යාඥයා තෝරා ගැනීමේ විනිශ්චය මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ආචාර්ය අයි. එස්. බී. අබේසිංහ මහතා කටයුතු කරන ලදී.

ඉන්දුනීසියාවේ ජකර්තා නුවර 2017 ඔක්තෝම්බර් 18 - 20 දක්වා පවත්වන ලද ලෝක වැවිලි සම්මන්ත්‍රණය හා ප්‍රදර්ශනය (2017) යටතේ පැවැත්වූ ජකර්තා අන්තර්ජාතික තේ සම්මේලනයේ (JIJC) දී "පළිබෝධ හා වල් මර්දනය කිරීම සඳහාවූ ප්‍රවේශයන් හා පලිබෝධනාශක අවශේෂ උපරිම මට්ටමට අදාල ගැටළු" යන මැයෙන් දේශනයක් සිදු කිරීමට ආචාර්ය අයි. එස්. බී. අබේසිංහ මහතාට ආරාධනා කරන ලදී.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සංවිධානය කරන ලද 2017 වසරේ ගණකාධිවරුන්ගේ වාර්ෂික වාර්තා සම්මාන ප්‍රදානෝත්සවයේ කර්මාන්ත ක්ෂේත්‍රයේ විශේෂඥයන්ගේ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ආචාර්ය අයි. එස්. බී. අබේසිංහ මහතා සහභාගි විය.

2017 නොවැම්බර් මස 6 - 9 වැනි දිනයන් දක්වා පකිස්ථානයේ කරච්චි විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද අණුක ඖෂධ හා ඖෂධ පර්යේෂණ පිළිබඳ අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණ හා පුහුණු පාඨමාලාවේ (MMDR-6) ආරාධිත දේශනය ආචාර්ය අයි. එස්. බී. අබේසිංහ මහතා විසින් සිදු කරන ලදී. තව ද පිළිකා පිළිබඳ පර්යේෂණ සැසිවාරයේ සම සභාපතිත්වය ද ආචාර්ය අයි එස් බී අබේසිංහ මහතා විසින් දරණ ලදී.

2018 - 2020 කාල පරිච්ඡේදය තුළ NARS විද්‍යාඥයින් සඳහා SLCARP යටතේ ඇති ශක්‍යතාවන් ගොඩනැංවීමේ පුහුණු වැඩසටහන යටතේ පශ්චාත් උපාධි පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා තේ පර්යේෂණ ආයතන නිලධාරීන් 13 දෙනෙකු තෝරා ගන්නා ලදී. මේ සඳහා තෝරා ගත් අපේක්ෂකයින් සඳහා මැලේසියාව, තායිලන්තය හා පිලිපීනයේ විශ්ව විද්‍යාලයන්හි අධ්‍යයන හා පුහුණුව ලබා දීමට නියමිත ය.

**අධ්‍යයන වැඩසටහන්**

ආචාර්ය බී. ඒ. ඩී. සමන්සිරි මහතා, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ (PGIA) "සංවර්ධනය සඳහා සන්නිවේදනය" යන තේමාව යටතේ දර්ශනශූරී (Ph D) උපාධි අධ්‍යයන කටයුතු සම්පූර්ණ කරන ලදී. "ශ්‍රී ලංකාවේ තේ වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා තොරතුරු ව්‍යාප්ත කිරීමේදී ඒකාබද්ධ තොරතුරු තාක්ෂණ පද්ධතියක් තුලින් ඵලදායී උපදේශන සේවා ලබා දීම" යන මැයෙන් නිබන්ධනය නම් කර ඇත.

එම්. ඒ. බී. රණතුංග මහතා විසින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයේ (PGIS) පිරිනමනු ලබන දර්ශනශූරී උපාධි අධ්‍යයන වැඩසටහන සම්පූර්ණ කරන ලදී. "රූප විද්‍යාත්මක, ජෛව රසායනික හා අණුක අනුලක්ෂණ භාවිතයෙන් ශ්‍රී ලංකා තේ ජාන ප්ලාස්මයේ එකතුවක්" යන මැයෙන් නිබන්ධනය නම් කර ඇත.

පී. එල්. කේ. තෙන්නකෝන් මියට "ජෛව පොහොර සූත්‍රකරණය හා තේ ආශ්‍රිත හඳුනා ගැනීම හා විශ්ලේෂණය කිරීම" යන නිබන්ධනය සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දර්ශනශූරී උපාධිය පිරිනමන ලදී.

එල්. ආර්. එම්. සී. ලියනගේ මහතාට "පහතරට තෙත් කලාපයේ තෝරා ගත් පෝෂණ ගතික තත්ත්වයන් යටතේ තේ වගා කරන පසෙහි ඇති දුර්වල පාංශු තත්ත්වයන් පරීක්ෂා කිරීම" යන මැයෙන් ඉදිරිපත් කල නිබන්ධනය වෙනුවෙන් දර්ශනපති උපාධිය පිරිනමන ලදී.

ආර්. එම්. බී. රණතුංග මහතා විසින් එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාලයේ ජාතික ආහාර පර්යේෂණ ආයතනය විසින් පරිනමන 2016 - 2017 කිරින් පර්යේෂණ අධි ශිෂ්‍යත්ව අධ්‍යයන වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කරන ලදී.

ආචාර්ය ජී. ඩී. සින්නයියා මහත්මිය ඉන්දියාවේ නොබැඳි රාජ්‍යයන්හි හා සංවර්ධනය වන රටවල විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ මධ්‍යස්ථානය විසින් පිරිනමනු ලබන සංවර්ධනය වන රටවල විද්‍යාඥයින් (RTF - DCS) සඳහා ලබා දෙන සය මාසික පර්යේෂණ අධිශිෂ්‍යත්ව පුහුණු වැඩසටහනක් සඳහා (දෙසැම්බර් 2016 - මැයි 2017) දක්වා සහභාගි විය.

**තලවාකැලේ ශාන්ත කූම්බ්ස් වතුයාය**
2017 වසර සඳහා ශාන්ත කූම්බ්ස් වතුයාය රුපියල් 27,443,121.76 ක ලාභයක් වාර්තා කරන ලදී.

**රත්නපුර ශාන්ත ජෝකිම් වතුයාය**
2017 පෙබරවාරි 22 වැනි දින සිට වතු අධිකාරිවරයා ලෙස ඩී සී සී ජයසේකර මහතා වැඩ භාර ගන්නා ලදී. පසුගිය වසරට සාපේක්ෂව වතුයාය රුපියල් 10,283,396.46 ක ලාභයක් වාර්තා කරන ලදී. පසුගිය දසවසර තුළ 2017 වසර වැඩිම ආදායම් ඉපැයූ වර්ෂය ලෙස වාර්තා විය.

මේ වසර තුළ දී රාජකාරි කටයුතු සඳහා මා වෙත සහයෝගය, උපදෙස් හා මඟපෙන්වීම ලබා දුන් සභාපතිතුමා වෙත සහ කළමනාකරණ මණ්ඩලයට මගේ ස්තූතිය පිරිනමනු කැමැත්තෙමි. තව ද ආයතනික සැලැස්මෙහි ඉලක්කයක් සපුරා ගැනීම සඳහා පූර්ණ සහයෝගය ලබා දුන් තේ පර්යේෂණ ආයතන කාර්යය මණ්ඩලයටත් මාගේ කෘතඥතාවය පළ කර සිටිමි.

**ආචාර්ය අයි එස් බී අබේසිංහ**
**අධ්‍යක්ෂ**
**තේ පර්යේෂණ ආයතනය**

# ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ කාර්යය මණ්ඩලය 2017

**ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය**

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී**
ආචාර්ය අයි එස් බී අබේසිංහ, B Sc (Peradeniya, Sri Lanka) Ph D (Sheffield, UK)

**අතිරේක අධ්‍යක්ෂ**
ආචාර්ය එල් එස් කේ හෙට්ටිආරච්චි, B Sc (Peradeniya, Sri Lanka) Ph D (Aberdeen, UK)

**නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (නිෂ්පාදන)**
ආචාර්ය කේ එම් මොහොට්ටි, B Sc Agric (Peradeniya, Sri Lanka) Ph D (Reading, UK)
F Biol (Sri Lanka), C Biol (Sri Lanka)

**නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (පිරිසැකසුම් තාක්ෂණ )**
ආචාර්ය ඩබ් එස් බොතේජු, B Sc (Colombo, Sri Lanka), M Phil (Peradeniya, Sri Lanka),
Ph D (Peradeniya, Sri Lanka)

**අධ්‍යක්ෂවරයාගේ පුද්ගලික සහායක**
ඩබ්ලිව් ඒ කේ ආර් ලක්මාලි, B Com (Sp) Entrepreneurship (Kelaniya, Sri Lanka)

**ලඝු ලේඛක (ඉංග්‍රීසි)**
එස් ෂන්මුගනාදන්
දේවිකා රත්නායක

**කළමනාකරණ සහකාර**
ආර් ජේ රායප්පන්, (ලිපිකරු)
ආර් එම් ඩී කේ රාජපක්ෂ, (දත්ත සටහන්කරු)
අයි ජී එන් ඩී බණ්ඩාර, (දත්ත සටහන්කරු)

**පොදු සේවක**
පී සෙල්වරාජ්
පී සෙල්වරාජ්
එස් ජෝන් පැට්‍රික්

**උපදෙස් හා ව්‍යාප්ති අංශය**

**අංශ ප්‍රධානී**
ආචාර්ය බී ඒ ඩී සමන්සිරි, B Sc Agric (Peradeniya, Sri Lanka) M Phil (UPLB, Philippines)
Ph D (Peradeniya, Sri Lanka)

**ප්‍රධාන උපදේශක නිලධාරී**
ජේ සී කේ රාජසිංහ, B Sc Agric (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka)
මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය, මහනුවර
ආචාර්ය වී එස් සිධාකරන්, B Sc Agric (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka)
Ph D (TNAU, India)

**ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී**
කේ ජී ජේ පී මහින්දපාල, B Sc Agric (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka)
PG Dip. (Applied Statistics) පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය, රත්නපුර

**උපදේශක නිලධාරී**
ටී පී එන් මහින්ද, BSc Agric (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka) ස්ථාන භාර නිලධාරී, ව්‍යාප්ති මධ්‍යස්ථානය, තල්ගම්පොල
එස් පී රත්නායක, B Sc Agric (Ruhuna, Sri Lanka) MBA (Wuhan University, China) ස්ථාන භාර නිලධාරී, ව්‍යාප්ති මධ්‍යස්ථානය, දෙනියාය
කේ ආර් ඩබ්ලිව් බී කහඳව, B Sc Agric (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka) වැඩ බලන ස්ථාන භාර නිලධාරී, මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය, මහනුවර
ඒ එල් ආර් යූ කුමාර, B Sc Agric (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka) ස්ථාන භාර නිලධාරී, ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානය, පස්සර
එම් ඒ එච් නිශාන්ති, B Sc Agric (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka)
සී ජේ ලියනාරච්චි, B Sc Agric (Wayamba, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka)

**ව්‍යාප්ති නිලධාරී**
හැරන් ජයවීර, ස්ථාන භාර නිලධාරී, ව්‍යාප්ති මධ්‍යස්ථානය, මතුගම
පී කේ ආර් සී ඊ මුණසිංහ, B Sc Agric (Wayamba,Sri Lanka) මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය, මහනුවර
ඒ අබේසූරිය, B Sc Agric (Peradeniya,Sri Lanka)
එස් පී ඒ කේ පී ජයරත්න, B Sc Agric (Peradeniya,Sri Lanka) පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය,රත්නපුර
පී ඩී ද අල්විස්, B Sc Agric (Ruhuna,Sri Lanka) ව්‍යාප්ති මධ්‍යස්ථානය, තල්ගම්පොල
පී එස් ප්‍රදීප්, B Sc Agric (Rajarata,Sri Lanka)
එච් එන් දයානන්ද, B Sc Agric(Sabaragamuwa, Sri Lanka) පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය, රත්නපුර - 2017 නොවැම්බර් දක්වා

**තාක්ෂණ නිලධාරී**
එන් එස් ඒකනායක
එම් පී එම් ජේ කුමාර, Higher National Diploma in Technology (Agriculture) (Hardy Advanced Technological Institute, Ampara) මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය, මහනුවර - 2017 සැප්තැම්බර් දක්වා

**කළමනාකරණ සහකාර (ලිපිකරු)**
ඒ එම් ඊ ටී අත්තනායක

**පොදු සේවක**
පී විජේකුමාර්
බී මනෝන්මනී
කේ ඥානසුන්දරී

## කෘෂි ආර්ථික විද්‍යා අංශය

**වැඩ බලන අංශ ප්‍රධානී / ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී**
ආචාර්ය එච් ඩබ්ලිව් ශ්‍යාමලී, B Sc Agric (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka) Ph D (CSKHPKV, India)

**පර්යේෂණ නිලධාරී**
බී එම් එන් සී කරුණාරත්න, B Sc Agric (Rajarata, Sri Lanka)
එච් එම් සී පී පිලපිටිය, B Sc Agric (Ruhuna, Sri Lanka) M Sc (PGIS Peradeniya, Sri Lanka)

**අත්හදා බැලීමේ නිලධාරී**
කේ ඩබ්ලිව් එන් නදීෂානී, B Sc (Peradeniya, Sri Lanka) M Sc (PGIA Peradeniya, Sri Lanka)

**තාක්ෂණ නිලධාරී**
පී ටී පී ලක්ෂානී, B Sc in Export Agriculture (Uva Wellassa, Sri Lanka)
අයි එච් ටී චතුරංග, B Sc Agric (Ruhuna, Sri Lanka)

**පොදු සේවක**
පී ඩී එස් එස් ද සිල්වා

**ශෂ්‍ය විද්‍යා අංශය**

**ව්‍යාපෘතිය A 5.3 කඳ ගුල්ලාගේ හා පහතරට සජීවී දැව වේයාගේ හානියට ප්‍රතිරෝධී ප්‍රභේද හඳුනාගැනීම**

ඇන්දාන වතුයායෙන් තෝරා ගන්නා ලද බීජ පැළ පහතරට සජීවී දැව වේයාගේ හානියට ඔරොත්තු දීමේ හැකියාව පිලිබඳ මුලික පරික්ෂා කිරීම් කීට විද්‍යා අංශය මගින් සිදු කරන ලදී.

*ජේ එච් එන් පියසුන්දර, ඒ කේ මුදලිගේ සහ කීට විද්‍යා අංශය*

**ප්‍රධාන ව්‍යාපෘතිය A51. තේ ජාන ප්ලාස්මය සංරක්ෂණ, චරිතායනය සහ ඇගයීම.**

**තේ ජාන සංචිතයේ පරිවෘත්තිය සංඝටක පැතිකඩ විශ්ලේෂණය කිරීම සහ අනුලක්ෂණය කිරීම**

ශ්‍රී ලාංකීය තේ ජාන ප්ලාස්මයේ ඉහල තාක්ෂණික මෙවලම් භාවිත පරිවෘත්තිය සංඝටක පැතිකඩ විශ්ලේෂණය කිරීම සඳහා වූ සහයෝගිතා ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කරන ලදී. එහි මූලිකම ප්‍රතිඵලය ලෙස තේ ජාන ප්ලාස්මයේ පරිවෘත්තිය සංඝටක විවිධත්වයේ පුළුල් පෙළගැස්ම අනාවරණය කරගන්නා ලදී. HPLC සහ LC-MS/MS තාක්ෂණික මෙවලම් උපයෝගී කරගනිමින් තේ ජාන ප්ලාස්මයේ පානීය තේ ප්‍රභේද සහ පානීය නොවන තේ ප්‍රභේද 87 ක ප්‍රධාන පරිවෘත්තිය සංඝටක හතක් එනම් එපිකැටකින් (EC), එපිකැටකින් ගැලේට් (ECg), එපිගැලොකැටකින් (EGC), එපිගැලොකැටකින් ගැලේට් (EGCg), කැෆෙන්, තියොබ්‍රෝමින් සහ ගැලික් අම්ලය යනාදී වශයෙන් පැතිකඩ විශ්ලේෂණය කර ගන්නා ලදී. පානීය තේ ප්‍රභේද අතර මෙම සියලුම පරිවෘත්තිය සංඝටකයන්හි පුළුල් විචලනයක් දක්නට ලැබිණි. පානීය නොවන තේ ප්‍රභේදයන්හි ගැලික් අම්ලය හා එපිකැටකින් පමණක් දක්නට ලැබිණි. හරිත පත්‍රවල අඩංගු EC සහ ECg ප්‍රමාණයන්ගේ පැවැත්ම උසස් තත්ත්වයේ කළු තේ නිපැයුම් ප්‍රභේද හඳුනා ගැනීම සඳහා නිවැරදි සලකුණක් ලෙස භාවිතා කල හැකි බව ප්‍රතිඵල වලින් තහවුරු කරගන්නා ලදී. ඉහළ EC සහ පහළ EGCg අගයක් සහිත හරිත පත්‍ර සහිත තේ ප්‍රභේද බුබුළු අංගමාරයට ඔරොත්තු දීමේ ඉහළ හැකියාවක් සහිත බව පෙනී යන ලදී. සංඛ්‍යාන වශයෙන් වෙසෙසි තියොබ්‍රෝමින්, කැෆෙන් සහ සමස්ත පොලිෆිනොල් ප්‍රමාණයන්හි ඇති විවිධත්වය සහ ජාන ප්ලාස්මයේ ප්‍රධාන තේ වර්ගීකරණ තුනෙහි සම්බන්ධතාවය හඳුනා ගන්නා ලදී. අපේක්ෂිත තත්ත්වයේ තේ ප්‍රභේද ප්‍රචාරණය සඳහා තෝරා ගැනීමට මෙන්ම තේ අභිජනනයෙන් පුළුල් විවිධත්වයක් සහිත ප්‍රජනිතයක් ලබා ගැනීමටද පරිවෘත්තිය සංඝටක පැතිකඩ විශ්ලේෂණය කිරීම සඵලදායිව උපයෝගී කර ගත හැකිය.

වගුව 19. *C.sinensis* ප්‍රධාන තේ වර්ගීකරණයන් තුනෙහි පරිවෘත්තිය සංඝටක පැතිකඩ විශ්ලේෂණය සියලු ඒකක mg/ g, දත්ත ප්‍රතිවලිත 6 ක සාමාන්‍ය අගය ± සම්මත දෝෂය ලෙස දක්වා ඇත.

| සංයෝගය | var. *sinensis* (n=10) | | | var. *assamica* (n=19) | | | var. *lasiocalyx* (n=58) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| TB | 3.00 | ± | 2.05[b] | 4.30 | ± | 1.30[a] | 4.48 | ± | 2.02[a] |
| CF | 29.18 | ± | 7.10[b] | 36.02 | ± | 4.46[a] | 35.74 | ± | 5.08[a] |
| EGC | 33.65 | ± | 11.13[a] | 32.75 | ± | 7.57[a] | 33.30 | ± | 9.98[a] |
| EC | 12.88 | ± | 4.80[a] | 13.77 | ± | 4.50[a] | 12.62 | ± | 4.02[a] |
| EGCg | 85.55 | ± | 17.22[a] | 92.00 | ± | 15.79[a] | 92.50 | ± | 14.99[a] |
| ECg | 24.50 | ± | 7.79[b] | 29.69 | ± | 7.38[a] | 27.31 | ± | 5.74[ab] |
| GA | 0.45 | ± | 0.40[a] | 0.52 | ± | 0.38[a] | 0.56 | ± | 0.31[a] |
| TPP | 215.89 | ± | 21.81[b] | 238.66 | ± | 17.72[a] | 236.13 | ± | 21.73[a] |

TB = තියොබ්‍රෝමින්; CF= කැෆෙන්; EGC= එපිගැලොකැටකින්; EC= එපිකැටකින්; EGCg= එපිගැලොකැටකින් ගැලේට්; ECg= එපිකැටකින් ගැලේට්; GA= ගැලික් අම්ලය; TPP= සමස්ත පොලිෆිනොල් ප්‍රමාණය. ඩන්කන් බහු පරාස පරීක්ෂාව මත පදනම්ව සමාන අකුරින් දක්වා සාමාන්‍ය අගය $p < 0.05$ ට සාපේක්ෂව වෙනස් නොවේ.

*එම් ඒ බී රණතුංග, ජේ ඩී කොට්ටාවආරච්චි, එම් ටී කේ ගුණසේකර,ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යංශය, පී ඒ එන් පුණ්‍යසිරි (IBMBB), අයි එස් බී අබේසිංහ සහ ජේ බුසාතේ සහ බී එම් ආර් බණ්ඩාර, පේරාදෙණිය විශ්ව විද්‍යාලය*

## තේ ජාන ප්ලාස්මයේ පුෂ්පීය විවිධත්වය සහ ජාන සැකැස්ම

ශ්‍රී ලාංකීය තේ ජාන ප්ලාස්මය සංරක්ෂිත ප්‍රභේද 600ක් අතුරින් අභිජනන ක්‍රියාවලිය සඳහා වැඩි වශයෙන් භාවිතයට ගෙන ඇත්තේ 4 ක ප්‍රමාණයක් පමණි. පුෂ්පීය රූපවිද්‍යාත්මක ලක්ෂණ ජාන සම්පත් මූලික චරිතායනය සඳහා තොරතුරු සපයන අතර පුෂ්ප ජායාංගයේ ලක්ෂණ උසස් ශාක වල වර්ගීකරණය සඳහා විශ්වාසදායක නිර්ණායකයක් ලෙස සලකනු ලැබේ. මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වනුයේ තේ ජාන ප්ලාස්මයේ ජාන සැකැස්මේ ස්වභාවය සහ විකසනය නිශ්චය කර ගැනීම සහ තේ ප්‍රභේද සියල්ල ප්‍රධාන වශයෙන් වර්ගීකරණය කිරීම උදෙසා ජාන ප්ලාස්මය පුෂ්පීය විවිධත්වය විස්තරාත්මක විග්‍රහයක් සිදුකිරීම වේ. මේ සඳහා තේ ප්‍රභේද 89ක් පුෂ්පීය ලක්ෂණ 16 ක් ඔස්සේ චරිතායනය කරන ලදී. ප්‍රභේද අතර සැලකිය යුතු විචල්‍යතාවයක් ප්‍රතිඵල අනුව පැවතිනි.

පුෂ්පීය ලක්ෂණ විවිධත්වය මත පදනම්ව ප්‍රභේද කාණ්ඩ 5ක් යටතේ වර්ගීකරණය කරන ලද අතර, සමූහන රටාව අනුව වඩාත්ම වෙනස් ලක්ෂණ පෙන්වන ප්‍රභේද හඳුනා ගන්නා ලදී. පුෂ්පීය ලක්ෂණ අනෙකුත් ලක්ෂණ වලට වඩා ඉහල විචල්‍යතාවක් දක්වන ලදී. තේ ජාන ප්ලාස්මය ප්‍රමුඛ වශයෙන් 68% කම්බෝජීය වර්ගය නියෝජනය කරන අතර අතර 20%ක් ඇසෑම් වර්ගය නියෝජනය කරයි. චීන සම්භවය සහිත වර්ග වල නියෝජනය අඩුය. ජාන ප්ලාස්මය එක්රැස් කිරීමෙහි ලා ඇති හිදැස් හඳුනා ගන්නා ලද අතර ජාන ඉදිරි ප්ලාස්මය ගවේෂණය සඳහා පර්යේෂණ මෙහෙවර සහ අභිජනන වැඩසටහන සඳහා තොරතුරු රැසක් සම්පාදනය කර ගැනීමට හැකි විය. ඉදිරි පර්යේෂණ මෙහෙවර සඳහා චීන සම්භවය සහිත වර්ග හැකිතාක් උත්ග්‍රහණය කර ගැනීමට අවශ්‍ය වී තිබෙන අතර වතු ප්‍රභේද වරණ වැඩසටහනට අඛණ්ඩව යොමු වීම යෝජිත වී ඇත. තවදුරටත්, චීන සම්භවය සහිත ප්‍රභේද දෙමුහුම්කරණය මගින් තේ ප්‍රභේද නිපදවීම ජාන සංචිතය පුළුල් කිරීමට ප්‍රයෝජනවත් වනු ඇත.

*එම් ඒ බී රණතුංග, ජේ ඩී කොට්ටාව ආරච්චි, එම් ටී කේ ගුණසේකර (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යංශය),*
*සහ ඩී යකන්දාවල (පේරාදෙණිය විශ්ව විද්‍යාලය)*

## SSR අනුක සලකුණු භාවිතයෙන් ශ්‍රී ලංකා ජාන සංචිතයේ ජාන විවිධත්වය ඇගයීම

ජාන ප්ලාස්මයේ ප්‍රභේද අතර ජාන විශ්ලේෂණය සඳහා අණුක සලකුණු සැලකිය යුතු ජාන විචල්‍යතාවයන් හෙළිදරව් කරනු ලබයි. ප්‍රතිඵල අනුව කාණ්ඩගත කරන ලද ප්‍රභේද අතරින් ඉහළ විචල්‍යතාවක් වතු ප්‍රභේද හා හඳුන්වා දුන් තේ ප්‍රභේද අතර විය. තෝරා ගත් ප්‍රභේද අතුරින් ජාන විචල්‍යතාවය වතු ප්‍රභේද වල ඉහලම වූ අතර වැඩිදියුණුකල තේ ප්‍රභේද වල මීලගට වැඩි විචල්‍යතාව දක්නට ලැබිණි. එම නිසා වතු ප්‍රභේද භාවිතය හා සංරක්ෂණයේ ඇති වැදගත්කම අධ්‍යයන තුලින් මැනවින් පෙන්වා දෙයි. තේ ඉතිහාසයේ මුල් කාලයේදී හඳුන්වා දුන් ප්‍රභේද සහ මෑතකදී හඳුන්වා දුන් ප්‍රභේද අතර මධ්‍යස්ථ ජාන විච්‍යලතාවක් පෙන්වයි. කෙසේ වුවද අනුක ජීව විද්‍යාත්මක විශ්ලේෂණය තුලින් තේ ප්‍රභේද ප්‍රධාන වර්ගීකරණ තුනක් යටතේ වෙන්කර හඳුනා ගැනීමට නොහැකි විය.

*එම් ඒ බී රණතුංග, එම් ටී කේ ගුණසේකර (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යංශය),*
*සහ ඩී යකන්දාවල (පේරාදෙණිය විශ්ව විද්‍යාලය)*

## ශ්‍රී ලංකා තේ ජාන ප්ලාස්මයේ හරාත්මක එකතුවක් එක් රැස් කිරීම

තේ ජාන ප්ලාස්මයේ හරාත්මක එකතුවක් සාකල්‍ය ප්‍රවේශයකින් ගොඩනැගීම මෙම අධ්‍යයනයේ අරමුණයි. හරාත්මක එකතුව ජෛව රසායනික පරාමිතීන් මගින් සහ අවසන් ප්‍රවේශනයන් සිදු කිරීම සඳහා තෝරා ගත් නියදිකරණයක් වඩා උචිත බව සොයා ගන්නා ලදී. වර්තමාන භාවිතා ජාන ප්ලාස්මයේ ජාන විවිධත්වය සංයෝජනය වන පරිදි තෝරා ගැනීම් 64 කින් මෙම හරාත්මක එකතුව ගොඩ නගා ඇත. මෙම සම්පූර්ණ ජාන විවිධත්වය නියෝජනය හරාත්මක එකතුවෙහි සනාථ කරමින් එහි වලංගුකරණය සඳහා පුෂ්පීය ලක්ෂණ, ජෛව රසායනික පරාමිතීන්, අණුක සලකුණු නිරීක්ෂණ උපයෝගී කර ගන්නා ලදී.

මෙම හරාත්මක එකතුව හැසිරවීමට පහසු ප්‍රභේද සංඛ්‍යාවකින් යුත් ජාන විවිධත්ව නියෝජනයක් වන බැවින් වියදම, ඉඩකඩ සහ කාලය ඉතිරි කර ගනිමින් ජාන ප්ලාස්මය ක්ෂේත්‍රයේ ජාන බැංකුවක් ලෙස පවත්වා ගෙන යෑමට ද පහසු වේ. මෙම හරාත්මක එකතුව ඉදිරි බෝග වැඩි දියුණු කිරීමේ වැඩසටහන සඳහා ආර්ථිකමය වශයෙන් වැදගත් ලක්ෂණ සවිස්තර ඇගයීමකින් අනතුරුව ඉදිරියේදී යොදා ගත හැක. ජාන ප්ලාස්මයේ නව ලක්ෂණ සඳහා හේතු වන ජාන හඳුනා ගැනීමට මෙම හරාත්මක එකතුව ඵලදායි ලෙස ප්‍රයෝජනවත් වේ. ගෝලීය ජාන ප්ලාස්ම හුවමාරු වැඩසටහන සඳහා මෙම ප්‍රභේද 64 කින් යුත් හරාත්මක එකතුව ජාන ප්ලාස්මයේ තොරතුරු සොයා ගත හැකි යොමුවක් ලෙසද වැඩි දුරටත් යොදා ගත හැක. මෙම හරාත්මක එකතුව ගොඩ

නැගීමේ මූලික අභිලාශය වනුයේ ප්‍රභේද විවිධත්වය භාවිතය සහ සංරක්ෂණය වේ. හරාත්මක එකතුව ගොඩනැගීමේ ක්‍රියාවලියෙ හි රූපමය සාරාංශයක් 1 රූපයෙහි දැක්වේ.




රූපය 1. ශ්‍රී ලාංකීය ජාන ප්ලාස්මයේ හරාත්මක එකතුව ගොඩ නැගීමේ ක්‍රියාවලිය

*එම් ඒ බී රණතුංග, ජේ ඩී කොට්ටාවආරච්චි, එම් ටී කේ ගුණසේකර (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය) සහ ඩී යකන්දාවල (පේරාදෙණිය විශ්ව විද්‍යාලය)*

## ක්ෂේත්‍ර ජාන බැංකුව පිහිටුවීම සහ නඩත්තුව

ක්ෂේත්‍ර ජාන බැංකුව, රත්නපුර- ප්‍රභේද කිහිපයක් පුෂ්පීය ලක්ෂණ අධ්‍යයනය සඳහා ස්වභාවිකව වැඩෙන්නට ඉඩ සලසා, ඉතිරිය 2017 ජූලි දෙවන කප්පාදු චක්‍රයෙන් පසු අස්වනු නෙළීම ආරම්භ කරන ලදී.

*එම් ඒ බී රණතුංග, ජේ ඩී කොට්ටාවආරච්චි, කේ කේ රණවීර, ජේ එච් එන් පියසුන්දර සහ ඒ කේ මුදලිගේ*

## mRNA ප්‍රතිලේඛණ, ප්‍රෝටීන, රසායනික පරිවෘත්තිකයන් පදනම් කර ගත් අධ්‍යයන තුලින් කඳ ගුල්ලාගේ හානිය වළක්වා ගැනීම සඳහා අවබෝධයක් ලබා ගැනීම

තේ වගාව කෘමි පළිබෝධ හානි කිහිපයකටම නතු වන අතර මේ අතුරින් බරපතලම පළිබෝධකයා වන කඳ ගුල්ලාගේ හානිය (SHB; *Xyleborus fornicatus*) ශ්‍රී ලංකාවේ තේ වගා කර ඇති ප්‍රධාන කලාපයන්හි (ඌව, මැදරට හා පහතරට සමහර ප්‍රදේශ) ආසන්න වශයෙන් තුනෙන් දෙකක වගාවට හා එහි ආර්ථිකයට බරපතල තර්ජනයක් වී ඇත. පැන්සලක් තරම් මහත, විෂ්කම්භය 1cm ක් පමණ වූ නොමේරූ අතු විද ගැහැණු සතුන් උමං සාදා ගනිමින් හානිය සිදු කරයි. ප්‍රාථමික වශයෙන් අතු කැඩීයාම සිදුවන අතර ක්‍රම ක්‍රමයෙන් අතු දිරාපත් වීම හා පසු මැරීම සිදු වේ. පළිබෝධනාශක හිමි තේ වල අවශේෂ වීම නිසාත් අධික වියදම නිසාත් කෘමිනාශක මගින් කඳ ගුල්ලා රසායනිකව පාලනය කිරීම යෝග්‍ය නොවේ. මූලික වළක්වා ගැනීමේ ක්‍රියාපිළිවෙත් අනුගමනය කිරීම සහ සමෝධානික පළිබෝධ පාලනය තරමක් දුරට සාර්ථකවී ඇත. කඳ ගුල්ලාගේ ආක්‍රමණයෙන් තේ ශාකය ආරක්ෂා වීම සඳහා ජානමය වශයෙන් සහ අණුක මට්ටමින් දක්වන යාන්ත්‍රණය අවබෝධ කර ගැනීම කඳ ගුල්ලාගේ හානියට ප්‍රතිරෝධී නව තේ ප්‍රභේද නිපද වීම සඳහා සහ හානිය මර්දනය කිරීමට අවශ්‍ය ක්‍රමෝපායන් යෙදීමටද වැදගත් වේ.

ශාක භක්ෂක ආහාර රටාවක් ඇති පළිබෝධකයන්ට ශාක දක්වන ප්‍රතිචාරය ගතික ක්‍රියාවලියක් බව සහ mRNA ප්‍රතිලේඛන රටා ප්‍රෝටීන සහ පරිවෘත්තීය සංඝටක පැතිකඩ අවස්ථානුරූපීව සහ තත්වයට අනුව වෙනස් වන බව පූර්ව අධ්‍යයන ප්‍රතිඵල දක්වා ඇත. තවද මෙම පළිබෝධී ආහාරය බවට පත්වන ශාකය දක්වන ගතිකත්වය, එනම් mRNA ප්‍රතිලේඛන රටාවන් හි, ප්‍රෝටීන සහ පරිවෘත්තීය සංඝටක දක්වන වෙනස්කම් විමර්ශනය කිරීම අවශ්‍ය වේ. mRNA ප්‍රතිලේඛන සහ ප්‍රෝටීන මත පදනම් වූ අධ්‍යයනයන් ජාන වලට අනුරූපී ස්වභාවය (Gene expression) පිළිබඳව පමණක් පුරෝකථනය කල හැකි අතර තව දුරටත් පරිවෘත්තීය සංඝටක මත පදනම් වූ අධ්‍යයනයන් තුලින් ජාන හෝ ප්‍රෝටීන මගින් නිර්ණය කරන ලද ප්‍රතිචාර ප්‍රතික්‍රියාව කුමක්ද යන්නද විමසිය හැක. එම නිසා mRNA ප්‍රතිලේඛන, ප්‍රෝටීන සහ පරිවෘත්තීය සංඝටක යන සියල්ල මත පදනම් වූ ප්‍රවේශයකින් පළිබෝධ භක්ෂණයට එරෙහිව ශාක දක්වන ප්‍රතිචාරය හොඳින් අවබෝධ කර ගැනීමට හැකි වනු ඇත. මෙම අධ්‍යයනයේදී කඳ ගුල්ලාගේ හානියට ප්‍රතිරෝධී (TRI 2023) සහ අධික ලෙස ග්‍රාහී (TRI 2025) ප්‍රවේණි දර්ශක දෙක කඳ ගුල්ලා හානි කරන අවධියේදී පැය 0, 2, 24, 72 හා 240 කාල සීමාවන් වලදී ශාක අතු වල පටක ගෝලීය ජාන ප්‍රකාශන විශ්ලේෂණය, ප්‍රෝටීන, පරිවෘත්තීය සංඝටක පදනම් වූ අධ්‍යයනයන් මගින් පැතිකඩකරණය කිරීමට බලාපොරොත්තු වේ.

TRI 2023 සහ 2025 හි සංසන්දනාත්මක mRNA ප්‍රතිලේඛනයන් විශ්ලේෂණය අනුමාන පරිවෘත්තීය මාර්ගයන්, ජාන හා ඒවායේ අන්තර් ක්‍රියා හඳුනා ගැනීමට යොදා ගත හැක. එමෙන්ම තේ ශාකය කඳ ගුල්ලාගේ හානියට දක්වන ආරක්ෂාකාරී යාන්ත්‍රණය පිළිබඳ සවිස්තර අර්ථකතනයක් ලබා ගැනීමටද හැකි වනු ඇත.

ප්‍රෝටීන මත පදනම් වූ සහ පරිවෘත්තීය සංඝටක මත පදනම් වූ විශ්ලේෂණයන් තේ ශාකයේ ප්‍රතිරෝධී/ ආරක්ෂක යාන්ත්‍රණයට ඉවහල් වන ප්‍රෝටීනයන්ගේ සහ පරිවෘත්තීය සංඝටකයන්ගේ සවිස්තර පැතිකඩකරණය සහ සංසන්දනය සඳහා ප්‍රයෝජනවත් වේ. මෙම අධ්‍යයනයෙන් ලැබෙන පුළුල් අවබෝධයද සමග සම්ප්‍රදායික අභිජනන ක්‍රියාවන් තේ ජාන වැඩි දියුණු කිරීමේ වැඩපිළිවෙල උදෙසා මෙන්ම අනෙකුත් බහු වාර්ෂික භෝග සඳහාද යොදා ගත හැකි වනු ඇත.

**අරමුණු**

තේ ශාකය කඳ ගුල්ලාගේ හානියට දක්වන ප්‍රතිරෝධී/ග්‍රාහී ගතික ප්‍රතිචාර විමර්ශනය සඳහා නවීන ජාන විද්‍යාත්මක තාක්ෂණය භාවිත කරමින්:

1) කඳ ගුල්ලාගේ හානියට ප්‍රතිරෝධී ජාන හඳුනා අර්ථකතනය කර ගැනීම.
2) කඳ ගුල්ලාගේ හානියට තේ ශාකය දක්වන ප්‍රේරිත ආරක්ෂාකාරී යාන්ත්‍රණය පිළිබඳ අවබෝධය ලබා ගැනීම.
3) තේ පළිබෝධ පාලන ක්‍රමෝපායන් පිළිබඳ අවශ්‍ය තොරතුරු ලබා ගැනීම.

දැනට කඳ ගුල්ලාගේ හානියට ප්‍රතිරෝධී හා ග්‍රාහී ලෙස හඳුනා ගෙන ඇති ප්‍රභේදයන්හි ප්‍රතිරෝධී හා ග්‍රාහී මට්ටමට තහවුරු කර වලංගු කර ගැනීම උදෙසා, තේ අත්තක ඇති පුරුක් සංඛ්‍යාව, අත්තෙහි දිග එහි උමං සාදා ගැනීම සහ අත්ත විද ඇතුලට යාම කෙරෙහි ඇති බලපෑම පිලිබඳ මූලික අධ්‍යයනයන් සිදු කරන ලදී. විද්‍යාගාරයක් තුල සිදු කරන ලද ජෛව ඇගයීම් වලින් අත්තක ඇති පුරුක් සංඛ්‍යාව ප්‍රභේද අතර සංඛ්‍යාන වශයෙන් වෙසෙසි විචලනයක් නොපෙන්වන ලදී. තේ ශාකයේ කඳ ගුල්ලාගේ හැසිරීම පිළිබඳ මූලික අධ්‍යයනයන් වලදී, කඳ ගුල්ලා අත්ත තුලට ඇතුල් වී (දූහනය වී) පැය 24ක් ඇතුලත අත්තෙහි මජ්ජාව දක්වා රේඛාවක් සේ විදගෙන යන බව පෙන්වා දී ඇත. දූහනයෙන් පැය 96කට පසු මජ්ජාව තුළ වෘත්තාකාර උමගක් සාදා ගනී. අත්තට ඇතුළු වී 8 වන දින සිට සිරස් සහ සංකීර්ණ හැඩයන්ගෙන් යුත් උමං සාදා ගනී. මෙම වර්තමාන අධ්‍යයනය කඳ ගුල්ලාගේ හානියට ප්‍රතිරෝධී ප්‍රභේද ඇගයීම සහ කඳ ගුල්ලාගේ හැසිරීම අධ්‍යයනය මගින් තේ ශාකයේ කඳ ගුල්ලාගේ මර්ධනය පිළිබඳ ඉදිරි ගවේෂණ සඳහා ප්‍රවේශයක් සපයනු ඇත.

*ඩී පෙරේරා, එම් ඒ බී රණතුංග සහ ශාලිකා ගම්ලත් (රුහුණ විශ්වවිද්‍යාලය)*

අධ්‍යයනයන් පහසු කිරීම සඳහා හරිතාගාරය නවීකරණය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

*එම් ඒ බී රණතුංග, ඩී පෙරේරා, කේ කේ රණවීර, ටී ඒ එස් අනුරුද්ධ සහ තාක්ෂණික අංශය*

**ප්‍රධාන ව්‍යාපෘතිය A 52. නවීන කෘෂිකාර්මික පිළිවෙත් සහ ඉහළ යෙදවුම් සඳහා වැඩි වශයෙන් යොමු නොවන කුඩා තේ වතු සඳහා වඩා උචිත තේ ප්‍රභේද නිපදවීම සහ පරීක්ෂා කිරීම**

වගුව 20. TRI 5000 කාණ්ඩයේ අනුවර්තීය පර්යේෂණ නියැදි පිහිටුවා ඇති කුඩා තේ වතු හිමි ඉඩම්වල සාරාංශය

| අංකය | ස්ථානය | තේ පරීක්ෂක කොට්ඨාශය | කෘෂි පාරිසරික කලාපය | ආරම්භ කල වර්ෂය | සටහන් |
|---|---|---|---|---|---|
| 1 | අකුරැස්ස-දෙනියාය | අකුරැස්ස | WL2a | 2013 | පළමු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කර ගෙන යනු ලැබේ |
| 2 | මොරවක - දෙනියාය | කොටපොල | WL1a | 2013 | පළමු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කර ගෙන යනු ලැබේ |
| 3 | රන්නිගෙවත්ත | හොරණ | WL1a | 2013 | පළමු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කර ගෙන යනු ලැබේ |
| 4 | පැලවත්ත | පැලවත්ත | WL1 a | 2013 | පළමු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කර ගෙන යනු ලැබේ |
| 5 | ඇහැලියගොඩ රත්නපුර | රත්නපුරය | WL1a | 2014 | පළමු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කර ගෙන යනු ලැබේ |
| 6 | කලවාන | නිවිතිගල | WL1a | 2012 | පළමු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කර ගෙන යනු ලැබේ |
| 7 | ලිහිණියාව | මීගහතැන්න | WL1a | 2012 | පළමු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කර ගෙන යනු ලැබේ |
| 8 | නෙළුව ගාල්ල | හිනිදුම | WL 1a | 2013 | පළමු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කර ගෙන යනු ලැබේ |
| 9 | උනන්විට ගාල්ල | ඇල්පිටිය | WL 1a | 2013 | පළමු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කර ගෙන යනු ලැබේ |
| 10 | ඉහල කෙම්බියාව-ගාල්ල | වඳුරඹ | WL 2a | 2013 | පළමු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කර ගෙන යනු ලැබේ |
| 11 | තල්ගම්පොළ - ගාල්ල | අක්මීමන | WL 2a | 2013 | පළමු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කර ගෙන යනු ලැබේ |
| 12 | පලාවෙල | රත්නපුරය | WL1a | 2015 | අස්වනු නෙලීම සඳහා පැළ පුහුණු කරමින් පවතී |
| 13 | බටපොල | අම්බලන්ගොඩ | WL2a | 2017 | අස්වනු නෙලීම සඳහා පැළ පුහුණු කරමින් පවතී |
| 14 | මල්බෙරි වත්ත, ගලහ | හේවාහැට | IM3a | 2013 | පළමු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කර ගෙන යනු ලැබේ |
| 15 | කොත්මලේ | කොත්මලේ | WU2b | 2013 | පළමු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කර ගෙන යනු ලැබේ |
| 16 | කැප්පෙටිපොල | වැලිමඩ | IU3c | 2013 | අස්වනු නෙලීම සඳහා පැළ පුහුණු කරමින් පවතී |
| 17 | හාලි ඇල | හාලි ඇල | IU3c | 2013 | පළමු චක්‍රයේ අස්වනු නෙලීම සිදු කර ගෙන යනු ලැබේ |

*එම් ඒ බී රණතුංග, ජේ ඩී කොට්ටාවආරච්චි, කේ කේ රණවීර, සී ජේ රැටියලගේ, ඩී ජයලත්, එම් එන් පියසේන, සහ අයි යාපාබණ්ඩාර*

**ව්‍යාපෘතිය GL 340 - TRI 5000 කාණ්ඩයේ මව් ශාක ව්‍යාපෘතිය (නව)**

**ශාන්ත කූම්බ්ස් වතුයාය (0.5 හෙක්.)**

බිම් සකස් කිරීමේ මූලික අදියර (පැරණි තේ මුල් ගලවා ඉවත් කිරීම, කාණු පද්ධතිය සැකසීම) අවසන් කර ඇත. භූමියෙන් අඩක පස පුනරුත්පථානය සඳහා මානා සිටු වීම සිදු කර ඇත. හෙල්මළු තැනීම ආරම්භ කොට ඇත.

**ශාන්ත ජෝකිම් වතුයාය (1 හෙක්.)**

බිම් සකස් කිරීමේ මූලික අදියර අවසන් කර ඇත. පස පුනරුත්පථානය සඳහා මානා සිටුවීම සිදු කර ඇත. පැරණි සෙවන ශාඛ ගලවා ඉවත් කිරීම සහ වැට ඉදි කිරීම් කරගෙන යනු ලබයි.

**තේ ප ආ කොට්ටව**

බිම් සකස් කිරීමේ මූලික අදියර අවසන් කර ඇත. පස පුනරුත්පථානය සඳහා මානා සිටු වීම සිදු කර ඇත.

**තේ ප ආ පස්සර**

බිම් සකස් කිරීමේ මූලික අදියර ආරම්භ කොට පස පුනරුත්ථාපානය සඳහා මානා සිටුවීම සිදු කර ගෙන යනු ලබයි. 2017 දෙසැම්බර් දක්වා ප්‍රචාරණය කල පැළ පිලිබඳ විස්තරයක් වගුව 21 දක්වා ඇත.

වගුව 21. TRI 5000 කාණ්ඩයේ මව් ශාක ව්‍යාපෘතියේ අතු රිකිලි මගින් ප්‍රචාරණය කළ පැළ පිළිබඳ විස්තරය

| ස්ථානය | ප්‍රභේදය | අතු කැබලි සංඛ්‍යාව | ප්‍රචාරණය කල දිනය |
|---|---|---|---|
| රත්නපුර ශාක අභිජනන තවාන | 12/11 | 1200 | 23.05.2017 |
| | 23/5 | 950 | |
| | 10/1 | 400 | |
| | 12/11 | 640 | 14.09.2017 |
| | 84 | 1600 | නොවැම්බර්, 2017 |
| කොට්ටව TRI තවාන | 12/11 | 400 | 28.04.2017 |
| | 23/5 | 400 | |
| | 10/1 | 320 | |
| | 12/11 | 1200 | 09.05.2017 |
| | 23/5 | 1200 | |
| | 23/5 | 800 | 25/26-09.2017 |
| | 12/11 | 400 | |
| හන්තාන TRI තවාන | 12/11 | 400 | 17.04.2017 |
| | 10/1 | 400 | |
| තලවාකැලේ ශාක අභිජනන තවාන | 582 | 1600 | 03.10.2017 |
| | 272 | 1600 | |
| | 89 | 1700 | |
| | 15 | 1000 | |

**ව්‍යාපෘතිය D-1. සාම්ප්‍රදායික ශාඛ අභිජනන ක්‍රියාවලියට ආදේශකයක් ලෙස පටක රෝපණ තාක්ෂණයේ භාවිතාව**

**තේ දෛහික කළල ජනනය සඳහා රෝපණ මාධ්‍යයේ සංයුතිය සහ යොග්‍යතාවය ප්‍රශස්ත කිරීම**

අලුතින් නිපදවන ලද උසස් තත්වයේ තේ ප්‍රභේද තනි පත්‍රයක් සහිත වූ දඬු කැබලි මගින් සීඝ්‍රව ප්‍රචාරණය කිරීමේදී විවිධ සීමාකාරී තත්වයන් පවතී. එහෙයින් මේ සඳහා විකල්ප ක්‍රමවේදයක් ලෙස සීඝ්‍ර ගුණන හැකියාවක් සෛල සහ පටක රෝපණ තාක්ෂණය මගින් හඳුන්වා දී ඇත. නමුත් මෙය ශ්‍රී ලංකාව තුල එතරම් භාවිතයට ගෙන නොමැත. එහෙයින් තේ වල ඍජු දෛහික කළල ජනනය සඳහා ක්‍රමවේදයක් සොයා ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. TRI 2024 සහ TRI 2043 වගා ප්‍රභේදයන්හි අපශාක වර්ග 2ක් (පරිණත බීජ පත්‍ර හා බාහිර දඬු කැබලි) භාවිතයන් ගෙන් දෛහික සෛල ප්‍රේරණය කරනු ලැබේ.

**පර්යේෂණ 1: බීජ පත්‍ර මගින් ඍජු දෛහික සෛල ජනනය**

i. 2 mg/l BAP + 3 mg/l NAA (T1C) ii සම්පූර්ණ ප්‍රබලතාව සහිත වූ මුරුසිංහ සහ ස්කූග්ගේ මාධ්‍යය(MS මාධ්‍යය) සමග 3 mg/l BAP + 0.1 mg/l NAA (T2C) සහ iii මුරුසිංහ සහ ස්කූග්ගේ මාධ්‍ය (MS මාධ්‍ය) අඩක් ප්‍රබල වූ මාධ්‍ය සමග 2 mg/l BAP (T3C) වූ වර්ධක යාමකයක් සහිත ඝන සහ ද්‍රව මාධ්‍ය වල බීජ පත්‍ර ආමුකුලනය කරන ලදී. මෙහිදී ලද ප්‍රතිඵල වලට අනුව TRI 2043 වගා ප්‍රභේදයේ 3 mg/l BAP + 0.1 mg/l NAA ද්‍රව මාධ්‍ය තුල සැලකිය යුතු ඉහල දෛහික කළල සංඛ්‍යාවක් ඇතිකර ගෙන ඇත.







**පර්යේෂණය 2: බාහිර අංකුර කොටස් මගින් සෘජු දෛහික කළල ජනනය**

බාහිරයෙන් ලබාගත් අංකුර කොටස් ඝන සහ ද්‍රව මාධ්‍යවල පහත වර්ධක හෝමෝන සංයෝජනයන් යටතේ රෝපණය කරන ලදී i 0.5 mg/l BAP + 3 mg/l GA3 + 0.1 mg/l IBA (T1C) ii 0.5 mg/l BAP+ 3 mg/l GA3 + 0.1 mg/l IBA + 8.6 Ag NO3 (T2C) සහ iii 1 mg/l BAP + 4 mg/l NAA (T3C). රෝපණය කිරීමෙන් සති 6 කට පසුව 0.5 mg/l BAP + 3 mg/l GA3 + 0.1 mg/l IBA එක් කරන ලද ඝන මාධ්‍යයේ අංකුර ශාක කොටස් වල කැපුම් පෘෂ්ඨයන් ආශ්‍රිතව හොඳ ගුණාත්මයේ දෛහික කළල නිරීක්ෂණය කරන ලදී.



**පර්යේෂණය 3: දෛහික කළල පුනර්ජනනය**

ජනනය වූ දෛහික කළල, කළල පුනර්ජනන මධ්‍යයට මාරු කරන ලදී. ඝන සහ ද්‍රව මුරුසිංහ සහ ස්කුග් මාධ්‍යයේ එකිනෙකට වෙනස් වර්ධක හෝමෝන සංයෝජනයන් තුනක් යටතේ කළල නිරීක්ෂණය කරන ලදී. (1) 0.1 NAA + 3 mg/l BAP (R1S) (2) 0.1 mg/l Kinetin + 0.1 mg/l ABA (3) $NH_4NO_3$ (R2S) සහ හෝමෝන රහිත මාධ්‍යය (R3S) සති 10ක ට පසු 0.1 mg/l Kinetin + 0.1 mg/l ABA සහිත ද්‍රව මාධ්‍ය තුල කළල ජනනයේ විවිධ අවස්ථා පැහැදිලිව නිරීක්ෂණය කරන ලදී.

බාහිර බීජ පත්‍ර මගින් ද්‍රව මාධ්‍ය තුළ දෛහික කළල ජනනය සහ පුනර්ජනනය වන ප්‍රභේදයේ බලපෑමකින් තොරව ඉහළ ප්‍රතිඵල වලින් අනාවරණය වූ අතර එය තේ සඳහා බහු ප්‍රචාරණය ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය තොරතුරුද සපයනු ලැබේ.

*එම් ඒ බී රණතුංග,කේ කේ රණවීර, ඩී ජයලත් සහ එස් ඩී සී කේ වික්‍රමරත්න සහ රජරට විශ්ව විද්‍යාලය*

**සම්ප්‍රදායික තේ අභිජනන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා නලස්ථ ක්‍රමවේද භාවිතය**

2014 වසරේ දෙමුහුම්කරණ වැඩසටහනෙන් ලබාගත් පැල 60 ක් තවාන් වෙත යොමු කරන ලදී.

2017 වසරේ දෙමුහුම්කරණ වැඩසටහනෙන් ලබා ගත් කළල 250 ක් දෙමුහුම් කළල ප්‍රරෝහණය සඳහා රෝපණ මාධ්‍යයට අක්‍රමණය කරන ලදී. රෝපණය කල මුළු කළල සංඛ්‍යාවෙන්, ප්‍රරෝහණය වූ කළල 76 ක් උපරෝහනය කරන අතර රෝපණයන් පාලිත රෝපණ තත්ත්වයන් යටතේ පැළ වර්ධන කාමරය තුල නඩත්තු කරන ලදී.

ආලෝකයේ ගුණාත්මය වෙනස් කරමින් සහ ප්‍රශස්ත ආලෝක මට්ටම් හඳුනාගනිමින් පහසුකම් සැලසීමේ ක්‍රියාවලින් ආරම්භ කරන ලදී.

*එම් ඒ බී රණතුංග,කේ කේ රණවීර, ඩී ජයලත් සහ ටී ඒ එස් අනුරුද්ධ තාක්ෂණික අංශය*

**ව්‍යාපෘතිය B 100. ප්‍රධාන පලිබෝධකයක් වන කඳ විදින ගුල්ලා සහ පහතරට සජීවී දැව වේයාගේ ව්‍යවච්ඡේදක, ජෛව රසායනික, අණුක විද්‍යාත්මක සහ ව්‍යාධිවේදී පදනම් ප්‍රතිස්ථාපනය කිරීම.**

**පර්යේෂණය 1: තෝරා ගත් ජෛව රසායනික සංඝටක පහතරට සජීවී දැව වේයාට ප්‍රතිරෝධී සහ ප්‍රතිරෝධී නොවන ප්‍රභේද අතර සංසන්දනය කිරීම.**

තෝරා ගත් ජෛව රසායනික සංඝටක පහතරට සජීවී දැව වේයාට ප්‍රතිරෝධී සහ ප්‍රතිරෝධී නොවන ප්‍රභේද අතර සංසන්දනය කිරීම, ජෛව රසායනික සංඝටක භාවිතයෙන් ප්‍රතිරෝධී ප්‍රභේද හඳුනා ගැනීම සහ තේ ප්‍රභේද තේරීම සඳහා ක්‍රමයක් දියුණු කිරීම සඳහා දත්ත ජනනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ.

ප්‍රභේද 9 ක් යොදා ගෙන සිදු කල ප්‍රථම පරීක්ෂණයේ සාර්ථක ප්‍රතිඵල හේතුවෙන් තවත් ප්‍රභේද 10 ක් යොදා ගෙන රත්නපුර ශාන්ත ජෝකිම් වතුයායේ වෙනත් ක්ෂේත්‍රයක ප්‍රාථමික තේ අතු නිදර්ශක එකතු කර එහි අඩංගු කැෆේන් ප්‍රමාණය, සම්පූර්ණ පොලිෆීනෝල ප්‍රමාණය සහ සම්පූර්ණ කැටකින ප්‍රමාණය විශ්ලේෂණය කල අතර එහිදීද පෙර පර්යේෂණයේ පරිදිම ප්‍රතිරෝධී ප්‍රභේදවල කැෆේන්, සම්පූර්ණ පොලිෆීනෝල, සම්පූර්ණ කැටකීන ප්‍රමාණය ප්‍රතිරෝධී නොවන ප්‍රභේදවලට සාපේක්ෂව වැඩි අගයක් පෙන්වයි. මෙම සාම්පලවල සෙලියුලෝස් ප්‍රමාණය හා ලිග්නින් ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා කටයුතු කරන අතර ම, කොට්ටව ප්‍රදේශයේ දී මේ සමාන සාම්පල එකතු කර පර්යේෂණයක් ආරම්භ කර ඇත. මෙම පර්යේෂණය කීට විද්‍යා අංශය සමග එක්ව සිදු කරයි.

**පර්යේෂණය 2: තේ අතු සාම්පල වල සෙලියුලෝස් සහ ලිග්නින් ප්‍රමාණය නිර්ණය කිරීමේ ක්‍රමෝපායන් දියුණු කිරීම.**

තද ලී සහිත තේ ප්‍රභේද වලට පහතරට සජීවී දැව වේයාගේ ආක්‍රමණය අඩු නිසාත්, වේයන් තම ආහාරය ලෙස සෙලියුලෝස් ප්‍රිය කරන නිසාත් තේ ප්‍රභේදවල අතු වල සෙලියුලෝස් ප්‍රමාණය හා ලිග්නින් ප්‍රමාණය ප්‍රභේදයේ ප්‍රතිරෝධීතාවයට දායකත්වයක් දක්වන බව පෙනී යයි. එම නිසා තේ අතු වල සෙලියුලෝස් ප්‍රමාණය හා ලිග්නින් ප්‍රමාණය නිර්ණය කිරීමට ක්‍රම දෙකක් පරීක්ෂා කල අතර තේ අතු සඳහා භාවිතයට එම ක්‍රම දෙක ප්‍රශස්තිකරණය කිරීම සිදු කරයි.

**පර්යේෂණය 3: තේ කඳ විදින ගුල්ලා පාලනය කිරීම සඳහා ජෛව රසායනික ක්‍රමයක් වැඩි දියුණු කිරීම**

රසායනික ද්‍රව්‍ය වලට ප්‍රතිරෝධීතාවයක් ඇති වීමේ අවධානමක් නොමැතිව කෘමි පළිබෝධකයන් පාලනය සඳහා ජෛව රසායනික භාවිතයෙන් පරිසර හිතකාමී ක්‍රමයක් දියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. කඳ විදින ගුල්ලාගේ ව්‍යාප්තිය පීඩාකාරී තත්වයන් යටතේ ඉහළ යන බැවින් වර්ෂයක් පුරා ප්‍රභේදවල සිදු වන ජෛව රසායනික වෙනස්කම් අධ්‍යයනය  කරන ලදී.

නිදර්ශක එකතු කිරීම මහදෝව වතු යායේ සිදු කල අතර මෙහිදී කඳ විදින ගුල්ලාගේ ඝනත්වය ප්‍රතිරෝධී නොවන ප්‍රභේදය වන TRI 2025 හි වැඩි බව පර්යේෂණය සිදු කල ක්ෂේත්‍ර දෙකෙහිම පෙන්නුම් කරයි. TRI 2023 ප්‍රතිරෝධී ප්‍රභේදයේ ගහන ඝනත්වය අඩු වන අතර TRI 3019, DT1 සහ CY9 යන ප්‍රභේදවල මධ්‍යස්ථ ගහන ඝනත්වයක් පවතී. එසේම සලකන ලද වාෂ්පශීලී සංඝටක වලින් ලිනලූල්, ට්‍රාන්ස් -2- හෙක්සනැල්, සිස් -3- හෙක්සනැල්, පෙන්ටනැල් සහ මෙතිල් සැලිසිලේට් ප්‍රතිරෝධී නොවන ප්‍රභේදවල ප්‍රතිරෝධී ප්‍රභේදවලට සාපේක්ෂව වැඩි ප්‍රමාණයකින් පවතී. මෙම ව්‍යාපෘතිය කිට විද්‍යා අංශය සමග ක්‍රියාත්මක වෙමින් පවතී.

*එම් එස් සී ප්‍රනාන්දු, එන් සී වීරකෝන්, ඒ එස් ගවුස් සහ කේ එම් මෙවන්*

**5000 කාණ්ඩයේ පත්‍ර වල රසායනික විශ්ලේෂණය**

5000 කාණ්ඩයේ පත්‍ර වල රසායනික විශ්ලේෂණ ප්‍රතිඵල පහත පරිදි වේ.

| Sample name | TPP% (w/w) | TAA % (w/w) | EGC % (w/w) | Cat % (w/w) | Caf % (w/w) | EC % (w/w) | EGCG % (w/w) | ECG % (w/w) | Total Cat % (w/w) |
|---|---|---|---|---|---|---|---|---|---|
| P - 17 | 30.74 - 22.58 | 1.27 - 0.96 | 2.16 - 0.85 | 1.18 - 0.68 | 3.62 - 3.48 | 0.81 - 0.77 | 10.62 - 7.02 | 2.34 - 1.49 | 16.11 - 11.35 |
| P - 199 | 27.98 - 22.3 | 1.76 - 0.47 | 2.51 - 1.87 | 0.83 - 0.51 | 3.64 - 3.03 | 0.81 - 0.71 | 11.11 - 7.98 | 1.6 - 2.46 | 17.64 - 13.46 |
| P - 2025 | 29.95 - 22.51 | 1.46 - 1.20 | 2.6 - 2.04 | 0.71 - 0.18 | 3.64 - 3.06 | 1.02 - 0.67 | 12.88 - 9.65 | 2.96 - 2.13 | 19.48 - 15.14 |
| P - 208 | 28.15 - 19.73 | 1.08 - 0.35 | 4.21 - 2.87 | 0.36 - 0.11 | 3.78 - 3.25 | 1.16 - 0.84 | 8.19 - 9.93 | 1.78 - 2.3 | 17.38 - 14.34 |
| P - 210 | 22.52 - 19.43 | 1.67 - 1.36 | 2.06 - 1.73 | 0.45 - 0.16 | 2.92 - 2.57 | 0.83 - 0.55 | 11.6 - 8.89 | 2.58 - 1.75 | 17.04 - 13.8 |
| P - 243 | 24.6 - 20.77 | 1.88 - 0.44 | 2.61 - 2.44 | 0.31 - 0.28 | 3.64 - 3.4 | 1.44 - 1.3 | 6.49 - 4.82 | 2.51 - 1.78 | 10.77 - 13.12 |
| P - 5 | 26.27 - 18.86 | 1.49 - 0.88 | 3.59 - 2.94 | 0.38 - 0.14 | 3.66 - 2.84 | 0.91 - 0.76 | 10.25 - 7.67 | 1.98 - 1.32 | 12.97 - 16.66 |
| P - 89 | 22.97 - 20.48 | 1.83 - 0.99 | 2.95 - 2.36 | 0.58 - 0.33 | 3.33 - 2.85 | 3.18 - 1.88 | 7.34 - 4.32 | 5.25 - 2.38 | 19.23 - 11.27 |
| P - DN | 23.06 - 16.25 | 1.59 - 1.4 | 3.94 - 3.71 | 0.32 - 0.26 | 3.48 - 2.84 | 1.21 - 1.18 | 8.62 - 4.43 | 2.04 - 0.87 | 15.88 - 10.71 |
| P - 21 | 24.43 - 21.19 | 1.16 - 0.33 | 3.03 - 2.73 | 0.66 - 0.36 | 3.66 - 3.14 | 1.99 - 1.61 | 10.04 - 7.54 | 4.88 - 3.7 | 20.3 - 16.23 |
| T - 101 | 26.51 | 0.73 | 4.52 | 0.36 | 3.17 | 2.01 | 5.95 | 1.94 | 14.79 |
| T - 15 | 29.14 - 27.94 | 0.64 - 0.62 | 3.05 - 2.88 | 0.33 - 0.26 | 2.89 - 2.86 | 2.87 - 2.42 | 6.5 - 5.6 | 3.97 - 3.65 | 16.02 - 15.5 |
| T - 2025 | 28.19 - 26.02 | 0.87 - 0.56 | 3.53 - 2.81 | 0.63 - 0.53 | 3.75 - 3.48 | 1.39 - 0.94 | 9.98 - 9.0 | 3.02 - 2.2 | 18.45 - 15.77 |
| T - 208 | 28.38 | 1.13 | 4.52 | 0.3 | 3.81 | 1.47 | 7.46 | 1.94 | 15.7 |
| T - 210 | 27.57 - 23.19 | 1.61 - 0.81 | 3.04 - 2.28 | 0.33 - 0.26 | 3.06 - 3.05 | 1.1 -0.75 | 9.31 - 8.49 | 2.56 - 2.01 | 16.36 - 13.79 |
| T - 272 | 25.41 | 1.37 | 2.78 | 0.51 | 3.3 | 1.63 | 3.85 | 1.33 | 10.1 |
| T - 497 | 26.29 - 26.14 | 0.89 - 0.6 | 3.81 - 3.3 | 0.1 - 0.06 | 3.88 - 3.59 | 1.79 - 1.39 | 8.73 - 6.87 | 3.36 - 2.4 | 17.79 - 14.02 |
| T - 5 | 28.81 - 25 .89 | 1.11 - 0.71 | 5.36 - 4.61 | 0.43 - 0.28 | 3.98 - 3.92 | 1.51 - 1.13 | 10.84 - 9.15 | 2.13 - 1.95 | 18.99 - 18.4 |
| T - 582 | 27.15 - 23.14 | 1.18 - 0.86 | 4.09 - 3.58 | 0.37 - 0.35 | 3.13 - 2.72 | 1.74 - 1.4 | 7.51 - 6.17 | 1.07 - 1.8 | 14.92 - 14.18 |
| T - 89 | 25.67 - 23.14 | 1.44 - 1.36 | 3.49 - 3.29 | 0.56 - 0.42 | 3.76 - 3.52 | 3.11 - 2.93 | 6.5 - 5.37 | 4.24 - 3.4 | 17.9 - 15.41 |
| T - DT1 | 25.13 - 24.75 | 0.68 - 0.42 | 4.21 - 4.18 | 0.72 - 0.71 | 3.94 - 3.6 | 2.21 - 2.0 | 8.39 - 7.58 | 3.6 - 3.31 | 19.1 - 17.8 |

*එම් එස් සී ප්‍රනාන්දු, එච් බී තරංගිකා*



**ප්‍රධාන ව්‍යාපෘති A 51.1. පාංශු සශ්‍රීකත්වය උදෙසා ඒකාබද්ධ ක්‍රමවේද භාවිතය**

**පර්යේෂණය : මේරූ තේ වගාව සඳහා කර්මාන්තශාලා දර අළු පෝෂක ප්‍රභවයක් ලෙස භාවිතා කිරීම**

මෙම අධ්‍යයනයෙ හි මූලික පරමාර්ථය වූයේ, කර්මාන්තශාලා දර අළු සහ කසල තේ, තේ වගාවේ පෝෂක ප්‍රභවයන් ලෙස භාවිතා කිරීමට ඇති හැකියාව පරීක්ෂා කිරීමයි. මෙම අධ්‍යයනයන් ශාන්ත කූම්බ්ස් වතුයාය (උඩරට ප්‍රදේශය සඳහා), මොරගොල්ල වතුයාය (පහතරට ප්‍රදේශය සඳහා), සහ කූරූගම වතුයාය (මැදරට ප්‍රදේශය සඳහා) තෝරා ගැනිණි. මෙහිදී ප්‍රතිකාරක ලෙස කර්මාන්තශාලා දර අළු විවිධ ප්‍රමාණ (අවුරුද්දකට හෙක්ටයාරයකට කි.ග්‍රෑම් 1000, 2000 වන පරිදි) සමග කසල තේ (අවුරුද්දකට හෙක්ටයාරයකට ටොන් 20) සහ යූරියා පොහොර ඇතිව හෝ නැතිව යොදන ලදී. තේ පර්යේෂණායතනයේ වර්තමාන නිර්දේශ වන VP/UM 910 සහ VP/LC 880 සංසන්ධනය සඳහා යොදා ගන්නා ලදී.

උඩරට ප්‍රදේශය සඳහා තෝරා ගත් ශාන්ත කූම්බ්ස් වතුයායේ කරනු ලැබූ පර්යේෂණයේ ප්‍රතිඵලවලට අනුව පාංශු pH අගය ප්‍රතිකාරක අතර සැළකිය යුතු ලෙස වෙනස් වී නැත. එනමුදු, වැඩි pH අගයන් වාර්තා වූයේ කර්මාන්තශාලා දර අළු යෙදු ප්‍රතිකාරකවලය. පාංශු K ප්‍රමාණය සැලකිය යුතු ලෙස ප්‍රතිකාරක අතර වෙනස් වී ඇත. දර අළු යෙදු ප්‍රතිකාරක, වර්තමාන තේ.ප.ආ. පොහොර යෙදු ප්‍රතිකාරකය සමග සමාන අගයක් පෙන්වයි. අස්වැන්න ගැන සළකා බැලීමේදී, කර්මාන්තශාලා දර අළු අඩංගු ප්‍රතිකාරක, වර්තමාන තේ.ප.ආ. නිර්දේශය සමග සංසන්දනාත්මකව සමානකමක් පෙන්වයි.

*කේ ඒ අමාලි, වී ඒ එන් වික්‍රමසිංහ,* සී එස් පතිරණ සහ *ජී පී ගුණරත්න*

**පර්යේෂණය : පුනරුත්ථාපන තෘණ වගාව සඳහා කර්මාන්තශාලා දර අළු පෝෂක ප්‍රභවයක් ලෙස සහ පසේ ආම්ලිකතාවය නිවැරදි කිරීමට ප්‍රතිකාරකයක් ලෙස භාවිතා කිරීම**
මෙම අධ්‍යනයෙහි මූලික පරමාර්ථය වූයේ, කර්මාන්තශාලා දර අළු පෝෂක ප්‍රභවයක් ලෙස සහ පසේ ආම්ලිකතාවය නිවැරදි කිරීමට ප්‍රතිකාරකයක් ලෙස පුනරුත්ථාපන තෘණ සඳහා භාවිතා කිරීමට ඇති විභවය පරීක්ෂා කිරීමයි.

මෙම අධ්‍යයනයන්, ලේල්වල වතුයාය (පහතරට ප්‍රදේශය සඳහා), සහ කුරුගම වතුයාය (මැදරට ප්‍රදේශය සඳහා) තෝරා ගැණිනි. මෙහි දී ප්‍රතිකාරක ලෙස කර්මාන්තශාලා දර අළු විවිධ ප්‍රමාණ (අවුරුද්දකට හෙක්ටෙයාරයකට කි.ග්‍රෑම් 1000, 2000 වන පරිදි) සමඟ කසල තේ හෝ කොම්පෝස්ට් සහ යූරියා පොහොර ඇතිව හෝ නැතිව යොදාගන්නා ලදී. තේ පර්යේෂණායතනයේ පුනරුත්ථාපන තෘණ සඳහා පොහොර නිර්දේශය වන යූ 625 මිශ්‍රණය සංසන්දනය සඳහා යොදාගන්නා ලදී.

ලේල්වල වතුයායේ කරනු ලැබූ පර්යේෂණයේ ප්‍රතිඵල වලට අනුව පාංශු pH අගය ප්‍රතිකාරක අතර සැළකිය යුතු ලෙස වෙනස් නොවිනි. කෙසේ වුව ද, පාංශු pH අගය ප්‍රශස්ථ තෘණ වගාවක් සඳහා අවශ්‍ය 5 ට වඩා වැඩි අගයක පැවතිණි. පාංශු K ප්‍රමාණය සැළකිය යුතු ලෙස ප්‍රතිකාරක අතර වෙනස් වී ඇත. පාංශු K ප්‍රමාණය කර්මාන්තශාලා දර අළු යෙදූ ප්‍රතිකාරකවල වැඩි අගයක් පෙන්වනු ලැබිණි. පත්‍රවල K ප්‍රමාණය සැළකිය යුතු ලෙස ප්‍රතිකාරක අතර වෙනස් වී ඇත. කර්මාන්තශාලා දර අළු අඩංගු ප්‍රතිකාරකවල වැඩි පත්‍ර K ප්‍රමාණයක් පෙන්වනු ලැබිණි. එසේම ලැබුනු තෘණ අස්වැන්න ප්‍රතිකාරක අතර සැළකිය යුතු ලෙස වෙනස් වී ඇත.

*බී ඩී ප්‍රියන්ත, ජේ ආර් වයි අබේවික්‍රම සහ ජී පී ගුණරත්න*

**ප්‍රධාන ව්‍යාපෘතිය A 15.2. ක්ෂුද්‍ර පෝෂක භාවිතය**

**පර්යේෂණය : මස්කෙළිය පාංශු ශ්‍රේණියට අයත් තේ වගාවේ ඇති මැංගනීස් පෝෂක ඌණතාවය සඳහා ප්‍රතිකර්ම සෙවීම**
මැංගනීස් ඌණතාවය මස්කෙළිය ප්‍රදේශයේ බහුලව දක්නට ලැබේ. එයට හේතුව වශයෙන් සළකනු ලබන්නේ ස්වාරක්ෂකතාවය අඩු වීම නිසා එම පසෙහි වැඩි pH අගයක් පැවතීමයි. එසේම මෙම පසෙහි ඇති මැංගනීස් පෝෂක ප්‍රමාණයද සාපේක්ෂව අඩුය. එසේම එය නොගැඹුරු පසකි. මෙම අධ්‍යයනයෙහි මූලික පරමාර්ථය වූයේ, මැංගනීස් අඩංගු පොහොර සමඟ නයිට්‍රජන් පොහොර වල විවිධ ප්‍රභව යෙදීම මැංගනීස් ඌණතාවයට ප්‍රතිකර්මයක් ලෙස යොදාගත හැකිද යන්න පරීක්ෂා කිරීමයි. මෙම පරීක්ෂණය මස්කෙළිය, ලක්ෂපාන වතුයායේ හැමිල්ටන් කොටසේ කේෂ්ත්‍ර අංක 7 හි පිහිටුවන ලදී. මෙහිදී මැංගනීස් පොහොර පසට සහ පත්‍ර මතට යෙදීම සහ නයිට්‍රජන් පොහොර වල විවිධ ප්‍රභව ප්‍රතිකාරක ලෙස යොදාගන්නා ලදී.

පාංශු pH අගය ප්‍රතිකාරක අතර සැළකිය යුතු ලෙස වෙනස් වී ඇති බව දක්නට ලැබුණි. ඇමෝනියම් සල්ෆේට් නයිට්‍රජන් ප්‍රභවය ලෙස යෙදූ ප්‍රතිකාරක වල පාංශු pH අගය සංසන්දනාත්මකව අඩු අගයක පැවතිනි. එසේම පාංශු මැංගනීස් පෝෂක ප්‍රමාණයද ප්‍රතිකාරක අනුව සැළකිය යුතු ලෙස වෙනස් වී ඇති බව දක්නට ලැබුණි. වැඩිම පාංශු මැංගනීස් ප්‍රමාණයක් වාර්තා වූයේ පසට මැංගනීස් සල්ෆේට් සමග නයිට්‍රජන් ප්‍රභවය ලෙස ඇමෝනියම් සල්ෆේට් යෙදූ ප්‍රතිකාරක වලය. පත්‍ර වල අඩංගු මැංගනීස් පෝෂක ප්‍රමාණයද ප්‍රතිකාරක අනුව සැළකිය යුතු ලෙස වෙනස් වී ඇති බව දක්නට ලැබුණි. පත්‍ර වලට මැංගනීස් යෙදූ ප්‍රතිකාරකවල සාපේක්ෂව වැඩි අගයක් පෙන්නුම් කෙරිණි. එසේ වුවද වාර්ෂික අස්වැන්න ප්‍රතිකාරක අතර සැළකිය යුතු ලෙස වෙනස් නොවිනි.

*එස්. රගුරාජ්, කේ ආර් මනෝරි, එස් කේ වීරතුංග සහ ජී පී ගුණරත්න*

**ශාක වර්ධන ප්‍රවර්ධන බැක්ටීරියා (PGPR) ක්ෂේත්‍ර තත්ත්ව යටතේ ඇගයීම**

ශාක මුල් ආසන්නයෙන් වෙන් කරන ලද, ඵලදායි, සජීව, සංගමික සහ සහජීවී බැක්ටීරියා ශාක වර්ධන ප්‍රවර්ධන බැක්ටීරියා ලෙස හැඳින්වේ. මෙම බැක්ටීරියා ශාක වර්ධනය සහ අස්වැන්න වැඩි කරන බව පර්යේෂණ මගින් පෙන්වා දී ඇත. මෙම අධ්‍යයනයෙහි මූලික පරමාර්ථය වූයේ, තේ තවාන් තත්ත්ව යටතේ දැනටමත් තෝරා වෙන් කර ගත් කාර්යක්ෂම බැක්ටීරියා මාදිලි ක්ෂේත්‍ර තත්ත්ව යටතේ අකාබනික පොහොර සමඟ ඇගයීමයි. මෙහි දී තෝරා ගත් ප්‍රතිකාරක වන්නේ, හොඳම නයිට්‍රජන් තිර කරන මාදිලිය සහ පොස්පරස් ද්‍රව්‍ය කරන මාදිලිය සමඟ නිර්දේශිත නයිට්‍රජන් ප්‍රමාණයෙන් 2/3 සහ නිර්දේශිත පොස්පරස් ප්‍රමාණයෙන් 1/3 යෙදීම සහ ඒ ඒ පාංශු ශ්‍රේණි සඳහා හොඳම නයිට්‍රජන් තිර කරන මාදිලිය සහ පොස්පරස් ද්‍රාව්‍ය කරන මාදිලිය සමඟ නිර්දේශිත නයිට්‍රජන් ප්‍රමාණයෙන් 2/3 සහ නිර්දේශිත පොස්පරස් ප්‍රමාණයෙන් 1/3 යෙදීමයි. මෙහි දී නිර්දේශිත පොහොර වන VP/UM 910 සංසන්දනය සඳහා යොදා ගන්නා ලදී.

ක්ෂේත්‍ර පර්යේෂණ මැදරට ප්‍රදේශයේ පාංශු ශ්‍රේණි මට්ටමෙන් පිහිටුවන ලදී. ගිය වසරේ දක්නට ලැබූ ආකාරයටම මෙම වර්ෂයේ ද, එකතු කරන ලද බැක්ටීරියා මාදිලි පාංශු ශ්‍රේණි සඳහා විශේෂත්වයක් සමග අස්වැන්න කෙරෙහි ධනාත්මක සම්බන්ධතාවයක් පෙන්වන ලදී. එසේම පාංශු ශ්‍රේණි සඳහා ද්විත්ව මාදිලි සමඟ මේරූ තේ පොහොර මිශ්‍රණයෙන් (VP/UM 910) නයිට්‍රජන් 33% සහ පොස්පරස් වලින් 50% අඩු කළ හැකි බව පෙනේ.

*ජී එල් කේ තෙන්නකෝන් සහ ජී පී ගුණරත්න*

**සෙමින් පෝෂක මුදා හරින පොහොර (Slow Releasing Fertilizer) පසෙහි සහ ශාකයේ පෝෂක ප්‍රමාණයට සහ අස්වැන්නට බලපෑම**

මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වූයේ, ආර්ථිකව වැඩදායක සෙමින් පෝෂක මුදාහරින පොහොර වර්ගයක් හඳුන්වා දීමයි. මේ සඳහා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) මගින් නිපදවූ සෙමින් පෝෂක මුදා හරින පොහොරවල විවිධ ප්‍රමාණ සහ යොදන වාර ගණන යොදා ගන්නා ලදී. ඒවා වර්තමානයේ නිර්දේශ කර ඇති පොහොර සමඟ සංසන්දනය කරන ලදී.

පහතරට ප්‍රදේශය සඳහා තෝරා ගත් දෙහිඕවිට දොන් පීඩ්රෝ වතුයායේ කරනු ලැබූ පර්යේෂණයේ ප්‍රතිඵලවලට අනුව පාංශු නයිට්‍රජන් ප්‍රමාණය සහ පොටෑසියම් ප්‍රමාණය ප්‍රතිකාරක අතර සැළකිය යුතු ලෙස වෙනස් නොවිණි. එනමුදු පාංශු පොස්පරස් ප්‍රමාණය ප්‍රතිකාරක අතර සැළකිය යුතු ලෙස වෙනස් විණි. වාර්ෂික අස්වැන්න ප්‍රතිකාරක අතර සැළකිය යුතු ලෙස වෙනස් නොවිනි. වැඩිම අස්වැන්න වූ අවුරුද්දකට හෙක්ටයාරයකට නිමි තේ කි.ග්‍රෑම් 3224 ලැබුනේ දිය යුතු මුළු නයිට්‍රජන් ප්‍රමාණය නැනෝ යූරියා මගින් ලබා දුන් ප්‍රතිකාරකයේය. එම අස්වැන්න වර්තමාන නිර්දේශවට වඩා 28% වැඩි වීමකි.

*ඩබ්ලිව් එම් එස් විජයතුංග, එල් ආර් එම් සී එල් ලියනගේ සහ ජී පී ගුණරත්න*

**පසෙහි අඩංගු ක්ෂුද්‍ර පෝෂක ප්‍රමාණය මත පදනම් වූ පත්‍ර මතට යොදන ක්ෂුද්‍ර පෝෂක පොහොර මිශ්‍රණයක් හඳුන්වා දීම.**

වර්තමානයේදී පත්‍ර මතට යොදන විවිධ පොහොර වර්ග විශාල ප්‍රමාණයක් තේ වගාවේදී භාවිතා කරනු ලැබේ. එය භාවිතා කරන්නන් අස්වැන්න වැඩි වන බව ප්‍රකාශ කළ ද, දීර්ඝකාලීනව යෙදීමෙන් සිදුවන අහිතකර ප්‍රතිඵල ද වාර්තා වී ඇත. පත්‍ර මතට යොදන පොහොර පිළිබඳව කර ඇති පර්යේෂණ සංඛ්‍යාව සීමිතය. මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වූයේ, ඵලදායි සහ ආර්ථිකමය ලාභදායී ක්ෂුද්‍ර පෝෂක අඩංගු මිශ්‍රණයක් හඳුන්වා දීමයි. මෙහිදී ප්‍රතිකාරක ලෙස සින්ක් (සින්ක් සල්ෆේට්) මැංගනීස් (මැංගනීස් සල්ෆේට්) සහ බෝරෝන් (බෝරික් ඇසිඩ්) වල විවිධ සංයෝජන භාවිතා කරන ලදී.

ඌව ප්‍රදේශය සඳහා කරන ලද යූරි වතුයායේ ඇති පර්යේෂණයේ ප්‍රතිඵල වලට අනුව මව් පත්‍රයේ සින්ක් සහ මැංගනීස් ප්‍රමාණය ප්‍රතිකාරක අතර සැළකිය යුතු ලෙස වෙනස් විණි. එනමුදු මව් පත්‍රයේ අඩංගු බෝරෝන් ප්‍රමාණය ප්‍රතිකාරක අතර සැළකිය යුතු ලෙස වෙනස් නොවිණි. ක්ෂුද්‍ර පෝෂක යෙදීම නිසා ප්‍රතිකාරක අතර සැළකිය යුතු අස්වනු වෙනසක් දක්නට ලැබිණි. සින්ක් + මැංගනීස් සහ සින්ක් + මැංගනීස් + බෝරෝන් ප්‍රතිකාරක යෙදීම නිසා  අස්වැන්න වැඩි වීම, තේ.ප.ආ. වර්තමාන නිර්දේශවට වඩා පිළිවෙලින් 12% සහ 8% විය.

*එස් රගුරාජ්, කේ ආර් මනෝරි, එස් කේ වීරතුංග, ජී පී ගුණරත්න*

**විවිධ තේ ප්‍රභේද වල මුල්වල ව්‍යුහය සහ පැතිරීම (Root Architecture)**

මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වූයේ, මුල්වල ව්‍යුහය සහ පැතිරීම නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් පෝෂක අවශෝෂණය කෙරෙහි බලපෑම සෙවීමයි. මෙහිදී තේ පර්යේෂණායතනයේ නිර්දේශය වන VP/UM 910 මිශ්‍රණය නිර්දේශිත ප්‍රමාණයෙන් අර්ධයක් හෝ සම්පූර්ණ ප්‍රමාණය සමඟ තේ ප්‍රභේද වන TRI 2023, TRI 3072, TRI 4071, DTI, DN සහ බිජ තේ ප්‍රතිකාරක ලෙස යොදා ගන්නා ලදී.

තේ ශාකයේ පෝෂක අවශෝෂණය, තේ ප්‍රභේදය සහ පොහොර ප්‍රමාණය සහ ඒවායේ විවිධ සංයෝජන මත සැළකිය යුතු ලෙස වෙනස් විනි. එසේම මුල් වල වියළි බර හා පෝෂක අවශෝෂණය අතර පැහැදිලි සම්බන්ධතාවයක් පෙන්නුම් කරන ලදී.

*ජී පී ගුණරත්න සහ ඩී එම් එස් නවරත්න*

**ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම මගින් භූමි ඵලදායිතාවය වැඩි දියුණු කිරීම**

**ව්‍යාපෘතිය A 10.2. පැළ නැවත සිටුවීමට පෙර පස පුනරුත්ථාපනය නොකිරීම /පුනරුත්ථාපන කාල සිමාව අඩුකිරීම සදහා ආර්ථිකමය වාසිදායක ක්‍රමවේදයක් සකස් කිරීම.**

**පාංශු පුනරුත්ථාපන කාලය කෙටි කර ගැනීම සඳහා වැඩි අස්වැන්නක් ලබා දෙන නව තෘණ විශේෂ දෙකක් අධ්‍යයනය කිරීම, හවුපේ වත්ත (කහවත්ත) සහ කොට්ටව ව්‍යාප්ති මධ්‍යස්ථානය :2011**

**A 10.2. විකල්ප පුනරුත්ථාපන තෘණ ලෙස නව තෘණ විශේෂ භාවිතා කිරීමේ ශක්‍යතාව**

ඉහළ ජෛව ස්කන්ධ නිෂ්පාදකයන් ලෙසින් හඳුන්වන ශාක විශේෂ දෙකක් වන (T1) හයිබ්‍රිඩ් නේපියර්) *Pennisetum Purpureum* x *Pennisetum americanum*) (CO- ප්‍රභේදය) සහ (T2) නැගෙනහිර ඉන්දීය ලෙමන්ග්‍රාස් (*Cymbopogon flexuosus*) සමග (T3) ගෝතමාලා (*Tripsacum laxmum*) සහ (T4) මානා (*Cymbopogon confertiflorus*) (T5) පුනරුත්ථාපන නොකරන ලද පාලකය සමග සංසන්දනය කරන ලදී. මෙම පර්යේෂණය ස්ථාන හතරක සිදු කරනු ලබයි. ඒවා නම් යාඉන්න කොටස, හවුපෙ වත්ත, කහවත්ත, තේ.ප.ආ. ප්‍රාදේශීය මධ්‍යස්ථානය, කොට්ටව, දෝතැල්ල කොටස, ඇල්කඩුව වත්ත සහ ඩන්සිනන් වත්ත, පුඩළුඔය වේ.

**පර්යේෂණය 1: යාඉන්න කොටස, හවුපෙ වත්ත, කහවත්ත (2011 ජූලි)**

තෘණ විශේෂ 4 ක් සමග පස පුනරුත්ථාපනය කිරීමෙන් පසුව 2013 ජුනි මාසයේ දී තේ පැල (TRI 4042) සිටු විය. ඉන්පසු නියඟ කාලවලදී මැරුණු පැළ ප්‍රතිශතය හා තේ පැළවල වර්ධනය වාර්තා කරගන්නා ලදී. තේ පැළ සිටුවීමෙන් වසරකට පසු (ජූලි 2014), පැලයක කොළ සංඛ්‍යාව, අතු (ශාඛා) සංඛ්‍යාව, ශාක උස ආදී විස්තර වාර්තා කරගන්නා ලදී.

පළමුවන මට්ටම් කැපීම වසරකින්ද දෙවන මට්ටම් කැපීම වසර එක හමාරකින්ද සිදු කරන ලදී. මෙම කැපුම් අතුවල තෙත් සහ වියලි බර ලබා ගන්නා ලදී. අවම තෙත් බර (පැලයකට ග්‍රෑම් 87.3) සහ වියලි බර (පැලයකට ග්‍රෑම් 22.9) වාර්තා වන ලද්දේ පුනරුත්ථාපනයක් සිදු නොකරන ලද T5 ප්‍රතිකාරකයෙහිය. ඉහලම තෙත් බර (පැලයකට ග්‍රෑම් 140.9) සහ වියලි බර (පැලයකට ග්‍රෑම් 38.7) වාර්තා කරන ලද්දේ හයිබ්‍රිඩ් නේපියර් තෘණ වගා කරන ලද T1 ප්‍රතිකාරකයෙහිය.

නියං කාල පරිච්ඡේදයේදී (2015) පිළිවෙලින් T1 = 1%, T2 = 2.5%, T3 = 2%, T4 = 2% සහ T5 = 13% ලෙස පැල මිය යාමේ ප්‍රතිශත වාර්තා විය. නියඟය අවසන් වන විට වැඩිම මැරුණු පැල සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ T5 ප්‍රතිකර්මයෙහිය. තෙවැනි මට්ටම් කැපීම සිදුකල අවස්ථාවේදී ලබාගන්නා ලද ශාක අතු වල වියලි බර වලට අනුවද, අවම බර (පැලයකට ග්‍රෑම් 81.4) වාර්තා වන ලද්දේ T5 ප්‍රතිකාරකයෙහි වන අතර ඉහලම වියලි බර (පැලයකට ග්‍රෑම් 103.8) වාර්තා කරන ලද්දේ T1 ප්‍රතිකාරකයෙහිය. එනමුදු 2017 වසර තුලදී දළු අස්වැන්නෙහි වෙසෙසි වෙනසක් ප්‍රතිකාර අතර දක්නට නොලැබිණි.

කාබන් ඇතුලු පාංශු පෝෂක තත්වය පිළිබඳ විශ්ලේෂණයක් 2017 අගෝස්තු මස සිදු කරන ලද අතර ප්‍රතිකර්ම අතර වෙසෙසි වෙනසක් දැකිය හැකි විය. අවම පාංශු පෝෂණ තත්වයන් නිරීක්ෂණය කරන ලද්දේ පාංශු පුනරුත්ථාපනය නොකරන ලද පාලකයෙහිය (T5). පරීක්ෂණය තවදුරටත් සිදු කෙරෙමින් පවතී.

**පර්යේෂණය 2: තේ.ප.ආ. ප්‍රාදේශීය මධ්‍යස්ථානය, කොට්ටව**
විවිධ තෘණ වගා කර පස පුනරුත්ථාපනය කිරීමෙන් පසුව TRI 4049 ප්‍රභේදය 2013 ඔක්තෝබර් මසදී සිටුවන ලදී. සියලු ප්‍රතිකාරක වල ශාක වර්ධනය සටහන් කර ගන්නා ලදී.

පලවෙනි සහ දෙවැනි කැපුම් නියමිත කාලවලදී සිදු කරන ලද අතර දෙවැනි කැපුම් මට්ටමට අනුව පැලයක අතුවල වියලි බර පිලිවෙලින් T1 = ග්‍රෑම් 94.1, T2 = ග්‍රෑම් 74.7, T3 = ග්‍රෑම් 111.0, T4 = ග්‍රෑම් 77.1 සහ T5 = ග්‍රෑම් 29.6 ලෙස වාර්තා විය. මේ අනුව ප්‍රතිකාර අතර වෙසෙසි වෙනසක් දැකිය හැකි විය.

තෙවැනි මට්ටම කැපීමේදීද මේ අයුරින්ම ප්‍රතිකර්ම අතර වෙසෙසි වෙනසක් දක්නට ලැබිණි. එහිදී පැලයක අතුවල වියලි බර ලෙස T1 = ග්‍රෑම් 193, T2 = ග්‍රෑම් 144.7, T3 = ග්‍රෑම් 173.7, T4 = ග්‍රෑම් 136.3 සහ T5 = ග්‍රෑම් 38.5 ලෙස වාර්තා විය. පාංශු විශ්ලේෂණය සිදු කරන ලද අතර, 2017 වසර අවසානයේදී දළු නෙලීම ආරම්භ කරන ලදී.

**පර්යේෂණය 3: දොතැල්ල කොටස, ඇල්කඩුව වතුයාය, ඇල්කඩුව (දෙසැම්බර් 2017)**
මෙම අත්හදා බැලීම නොවැම්බර් මස 2017 දී ආරම්භ කරන ලදී. පාංශු ඇගයීම් කටයුතු අඛණ්ඩව සිදු කරමින් අත්හදා බැලීම තව දුරටත් සිදු කරයි.

ප්‍රතිකාරක වනුයේ T1 - හයිබ්‍රිඩ් නේපියර් (*Pennisetum purpureum* x *Pennisetum americanum*) = *Pennisetum typhodieu purpureum* -Variety CO-3, T2- මානා (*Cymbopogon confertiflorus* ) සම්මතය ලෙස T3- ගෝතමාලා (*Tripsacum laxum*) T4 - "නැගෙනහිර ඉන්දීය ලෙමන්ග්‍රාස්" *Cymbopogon flexuosus* සම්මතය ලෙස සහ T5- කිසිදු පුනරුත්ථාපනයක් නොකරන ලද පාලිතයයි.

**පර්යේෂණය 4: මැද කොටස, ඩන්සිනන්, පුඩලුඔය (නොවැම්බර් 2017)**
මෙම පරීක්ෂණය ප්‍රතිකර්ම 5ක් සහිතව 2017 දෙසැම්බර් මස ස්ථාපනය කරන ලදී. ප්‍රතිකාරක ඉහත පරිදි වේ. පාංශු විශ්ලේෂණයන් හා පරීක්ෂණය තව දුරටත් සිදු කෙරෙමින් පවතී.

*එම් ජී එස් ලියනගේ, එන් පී එස් එන් බණ්ඩාර, යූ පී අබේසේකර*

**ව්‍යාපෘතිය A 10.3. පාංශු තත්ත්ව දර්ශක වලංගු කිරීම**
ඌව පළාතේ තවත් වතු 5 කින් නියැදි ලබා ගැනීම සිදු කරන ලදී (පිටරත්මලේ වත්ත, තොටලාගල වත්ත, වේවැස්ස වත්ත, බටාවත්ත වත්ත සහ ගෝනකැලේ වත්ත). තෘණ වගා කර ඇති බිම්වලට යාබදව පිහිටි පැරණි බීජ හෝ රිකිලි තේ ඉඩම්වලින් නියැදි ලබා ගන්නා ලදී. කෙසේ වෙතත් සමහර ක්ෂේත්‍රවල දී තෘණ වගාව නිසි ලෙස කළමනාකරණය නොවීම සහ වසර දෙකකට වඩා වැඩි කාලයක් තෘණ පැවතීම හා මල් හටගෙන තිබීම නිරීක්ෂණය විය. සමුච්චිත දත්ත විශ්ලේෂණයට අනුව තෘණ වගා කල ඉඩම්වල පාංශු තත්ත්ව දර්ශක අගය 6.51 (± 0.3) වූ අතර පැරණි තේ ඉඩම් වල මෙම අගය 5.68 (± 0.3) විය.

ඒ අනුව පාංශු පුනරුත්ථාපනය කරන ලද ක්ෂේත්‍රවල පාංශු තත්ත්ව දර්ශක අගය පැරණි තේ ක්ෂේත්‍රවලට වඩා 15% කින් වැඩිවී ඇති බව නිරීක්ෂණය විය. 2017 වසර අවසානයේ දී පහත රට කලාපයේ තවත් වතු කිහිපයකින් නියැදි ලබා ගැනීම ආරම්භ කරන ලද අතර ඒ අනුව ඇන්දාන සහ හපුගස්තැන්න වතු වලින් නියැදි ලබා ගන්නා ලදී.

**පාංශු වැඩි දියුණු කිරීම සහ තේ සංවර්ධනය කිරීම සඳහා ජෛව රසායන යෙදීම ඇගයීම**
කසල තේ සහ දහයියාවලින් සාදන ලද ජෛව අඟුරු තවාන් පාලනයේදී සහ පැළවල මුල් වර්ධන අවධියේදී යොදා ගැනීම පිළිබඳ පර්යේෂණයක් සිදු කරන ලදී. රත්නපුර තේ පර්යේෂණ ආයතනයේ දී පහත සඳහන් ප්‍රතිකර්මයන් යොදා ගනිමින් පරීක්ෂණය සිදු කරන ලදී.

T1 කසල තේ ජෛව අඟුරු : පස් (1:2) T2 දහයියා ජෛව අඟුරු : පස් (1:2) T3 - කසල තේ ජෛව අඟුරු : පස් (1:4) T4 - දහයියා ජෛව අඟුරු : පස් (1:4) සහ T5 - පාලිතය (පස්)

TRI 4049 ප්‍රභේදය මේ සඳහා යොදා ගන්නා ලද අතර, කසල තේ ජෛව අඟුරු භාවිතා කිරීමෙන් පැළ මිය යාමක් නිරීක්ෂණය වූ අතර, එය තව දුරටත් වැඩි දියුණු කිරීමට අවශ්‍ය බව පෙනී යන ලදි. දහයියා ජෛව අඟුරු භාවිතයෙන් ඉහල ශාක වර්ධනයක්, ඉහළ ජල ධාරිතාවක් මෙන්ම අඩු ජල හානියක් නිරීක්ෂණය කරන ලදී.

*එන් පී එස් එන් බණ්ඩාර, යූ පී අබේසේකර, ඒ ඩබ් ටී පී ප්‍රේමතුංග*

## ප්‍රධාන ව්‍යාපෘතිය A 19. ජලසම්පාදනය හා ජල කළමනාකරණය

### ව්‍යාපෘතිය A 19.1 පහතරට තේ සඳහා ජල බිංදු හා විසුරුම් ජල සම්පාදන පද්ධති ඇගයීමට ලක් කිරීම සහ නියඟය ඇතිවන ප්‍රදේශවල තේ සඳහා ජල කළමනාකරණ තාක්ෂණ සංවර්ධනය.

තේ ශාකයේ ජල බිංදු හා විසිරි ජලසම්පාදන කාර්යක්ෂමතාවය බැලීමට රත්නපුර ශාන්ත ජෝකිම් වතුයායේ පර්යේෂණ දෙකක් සිදු කෙරෙමින් පවතී. පරීක්ෂණය A හි තේ ප්‍රභේද දෙකක් (TRI 4061 සහ TRI 2021) දී ජුනි මාසයේදී ජල බිංදු හා සහන නොමැතිව රෝපණය කරන ලදී. පරීක්ෂණය B යනු ජල සම්පාදනය සඳහා නොමේරූ තේ වල ප්‍රතිචාරය ඇගයීමකි. අත්හදා බැලීමේ සැලැස්ම CRD වන අතර TRI 2023, TRI 2027 සහ TRI 4004 වගාවන් භාවිතා කරනු ලබන්නේ අත්හදා බැලීම් වලිනි. තේ පැලවල මුල් වර්ධනය වෙන් වෙන් වශයෙන් තක්සේරු කරන ලදී.

පරීක්ෂණය A හි TRI 2027 ප්‍රභේදය වැඩිම වර්ධනයක් පෙන්වන ලද අතර ජල සම්පාදිත පැලවල කදේ ඝණකම සෙ.මී 5.48 (± 0.24) ක් හා ජල සම්පාදනය නොකල පැලවල කඳේ ඝණකම සෙ.මී. 4.43 (± 0.04) ක් විය. TRI 2023 සහ TRI 4004 ප්‍රභේදයේ වර්ධනයෙහි එතරම් වෙනසක් නොතිබුණි. පරීක්ෂණය B හි ප්‍රභේදය වලින් TRI 2021 හි වාරි ජලය සහ වර්ෂා ජලය යටතේ ඇති පැළවල සැලකිය යුතු වෙනසක් නිරීක්ෂණය කරන ලදී. මාර්ග පුළුල් කිරීමේ ව්‍යාපෘතිය හේතුවෙන් ශාන්ත ජෝකිම් වතුයායේ අංක 1 ස්ථානයේ ජල බිංදු හා ස්ප්‍රින්ක්ලර් ජල සම්පාදන අත්හදා බැලීමේ පරීක්ෂණය අත්හැර දැමීමට සිදුවිය.

*එන් පී එස් එන් බණ්ඩාර, බී එස් එන් විතාන, ඊ ඩබ් ටී පී ප්‍රේමතුංග*

### ව්‍යාපෘතිය A 19.4. සුදුසු වැසි ජල අස්වැන්න හා රඳවා ගැනීමේ ක්‍රමය ඇගයීම සහ තේ සඳහා වැසි ජලය භාවිතා කිරීම ඵලදායී ලෙස ඇගයීම

කෘෂිකාර්මික වසුන් වල ප්‍රයෝජ්‍යතාව මැන බැලීම සඳහා පර්යේෂණයන් දෙකක් හපුතලේ, කහගල්ල වත්තේ දී සහ රත්නපුර ශාන්ත ජෝකිම් වත්තේ දී සිදු කෙරෙමින් පවතී. මෙම වසුන් යොදා ගැනීමේ මූලික අරමුණ පාංශු ජලය සංරක්ෂණය වුවද, සමහර වල් නාශකයන් තේ කර්මාන්තය තුළ භාවිතය තහනම් කිරීම තුළ වල් පැළෑටි පාලනය සඳහා විකල්පයක් ලෙස ද මෙම වසුන් භාවිතා කල හැකිය.

කහගල්ල වත්තේ පර්යේෂණය 2013 වසරේදී ආරම්භ කරන ලද අතර, වසර 5 කට ආසන්න කාලයක් අවසානයේදීද මෙම වසුන දිරා නොතිබිණ. මෙයට සාපේක්ෂව කළු පොලිතීන් වසුන දිරා යාම දකින්නට හැකි විය. 2017 අප්‍රේල් වලදී කොටුවල වල්පැල ඝනත්වය කිලෝ ග්‍රෑම් - කෘෂිකාර්මික වසුන 3.24(±0.79) කොම්පෝස්ට් වසුන 5.66(±1.04) කළු පොලිතීන් 5.18(±0.94) හා මානා වසුන 7.83(±1.13) වේ.

#### රත්නපුර පරීක්ෂණය

අධික හිරු එළියට නිරාවරණය වූ පර්යේෂණ කොටු වල කළු පොලිතීන් සහ කෘෂිකාර්මික වසුන දිරා යාමක් දක්නට හැකි වුවද අනිකුත් කොටු වල එවන් දිරා යාමක් දක්නට නොලැබුණි. හොඳින් පාංශු තෙතමනය සහිත මසක් වූ 2017 දෙසැම්බර් මස දක්නට ලැබුන වල් පැළෑටි ඝනත්වය කිලෝ ග්‍රෑම් - කෘෂිකාර්මික වසුන 0.285(±0.02) කොම්පෝස්ට් වසුන 0.357(±0.06) කළු පොලිතීන් 0.315(±0.08) මානා වසුන 0.391(±0.12) හා පාලිතය 0.557(±0.13) වේ. මෙම පරීක්ෂණයේදී කම්බි තණකොළ (*Panicum trichocladum*) ප්‍රචලිත වී තිබීමක් දැකිය හැකි විය.

#### නව සෙවන ශාක විශේෂයන්හි වර්ධන හැකියාවන් ඇගයීම

**a) උස් සෙවන + මධ්‍යම සෙවන - හවුපේ වතුයාය කහවත්ත**

2014 ජුනි මස ආරම්භ කල මෙම පර්යේෂණ භූමියෙහි TRI 4042 තේ ප්‍රභේදය වගා කර ඇති අතර මධ්‍යම සෙවන ශාක ලෙස ග්ලිරිසීඩියා වගා කර ඇත. ප්‍රතිකාරක (Treatments) ලෙස විවිධ උස් සෙවන ශාක සංස්ථාපනය කර ඇති අතර ඒවායේ සිටවුම් පරතර පහත පරිදි වෙයි.

T1. ඩෙරිස් මයික්‍රොපයිලා (*Derris microphylla*) (20’x20’) + ග්ලිරිසීඩියා (*Gliricidia sepium*) (10’x10’)
T2. ඩෙරිස් මයික්‍රොපයිලා (30’x30’) + ග්ලිරිසීඩියා (10’x10’)
T3. ඩෙරිස් මයික්‍රොපයිලා (20’x30’) + ග්ලිරිසීඩියා (10’x10’)
T4. කැසියා නොඩෝසා (*Cassia nodosa*) (20’x30’) + ග්ලිරිසීඩියා (10’x10’)
T5. කැසියා නොඩෝසා (30’x30’) + ග්ලිරිසීඩියා (10’x10’)
T6. කැසියා නොඩෝසා (20’x30’) + ග්ලිරිසීඩියා (10’x10’)
T7. ඇල්බීසියා මොලුකානා (*Albizzia molluccana*) (20’x30’) + ග්ලිරිසීඩියා (10’x10’)

2107 වර්ෂයේ ශාක වර්ධක මිනුම් සටහන් කල අතර පාංශු පෝශක ප්‍රමාණය, pH අගය සහ පාංශු කාබන් ප්‍රමාණය ආදි මිනුම් සටහන් කරන ලදී.

**ඩෙරිස් මැක්රොෆයිලා *(Derris microphylla)***

ඇල්බීසියා මොලුකානා ශාකයට සාපේක්ෂව ඩෙරිස් මැක්රොෆයිලා ශාකයේ උස මධ්‍යස්ථ අගයක් ගත් අතර කඳෙහි වට ප්‍රමාණයද අඩු විය. ශාකය ප්‍රමාණවත් තරම් වූ උසකින් අතු බෙදුනු අතර එහි අතුපතර පැතිරීම සහ ශාකයේ උස, උස්-සෙවන ශාකයක් සඳහා සුදුසු මට්ටමක පැවතිණ. මෙම ශාකය ඇල්බීසියා ශාකය මෙන් ඉතා විශාලව වර්ධනය නොවීම සහ කඳ සාපේක්ෂව ඉතා සුළු ඉඩ ප්‍රමාණයක් ගැනීම අමතර සුදුසුකමක් වේ. අතු තිරස් අක්ෂය ඔස්සේ විහිදෙන අතර එයින් තේ වගාව සඳහා ප්‍රමාණවත් සෙවනක් ලබාදීම තහවුරු කරයි. කිසිදු පලිබෝධ උවදුරක් වාර්තා නොවූ මෙම ඩෙරිස් මැක්රොෆයාලා ශාකය, උස් සෙවන ශාකයක් ලෙස ඇල්බීසියා වෙනුවට වගාකිරීමට සුදුසු බව නිරීක්ෂණය කරන ලදී. පර්යේෂණය තවදුරටත් සිදුවෙමින් පවතියි.

**කැසියා නොඩෝසා *(Cassia nodosa)***

මෙම ශාකය ඉතා හොඳින් අතු බෙදී තිරස්ව වේගයෙන් වර්ධනය වුවද ශාකයේ උස, උස්-සෙවන ශාකයක් ලෙස වගා කිරීමට තරම් සතුටුදායක නොවීය. කැසියා ශාකය මගින් ලබාදුන් අධික සෙවන පාලනය කිරීම සඳහා අතු ඉවත් කිරීමට පවා සිදුවූ නමුත්, තේ වගාවට සෙවන වැදගත්ම වන වියලි කාල වලදී මෙම ශාකයේ කොල හැලියාම සහ මේරූ කඳ කටු සහිත වීම සෙවන ශාකයක් ලෙස ගැටළු සහගතවේ. මෙසේ මෙම ශාකය ඇල්බීසියා ශාකය වෙනුවට වගා කරන උස්-සෙවන ශාකයක් ලෙස සැලකීමට ඇති හැකියාව අඩු බව නිරීක්ෂණය කරන ලදී.

**ඇල්බීසායා මොලුකානා (*Albizia molluccana)* (පාලකය)**

පර්යේෂණය කරන ලද අන් සෙවන ශාක වලට සාපේක්ෂව ඉතා හොඳ වර්ධනයක් නිරීක්ෂණය කරන ලදී.

**b) උස් සෙවන + මධ්‍යම සෙවන - තල්ගස්වල වතුයාය, තල්ගස්වල**

2014 දී ආරම්භකරන ලද මෙම පර්යේෂණයේ උස් සෙවන ශාක ලෙස ඩෙරිස්, කැසියා සහ ඇල්බීසියා ද එහි මධ්‍යම සෙවන ශාක සේ ග්ලිරිසීඩියා ද වගා කර ඇත. මෙම බිම් කඩෙහි සෙවන ශාක ස්ථාපනය කරනු ලැබුයේ තේ සිටුවීමෙන් පසුවය. සංස්ථාපිත සෙවන ශාක වර්ග (ප්‍රතිකාරක) සහ ඒවා ස්ථාපනය කළ පරතර පහත පරිදි වෙයි. මෙම ඩෙරිස් විශේෂය ඉහත සඳහන් ඩෙරිස් මැක්‍රොපයිලා නොවන අතර විද්‍යාත්මක නාමය තවම හඳුනාගෙන නොමැත.

T1. නව ඩෙරිස් විශේෂය (20’x20’) + ග්ලිරිසීඩියා (10’X10’)
T2. කැසියා (20’x20’) + ග්ලිරිසීඩියා (10’X10’)
T3. ඇල්බීසියා ( 20’x20’) + ග්ලිරිසීඩියා (10’X10’)

2017 දී ශාක වර්ධනය සහ පාංශු රසායනික තත්ව පිලිබඳ දත්ත එක්රැස් කරන ලදී.

**නව ඩෙරිස් විශේෂයේ වර්ධනය**

ඇල්බීසියා ශාක (පාලකය) වලට සාපේක්ෂව නව ඩෙරිස් විශේෂයේ කක්ෂයෙ හි වර්ධනය සහ උස අඩු අගයක් පෙන්විය. ඩෙරිස් ශාකවල ප්‍රාථමික අතු සංඛ්‍යාව සහ ඒවායේ පැතිරීම ඇල්බීසියා වලට සාපේක්ෂව අඩු වුව ද ඒවා සැලකිය යුතු තරම් විශාල අඩු වීමක් නොවන බව නිරීක්ෂණය විය. ඩෙරිස් ශාකය වර්ධනයේදී මුල්ම වරට අතු බෙදෙන උස අඩු වුවද, කප්පාදුව වැනි ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රියා මගින් එය පාලනය කල හැක.

**කැසියා (*Cassia ceamea)***

කැසියා ශාකයේ කඤෙහි වට ප්‍රමාණය මධ්‍යස්ථ අගයක් විය. තල්ගස්වල වතුයායේ වගා කල කැසියා ශාක හපුජේ වතුයායේ වගා කල ශාක (*Cassia nodosa*) වලට වඩා උසින් වැඩි විය. කැසියා සියාමියා ශාක ඉතා අඩු උසක දී අතු බෙදීම ආරම්භ වූ අතර ඉතා අධිකව ද්වීතීයික අතු වර්ධනය විය. මෙසේ මෙම ශාකය (කැසියා සියාමියා) ප්‍රමාණවත් පමණ පුහුණු කිරීම් සිදු කරමින් සෙවන ශාකයක් ලෙස වගා කිරීමට හැකියාවක් පවතින බව නිරීක්ෂණය විය.

**ඇල්බීසියා *(Albizzia molluccana)* ශාකයේ වර්ධනය**

පර්යේෂණය කල අනෙකුත් සෙවන ශාක වලට සාපේක්ෂව ඉතා හොඳ වර්ධනයක් නිරීක්ෂණය කරන ලදී. පාංශු රසායන විද්‍යාත්මක දත්ත සඳහා නියැදි එක්රැස් කළ අතර පර්යේෂණය තවදුරටත් සිදුවෙමින් පවතී.

**නව සෙවණ ශාක වල කායික විද්‍යා ඇගැයීම**

තේ වගාව සඳහා නව සෙවන ශාක හඳුනා ගැනීම සඳහා මෙම අධ්‍යයනය ශාක කායික විද්‍යා අංශය ආරම්භ කරන ලදී. මේ සඳහා තේ පර්යේෂණායතනයේ ශෂ්‍ය විද්‍යා අංශයෙන් තල්ගස්වෙල වතුයායේ පවත්වාගෙන යනු ලබන පර්යේෂණ භූමිය යොදා ගන්නා ලදී. නව සෙවන ශාක සමග වගාකර ඇති තේ ශාකවල කායික විද්‍යාත්මක දත්ත සහ සෙවන ශාක නිසා ඇතිවී ඇති ක්ෂුද්‍ර දේශගුණික සහ පාංශු තත්ව, දැනට නිර්දේශිත ඇල්බීසියා *(Albizzia moluccana)* සෙවන ශාක සමග සංසන්දනය කිරීම තුලින් නව ශාක, තේ වගාවේ සෙවන ශාක ලෙස යොදා ගත හැකි විභවය පරීක්ෂා කරන ලදී. මෙහිදී ඩෙරිස් (*Derris microphylla*) ශාකයට, ඇල්බීසියා ශාකයට සමාන හෝ උසස් විභවයක් ඇති බවත්, කැසියා *(Cassia siamea)* ශාකයට පරීක්ෂා කරන ලද පරාමිතීන් බහුතරයකින් අඩු විභවයක් ඇති බවත් සොයා ගන්නා ලදී.

මෙම පර්යේෂණය ඉදිරියටත් සිදුකෙරෙමින් පවතී.

*ටී එල් විජේරත්න, ඩී එම් එස් නවරත්න, එම් එම් එන් දමයන්ති, වී සිදාකරන්,*
*වී පී ආර් පී වී පතිරණ, යූ ජයවර්ධන, පී රාජික, ජේ එම් ඩී කොස්තා සහ එම් එස් පී ලියනගේ*

**c) උස් සෙවන + මධ්‍යම සෙවන - ඇල්කඩුව වතුයාය**

මෙම පර්යේෂණය වර්ෂ 2017 හි ආරම්භ කල අතර මධ්‍යම සෙවන ලෙස එරිත්‍රිනා ශාකය ද, උස් සෙවන සඳහා වෙනත් ශාක ද පහත සඳහන් පරිදි වගා කරන ලදී. සිටුවා ඇති තේ ප්‍රභේදය TRI 2023 වේ.

T1) ඩෙරිස් මයික්‍රොපයිලා (20’x20’) + එරිත්‍රිනා (10’x10’)
T2) නව ඩෙරිස් ශාකය (විශාල පත්‍රිකා සහිත) (20’x20’) + එරිත්‍රිනා (10’x10’)
T3) ග්‍රැවිලියා රෝබස්ටා (20’x20’) + එරිත්‍රිනා (10’x10’)
T4) උස් සෙවන නොමැතිව එරිත්‍රිනා (10’x10’) පමණක්

පසුගිය 2017 වර්ෂයේ ශාක වර්ධනය සහ පාංශු රසායන සම්බන්ධ දත්ත එක්රැස් කිරීම සිදුකරන ලදී. පර්යේෂණයේ මේ දක්වා ලද ප්‍රතිඵල අනුව නව සෙවන ශාක වල වර්ධනය ග්‍රැවිලියා ශාකය සමග වෙනසක් නොපෙන්වන ලදී. සිටුවා ඇති ශාක සමග පාංශු රසායනික සාධකවල වෙනසක් නොපෙන්වන ලදී.

**d) උස් සෙවන + මධ්‍යම සෙවන - පුන්ඩළුඔය වතුයාය**

2017 හි ස්ථාපනය කරන ලද මෙම පර්යේෂණයෙහි සැකසුම පහත පරිදි වෙයි. එරිත්‍රිනා ශාකය මධ්‍යම සෙවන ලෙසද විවිධ උස් සෙවන ශාකද සිටුවා ඇති අතර සිටුවා ඇති තේ ප්‍රභේද දෙක TRI 4072 සහ TRI 4052 වේ.

T1) ඩෙරිස් මයික්‍රොපයිලා (20’x20’) + එරිත්‍රිනා (10’x10’)
T2) නව ඩෙරිස් ශාකය (විශාල පත්‍රිකා සහිත) (20’x20’) + එරිත්‍රිනා (10’x10’)
T3) ග්‍රැවිලියා රෝබස්ටා (20’x20’) + එරිත්‍රිනා (10’x10’)
T4) උස් සෙවන ශාක නොමැතිව එරිත්‍රිනා පමණක් (10’x10’)

පර්යේෂණය තවදුරටත් සිදුකරමින් පවතී.

**e) උස් සෙවන + මධ්‍යම සෙවන - පිටරත්මලේ වතුයාය**

2017 වර්ෂයේ දෙසැම්බර් මස ස්ථාපනය කරන ලද මෙම පර්යේෂණයේ සැකැස්ම පහත පරිදි වෙයි.

T1) ඩෙරිස් මයික්‍රොපයිලා (20’x20’) + කැලියැන්ඩ්‍රා (10’x10’)
T2) නව ඩෙරිස් ශාකය (විශාල පත්‍රිකා සහිත) (20’x20’) + කැලියැන්ඩ්‍රා (10’x10’)
T3) ග්‍රැවිලියා රෝබස්ටා (20’x20’) + කැලියැන්ඩ්‍රා (10’x10’)
T4) උස් සෙවන ශාක නොමැතිව කැලියැන්ඩ්‍රා පමණක් (10’x10’)

*එම් පී එස් ලියනගේ, යූ පී අබේසේකර සහ සම්පත් පතිරණගේ*

**රිකිලි බද්ධ තාක්ෂණය මගින් තේ ශාකයේ ඵලදායිතාවය සහ නිම් තේවල තත්වය වැඩි කිරීමේ හැකියාව අධ්‍යයනය කිරීම**

තේ ශාකයේ වැඩි අස්වැන්න, උසස් ගුණාත්මය, දියුණු මූල පද්ධතිය සහ නියගයට හා රෝග පලිබෝධවලට ඔරොත්තු දෙන යන ධනාත්මක ලක්ෂණ සහිත ප්‍රභේද බද්ධ සංයෝජනයන් සඳහා යොදාගැනීමට වඩාත් ම අනුකූල ප්‍රභේද හඳුනා ගැනීම සඳහා පර්යේෂණයන් සිදුකරන ලදි.

**ඉහළ අස්වැන්න සහ පලිබෝධවලට ඔරොත්තු දීමේ හැකියාව ඇති පැළ ලබාගැනීම සඳහා වන බද්ධ සංයෝජනයන් අත්හදා බැලීම.**

අනුජය ලෙස තෝරා ගනු ලබන ප්‍රභේදයන් හි ලක්ෂණ වනුයේ බුබුළු අංගමාරයට, කඳ විදින ගුල්ලාගේ හානියට ඔරොත්තු දෙන සහ වැඩි අස්වැන්නක් ලබා දීම වන අතර, ග්‍රාහකයේ ලක්ෂණ වන්නේ හොඳ මුල් පද්ධතියක් පැවතීම සහ නියඟයට ඔරොත්තු දීමයි. පර්යේෂණය ශාන්ත කූම්බ්ස් වත්තේ ස්ථාපිත කර ඇත. එය දෙවන කප්පාදු චක්‍රයේ තෙවන වසරේ පවතී.

TRI 4046, TRI 3072, TRI 4046, TRI 4053 සහ TRI 4046, TRI 4006 යන බද්ධ සංයෝජනයන් පාලකයන් සමග සංසන්දනය කිරීමේ දී මෙම වසරේ සංඛ්‍යාන වශයෙන් වැඩි අස්වැන්නක් ලබා දී ඇත. අස්වැන්න වැඩිවීම ප්‍රතිශතයක් ලෙස ගත් විට TRI 4046/ TRI 3072, TRI 4046/ TRI 4053 සහ TRI 4046/ TRI 4006 බද්ධ සංයෝජනයන්හි පිළිවෙලින් 53.7% 42.1% සහ 23.7% වේ. තවද TRI 3072/ TRI 4053 බද්ධ සංයෝජනය 24.3%ක අස්වැන්න වැඩිවීමක් පෙන්වා ඇත.

**බලංගොඩ ප්‍රදේශය සඳහා ඉහල අස්වැන්නක් සහ නියඟයට ඔරොත්තු දීමේ හැකියාව ඇති බද්ධ සංයෝජනයන් අත්හදා බැලීම.**

බලංගොඩ වතුයායේ ක්ෂේත්‍ර පර්යේෂණය සඳහා TRI 4054/DG 7, TRI 4042/ DG 7, TRI 4053/DG 39, TRI 4054/ DG 39 සහ TRI 4042 /DG 39 යන බද්ධ සංයෝජනයන් යොදා ගත් අතර පළමු වන කප්පාදු චක්‍රයේ තුන් වන වසර සඳහා ඒවායෙහි අස්වැන්න වාර්තා කරන ලදී. පාලකයන් සමග සංසන්දනය කිරීමේදී, බද්ධ සංයෝජනයන් වන TRI 4042/ DG 39 සහ TRI 4042 /DG 7 සැලකිය යුතු ලෙස අස්වැන්නේ වර්ධනයක් පෙන්වා ඇති අතර වැඩිම අස්වැන්න TRI 4054/ DG 7 බද්ධ සංයෝජනයනය වාර්ථා කර ඇත. TRI 4054/DG 7, TRI 4042/ DG 39 සහ TRI 4042 /DG 7 හි අස්වැන්නේ වර්ධනය පිළිවෙලින් 46 %, 29% හා 9% වේ.

පළමු කප්පාදුව 2017 දෙසැම්බර් මස සිදුකල අතර තේ පඳුරක ඉහළම කප්පාදු අතු බර TRI 4054 පෙන්වූ අතර මීලගට TRI 4054 / DG 7 සහ TRI 4042/ DG 7 පිළිවෙලින් වේ. සංඛ්‍යාන වශයෙන් සැසඳීමේ දී කප්පාදු අතු වියලි බර අතර වෙනසක් නොමැති අතර කප්පාදු අතු වියලි බර පරාසය 39% - 42% වේ.

**පහතරට පවතින අහිතකර කාලගුණික විපර්යාසයන් සඳහා සුදුසු වන බද්ධ සංයෝජනයන් අත්හදා බැලීම.**

ශාන්ත ජෝකිම් වත්තේ සිදු කරන රිකිලි බද්ධ පර්යේෂණය හතර වන වසරේ සිදුකර ගෙන යන අතර බද්ධ සංයෝජනයන් වන TRI 4042/TRI 4049 සහ TRI 2023/ TRI 4049 හි අස්වැන්න සංඛ්‍යාන වශයෙන් වැඩි අතර TRI 2023/ TRI 3025 සංයෝජනය හැර අනෙකුත් සංයෝජනයන් අතර සංඛ්‍යාන වශයෙන් වෙනසක් නොමැත. දත්ත සැකසීම Anova හා Ancova යන ක්‍රම දෙකටම සිදුකර ඇත.

**ව්‍යාපෘතිය A 32.3. කාබනික තේ වගාවේ වර්ධනය, අස්වැන්න, රෝග හා පලිබෝධ කළමණාකරණය පිළිබඳ අධ්‍යයනය**

ස්වභාවික හා ජෛව විද්‍යාත්මක ක්‍රියාවලින් තුළින් කාබනික තේ වගාවේ රෝග, පළිබෝධ හා වල් පැළෑටි පාලනය හා පාංශු සහ භෝග ඵලදායීතාවය පවත්වා ගැනීම යනාදියෙ හි විද්‍යාත්මක පසුබිම අධ්‍යයනය කිරීම තලවකැලේ තේ පර්යේෂණ ආයතනයේ ස්ථාපනය කරන ලද දිගුකාලීන පර්යේෂණ භූමින්වන ‘TRIORCON’ හා ‘BIDORCON’ පර්යේෂණයන් හි සිදු කෙරිණ.

**TRIORCON පර්යේෂණ භූමියේ තේ පඳුරුවල පස්වැනි කප්පාදු චක්‍රයේදී දත්ත අධ්‍යයනය**

TRIORCON පර්යේෂණ භූමියේ 1996 වසරේදී DT 1 ප්‍රභේදයේ තේ පැළ ස්ථාපනය කළ අතර පස්වැනි කප්පාදුව 2017 වසරේ සිදු කරන ලදී. පස්වැනි කප්පාදු චක්‍රයේදී පාංශු හා බෝගය හා සම්බන්ධව හා පළිබෝධ හා රෝග පිළිබඳව දත්ත ඇගයීම සිදුකරන ලදී.

**පස්වැනි කප්පාදු චක්‍රයේදී පසේ රසායනික පරාමිතික පිළිබඳ දත්ත අධ්‍යයනය**

TRIORCON පර්යේෂණ භූමියේ පාංශු විශ්ලේෂණය කළ අතර පසේ කාබනික කාබන් ප්‍රමාණය හා ප්‍රධාන හා අංශු මාත්‍ර මූලද්‍රව්‍ය ප්‍රමාණයන් පිළිබඳව ලබාගත් දත්තවල සාරාංශය පහත වගුවේ දැක්වේ.

| පාංශු පරාමිතික | කාබනික | | | රසායනික | ප්‍රශස්ත පරාසය |
|---|---|---|---|---|---|
| | කසළ තේ | කොහොඹ පුන්නක්කු | කොම්පෝස්ට් | | |
| පාංශු පී එච් අගය | 4.9 | 4.8 | 5.3 | 5.4 | 4.5 - 5.5 |
| පාංශු EC අගය | 48.48 | 23.46 | 45.28 | 33.95 | < 500 |
| පාංශු කාබනික කාබන් ප්‍රමාණය | 3.35 | 2.68b | 3.69 | 2.6 | 3 – 5 |
| පාංශු නයිට්‍රජන් | 0.39 | 0.27 | 0.4 | 0.26 | 0.2 - 0.3 % |
| පාංශු කාබන්: නයිට්‍රජන් අනුපාතය | 8.68 | 9.74 | 9.20 | 9.93 | 30 |
| පාංශු පොටෑසියම් | 116.25 | 80.0 | 41.0 | 130.25 | 80 – 200 |
| පාංශු පොස්පරස් | 8.25 | 3.25 | 4.75 | 53.75 | 10 – 20 |
| පාංශු කැල්සියම් | 87.5 | 45.75 | 118.75 | 68.0 | > 100ppm |
| පාංශු මැග්නීසියම් | 15a | 9.755 | 20.25 | 16.25 | > 0.2% |
| පාංශු යකඩ | 46.39 | 28.27 | 50.48 | 28.81 | NA |
| පාංශු මැංගනස් | 7.96 | 7.08 | 7.09 | 7.19 | > 100ppm |
| පාංශු කොපර් | 1.54 | 0.71 | 1.87 | 0.91 | NA |
| පාංශු සින්ක් | 3.99 | 2.09 | 3.35 | 2.06 | 10 - 40ppm |

කාබනික තේ වගා පද්ධතියක් සාමාන්‍යයෙන් අඩු යෙදවුම් පද්ධතියක් ලෙස සළකනු ලැබේ. මූලික පාංශු හා බෝග කළමණාකරණ ක්‍රමවේද අනුගමනය කිරීම කාබනික තේ වගාවේ අත්‍යවශ්‍ය අංගයකි. මෙම පර්යේෂණයේ ප්‍රතිඵල වලට අනුව පෙනී ගිය කරුණ නම් කාබනික වගාවේ විකල්ප පෝෂක ප්‍රභව හා කාබනික ද්‍රව්‍ය භාවිතය හරහා නිසි ලෙස පාංශු කළමනාකරණය තුළින් පාංශු පෝෂක ප්‍රමාණයන් ප්‍රශස්ත පරාසයක පවත්වා ගත ගත හැකි බවය. තවද, කාබනික වගාවේ පසේ අංශු මාත්‍ර මූලද්‍රව්‍ය ප්‍රමාණයන් සාපේක්ෂව ඉහළ බවද දැකගත හැකි විය.

*කීර්ති මොහොට්ටි සහ ජී පී ගුණරත්න*

**පර්යේෂණය : කාබනික තේ වගා පද්ධතියේ හතරවන කප්පාදු චක්‍රය දක්වා අස්වනු දත්ත අධ්‍යයනය**

අඩු යෙදවුම් හේතුවෙන් කාබනික තේ වගා පද්ධතියක අස්වනු ප්‍රමාණය අඩුවන බව සාමාන්‍ය මතයයි. නමුදු, නිසි ලෙස පාංශු හා බෝග කළමණාකරණය තුළින් පවත්වා ගෙන යන කාබනික තේ වගාවන් තිරසාර පද්ධතින් වන බවට මෙම පර්යේෂණ දත්ත මගින් තහවුරු කර ඇත.

TRIORCON පර්යේෂණ භූමියේ අමු දළු හා නිමි තේ අස්වැන්න පිළිබඳ දත්ත සතිපතා ලබාගැණිනි. මෙම දත්ත වලට අනුව පෙනී ගියේ අස්වැන්න අතින් කාබනික පද්ධතියේ හා රසායනික පද්ධතියේ සැළකිය යුතු තරමේ වෙනසක් දක්නට නොමැති බවය. මෙයින් පිළිබිඹු වන්නේ සුදුසු විකල්ප පෝෂක පසට සැපයීම නිසා තේ ගසේ කායික විද්‍යාත්මක ක්‍රියාවලි කෙරෙහි අහිතකර බලපෑමක් හෝ ගසට ආතතියක් ඇතිකිරීම වළක්වා ඇති බවය.

*කීර්ති මොහොට්ටි*

**පර්යේෂණය : තේ වගාවේ පස්වැනි කප්පාදු චක්‍රයේ දී රෝග හා පළිබෝධ පිළිබඳ දත්ත අධ්‍යයනය**

TRIORCON පර්යේෂණ භූමියේ කාබනික හා රසායනික වගා පද්ධතීන් තුළ පරපෝෂී වටපණු ගහණය හා බුබුළු අංගමාරය රෝගය පිළිබඳව සංසන්දනාත්මකව අධ්‍යයනය කෙරිණ. මෙහිදී පරපෝෂී වටපණු ගහණය කාබනික වගා පද්ධතීන් තුළ අඩු බව දක්නට ලැබිණ. කාබනික පසක පරපෝෂී නොවන වටපණුවන් හා මෘතෝපජීවී වටපණුවන් බහුල වීම සහ ජෛව විද්‍යාත්මක වටපණු පාලනයට දායක වන ක්ෂුද්‍ර ජීවීන් බහුල වීම මෙයට දායක වේ.

තවද, තුළ බුබුළු අංගමාරය රෝගය ඇතිවීමේ සැළකිය යුතු මට්ටමක වෙනසක් කාබනික හා රසායනික වගා පද්ධතීන් තුළ දක්නට නොවිය.

*කීර්ති මොහොට්ටි සහ එන් නවරත්න*



**ප්‍රධාන ව්‍යාපෘතිය DEnto1. ඒකාබද්ධ පළිබෝධ පාලනය සඳහා ආරක්ෂක පළිබෝධනාශක හඳුනාගැනීම**

**පර්යේෂණය E 396: ටීටෝට්‍රික්ස් දළඹුවා පාලනය කිරීම සඳහා එමමෙක්ටීන්බෙන්සොඒට් (Emamectinbenzonate 5% SC) ක්ෂේත්‍ර පරීක්ෂණය**

ටීටෝට්‍රික්ස් දළඹුවා පාලනය කිරීම සඳහා නිර්දේශකර තිබූ කෘමිනාශකය වන ඇටබ්‍රොන් (Atabron 50 EC) භාවිතයෙන් ඉවත්කිරීමත් සමග විකල්ප කෘමිනාශකයක් සෙවීමේ අවශ්‍යතාවය ඉස්මතු විය. ප්‍රතිකාරක වූයේ

1. එමමෙක්ටීන්බෙන්සොඒට් (Emamectinbenzonate 5% SC) 0.3 ග්‍රෑම්/ලීටර
2. එමමෙක්ටීන් බෙන්සොඒට් (Emamectinbenzonate 5% SC) 0.28 ග්‍රෑම්/ලීටර
3. ඇටබ්‍රොන් (Atabron 50 EC) 1 ලිටර්/900 ලීටර
4. පාලිත පරීක්ෂණය

මේ සඳහා එමමෙක්ටීන් බෙන්සොඒට් (Emamectinbenzonate 5% SC) සාන්ද්‍රන 2 ක් 0.28 ග්‍රෑම්/ලීටර්, 0.3 ග්‍රෑම්/ලීටර් වෝල්ට්‍රිම් වතුයාය තුළ ක්ෂේත්‍ර පරීක්ෂණයට භාජනය කරන ලදී. දත්ත විශ්ලේෂණයට අනුව සාන්ද්‍රනය 0.28 ග්‍රෑම්/ලීටර්, මගින් ටීටෝට්‍රික්ස් දළඹුවාගේ ගහණය සැළකිය යුතු ප්‍රමාණයකින් අඩු විනි. තව ද පර්යේෂණ ප්‍රතිඵල අනුව එමමෙක්ටීන් බෙන්සොඒට් කෘමිනාශකය ඇටබ්‍රොන් කෘමිනාශකට සමාන ප්‍රතිඵල ලබාදෙන බව පෙණිනි. මේ නිසා මෙම කෘමිනාශකයේ අවශේෂ (MRL) සඳහා පර්යේෂණ දියත් කරමින් සිටියි.

ටීටෝට්‍රික්ස් දළඹුවාගේ කීට පරපෝෂිතයන් වන මැක්රොසෙන්ට්‍රස් හෝමොන (*Macrocentrus hormonae*) මත එමමෙක්ටීන් බෙන්සොඒට් වල බලපෑමද අධ්‍යයනය කරන ලදී.

**පර්යේෂණය E 397: කම්බිළි පණුවන් පාලනය කිරීම සඳහා කොරජන් (Chlorantraniliprole) කෘමිනාශකය යොදා ගැනිමේ හැකියාව පරීක්‍ෂා කිරීම**
නායබැද්ද වතුයායේ කම්බිළි පණුවන් පාලනය සඳහා කොරජන් (Chlorantraniliprole) කෘමිනාශකය යොදා ක්‍රියාත්මක කල ක්‍ෂෙත්‍ර පරීක්‍ෂාව සාර්ථකව නිම කරන ලදී.

ප්‍රතිකාරක වූයේ

1. කොරජන් (Chlorantraniliprole) 1 මිලි ලීටර/ලීටර
2. පාලිත පරීක්‍ෂණය

කම්බිළි පණුවන් ගේ ගහණය කෘමිනාශකය යෙදීමට පෙර සහ පසු ගණනය කරන ලදී. දත්ත විශ්ලේෂණයට අනුව සාන්ද්‍රනය මිලි ලීටර් 1/ 1 ලීටර් මගින් කම්බිළි පණුවන් ගේ ගහණය 60% - 80% කින් අඩුවිණි. ඒ අනුව මෙම සාන්ද්‍රණය (මිලි ලීටර් 1/ 1 ලීටර්) කම්බිළි පණුවන් පාලනය සඳහා නිර්දේශ කිරීමට නියමිතය.

**පර්යේෂණය LE 130: කම්බිළි පණුවන් පාලනය කිරීම සඳහා කෘත්‍රිම වසුන් යොදා ගැනීමට ඇති හැකියාව පරීක්ෂා කිරීම**
කම්බිළි පණුවන් පාලනය කිරීම සඳහා කෘත්‍රිම වසුන් යොදා ගැනීමට ඇති හැකියාව පරීක්ෂා කිරීම සඳහා ක්‍ෂේත්‍ර පරීක්‍ෂණයක් කොට්ටව තේ පර්යේෂණායතන භූමියේ දී සිදුකරන ලදී.

ප්‍රතිකාරක

1. කෘත්‍රිම වසුන
2. කලු පැහැති පොලිතින් වසුන
3. මානා වසුන

කුරුමිණියන් තේ ක්‍ෂෙත්‍රයේ බිත්තර දැමීම වළක්වා ලීමේ අරමුණින් කුරුමිණියන්ගේ පියාසර කාලයත් සමගම වසුන් ක්‍ෂේත්‍රයේ යොදන ලදී. කම්බිළි පණුවන් ගේ ගහණය පිළිවෙලින් ජුනි, ජුලි, අගෝස්තු, සැප්තැම්බර් මාස වල දී ගණනය කරන ලදී. කෘත්‍රිම වසුනේ සහ කලු පොලිතින් වසුනේ දක්නට ලැබුණු කම්බිළි පණුවන් ගේ ගහණය මානා වසුන සමග සංසන්දනාත්මකව විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණයට අනුව කෘත්‍රිම වසුන්වල සහ කලු පොලිතින් වසුන් වල කම්බිළි පණුවන් ගේ ගහණය මානා වසුනට වඩා සැළකිය යුතු ප්‍රමාණයකින් අඩුවිණි.

**පර්යේෂණය LE 133: කම්බිළි පණුවන් පාලනය කිරීම සඳහා දහයියා වසුනක් යොදා ගැනීමට ඇති හැකියාව පරීක්ෂා කිරීම**
කම්බිළි පණුවන් පාලනය කිරීම සඳහා දහයියා වසුනක් ලෙස යොදා ගැනීමට ඇති හැකියාව පරීක්ෂා කිරීම සඳහා ක්‍ෂේත්‍ර පරීක්‍ෂණයක් කොට්ටව තේ පර්යේෂණායතන භූමියේදී සිදු කරන ලදී.

ප්‍රතිකාරක

1. දහයියා වසුන
2. කලුපැහති පොලිතින් වසුන
3. මානා වසුන

කුරුමිණියන් තේ ක්ෂෙත්‍රයේ බිත්තර දැමීම වළක්වා ලීමේ අරමුණින් දහයියා, කලු පොලිතින් සහ මානා වසුන් කුරුමිණියන්ගේ පියාසර කාලයත් සමගම ජනවාරි මාසයේදි ක්ෂෙත්‍රයේ යොදන ලදී. වසුන් වර්ග තුනෙහිම සිටි කම්බිළි පණුවන් ගේ ගහණය පිළිවෙලින් ජුනි, ජුලි, අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාස වලදි ලබාගත් අතර දහයියා සහ කලු පොලිතින් වල සිටි කම්බිළි පණුවන් ගේ ගහණය මානා වසුන සමඟ සංසන්දනාත්මකව විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණයට අනුව කලු පොලිතින් සහ දහයියා වසුන යෙදූ ක්ෂේත්‍ර වල කම්බිළි පණුවන් ගේ ගහණය මානා වසුනට වඩා සැළකිය යුතු ප්‍රමාණයකින් අඩුවිණි.

**තේ පළිබෝධයින් පාලනය කරගැනීම සඳහා ජෛව පාලන කාරක හඳුනාගැනීම**

කැල්සේ වත්තෙන් සොයා ගන්නා ලද කම්බිළි පණුවන්ට හානිකරන වටපණු විශේෂය ඉටි සළඹයා තුල රෝපණය කරමින් සිටියි. ඉටි සළඹයා විද්‍යාගාරය තුළ ඇති කිරීමට ඇති හැකියාව ආහාර සංඝටක වන වියලි පාන් කුඩු, යීස්ට්, මී පැණි, මී ඉටි, ග්ලිසරීන්, සමපෝෂ, සහල්, තිරිඟු පිටි යොදා විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණයට අනුව සමපෝෂ, සහල්, යීස්ට්, මී පැණි, මී ඉටි සංයුතිය සුදුසුම සංයුතිය ලෙස නිර්ණය විය.

ඒකාබද්ධ පළිබෝධ පාලනයේ එක් ක්‍රමවේදයක් වන ජෛව පාලනය සඳහා ටී ටෝට්‍රික්ස් දළඹුවාගේ කීට පරපෝෂිතයන් වන මැක්රොසෙන්ට්‍රස් හෝමොන (*Macrocentrushomonae*) පරීක්ෂණාගාරය තුල ජනිත කර උඩරට ප්‍රදේශ වල තේ වතුවලට මුදාහරින ලදී.

*බී එස් එන් විතාන, ආර් පෙරේරා, ඒ ආර් අබේසේකර, එච් එම් එස් ඩී කුලතුංග, පී කන්නන්, එන් නවරත්න, බී එම් පී කේ ගොඩවිට සහ බී ජනනී*

**ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම සඳහා ආරක්ෂාකාරී පළිබෝධනාශක (වට පණු නාශක) හඳුනා ගැනීම**

**A 45.2 වටපණු රෝග නිවාරණය සඳහා පැළ සිටුවීමේදී හා කප්පාදුවෙන් පසු යෙදිය හැකි ආදේශක වටපණු නාශක පිළිබඳ අධ්‍යයනය කිරීම**

තේ වගාවලදී විවිධ ස්ථානවල විවිධ මට්ටම්වලින් වටපණු ගහණ දැකිය හැකිය. රසායනික ප්‍රතිකාරක යෙදීම ආර්ථිකව මෙන්ම කාර්යක්ෂමතාවය අතින්ද දුර්වලය. වටපණු ආසාදනය නිවාරණය සඳහා පැල සිටුවීමේදී සහ කප්පාදුවෙන් පසු වටපණු නාශක භාවිතය සමෝධානික වටපණු කලමනාකරණයේ ප්‍රධාන අංගයක් ලෙස දක්වා ඇත. ඒකාබද්ධ වටපණු පාලන ක්‍රමයේදී පසට යොදන පූර්ව ප්‍රතිකාරක, පළිබෝධ නාශක ප්‍රමාණය අවම කිරීමටත් පරිසර ආරක්ෂාව තහවුරු කිරීමටත් ඉතා වැදගත් වේ. තව ද, දැනට නිර්දේශයේ පවතින පාංශු ප්‍රතිකාරකය වන කාබොෆියුරාන් භාවිතයෙන් ඉවත් කිරීමත් සමග විකල්ප රසායනිකයක් සෙවීමේ අවශ්‍යතාවය ඉස්මතු විය. මෙහිදි පූර්ව ප්‍රතිකාරක ලෙස අධ්‍යයනයට ලක් කල රසායනිකයන් අතුරින් වෙලම් (Velum) (Fluopyram 400 SC) නැමැති රසායනිකය වටපණුවන් සඳහා ක්‍රියාකාරී වන බව පර්යේෂණ මගින් තහවුරු විය.

විද්‍යාගාරය, වීදුරු ගෘහ තුළ බඳුන් වගාවේ හා වටපණු ආසාදිත ක්ෂේත්‍ර වල ප්‍රැටිලේන්චස් ලුසයි වටපණු හානියට එරෙහිව කරන ලද පර්යේෂණ මාලාවකට අනුව වෙලම් (Velum) රසායනිකයේ ක්‍රියාකාරී සංඝටකය හෙක්ටයාරයට ග්‍රෑම් 800 වශයෙන් පැළ සිටුවන අවස්ථාවේ හා කප්පාදුවට පසු යෙදීමට සුදුසු බව නිර්ණය කෙරිණ. මෙම පර්යේෂණ ප්‍රතිඵල 235 වන පර්යේෂණ හා ව්‍යාප්ති සංසදයේදී ඉදිරිපත් කරන ලදී.

*කීර්ති මොහොට්ටි, ඒ කේ ප්‍රේමතුංග සහ යූ බී හේරත්*

**වටපණු හානිය අවම කිරීම සඳහා රසායනික පාංශු ධූමකරණයට ආදේශක ලෙස ක්ෂුද්‍ර තරංග අධෝරක්ත කිරණ කාබන් ඩයොක්සයිඩ් සහ වියලි අයිස් යොදාගැනීමේ හැකියාව අධ්‍යයනය කිරීම**

වර්ධක මාධ්‍ය ලෙස පස හා තවාන් පාත්ති ප්‍රතිකාර කිරීම මගින් පරපෝෂී වටපණුවන් විශේෂ ඇතුළු සියලුම පළිබෝධකයන් මුලින් උපුටා දැමීම සමෝධානික වට පණු කළමනාකරණයේ අත්‍යවශය අංගයක් වේ. කෙසේ වුවත් රසායනික ධූමකරණයේදී යම් සීමාකාරී තත්වයන් ලෙස සුදුසු ධූමකාරක සීමාකාරී බව, පරිසරයට අහිතකර බව සහ ආරක්ෂාව පිළිබඳ ගැටළු පෙන්වා දිය හැක.

අධ්‍යයනයන් වලදී සොයා ගත් පරිදි පස් සහ රෝපණ මාධ්‍යයන් ජීවාණුහරණය කිරීමට විභවයක් පවතින විකල්ප රසායනික ධූමකාරක ලෙස ක්ෂුද්‍රතරංග අධෝරක්ත කිරණ කාබන් ඩයොක්සයිඩ් සහ වියලි අයිස් යොදා ගත හැක. විවිධ පාංශු ආකාර, පාංශු තෙතමන තත්ව සහ විවිධ කාල පරාසයන් වලදී වටපණු ආසාදිත පස් ක්ෂුද්‍රතරංග

ප්‍රතිකාරක ලෙස යොදා ගනිමින් අධ්‍යයනයට ලක් කෙරිණ. එහිදී වට පණුවන් මිය යෑමේ ප්‍රතිශතය තක්සේරු කර ඇත.

මේ වන විට පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ ඉන්ජිනේරු අධ්‍යයන අංශය හා පෞද්ගලික අංශයේ ආයතන හා සමඟ සම්බන්ධ වී විකල්ප රසායනික ධූමකාරක ලෙස ක්ෂුද්‍ර තරංග, අධෝරක්ත කිරණ, කාබන් ඩයොක්සයිඩ් සහ වියලි අයිස් ප්‍රතිකාරක භාවිතා කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් යටතේ පර්යේෂණ තවදුරටත් සිදුවෙමින් පවතී.

*කීර්ති මොහොට්ටි, ඒ කේ ප්‍රේමතුංග සහ යූ බී හේරත්*

**පහතරට තේ වගාවේ අස්වනු අඩු වීම, තේ පඳුරු මැරී යාම කෙරෙහි වටපණු හානියේ බලපෑම අධ්‍යයනය**

පහතරට ප්‍රදේශයේ හපුගස්තැන්න, සිසිල්ටන් හා රිච්ලන්ඩ් වතුයාය වලින් ලබාගත් වටපණු ආසාදිත පස් නියැදි උපයෝගී කොට ගෙන වීදුරු ගෘහ තුල පර්යේෂණ සිදු කෙරිණ.

මෙහිදී ලද ප්‍රතිඵල වලට අනුව ප්‍රැටිලේන්චස් ලූසයි වටපණු ආසාදනය හේතුවෙන් තේ ගසේ මුල පද්ධතියට එල්ල වන බලපෑම තහවුරු විය. ප්‍රැටිලේන්චස් ලූසයි වටපණුවා තේ ගසේ මුල පද්ධතියට හානිකිරීම හේතුවෙන් පෝෂක හා ජලය අවශෝෂණය දුර්වල වේ. මේ නිසා ඇතිවන ආතති තත්ත්වය හේතුවෙන් තේ ගසේ මල් හා ගෙඩි හට ගනී. මෙම රෝග ලක්ෂණ කාලයත් සමඟ අවසානයේ අස්වනු අඩු වීමට හා තේ පඳුරු මැරී යාම කෙරෙහි බලපායි.

*කීර්ති මොහොට්ටි, ඒ කේ ප්‍රේමතුංග, බී එම් එල් එම් කරුණාරත්න සහ රජරට විශ්ව විද්‍යාලය*

**පහතරට තේ වගාවේ අස්වනු අඩු වීම, තේ පඳුරු මැරී යාම කෙරෙහි වටපණු හානියේ බලපෑම අධ්‍යයනය සඳහා සිදුකරන ලද සමීක්ෂණය**

පහතරට තේ වගාවේ අස්වනු අඩු වීම, තේ පඳුරු මැරී යාම කෙරෙහි වටපණු හානියේ බලපෑම අධ්‍යයනය සඳහා උපදෙස් හා ව්‍යාප්ති අංශයේද සහය ඇතිව පහතරට ප්‍රදේශයේ කුඩා තේ වතු ඉඩම් සමීක්ෂණයට ලක් කෙරිණි. බලංගොඩ, ගල්ලෑල්ල, කලවාන, පොතුපිටිය, දැරණියගල, වේවැල්වත්ත, රක්වාන, නෙළුව, ගාල්ල හා මතුගම ප්‍රදේශයේ කුඩා තේ වතු ඉඩම් මෙහිදී සමීක්ෂණයට ලක් කෙරිණි. මෙහිදී ලද ප්‍රතිඵල පහත වගුවේ දැක්වේ.

| ප්‍රදේශය | ඉඩම් ගණන | වටපණු ආසාදනයේ තත්ත්වය | | | | | | ආසාදිත මුළු ඉඩම් ගණන | ආසාදිත % |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආසාදිත නොවූ | ඉතා සුළු | සුළු | මධ්‍යස්ථ | වැඩි | ඉතා වැඩි | | |
| බලංගොඩ | 53 | 50 | 3 | 2 | 2 | | | 3 | 5.66 |
| ගල්ලෑල්ල | 51 | 45 | 2 | | | | | 6 | 11.76 |
| කලවාන | 81 | 71 | 10 | | | | | 10 | 12.35 |
| පොතුපිටිය | 41 | 35 | 6 | 1 | | | | 6 | 14.63 |
| දැරණියගල | 46 | 39 | 6 | | | | | 7 | 15.22 |
| වේවැල්වත්ත | 25 | 24 | 1 | | | | | 1 | 4.00 |
| රක්වාන | 5 | 5 | | | | | | 0 | 0.00 |
| නෙළුව | 56 | 47 | 8 | 1 | | | | 9 | 16.07 |
| ගාල්ල | 54 | 42 | 12 | | | | | 12 | 22.22 |
| මතුගම | 51 | 42 | 9 | | | | | 9 | 17.65 |
| ආසාදිත මුළු ඉඩම් ගණන | 463 | 400 | 57 | 4 | 2 | | | 63 | 13.61 |

*කීර්ති මොහොට්ටි, එන් නවරත්න, යූ බී හේරත් සහ ඒ කේ ප්‍රේමතුංග*

**ප්‍රධාන ව්‍යාපෘති A 22.1 & 22.6 තේ කඳ විදින ගුල්ලා පාලනය කර ගැනීම සඳහා ක්ෂෙත්‍ර පරීක්ෂණ**

**පර්යේෂණය ME 68: තේ වගාව කඳ විදින ගුල්ලාගෙන් ආරක්ෂා කරගැනීම සඳහා ක්ෂෙත්‍ර පර්යේෂණ**
මේ සඳහා නායපාන සහ හන්තාන වතු වල ආරම්භ කර තිබුණු ක්ෂේත්‍ර පර්යේෂණ 2 නිම කරන ලදී.

ප්‍රතිකාරක

1. පොල්තෙල් 10 L + රබර්කිරි 10 L/ha
2. පොල්තෙල් 20 L + රබර්කිරි 20 L/ha
3. පොල්තෙල් 10 L + Adhesive /ha
4. පොල්තෙල් 10 L + රබර්කිරි 15 L/ha
5. පොල්තෙල් 10 L + රබර්කිරි ($NH_4$ නොමැති) 15 L/ha
6. පාලිත පරීක්ෂණය

දත්ත ලබා ගැනීම සඳහා සාම්පල ලබාගැනීම මාසිකව සිදුකරන ලද අතර ප්‍රතිකාරක සියල්ල පාලිත පරීක්ෂණය සමඟ සංසන්දනාත්මකව විශ්ලේෂණය කරන ලදී. නායපාන වත්තෙන් ලබාගන්නා ලද දත්ත විශ්ලේෂණයට අනුව ඉහත කිසිදු ප්‍රතිකාරකයක් කඳ විදින ගුල්ලා පාලනය සඳහා ක්‍රියාකාරි නොවන බව තහවුරු විය.

හන්තාන වත්තෙ හි ආරම්භ කරන ලද ක්ෂේත්‍රයේ කඳ විදින ගුල්ලාගේ හානිය අවම මට්ටමක පැවති බැවින් දත්ත විශ්ලේෂණය නොකරන ලදී.

**පර්යේෂණය ME 69: තේ කඳ විදින ගුල්ලා පාලනය කර ගැනීම සඳහා ක්ෂෙත්‍ර පර්යේෂණ**
තේ වගාව කඳ විදින ගුල්ලාගෙන් ආරක්ෂා කරගැනීම සඳහා ක්ෂේත්‍ර පර්යේෂණයක් නායපාන වත්තෙහි දියත් කරන ලදී
ප්‍රතිකාරක

1. පොල්තෙල් 15 L + රබර්කිරි 20 L/ha
2. පොල්තෙල් 20 L + රබර්කිරි 15 L/ha
3. පොල්තෙල් 20 L + රබර්කිරි 20 L/ha
4. පොල්තෙල් 20 L + රබර්කිරි 30 L/ha
5. පොල්තෙල් 20 L + රබර්කිරි ($NH_4$) 40 L/ha
6. පොල්තෙල් 20 L+චිනාකිරි 20 L+ ටීපෝල් 10 L/ha
7. පාලිත පරීක්ෂණය

දත්ත ලබා ගැනීම සඳහා සාම්පල ලබාගැනීම මාසිකව සිදුකරන ලද අතර ප්‍රතිකාරක සියල්ල පාලිත පරීක්ෂණය සමඟ සංසන්දනාත්මකව විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණයට අනුව කඳ විදින ගුල්ලාගේ හානිය 6 වන ප්‍රතිකාරකය (පොල්තෙල් 20 L+චිනාකිරි 20 L+ ටීපෝල් 10 L) යෙදූ ක්ෂෙත්‍රයේ පාලිත පරීක්ෂණයට සාපේක්ෂව ඉතා අඩු මට්ටමක පැවතිනි.

**පර්යේෂණය E 402: තේ කඳ විදින ගුල්ලා පාලනය කරගැනීම සඳහා ආකර්ශක උගුලක කාර්යක්ෂමතාවය පරීක්ෂා කිරීම**
තේ වගාව කඳ විදින ගුල්ලාගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ක්ෂේත්‍ර පර්යේෂණයක් නායපාන වත්තෙහි දියත් කරමින් සිටියි.

ප්‍රතිකාරක

T1 - Quercivorol (කෘමි ආකර්ෂකය)+ Alpha copaene
T2 – Quercivorol (කෘමි ආකර්ෂකය)
T3 - Alpha copaene (කෘමි ආකර්ෂකය)
T4 – පාලිත පරීක්ෂණය

ආකර්ශක උගුල් වල සිටින කඳ විදින ගුල්ලාගේ ගහනය දින 14 කට වතාවක් ලබාගනී. ක්ෂෙත්‍ර පර්යේෂණය තව දුරටත් ක්‍රියාත්මකයි.

*ඒ ආර් අබේසේකර, යූ බී හේරත්, එච් එම් එස් ඩී කුලතුංග, පී කන්නන්, බී එම් පී කේ ගොඩවිට සහ බී ජනනි*

**ප්‍රධාන ව්‍යාපෘතිය A 22.2 තේ කඳ විදින ගුල්ලා පාලනය කර ගැනීම සඳහා ජෛව පළිබෝධකයින් හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර පර්යේෂණ**

**පර්යේෂණය E 400: කඳ විදින ගුල්ලා පාලනය කර ගැනීම සඳහා කෘමි ව්‍යාධිජනක දිලීරයක් වන *Beauvaria bassiana* වල සඵලත්වය විමර්ශණය කිරීම සඳහා ක්ෂේත්‍ර පර්යේෂණය**

කෘමි ව්‍යාධිජනක දිලීරයක් වන *Beauvaria bassiana* වල සඵලත්වය වැඩි දියුණු කිරීම සඳහා පහත සංඝටක යොදා ගෙන පර්යේෂණයක් මහදෝව වතු යායෙහි සිදුකරමින් පවතී.

**ප්‍රතිකාරක**

1. කෘමි ව්‍යාධිජනක දිලීරය (*B.bassiana*) + විසුරුම්කාරකය
2. කෘමි ව්‍යාධිජනක දිලීරය (*B.bassiana*) + හකුරු + විසුරුම්කාරකය
3. කෘමි ව්‍යාධිජනක දිලීරය (*B.bassiana*) + හකුරු + කෙයොලින් + විසුරුම්කාරකය
4. අළුහුණු සහ ගෙන්දගම් මිශ්‍රණය
5. කෙයොලින් + විසුරුම්කාරකය
6. ජලය + විසුරුම්කාරකය

කඳ විදින ගුල්ලාගේ ගහනය පරීක්ෂා කිරීම සඳහා සාම්පල ලබා ගනිමින් සිටින අතර ක්ෂේත්‍ර පර්යේෂණය තව දුරටත් ක්‍රියාත්මකයි.

*එච් එම් එස් ඩී කුලතුංග, පී කන්නන් සහ බී එම් පී කේ ගොඩවිට*

**ප්‍රධාන ව්‍යාපෘතිය A 54. පහතරට සජීව දැව වේයා පාලනය කිරීමට ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම පරීක්ෂා කිරීම**

**ව්‍යාපෘතිය 54.2. පහතරට සජීව දැව වේයා පාලනය කිරීමට සහ කඳ දිරා යාම වළක්වා ගැනීමට දැව ආලේපනයක් හඳුනා ගැනීම**

**පර්යේෂණය LE 131: පහතරට සජීව දැව වේයා සහ කඳ දිරා යාම පාලනය කිරීමට Bitumix Candarsan වල යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා ක්ෂේත්‍ර පර්යේෂණය**

කඳ දිරා යාම පාලනය කිරීම තුලින් පහතරට සජීව දැව වේයා පාලනය කිරීම සඳහා Bitumix Candarsan වල යෝග්‍යතාවය පරීක්ෂා කිරීමට ක්ෂේත්‍ර පර්යේෂණයක් කොට්ටව තේ පර්යේෂණ භූමිය තුල දියත් කරමින් සිටි.
ප්‍රතිකාරක

1. දැව/කඳ ආලේපනය (Bitumix Candarsan)
2. දැව ආලේපනය බෑනෝලියම් (නිර්දේශිත දැව/කඳ ආලේපනය)
3. පාලිත පරීක්ෂණය

කඳ දිරා යාමේ ප්‍රවණතාවය අගයමින් සිටින අතර ක්ෂේත්‍ර පර්යේෂණය තව දුරටත් ක්‍රියාත්මකයි. වේයන්ගේ ගහණ වීම කප්පාදු කරන අවස්ථාවේ විමර්ශණය කරනු ඇත.

*බී එස් එන් විතාන සහ ආර් පෙරේරා*

**ව්‍යාපෘතිය A 54.4. පහතරට සජීව දැව වේයාගේ ගහණවීම කෙරෙහි කප්පාදු කිරීමෙන් ඇති වන බලපෑම අධ්‍යයනය කිරීම.**

තේ වගාව කප්පාදු කිරීම සඳහා යන්ත්‍ර යොදා ගැනීම පහතරට සජීවි දැව වේයාගේ ගහණ වීමට බලපෑමක් ඇතිදැයි සෙවීමට ක්ෂේත්‍ර පරීක්ෂණයක් පහත අයුරින් දියත් කරමින් පවතී.

ප්‍රතිකාරක

1. සනිපාරක්ෂක කප්පාදුව + බෑනෝලියම් (කප්පාදු මුහුණත් ආලේපණ)
2. යන්ත්‍ර මගින් කප්පාදුව + බෑනෝලියම්
3. යන්ත්‍ර මගින් කප්පාදුව + දිරාපත් වූ ශාක කඳන් ඉවත්කිරීම + බෑනෝලියම් ආලේපන

අංකුරවල ගහන ඝනත්වය ඇගයීමට ලක්කල අතර සැලකිය යුතු වෙනස්කමක් දක්නට නොලැබුණි.

වේයන්ගේ ගහණ වීම සහ දිරාපත් කඳන් සංඛ්‍යාව විමර්ශණයට ලක් කෙරේ.

*බී එස් එන් විතාන සහ ආර් පෙරේරා*

**ව්‍යාපෘතිය B 29. ප්‍රතිරෝධී ප්‍රභේද පර්යේෂණාගාරය තුළ දී නිර්ණය කරගැනීමට පර්යේෂණ දියත් කිරීම.**

**පහතරට සජීව දැව වේයාට ප්‍රතිරෝධී ප්‍රභේද තෝරාගැනීම සඳහා පර්යේෂණාගාරය තුළ දී අත්හදා බැලීම.**

දැනට ක්‍රියාත්මක වන ක්‍රමයට (ක්ෂේත්‍රයේදී ප්‍රතිරෝධී ප්‍රභේද තෝරාගැනීම) වඩා ඉතා කෙටි කලකින් ප්‍රතිරෝධී ප්‍රභේදයක් නිර්ණය කරන ලද පර්යේෂණයෙහි දත්ත විශ්ලේෂණයේදී පාත්‍රි ප්‍රභේද (TRI 2026) වල සහ ප්‍රතිරෝධී ප්‍රභේද වල (139) ස්කන්ධ  වල (weight loss) පැහැදිලි වෙනසක් දක්නට ලැබුණි.

පොලි ටනල් තුළ තේ ප්‍රභේද වවා තේ කඳ විදින ගුල්ලාට ප්‍රතිරෝධී ප්‍රභේද තෝරා ගැනීම සඳහා පර්යේෂණ දියත් කරමින් සිටියි.

*බී එස් එන් විතාන, ආර් පෙරේරා, ඒ ආර් අබේසේකර, එච් එම් එස් ඩී කුලතුංග සහ පී කන්නන්*

**ව්‍යාපෘතිය B 69. තේ වගාවේ පළිබෝධ පාලනය සඳහා Semiochemicals හඳුනා ගැනීම**

කඳ විදින ගුල්ලාට ඉතාම පාත්‍රි ප්‍රභේදයක් වන TRI 2025 විවිධ කොටස් යොදා ගෙන choice chamber bioassay මගින් ඔවුන්ගේ ප්‍රතිචාර අධ්‍යයනය කරන ලදී.

ප්‍රතිකාරක

1. ඇම්බ්‍රෝසියා දිලීරය ආසාදිත අතු කැබලි
2. පොතු කැබලි
3. ආසාදිත නොවුනු අතු කැබලි
4. ආසාදිත නොවුනු අතු කැබලි (not splitted)

දත්ත විශ්ලේෂණයට අනුව කඳ විදින ගුල්ලා වඩාත් ආකර්ශණයක් දැක්වූයේ ඇම්බ්‍රෝසියා දිලීරය ආසාදිත අතු කැබලි වලටය.

*එච් එම් එස් ඩී කුලතුංග*

**පර්යේෂණය E 404. ආඝ්‍රාණමාණ පරීක්ෂණය**

මෙය ජෛව රසායක අංශය සමඟ සිදුකරන ඒකාබද්ධ පර්යේෂණයකි.

තේ ප්‍රභේද TRI 2025, TRI 2023, CY9 DT1   සහ TRI 3019   වල නිස්සාරක යොදා ගෙන කඳ විදින ගුල්ලාගේ ප්‍රතිචාර අධ්‍යයනය කරන ලදී. දත්ත විශ්ලේෂණය සිදු කරමින් තිබේ.

**ව්‍යාපෘතිය B 103. තේ ශාකයේ කඳට වැළඳෙන රෝග අධ්‍යයනය**

මෙම පර්යේෂණයේ අරමුණ ලෙස කඳ පිළිකා රෝගයේ හේතු කාරකයින් පිළිබඳ අධ්‍යයනය සහ එවුන් රෝගයට දක්වන සහසම්බන්ධතාව අධ්‍යයනය කිරීම දැක්විය හැකිය. මෙහිදී කඳ පිළිකා රෝගය සහිත තේ සාම්පල විශාල ප්‍රමාණයක පිළිකාව සහිත කොටසේ දිග සහ පළල මනින ලද අතර රෝගයට හේතු වන රෝග කාරකයාගේ අන්වීක්ෂීය ලක්ෂණ අධ්‍යයනය කරන ලදී. බීජානු වල ලක්ෂණ අනුව රෝග කාරකයා හඳුනා ගන්නා ලදී.

විශාල ලෙස වර්ධනය වූ කඳ පිළිකා (දිග 90mmට වැඩි) සඳහා *Lassiodiplodia theobromae* දිලීරය හේතු වන බවත් පිළිකාවේ දිග 20 - 89mm අතර ප්‍රමාණයේ පිළිකා සඳහා *Botryosphaeria dothidea* සහ *Botryosphaeria mamane* යන දිලීර වර්ග දෙක හේතු කාරක වන බවත් සොයා ගන්නා ලදී.

*එන් එච් එල් ප්‍රදීපා, එන් පී කරුණාජීව, එන් එම් ද අල්විස් සහ සී ලීලාරත්න*

**ව්‍යාපෘතිය D/Pl/Pa/1 බුබුළු අංගමාර රෝගය මගින් සිදු වන අස්වනු හානිය ගණනය කිරීම**

මෙම රෝගය මගින් සිදු වන අස්වනු හානිය 32% බව ගණනය කර ඇත. මෙම පරීක්ෂණයේ අරමුණ වූයේ පැවති කාලගුණික තත්ත්ව හමුවේ එකිනෙකට වෙනස් ප්‍රතිකාරක තත්ත්ව යොදා ගනිමින් TRI 2024 හි අස්වනු අඩුවීම ගණනය කිරීමයි. 2016 ජූනි මසදී ප්‍රථම වරට කප්පාදු කරන ලද ක්ෂේත්‍රයක් පර්යේෂණය සඳහා යොදා ගන්නා ලදී. මෙහිදී එක් ප්‍රතිකාරකය ප්‍රතිවලිත 3 බැගින් වූ ප්‍රතිකාර 4ක් යොදා ගන්නා ලදී.

ඒවා නම්,

T1 - හෙක්සකොනසොල් 85ml / ජලය 170 L

T2 - කොපර් ඔක්සික්ලෝරයිඩ් 0.1 % සහ එලිසිටර්

T3 - කොපර් ඔක්සික්ලෝරයිඩ් 0.2 %

T4 - ප්‍රතිකාර නොකරන ලද පාලක පරීක්ෂණය

වර්ෂාව සහිත කාලවල දී පමණක් ප්‍රතිකාර යොදන ලදී. දින 7 ක කාල රාමුවක් තුළදී තේ දළු නෙළීම සිදු කර අමු දළු බර ගණනය කල අතර දින 14 ක කාල රාමුවක් තුළදී බුබුළු අංගමාර රෝගයේ තිව්‍රතාව ගණනය කරන ලදී.

ප්‍රතිකාර කරන ලද ක්ෂේත්‍රයේ අමු දළු බර සමග සංසන්දනය කරන විට ප්‍රතිකාර නොකරන ලද ක්ෂේත්‍රවල අමු දළු බරෙහි අඩු අගයක් පෙන්නුම් කෙරිණි. එම අගය 37- 43% දළු අඩු වීමේ ප්‍රතිශතයක් ලෙස දැක්විය හැකිය. වර්ෂා කාලයේදී ප්‍රතිකාර නොකරන ලද ක්ෂේත්‍රයේ බුබුළු අංගමාර රෝගය වැඩි වශයෙන් දැක ගත හැකි විය.

ප්‍රතිකාර නොකල ක්ෂේත්‍රයට වඩා හෙක්සකොනසොල් ප්‍රතිකාරය යෙදූ ක්ෂේත්‍රයේ බුබුළු අංගමාර රෝගය 40% කින් පමණ පාලනය වී තිබූ අතර එනිසා වැඩි වූ අමු දළු ප්‍රමාණය 49% ක් පමණ විය.

කොපර් ඔක්සික්ලෝරයිඩ් 0.1% යෙදූ ක්ෂේත්‍රයේ සහ කොපර් ඔක්සික්ලෝරයිඩ් 0.2% යෙදූ ක්ෂේත්‍රවල පිලිවෙලින් 35% කින් සහ 25% කින් පමණ රෝගය පාලනය වී තිබූ අතර සිදුවූ අමු දළු වැඩි වීම ප්‍රතිශතයක් ලෙස ගත් කල පිලිවෙලින් 36% සහ 30%ක් පමණ විය.

බුබුළු අංගමාර රෝගය හොඳින් පාලනය කරන විට රෝගය මගින් සිදු වන අස්වනු හානිය අඩු වේ.

*ජී ඩී සින්නයියා, එන් පී කරුණාජීව සහ එන් එම් ද අල්විස්*

**ව්‍යාපෘතිය B102. බුබුළු අංගමාර රෝගය පාලනය කිරීම සඳහා ප්‍රේරිත ආරක්ෂක උපක්‍රමවල භාවිතය**

*Exobasidium vexans* නම් දිලීරය මගින් වැළඳෙන බුබුළු අංගමාර රෝගය සඳහා වැඩි වශයෙන් නැඹුරු වන්නේ පත්‍රයේ මාංසල කොටස්ය. මෙම රෝගයට වැඩි වශයෙන් නැඹුරු තාවක් දක්වන ප්‍රභේදයක පරිණත පත්‍ර කොටස් වුවත් රෝගය සඳහා වැඩි ප්‍රතිරෝධිතාවයක් දක්වයි. මෙම පරීක්ෂණයේ අරමුණ වූයේ පත්‍රයේ වයස සමග බීජානු ප්‍රරෝහණය, පත්‍රයේ භෞතික සහ ජෛව රසායනික ලක්ෂණවල වෙනස්වීම අධ්‍යයනය කිරීමයි.

TRI 2024 ප්‍රභේදයේ විවිධ පරිණත අවධි පහකින් තෝරා ගත් ශාක පත්‍ර වලට බීජානු කෘතිමව ආක්‍රමණය කර පත්‍රයේ වයස සමග බීජානු ප්‍රරෝහණය අධ්‍යයනය කරන ලදී. ශාක පත්‍ර ග්‍රෑම් 10 ක අපිචර්මීය ඉටි ස්තරය ක්ලෝරෆෝම් වලට මිශ්‍ර කර ගන්නා ලදී. විවිධ පරිණත අවධි වල පවතින පත්‍රවල අඩංගු පොලිෆිනෝල් ප්‍රමාණය වර්ණමිතික ක්‍රමය මගින් ගණනය කරන ලදී.

පරීක්ෂණයෙන් ලබා ගත් දත්ත වලට අනුව පළමු සහ දෙවන පත්‍රවල තුනී, සිනිඳු අපිචර්මීය ඉටි ස්තරයක් පැවති අතර පරිණත පත්‍ර වල ඝනකම්, දිලිසෙන සුළු ඉටි ස්තරයක් දැකිය හැකි විය. නමුත් වැඩි පොලිෆිනෝල් ප්‍රමාණයක් දැකිය හැකි වූයේ පරිණත බවින් අඩු පළමු සහ දෙවන පත්‍ර වලයි. පරිණත බවින් වැඩි පත්‍රවල අධික කැෆේන් සහ කැටකින් ප්‍රමාණයක් පැවතුනි. පත්‍රවල පවතින භෞතික සහ රසායනික සංඝටක බුබුළු අංගමාර රෝගයට එරෙහි පවතින ප්‍රතිරෝධිතාව සඳහා දායක වේ.

*ජී ඩී සින්නයියා, එන් එම් ගමගේ, එම් එස් සී ප්‍රනාන්දු සහ ඊ එන් යූ එදිරිසිංහ*

**ව්‍යාපෘතිය A 23.1 ප්‍රධාන මූල රෝග සඳහා පසෙන් ලබා ගන්නා විරෝධක ද්‍රව්‍ය පරීක්ෂා කිරීම, ඇගයීම සහ වෙළඳපොල සඳහා සකස් කිරීම.**

**රතු මුල් රෝගයට එරෙහිව ට්‍රයිකොඩර්මා හර්සියනම් හි වෙළඳ සැකසුමක් පරීක්ෂා කිරීම**

ට්‍රයිකොඩර්මා හර්සියනම්හි සියලු ක්ෂේත්‍ර පර්යේෂණ වල ප්‍රතිඵල සාරාංශකරණය කර පේටන්ට් බල පත්‍රය ලබා ගැනීම සඳහා සූදානම් කරමින් පවතී.

**ව්‍යාපෘතිය B 115. තේ වගාවේ රෝග කාරක දිලීර හඳුනා ගැනීම සඳහා බහු කාර්යය අනුක විද්‍යා රෝග නිර්ණ කට්ටල නිපදවීම.**

මෙහි අරමුණ වන්නේ බහු කාර්යය අනුක විද්‍යා රෝග නිර්ණ කට්ටලය මගින් තේ වගාවේ බහුලව හමුවන රෝග නිර්ණය කිරීමයි.

**මූල රෝග සඳහා හේතු වන දිලීර වල ලක්ෂණ හඳුනා ගැනීම.**

රතු මුල් රෝගය සහිත තේ ශාක වල නිදර්ශක තෝරා ගෙන ඒවායින් ව්‍යාධිජනක දිලීරය වෙන් කර ගන්නා ලදී. ඉන්පසු එම දිලීර විශේෂිත රෝපණ මාධ්‍යයක රෝපණය කර විද්‍යාගාර තත්ත්ව යටතේදී එම දිලීර වල DNA වෙන් කර ගන්නා ලදී. ඉන්පසු PCR ක්‍රම වේදය උපයෝගී කර ගනිමින් තවදුරටත් තහවුරු කර ගැනීමේ පර්යේෂණ සිදු කරන ලදී.

*එන් එච් එල් ප්‍රදීපා, එම් නිරංජන්, එන් පී කරුණාජීව, එන් එම් ද අල්විස් සහ සී ලීලාරත්න*

**අශ්ව කෙඳි අංගමාරය සඳහා හේතු වන *Marasmius crinisequi* දිලීරයේ ලක්ෂණ හඳුනා ගැනීම.**

මෙම දිලීරය මගින් සුදු පැහැති කුඩා හතු ආකාර ව්‍යුහයක් සහ කළු පැහැති ඝනකම් කෙඳි ආකාර ව්‍යුහයක් සාදයි. නමුත් විද්‍යාගාර තත්ත්ව යටතේදී මෙම දිලීරය මගින් නිපද වන්නේ සුදු පැහැති දිලීර සූත්‍රිකා ජාලයක් පමණි. එනිසා මෙම පරීක්ෂණයේ අරමුණ වූයේ දිලීර DNA වල පවතින විශේෂිත කොටස් මගින් හතු ආකාර දිලීරය සහ කළු පැහැති කෙඳි ආකාර දිලීර විශේෂයේ ලක්ෂණ හඳුනා ගැනීමයි.

හතු ආකාර දිලීර කොටස් 2 ක් සහ කළු පැහැති කෙඳි ආකාර දිලීර කොටස් 2 ක DNA අනුක්‍රම නිර්ණය සිදු කර එම අනුක්‍රම ජාන බැංකුවේ පවතින අනුක්‍රම සමග සංසන්දනය කරන ලදී.

ජාන බැංකුවේ පවතින අනුක්‍රම වලට හතු ආකාරයෙන් පවතින දිලීර සහ කළු පැහැති කෙඳි ලෙස පවතින දිලීර කොටස් එකිනෙක සමග සමපාත වන බව පැහැදිලි විය.

*එන් එච් එල් ප්‍රදීපා, එම් නිරංජන්, එන් පී කරුණාජීව, එන් එම් ද අල්විස් සහ සී ලීලාරත්න*

**ව්‍යාපෘතිය B 119. බුබුළු අංගමාරය සහ කඳ පිළිකා රෝග සඳහා රෝග තක්සේරු කිරීමේ සුචි වැඩි දියුණු කිරීම.**

කඳ පිළිකා රෝගය තේ වගා ක්ෂේත්‍රයේදී හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම පහසු කිරීමට සරල සුචියක් සකස් කිරීම මෙහි ප්‍රධාන අරමුණ ලෙස හැඳින්විය හැකිය. රෝගයේ දරුණු බව තක්සේරු කිරීම සඳහා මේ වන විටත් මූලික සුචියක් සකස් කර ඇති අතර එය රත්නපුර, කුරුවිට, වැද්දාගල සහ කලවාන යන තේ වගා ප්‍රදේශ වලදී ඇගයීමට ලක් කර ඇත.

*එන් එච් එල් ප්‍රදීපා, එම් නිරංජන්, එන් පී කරුණාජීව, එන් එම් ද අල්විස් සහ සී ලීලාරත්න*

**D/PI/Pa 3 – නිමි තේ සහ තේ කර්මාන්තශාලා ආශ්‍රිත පරිසරයෙහි ක්ෂුද්‍ර ජීවාත්මක තත්ත්වය ඇගයීම.**

නිමි තේ වල පවතින ජල ප්‍රතිශතය ක්ෂුද්‍ර ජීවීන් වර්ධනය සඳහා හිතකර මට්ටමක නොපවතින නමුත් විවිධ නිමි තේ වර්ගවල මිනිසුන්ට අහිතකර ධූලක නිපදවන දිලීර වර්ධනය වන බව වාර්තා වී තිබේ. එනිසා මෙම පරීක්ෂණයේ ප්‍රධාන අරමුණ ලෙස ධූලක වර්ග නිපදවන දිලීර වර්ග සහ එම ධූලක හඳුනා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම දැක්විය හැකිය.

මෙහිදී ධූලක වර්ග නිපදවන දිලීර හඳුනා ගැනීම සඳහා ක්ෂුද්‍රජීවී රෝපණ මාධ්‍ය සහ PCR ක්‍රමය යොදා ගනී. ධූලක වර්ග හඳුනා ගැනීමට TLC යන ක්‍රමය භාවිතා කරනු ලැබේ. ඉහත ක්‍රම මගින් පරීක්ෂා කල විට නිමි තේ වලින් වෙන් කර ගත් දිලීර 19 ක් ධනාත්මක ප්‍රතිඵල පෙන්විය.

ELISA ක්‍රමය මගින් පර්යේෂණ සිදු කල විට එම දත්ත මගින් තහවුරු වූයේ ඉහත සඳහන් දිලීර ජාල 19 න් දිලීර වර්ග 5ක් පමණක් ධූලක නිපදවා ඇති බවයි.

*ජී ඩී සින්නයියා, එම් නිරංජන්, එන් පී කරුණාජීව සහ එන් එම් ද අල්විස්*

**ප්‍රධාන ව්‍යාපෘතිය A 24. ඒකාබද්ධ වල්පැළෑටි කළමනාකරණ උපායමාර්ග**
**ව්‍යාපෘතිය A 24.1: නව වල් නාශක පරීක්ෂා කිරීම**

**ගෝල් 4F ඔක්සිෆ්ලූවොරෆන් 480g/ISC- පූර්ව නිර්ගමන වල් නාශකය**

ගෝල් 4F (Oxyfluorfen 480 g/l w/v) වල් නාශකය අනෙකුත් පූර්ව නිර්ගමන වල්නාශක සමග පරීක්ෂාවට ලක් කෙරිනි. උඩරට ශාන්ත කූම්බ්ස් වත්ත, මැද රට රත්වත්ත වත්ත සහ පහතරට ශාන්ත ජෝකිම් වතු මේ සඳහා යොදාගන්නා ලදී.

**ගෝල් 4F (Oxyfluorfen 480g / l SC) පූර්ව නිර්ගමන වල්නාශක ලෙස පරීක්ෂා කිරීම ශාන්ත ජෝකිම් වත්ත**




ගෝල් 4F වල් නාශක යොදා සති 6ක්, සති 10ක් හා සති 14ක් අවසනදී වල් පැළෑටිවල වියලි බර - ශාන්ත ජෝකිම් වත්ත.

පහතරට සිදු කරන ලද පරීක්ෂාවේදී ගෝල් 4F සඳහා මිශ්‍රණ අනුපාත 4ක් එනම් 600 මි.ලී/හෙක්, 700 මි.ලී/හෙක්, 800මි.ලී/හෙක්, හා 80% ඩයියුරොන් කුඩු 1.2 කි.ග්‍රෑ/හෙක් (සම්මත 1) සහ ගෝල් 2E 1.2 ලී/හෙක් (සම්මත 2) ද පාලකය සඳහා වල් ඉවත් නොකිරීම ද යොදා ගන්නා ලදී. RCBD ක්‍රමය මගින් පිටපත් තුනකින් යුත් $3X3m^2$ක බිම්කඩක් එක් එක් මිශ්‍රණ අනුපාතය සඳහා ලබා දී ඇත. සියලුම ප්‍රතිකාර වල්නාශක යෙදීමෙන් සති හයකට පසු, සති දහයකට පසු සම්මත 1 හා සම්මත 2 සමග සංසන්දනාත්මක නිරීක්ෂණයට භාජනය කරන ලදී. වල්නාශක යෙදීමෙන් සති 14 කට පසු ගෝල් 4F700 මි.ලී/හෙක් හා 800මි.ලි/හෙක් මිශ්‍රණ අනුපාතයන් සම්මත 2 වන ගෝල් 2 E 1.2 ලී/හෙක් හා සමාන වල් මර්ධනයක් පෙන්වන ලදී. අත්හදා බැලීම් සිදුකල ස්ථානයේ වල්පැළෑටි ජෛව ස්කන්ධය 0 - 50(ග්‍රෑම්)/Quadrant ලෙස විය.

**ගෝල් 4F (Oxyfluorfen 480g / l SC) පූර්ව නිර්ගමන වල්නාශක ලෙස පරීක්ෂා කිරීම රත්වත්ත වතුයාය**

මැදරට සිදු කරන ලද පරීක්ෂාවේදී ගෝල් 4F සඳහා මිශ්‍රණ අනුපාත 3 ක් එනම් 700මි.ලී/හෙක්, 900 මි.ලී/හෙක, 1.2ලී/හෙක්, හා 80% ඩයියුරොන් කුඩු 1.2කි.ග්‍රෑ/හෙක් (සම්මත 1) සහ ගෝල් 2 E 1.2ලී/හෙක් (සම්මත 2) ද පාලකය ලෙස වල් ඉවත් නොකිරීම ද යොදා ගන්නා ලදී. RCBD ක්‍රමය මගින් පිටපත් තුනකින් යුත් $3X3m^2$ ක බිම්කඩක් එක් එක් මිශ්‍රණ අනුපාතය සඳහා ලබා දී ඇත. මෙහි දී වල් නාශක යොදා මසක් අවසන දී

ගෝල් 4F 700මි.ලී/හෙක් (සම්මත 1) මගින් ගෝල් 2E 1.2ලී /හෙක් (සම්මත 2) ට සාපේක්ෂව සමාන වල් මර්ධනයක් පෙන්නුම් කරන ලදී. වල් නාශක යෙදීමෙන් මාස දෙකකට පසු ගෝල් 2E 1.2ලී /හෙක් (සම්මත 2) හා සැසඳීමේදී ගෝල් 4F 700මි.ලී/හෙක් (සම්මත 1) මාත්‍රාවන් මගින් සැලකිය යුතු වල් මර්ධනයක් පෙන්වන ලදී. අත්හදා බැලීම් සිදුකල ස්ථානයේ වල් පැළෑටි ජෛව ස්කන්ධය 0- 10(ග්‍රෑම්)/Quadrant ලෙස විය.




ගෝල් 4F වල් නාශක යොදා මසක් හා දෙමසක් අවසනදී වල් පැළෑටිවල වියලි බර රත්වත්ත වතුයාය

ශාන්ත කුම්බිස් වතුයායේ කල පරීක්ෂණයෙහි දී, ගෝල් 4F 700මි.ලී/හෙක්, 900මි.ලි/හෙක් හා 1.2ලී/හෙක් මාත්‍රාවන් ඩයියුරොන් කුඩු 1.2කි.ග්‍රෑ/හෙක් හා ගෝල් 2E 1.2ලී/හෙක් යන සම්මත සමග පරීක්ෂාවට ලක් කෙරිනි. මෙහි දී වල්නාශක යොදා මසක් අවසන දී ගෝල් 4F 700මි.ලී/හෙක්, 900මි.ලී/හෙක් හා 1.2ලී/හෙක්. මාත්‍රාවන් ඩයුරොන් 1.2කි.ග්‍රෑ/හෙක් හා ගෝල් 2 E 1.2ලී/හෙක් යන සම්මත සමග සංසන්දනාත්මක නිරීක්ෂණයට භාජනය කරන ලදී. වල් නාශක යොදා දෙමසක් අවසනදී ගෝල් 4F හෙක්ටයාරයට මිලි ලීටර 700හා හෙක්ටයාරයට මිලි ලීටර 900 මාත්‍රාවන් ගේ සම්මත පරීක්ෂාවන්ට සාපේක්ෂව වල්පැළෑටිවල සැලකිය යුතු ලෙස අඩු වියලි බරක් (වල් පැළෑටි ප්‍රරෝහන අනුපාතය අඩුවක්) වාර්තා වූ අතර පාලක පරීක්ෂාවට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු ප්‍රරෝහණ අනුපාතයක් පෙන්නුම් කරයි.

එබැවින් සියලුම කලාපවල වල්පැළෑටි පාලනය සඳහා මතු බලාපොරොත්තු සහිත පූර්ව නිර්ගමන වල් නාශකයක් ලෙස ගෝල් 4F 700 මි.ලී/හෙක් මිශ්‍රණ නම් කල හැක. කෙසේ වෙතත්, තේ නිෂ්පාදනවල උපරිම අවශේෂ මට්ටම (MRL) සඳහා එය පරීක්ෂා කළ යුතු අතර මෙහිදී වඩාත් සඵලදායී අනුපාතය වන ගෝල් 4F 700 මි.ලී/හෙක් මිශ්‍රණ අනුපාතය මෙම අධ්‍යයනය සඳහා යොදා ගෙන ඇත. මෙම අත්හදා බැලීම් ශාන්ත කුම්බිස්, හන්තාන, පස්සර සහ රත්නපුර යන ප්‍රදේශයන්හි සිදු කෙරෙමින් පවතී.

**ඩයියුරොන් (දියර) 500g/L Liquido Diuron**

ඩයුරොන් (දියර) 500 g/L SC උඩරට ශාන්ත කුම්බිස් වතුයායේ වෙනත් පශ්චාත් නිර්ගමන වල් නාශක සමග පරීක්ෂණයට ලක් කෙරුණි. මැදරට ඇල්කඩුව වතුයාය සහ පහතරට ශාන්ත ජෝකිම් වතුයායන්ද මෙම පරීක්ෂණයට යොදාගන්නා ලදී.

**ඩයියුරොන් (දියර) පශ්චාත් නිර්ගමන වල්නාශක ලෙස පරීක්ෂා කිරීම - උඩරට ශාන්ත කුම්බිස් වතුයාය**




ඩයියුරොන් වල් නාශක යෙදීමෙන් මාස 1කට පසු හා මාස 3කට පසු වල් පැළෑටිවල වියළි බර - තලවකැලේ ශාන්ත කුම්බිස් වත්ත

ශාන්ත කුම්බිස් වතුයායේ කල පරීක්ෂණයෙහිදී ඩයියුරොන් (දියර) 1.5 ලී/හෙක්, 2 ලී/ හෙක්, 2.5 ලී/හෙක් අනුපාත සහ ග්ලුෆෝසිනේට් ඇමෝනියම් 1.3 ලී/හෙක් (සම්මත 1) සහ MCPA 2 ලී/හෙක් (සම්මත 2) ද පාලකය සඳහා වල් ඉවත් නොකිරීම ද යොදා ගන්නා ලදී. RCBD ක්‍රමය මගින් පිටපත් තුනකින් යුත් 3X3m$^2$ ක බිම්කඩක් එක් එක් මිශ්‍රණ අනුපාතය සඳහා ලබා දී ඇත. වල් නාශක යෙදීමෙන් මාස 1කට පසු පරීක්ෂාවට බඳුන් කල සියලුම අනුපාත සම්මත ප්‍රතිකාර වලට සංසන්දනාත්මකව සාපේක්ෂව සමාන වල් මර්ධනයක් පෙන්නුම් කලේය. මෙහිදී වල් නාශක යෙදීමෙන් මාස 3කට පසු ඩයියුරොන් (දියර) 2ලී/හෙක් අනුපාතය මගින් ග්ලුෆෝසිනේට් ඇමෝනියම් 1.3 ලී/හෙක් (සම්මත 1) සහ MCPA 2ලී/හෙක් (සම්මත 2) ට සාපේක්ෂව සැලකිය යුතු වල් මර්ධනයක් පෙන්වන ලදී.

**ඩයියුරොන් (දියර) පශ්චාත් නිර්ගමන වල්නාශක ලෙස පරීක්ෂා කිරීම - මැදරට ඇල්කඩුව වතුයාය**

මැදරට සිදු කරන ලද පරීක්ෂාවේදීද ශාන්ත කුම්බිස් වතුයායේ යොදාගත් ක්‍රමවේදයම යොදාගන්නා ලදී. වල් නාශක යෙදීමෙන් මාස 1කට පසු පරීක්ෂාවට බඳුන් කළ සියලුම ඩයියුරොන් අනුපාත සම්මත ග්ලුෆෝසිනේට් ඇමෝනියම් 1.3ලී/හෙක් මාත්‍රාවට සංසන්දනාත්මකව සාපේක්ෂව සමාන වල් මර්ධනයක් පෙන්නුම් කල අතර වල් නාශක යෙදීමෙන් මාස 3කට පසු පරීක්ෂාවට බඳුන් කළ සියලුම ඩයියුරොන් අනුපාත සම්මත ප්‍රතිකාර ද්විත්වයටම සංසන්දනාත්මකව සමාන වල් මර්ධනයක් පෙන්නුම් කලේය.




ඩයියුරොන් වල් නාශක යෙදීමෙන් මාස 1කට පසු හා මාස 3කට පසු වල් පැළෑටි වල වියලි බර මැදරට රත්වත්ත වත්ත

**ඩයියුරොන් (දියර) පශ්චාත් නිර්ගමන වල්නාශක ලෙස පරීක්ෂා කිරීම - පහතරට ශාන්ත ජෝකිම් වතුයාය**




ඩයියුරොන් වල් නාශක යෙදීමෙන් සති 3කට පසු හා සති 6 කට පසු වල් පැළෑටි වල වියලි බර පහතරට ශාන්ත ජෝකිම් වතුයාය

පහතරට සිදු කරන ලද පරීක්ෂාවේදී ඩයියුරොන් (දියර)1ලී/හෙක්, 15ලී/හෙක්, 2ලී/හෙක් වශයෙන් අනුපාත 3ක් සමග ග්ලුෆෝසිනේට් ඇමෝනියම් 1.3ලී/හෙක් (සම්මත 1) හා පාලකය සඳහා වල් ඉවත් නොකිරීම ද යොදා ගන්නා ලදී. වල් නාශක යෙදීමෙන් සති 6කට පසු පරීක්ෂාවට බඳුන් කළ සියලුම ඩයියුරොන් මාත්‍රාවන්, පාලක පරීක්ෂාවට සාපේක්ෂව සැලකිය යුතු වල් මර්ධනයක් පෙන්වන ලදී. එමෙන්ම සියලුම ඩයියුරොන් මාත්‍රාවන්, ග්ලුෆෝසිනේට් ඇමෝනියම් 1.3ලී/හෙක් (සම්මත 1)ට සාපේක්ෂව වඩා අඩු සඵලතාවයක් පෙන්වන ලදී. (රූපය 6) පහතරට ශාන්ත ජෝකිම් වතුයායේ වල්පැළෑටි ජෛව ස්කන්ධය අධික වු අතර අනෙක් ප්‍රදේශ හා සසඳන විට වල් පැළෑටි පාලනය කිරීමේ කාලය අඩු විය.

**ජෛව වල් නාශක පරීක්ෂා කිරීම - යුකැලිප්ටෝල් (බුවුන්අවුට්) සයිනොල් 0.2% w/v –SL- *Eucalyptus* spp ශාක සාර**

මෙම වල් නාශකය යුකැලිප්ටස් ශාකයෙන් නිස්සාරණය කරන ලද ශාකසාර නිස්සාරණයකි. මෙහිදී උඩරට, මැදරට සහ පහතරට ප්‍රදේශ වලදී යුකැලිප්ටෝල් 0.2% w/v SL මාත්‍රාවන් 4ක් වන 6ලී/හෙක්, 8ලී/හෙක්, 11ලී/හෙක් සහ 14ලී/හෙක් යන අනුපාතයන් බේයර් නිෂ්පාදනයක් වන ග්ලුෆෝසිනේට් ඇමෝනියම් 1.3ලී/හෙක් (15% a.i.) හා MCPA(60%) 2 ලී/හෙක් යන සම්මත ප්‍රතිකාර සමග පරීක්ෂාවට බඳුන් කරන ලදී. ප්‍රතිකාර නොකල බිම්කඩ පාලකය ලෙස යොදාගන්නා ලදී. RCBD ක්‍රමය මගින් ප්‍රතිවලිත තුනකින් යුත් 3X3$m^2$ක බිම්කඩක් එක් එක් මිශ්‍රන අනුපාතය සඳහා ලබා දෙන ලද අතර හෙක්ටයාරයට ජලය ලීටර් 500ක් ලෙස දියකරන ලදී.

**බුවුන්අවුට් වල් නාශක පරීක්ෂා කිරීම ( 0.2% w/v - SL - *Eucalyptus spp* ශාක සාර) ශාන්ත කූම්බ්ස් වත්ත**

ශාන්ත කූම්බ්ස් වතුයායේ කල පරීක්ෂණයෙහි දී යුකැලිප්ටෝල් 0.2% w/v SL මාත්‍රාවන් 4ක් වන 6ලී/හෙක්, 8ලී/හෙක්,11ලී/හෙක් සහ 14ලී/හෙක් යන අනුපාතයන් ග්ලුෆෝසිනේට් ඇමෝනියම් 1.3ලී/හෙක් (සම්මත 1) හා MCPA 2 ලී/හෙක් (සම්මත 2) යන සම්මත ප්‍රතිකාර සමග පරීක්ෂාවට බඳුන් කරන ලද අතර පාලකය ලෙස වල් ඉවත් නොකිරීමද යොදා ගන්නා ලදී. වල් නාශක යෙදීමෙන් මාස 1 කට පසු පරීක්ෂාවට බඳුන් කළ සියලුම යුකැලිප්ටෝල් මාත්‍රාවන් සම්මත මාත්‍රාවන්ට සාපේක්ෂව සමාන වල් මර්ධනයක් පෙන්නුම් කල අතර වල් නාශක යෙදීමෙන් මාස 3කට පසු පරීක්ෂාවට බඳුන් කල 11ලී/හෙක් යුකැලිප්ටෝල් මාත්‍රාව ග්ලුෆෝසිනේට් ඇමෝනියම් 1.3 ලී/හෙක් (සම්මත 1) හා MCPA 2ලී/හෙක් (සම්මත 2) යන සම්මත ප්‍රතිකාර ද්විත්වයටම වඩා සාපේක්ෂව සැලකිය යුතු වල් මර්ධනයක් පෙන්නුම් කරන ලදී.




යුකැලිප්ටෝල් වල් නාශක යෙදීමෙන් මාස 1කට හා මාස 3කට පසු වල් පැළෑටිවල වියලි බර
තලවකැලේ ශාන්ත කූම්බස් වත්ත

**බුරුන්අවුට් වල් නාශක පරීක්ෂා කිරීම (0.2%w/v –SL -*Eucalyptus* spp ශාක සාර) රත්වත්ත වතුයාය.**

මැදරට සිදු කරන ලද පරීක්ෂාවේදීද ශාන්ත කූම්බ්ස් වතුයායේ යොදාගත් ක්‍රමවේදයම යොදාගන්නා ලදී. මෙහිදී වල් නාශක යෙදීමෙන් මාස 1කට පසු පරීක්ෂාවට බඳුන් කල 6ලී/හෙක්, 8ලී/හෙක්, 11ලී/හෙක් යුකැලිප්ටෝල් මාත්‍රාවන් MCPA 2ලී/හෙක් (සම්මත 2) ට වඩා සාපේක්ෂව සැලකිය යුතු වල් මර්ධනයක් පෙන්නුම් කරන ලද අතර ග්ලූෆෝසිනේට් ඇමෝනියම් 1.3ලී/හෙක් (සම්මත 1) හා සමාන අගයන් පෙන්වන ලදී. මාස 3කට පසු පරීක්ෂාවට බඳුන් කල සියලුම යුකැලිප්ටෝල් මාත්‍රාවන් සම්මත මාත්‍රාවන්ට සාපේක්ෂව සමාන අගයන් පෙන්වන ලදී.




යුකැලිප්ටෝල් වල් නාශක යෙදීමෙන් මාස 1කට හා මාස 3කට පසු වල් පැළෑටිවල වියලි බර
මාතලේ ඇල්කඩුව වත්ත

**බුරුන්අවුට් වල් නාශක පරීක්ෂා කිරීම (0.2%w/v –SL- *Eucalyptus* spp ශාක සාර) පහතරට ශාන්ත ජෝකිම් වතුයාය**

පහතරට සිදු කරන ලද පරීක්ෂාවේදී යුකැලිප්ටෝල් මාත්‍රාවන් 3ක් එනම් 6ලී/හෙක්, 8ලී/හෙක්, 11ලී/හෙක් ග්ලූෆෝසිනේට් ඇමෝනියම් 1.3ලී/හෙක් සම්මතය ලෙසද, පාලකය ලෙස ප්‍රතිකාර නොකළ බිම්කඩ ද යොදාගන්නා ලදී. වල් නාශක යෙදීමෙන් සති 3කට පසු සම්මතයට හා පාලකයට සාපේක්ෂව සැලකිය යුතු වල් මර්ධනයක් පෙන්නුම් නොකල අතර සති 6කට පසු යුකැලිප්ටෝල් 11ලී/හෙක් මාත්‍රාව ග්ලූෆෝසිනේට් ඇමෝනියම් 1.3ලී/හෙක් (සම්මත 1) හා සංසන්දනාත්මකව සමාන අගයන් පෙන්වන ලදී. පහතරට වල්පැලෑටි වල ජෛව ස්කන්ධය අනෙකුත් ප්‍රදේශ වලට වඩා ඉහල අගයක් ගත් අතර වල් පැළෑටි පාලනය වීමේ කාල පරාසයද අඩු විය.




යුකැලිප්ටෝල් වල් නාශක යෙදීමෙන් සති 3කට හා සති 6කට පසු වල් පැළෑටි වල වියළි බර
පහතරට ශාන්ත ජෝකිම් වතුයාය

ඒ අනුව පොදුවේ වල් මර්ධනය සඳහා යුකැලිප්ටෝල් 11 ලී/හෙක් මාත්‍රාව පහතරට ප්‍රදේශයට වඩා සඵලදායී බව ප්‍රතිඵල වලින් අනාවරණය විය.

**ජෛව වල් නාශක පරීක්ෂා කිරීම (පයින් ඔයිල් 25%w/v – SL - පයින් ශාක සාර - Organic Weed Free Rapid Concentrate)**

මෙම වල් නාශකය පයින් ගස් වලින් කඩදාසි සහ පල්ප් නිෂ්පාදනය කිරීමේදී ඉතිරිවන අවශේෂ ද්‍රව්‍ය වලින් ලබා ගැනේ. මෙය ස්පර්ශක වල් නාශකයක් ලෙස ක්‍රියා කරමින් පැළෑටියේ උච්ඡර්මයට හානි කිරීමෙන් පැළෑටිය විජලනයට ලක් කෙරේ.

මෙහිදී පහතරට හා මැදරට ප්‍රදේශ වලදී අඩු මාත්‍රාවෙන් යුත් පයින් ඔයිල් ලීටර 2, 4, 6, 8,10 හා 12/හෙක් යන අනුපාත MCPA 40% 3 ලී/හෙක් + 1% පෘෂ්ඨීය සක්‍රියකාරකය සමග සංසන්දනාත්මකව පරීක්ෂාවට බඳුන් කල අතර වල්පැළෑටි පාලනය කිරීම සඳහා එම අඩු මාත්‍රාවන් ඵලදායි නොවන බව ප්‍රතිඵල වලින් පෙන්නුම් කෙරිණි. එබැවින් උඩරට, පහතරට හා මැදරට කරන ලද පරීක්ෂා වලදී ඉහල මාත්‍රාවෙන් යුත් පයින් ඔයිල් යොදා ගැනිණි.

**පයින් ඔයිල් වල් නාශක පරීක්ෂා කිරීම (වැඩි මාත්‍රාව - OWFRC) ශාන්ත කූම්බ්ස් වතුයාය**

මෙහිදී RCBD ක්‍රමය මගින් ප්‍රතිවලිත තුනකින් යුත් 3X3m$^2$ක බිම්කඩක් එක් එක් මිශ්‍රණ අනුපාතය සඳහා ලබා දෙන ලදී. වැඩි මාත්‍රාවෙන් යුත් පයින් ඔයිල් ලීටර 10, 12, 14, 16, 18, හා 20/හෙක් යන අනුපාත MCPA 40% 3ලී/හෙක් + 1% පෘෂ්ඨීය සක්‍රියකාරකය (සම්මත 1) සමග පරීක්ෂාවට බඳුන් කෙරිනි. මීට අමතරව උඩරට කරන ලද පරීක්ෂාවේදී ඉහත ප්‍රතිකාර වලට අමතරව MCPA 40% 3ලී/හෙක් + 1% පෘෂ්ඨීය සක්‍රියකාරකය - ඩයුරොන් 1.2කි.ග්‍රෑ/හෙක් (සම්මත 2) ද යොදාගන්නා ලදී




පයින් ඔයිල් වල් නාශක යෙදීමෙන් සති 1 කට හා සති 3 කට පසු වල් පැළෑටි වල වියළි බර
උඩරට - ශාන්ත කූම්බස් වතුයාය (* OWRC L/ha, 40% MCPA/ha)

උඩරට පරීක්ෂණයේ ප්‍රතිඵලවල දැක්වෙන ආකාරයට වල් නාශක යෙදීමෙන් සති 1 කට පසු MCPA 40% 3 ලී/හෙක් (සම්මත 1) හා සසඳන විට පයින් ඔයිල් 14ලී, 18ලී/හෙක් යන මිශ්‍රණ වඩා සාපේක්ෂව සැලකිය යුතු වල් මර්ධනයක් පෙන්නුම් කරන ලදී. තවද එම අනුපාතයන් MCPA 40% + ඩයුරොන් 1.2 කි.ග්‍රෑ/හෙක් (සම්මත 2) හා සංසන්දනාත්මක අගයන් පෙන්වන ලදී. පයින් ඔයිල් යෙදීමෙන් සති 3කට පසු 12 ලී - 18ලී/හෙක් අතර අනුපාත T8 සහ T9 සම්මත හා සංසන්දනාත්මක අගයන් පෙන්වන ලදී. වල් නාශක යෙදීමෙන් සති 3කට පසු වල් පැළෑටිවල නැවත වර්ධනයක් පෙන්නුම් කෙරිණි.




පයින් ඔයිල් ප්‍රතිකාර යෙදීමෙන් පසු වල් මර්ධන ප්‍රතිශතය
උඩරට- ශාන්ත කුම්බිස් වතුයාය

පයින් ඔයිල් වල් නාශක යෙදීමෙන් සති 1කට පසු වල් මර්ධන ප්‍රතිශත T4 සිට T7 දක්වා ඉහල මර්ධන ප්‍රතිශතයක් සම්මත T8 සිට T7 ට සාපේක්ෂව පෙන්වන ලදී. සති 3කට පසු T4 සහ T5 මගින් සම්මතයන්ට වඩා ඉහල වල් මර්ධන ප්‍රතිශතයක් පෙන්වන ලදී.




පයින් ඔයිල් ප්‍රතිකාර යෙදීමෙන් සති 1කට හා සති 3කට පසු වල් පැළෑටි වල වියලි බර
මාතලේ ඇල්කඩුව වත්ත

මැදරට සිදු කල පරීක්ෂාවේ පයින් ඔයිල් යෙදීමෙන් සති 1කට පසු 16ලී/හෙක් ප්‍රතිකාරය MCPA 40 (සම්මත 1) හා සංසන්දනාත්මකව සමාන අගයන් පෙන්වන ලදී. යෙදීමෙන් සති 3කට පසු 10 - 20 ලී/හෙක් අතර ප්‍රතිකාරක MCPA 40% + (සම්මත 1) හා සංසන්දනාත්මකව සමාන අගයන් පෙන්වන ලදී.




පයින් ඔයිල් ප්‍රතිකාර යෙදීමෙන් පසු වල් මර්ධන ප්‍රතිශතය
මැදරට - මාතලේ ඇල්කඩුව වත්ත

පයින් ඔයිල් ප්‍රතිකාර යෙදීමෙන් පසු මාස 1කට හා 3කට පසු පරීක්ෂාවට බඳුන් කළ සියලුම පයින් ඔයිල් ප්‍රතිකාර සම්මත මාත්‍රාවන්ට T8 සාපේක්ෂව හා සංසන්දනාත්මකව සමාන අගයන් පෙන්වන ලදී.




පයින් ඔයිල් ප්‍රතිකාර යෙදීමෙන් සති 1කට හා සති 3කට පසු වල් පැළෑටි වල වියළි බර
පහතරට - ශාන්ත ජෝකිම් වතුයාය

පහතරට සිදුකල පරීක්ෂාවේ පයින් ඔයිල් යෙදීමෙන් සති 1 කට පසු සාපේක්ෂව සැලකිය යුතු වල් මර්ධනයක් පෙන්නුම් නොකරන ලදී. සති 1කට පසු 16-20 ලී/හෙක් ප්‍රතිකාරක වල වල් මර්ධනය MCPA 40% + (සම්මත 1) හා සංසන්දනාත්මක අගයන් පෙන්වන ලදී. මෙහිදී සඵලදායි 16-20 ලී/හෙක් ප්‍රතිකාරක හැරුනුවිට MCPA ඇතුලු සියලුම වල් නාශක මගින් පසුකාලිනව වල් පැළෑටි වල නැවත වර්ධනයක් පෙන්නුම් කෙරිණි.




පයින් ඔයිල් ප්‍රතිකාර යෙදීමෙන් පසු වල් මර්ධන ප්‍රතිශතය පහතරට
ශාන්ත ජෝකිම් වතුයාය

පයින් ඔයිල් ප්‍රතිකාර යෙදීමෙන් පසු සති 1කට පසු T3, T4, T5 සහ T7 ප්‍රතිකාරක සම්මත T8 ප්‍රතිකාරකය සමග සංසන්දනාත්මකව සමාන වූ අතර T6 ප්‍රතිකාරකය සම්මත මාත්‍රාවන්ට සාපේක්ෂව සැලකිය යුතු ඉහල වල් මර්ධනයක් පෙන්නුම් කරන ලදී. ප්‍රතිකාර යෙදීමෙන් පසු සති 3කට පසු T3 හා T7 ප්‍රතිකාරක සම්මත T8 ප්‍රතිකාරකය සමග සංසන්දනාත්මකව සමාන වල් මර්ධන ප්‍රතිශතයක් පෙන්වන ලදී.

ප්‍රතිඵල මගින් අනාවරණය වූයේ වල් මර්ධනය කිරීමේදී මැදරට සඳහා පයින් ඔයිල් 14-16 ලී/හෙක් ප්‍රතිකාරකත්, පහතරට සඳහා පයින් ඔයිල් 16 ලී/හෙක් ප්‍රතිකාරකයත් සුදුසු බවයි. නමුත් මෙහිදී පයින් ඔයිල් අවශ්‍ය ප්‍රමාණය අධික වන අතර ඒකාබද්ධ වල් මර්ධනයේදී ගැටකොළ සහ *Cyrtococcum trigonum* වැනි වල් පැළෑටි මර්ධනයට එය භාවිතා කළ හැක.

**Pelargonic Acid (57%) වල් නාශක පරීක්ෂා කිරීම - (වැඩි මාත්‍රාව) ශාන්ත කුම්බස් වතුයාය**

මෙම වල් නාශකය Pelargonium ශාකයෙන් නිස්සාරණය කර ලබා ගනී.

මෙහිදී Pelargonic Acid අඩු මාත්‍රා ( 2.75ලී - 16.5 ලී/හෙක්) වලින් සිදු කරන ලද පරීක්ෂණය සියලුම කලාප වලදී සඵලදායි නොවීය. එබැවින් ශාන්ත කුම්බිස් වතුයායේදී Pelargonic Acid (57%) වැඩි මාත්‍රාවකින් කරන ලද පරීක්ෂණයේ දී 16 ලී/හෙක් 20 ලී/හෙක් 24 ලී/හෙක් ප්‍රතිකාරක සහ 60% MCPA 2 ලී/හෙක් සහ 40% MCPA 3ලී/හෙක් යන සම්මතයන් ප්‍රතිකාර නොකළ පාලකයක් සමග පරීක්ෂා කරන ලදී.




Pelargonic acid ප්‍රතිකාර යෙදීමෙන් පසු සති 1කට පසු, සති 3කට පසු වල් පැළෑටිවල වියලි බර උඩරට - ශාන්ත කුම්බිස් වතුයාය.

ප්‍රතිඵල මගින් Pelargonic acid 20ලී/හෙක් හා 24ලී/හෙක් ප්‍රතිකාරකයන් සම්මත MCPA මාත්‍රාවන්ට සාපේක්ෂව සැලකිය යුතු ඉහල වල් මර්ධනයක් පෙන්නුම් කරන ලදී. මෙහිදී ද Pelargonic acid අවශ්‍ය ප්‍රමාණය අධික බැවින් ඒකාබද්ධ වල් මර්ධනයේදී ගැටකොළ සහ *Paspalum congugatum* වැනි වල් පැළෑටි වර්ග මර්ධනයට එය භාවිතා කල හැක.




Pelargonic acid ප්‍රතිකාර යෙදීමෙන් පසු වල් මර්ධන ප්‍රතිශතය
ශාන්ත කුම්බිස් වතුයාය

**ව්‍යාපෘතිය A 24.2/3 ඒකාබද්ධ වල් මර්ධනය**

මෙම පර්යේෂණය ශාන්ත ජෝකිම් වතුයායේදී පහත ප්‍රතිකාරක සමග 2016 ජූලි මාසයේදී ආරම්භ කරන ලදී.

T1 කළු පොලිතින්

T2 කෘෂිකාර්මික පොලිතින්

T3 ගෝල් 2E

T4 පාලකය

RCBD ක්‍රමය මගින් කොටස් තුනකින් යුත් 3x3m$^2$ ක බිම්කඩක් එක් එක් ප්‍රතිකාරක සඳහා ලබා දෙමින් පර්යේෂණය අපරිණත තේ ක්ෂේත්‍රයක ස්ථාපනය කර ඇත. ප්‍රතිකාරක ආරම්භ කිරීමෙන් මාස 3, 6, 9 සහ 12කින් වල් පැළෑටි වල වියලි බර ලබා ගන්නා ලදී.

පාංශු කාබන්, පාංශු pH පාංශු පොස්ෆරස්, පාංශු හුවමාරු පොටෑසියම්, යන පාංශු පරාමිතීන් ප්‍රතිකාරක ආරම්භ කිරීමට පෙර හා ප්‍රතිකාරක යෙදීමෙන් මාස 6කින් සහ 12කින් ලබා ගන්නා ලදී.

වගුව 1. වල් පැළෑටිවල වියළි බර (කි.ග්‍රෑම්/ බිම්කඩක ට) විවිධ කාලාන්තරවල දී ඒකාබද්ධ වල් මර්ධනය - ශාන්ත ජෝකිම් වතුයාය

| ප්‍රතිකාරක | මාස 3 | මාස 6 | මාස 9 | මාස 12 |
|---|---|---|---|---|
| T1 කළු පොලිතින් | 2.14 b | 2.02 b | 2.44 c | 1.23 a |
| T2 කෘෂිකාර්මික පොලිතින් | 2.36 b | 2.33 b | 3.54 cb | 1.35 a |
| T3 ගෝල් 2E | 2.06 b | 1.98 b | 4.60 b | 2.17 a |
| T4 පාලකය (අතින් වල් නෙලීම) | 5.76 a | 6.71 a | 7.58 a | 3.30 a |
| CV ( %) | 27.04 | 19.02 | 14.35 | 68.39 |
| LSD p = 0.05 | 1.52 | 1.23 | 1.29 | 2.75 |

පරීක්ෂාවට ලක් කළ සියලුම ප්‍රතිකාරකවල ප්‍රතිකාරක ආරම්භ කිරීමෙන් මාස 9ක් වන තෙක් වල් පැළෑටිවල සැලකිය යුතු වියලි බර අඩුවීමක් නිරීක්ෂණය විය. මාස 12කට පසු අතින් වල් ඉවත් කිරීමේ පාලකයට සාපේක්ෂව වල් පැළෑටිවල වියලි බර සැලකිය යුතු වෙනස්කමක් නොපෙන්විය.

වගුව 2. පාංශු pH - ඒකාබද්ධ වල් මර්ධනය - ශාන්ත ජෝකිම් වතුයාය

| ප්‍රතිකාරක | පූර්ව දත්ත | මාස 6 | මාස 12 |
|---|---|---|---|
| T1) කළු පොලිතින් | 4.06 | 4.32 | 4.34 |
| T2) කෘෂිකාර්මික පොලිතින් | 4.10 | 4.30 | 4.47 |
| T3) ගෝල් 2E | 4.10 | 4.17 | 4.32 |
| T4) පාලකය (අතින් වල් නෙලීම) | 4.19 | 4.22 | 4.38 |
| CV ( %) | 3.79 | 3.50 | 3.61 |
| LSD p=0.05 | 0.312 | 0.298 | 0.316 |

ප්‍රතිකාරක ආරම්භ කිරීමෙන් මාස 6 හා 12 අතර පාංශු pH අගයයන්වල සැලකිය යුතු වෙනස්කමක් දක්නට නොමැත.

වගුව 3. පාංශු කාබන් % - ඒකාබද්ධ වල් මර්ධනය - ශාන්ත ජෝකිම් වතුයාය

| ප්‍රතිකාරක | පූර්ව දත්ත | මාස 6 | මාස 12 |
|---|---|---|---|
| T1 කළු පොලිතින් | 1.10 | 1.15 a | 1.19 a |
| T2 කෘෂිකාර්මික පොලිතින් | 1.10 | 1.15 a | 1.20 a |
| T3 ගෝල් 2E | 1.05 | 1.08 b | 1.05 b |
| T4 පාලකය (අතින් වල් නෙලීම) | 1.11 | 1.13 a | 1.19 a |
| CV ( %) | 4.35 | 1.17 | 4.33 |
| LSD p=0.05 | 0.0967 | 0.0383 | 0.1003 |

අනෙකුත් ප්‍රතිකාරක හා සසඳන විට ගෝල් 2E හි පාංශු කාබන් අගයෙහි සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබිනි.

වගුව 4. පාංශු නයිට්‍රජන් %- ඒකාබද්ධ වල් මර්ධනය - ශාන්ත ජෝකිම් වතුයා

| ප්‍රතිකාරක | පූර්ව දත්ත | මාස 6 | මාස 12 |
|---|---|---|---|
| T1 කළු පොලිතින් | 0.189 | 0.203 a | 0.206 a |
| T2 කෘෂිකාර්මික පොලිතින් | 0.191 | 0.196 a | 0.203 a |
| T3 ගෝල් 2E | 0.184 | 0.179 b | 0.189 b |
| T4 පාලකය (අතින් වල් නෙලීම) | 0.191 | 0.189 ab | 0.205 a |
| CV ( %) | 6.14 | 4.21 | 2.99 |
| LSD p=0.05 | 0.0232 | 0.016 | 0.012 |

අනෙකුත් ප්‍රතිකාරක හා සසඳන විට ගෝල් 2E හි පාංශු නයිට්‍රජන් අගයෙහි සැළකිය යුතු අඩුවීමක් දක්නට ලැබිනි.

වගුව 5. පාංශු පොටෑසියම් - ඒකාබද්ධ වල් මර්ධනය - ශාන්ත ජෝකිම් වතුයාය

| ප්‍රතිකාරක | පූර්ව දත්ත | මාස 6 | මාස 12 |
|---|---|---|---|
| T1 කළු පොලිතින් | 100.36 | 101.77 | 113.7 |
| T2 කෘෂිකාර්මික පොලිතින් | 89.96 | 94.93 | 110.3 |
| T3 ගෝල් 2E | 99.77 | 96.30 | 103.6 |
| T4 පාලකය (අතින් වල් නෙලීම) | 94.33 | 99.73 | 114.4 |
| CV ( %) | 8.12 | 6.52 | 8.94 |
| LSD p=0.05 | 15.61 | 12.79 | 19.73 |

අනෙකුත් ප්‍රතිකාරක හා සසඳන විට පාංශු හුවමාරු කැටායන(පොටෑසියම්) අගයන් වල සැළකිය යුතු වෙනස්කමක් දක්නට නොමැත.

වගුව 6. පාංශු පොස්ෆරස් ඒකාබද්ධ වල් මර්ධනය ශාන්ත ජෝකිම් වතුයාය

| ප්‍රතිකාරක | පූර්ව දත්ත | මාස 6 | මාස 12 |
|---|---|---|---|
| T1 කළු පොලිතින් | 25.07 | 22.50 | 27.47 a |
| T2 කෘෂිකාර්මික පොලිතින් | 20.70 | 21.27 | 21.73 b |
| T3 ගෝල් 2E | 19.93 | 20.87 | 20.20 b |
| T4 පාලකය (අතින් වල් නෙලීම) | 23.17 | 22.57 | 25.10 ab |
| CV ( %) | 15.83 | 14.39 | 11.28 |
| LSD p=0.05 | 7.028 | 6.55 | 5.325 |

ප්‍රතිකාරක ආරම්භ කිරීමෙන් මාස 12 කට පසු කළු පොලිතින් ප්‍රතිකාරකය හා පාලකයෙහි පාංශු පොස්ෆරස් අගයෙහි සැළකිය යුතු වැඩිවීමක් දක්නට ලැබිනි.

මෙම ප්‍රතිඵල මගින් අනාවරණය වූවේ සම්මත ගෝල් 2E වල්නාශකයට සාපේක්ෂව කෘතිම වසුන් (කළු පොලිතින් හා කෘෂිකාර්මික පොලිතින්) වඩා සඵලදායී බවයි. මෙහිදී ගෝල් 2E අදාල නිර්දේශ වලට අනුකූලව වසරකට දෙවතාවක් පමණක් යොදන ලදී.

*එම් එස් ඩී එල් ද සිල්වා සහ ඒ ඩබ් ටී පී ප්‍රේමතුංග*



**ව්‍යාපෘතිය A50.1 ගෝලීය දේශගුණික විපර්යාසයන් සඳහා තේ ශාකයේ කායික විද්‍යාත්මක ප්‍රතිචාර අධ්‍යයනය කිරීම**

ප්‍රධාන පාරිසරික පරාමිතිකයන් වන උෂ්ණත්වය සහ වර්ෂාපතනය, තේ අස්වැන්නට බලපාන ආකාරය පිළිබඳව අධ්‍යයනය කරන ලදී.

එස්ඩීජීවීඑම් වගා ආකෘතිය නියත සහ වෙනස්වන වායුගෝලීය කාබන් ඩයොක්සයිඩ් සාන්ද්‍රන යටතේ ක්‍රියාත්මක කිරීම මගින් අනාගත තේ අස්වැන්න සඳහා සාමාන්‍ය මාසික උෂ්ණත්වය සහ වාර්ෂික වර්ෂාපතනයේ සම්බන්ධතාවය නිර්ණය කරන ලදී. මෙහිදී අනාගත තේ අස්වැන්න සඳහා වායුගෝලීය කාබන් ඩයොක්සයිඩ් සාන්ද්‍රණයේ සහ වර්ෂාපතනයේ බලපෑම ධනාත්මක බවද, උෂණාත්වයේ බලපෑම ඍණාත්මක බවද සොයා ගන්නා ලදී. තවද උෂ්ණත්වයේ බලපෑම, වර්ෂාපතනයේ බලපෑම සමග සසදනවිට ඉතා ඉහළ බවද සොයා ගන්නා ලදී. ආකෘති පුරෝකතනයන්ගේ නිරවද්‍යතාවය උඩරට, මැදරට සහ පහතරට ප්‍රදේශයන්ගෙන් 2009-2012 කාලය තුලදී ලබා ගන්නා ලද තේ ශාකයේ ජීවී ස්කන්ධයන්, සාමාන්‍ය දෛනික උෂ්ණත්වය සහ වාර්ෂික වර්ෂාපතනය යොදාගනිමින් තව දුරටත් තහවුරු කරන ලදී. මෙම පර්යේෂණය ඉදිරියටත් සිදුකෙරෙමින් පවතී.

*ටී එල් විජේරත්න, ඩී. එම්. එස්. නවරත්න, එම්. එම්. එන්. දමයන්ති, වි. සිදාකරන්,*
*වී පී ආර් පී වී පතිරණ සහ ජේ එම් ඩි කොස්තා (පේරාදෙණිය විශ්වවිද්‍යාලය)*

**ව්‍යාපෘතිය A50.3. තේ වගා කරනු ලබන විවිධ ප්‍රදේශ සඳහා කාබන් අය වැය වාර්තා පිළියෙල කිරීම**

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ තේ වගාවේ කාබන් අය වැය ලේඛනය පිළියෙල කිරීමයි. මෙහිදී තේ වගා භූමියේ පාංශු ස්වසනය, තේ වගාකරන විවිධ උච්චත්වයන් සහ පාංශු ශ්‍රේණි සඳහා වෙන වෙනම ගණනය කිරීම සිදුකරනු ලබයි.

මැදරට ප්‍රදේශය වෙනුවෙන්, මහනුවර පාංශු ශ්‍රේණිය සඳහා පාංශු ස්වසනය පැයකට වර්ග මීටරයකට කාබන් ඩයොක්සයිඩ් වායුව මිලි ග්‍රෑම් 16.97 – 24.93 ලෙස නිකුත් වන බව සොයා ගන්නා ලදී. තවද මේ සඳහා බලපෑ හැකි විවිධ පරාමිතීන් තනි තනිව සැලකීමේදී, පාංශු උෂ්ණත්වය ඍණාත්මකවද පාංශු තෙතමනය සහ පාංශු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයන් ධනාත්මකවද බලපාන බවත්, සියලුම පරාමිතීන් එක්ව සැලකීමේදී පාංශු තෙතමනය සහ පාංශු උෂ්ණත්වය පිළිවෙලින් ධනාත්මකව සහ ඍණාත්මකව බලපාන බවත් සොයා ගන්නා ලදී. මෙම පර්යේෂණය ඉදිරියටත් සිදුකෙරෙමින් පවතී.

*ටී එල් විජේරත්න, වී සිදාකරන්, වී පී ආර් පී වී පතිරණ සහ ඒ සිවාප්‍රියදර්ශනි*

**ව්‍යාපෘතිය A 50.5 දේශගුණික විපර්යාස පිළිබඳ අධ්‍යයන, ග්‍රාහී ප්‍රදේශ හඳුනා ගැනීම හා කාලගුණික වෙනස්කම් පුරෝකථනය**

තේ වගාකරන ප්‍රදේශවල වර්ෂාපතනය හා උෂ්ණත්වය වෙනස් වී ඇති ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීම පිණිස කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සමග මෙම ව්‍යාපෘතිය 2012 වසරේ දී ආරම්භ කරන ලදි. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා සමග කරන ලද සාකච්ඡාවලට අනුව ඉදිරි මෝසම් වැසි පිළිබඳ පුරෝකථන මේ වන විට ගොවීන්ට ලබා දේ. මෙම විස්තර තේ පර්යේෂණායතන වෙබ් අඩවිය හරහා තේ වගාකරුවන්ට පහසුවෙන් ලබා ගැනීමටද පුළුවන. වර්ෂාපතනය හා උෂ්ණත්ව වෙනස්කම් පිළිබඳ අධ්‍යයනය තුලින් දේශගුණ විපර්යාසවලට වැඩිපුර භාජනය වියහැකි කලාප හඳුනාගන්නා ලද අතර ඒවා සිතියම්ගත කර ඇත. ඒ පිළිබඳව තේ වගා කරුවන් දැනුම්වත් කිරීමට සම්මන්ත්‍රණ වැඩ මුළු හා වෙනත් පත්‍රිකා උපයෝගී කර ගන්නා ලදී. මේ පිළිබඳව පෝස්ටර්, පත්‍රිකා සකස් කර තේ කර්මාන්තයට වසර 150 ක් පිරීම නිමිති කරගෙන පැවැත්වූ ප්‍රදර්ශන සඳහා භාවිතා කරන ලදී. මීට අමතරව බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ මාර්තු 31 සිට අප්‍රේල් 4 දක්වා පැවැත්වූ තිරසර යුගයක හරිත උදානය ප්‍රදර්ශනයට දේශගුණ විපර්යාසවල බලපෑම් පිළිබඳ දේශනයක් පවත්වන ලදී . ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ පැවැත්වූ විශේෂ වැඩ මුලුවක දීද දේශගුණික බලපෑම් නිසා තේ වගාව ආශ්‍රිතව සිදුවන ස්වභාවික විපත් පිළිබඳව දේශනයන් ශෂ්‍ය විද්‍යා අංශය මගින් ඉදිරිපත් කරන ලදී. මේ පිළිබඳව කුඩා තේ ගොවීන්ට දැනුම ලබාදීමට දිනමිණ පුවත්පතේ වැවිලි සවිය අතිරේකයට ලිපියක් සකස් කර පලකරන ලදී. තේ වගා ආශ්‍රිත ස්වභාවික විපත් අවම කර ගැනීමට පිළිපැදිය යුතු පිළිවෙත් අඩංගු සැලසුම් සකස් කරන ලදී. මීට අමතරව බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වූ විවිධ ප්‍රදර්ශන සඳහා ප්‍රදර්ශන කුටි හා පොස්ටර් ආදිය ශෂ්‍ය විද්‍යා අංශය මගින් සකස් කරන ලදී.

*එම් ඒ විජේරත්න සහ පද්මිනි ප්‍රේමතුංග*

**ව්‍යාපෘතිය A 50. 4 දේශගුණික විපර්යාසයන් තේ වගාවේ පළිබෝධ කෙරෙහි බලපෑම අධ්‍යයනය කිරීම**

පළිබෝධකයන්, ස්වභාවික සතුරන් හා ඔවුන් අතර අන්තර් සම්බන්ධතා යනාදිය කෙරෙහි දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම අධ්‍යයනයේ මූලික අදියරයක් ලෙස තේ වගාවේ වටපණු විශේෂයන් පිළිබඳ අධ්‍යයනය ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රදේශ  හයක ක්ෂේත්‍රවලින් ලබාගත් ප්‍රැටිලෙන්චස් ලුසයි වටපණු ගහණයන්ගේ රූපාකාරය, ජානමය, රෝගකාරක හැකියාව හා රෝග ලක්ෂණවල වෙනස්කම් පිළිබඳ අධ්‍යයනය පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහනක් යටතේ සිදු කෙරිණි. සිසිල්ටන් වත්ත (PL 1), ඩෙල්මා වත්ත  (PL 2), හපුගස්තැන්න (PL 3), මහදෝව වත්ත (PL 4), රිච්ලන්ඩ් වත්ත (PL 6), හා නාවලපිටියේ කුඩා තේ වතු හිමි ඉඩම (PL 5) තෝරා ගත් ක්ෂේත්‍ර වේ.

මෙම අධ්‍යයනයේදී පාංශු උෂ්ණත්වය, වර්ෂාපතනය, ප්‍රැටිලෙන්චස් ලුසයි වටපණුවාගේ ගහණය මෙන්ම වටපණු හානිය ගැනද පර්යේෂණ සිදු කරන ලද අතර මසකට වරක් දත්ත ලබාගන්නා ලදී. මෙහිදී ඉහත සඳහන් කළ ක්ෂේත්‍ර හයේදී පර්යේෂණ සිදු කෙරණි. මෙම ක්ෂේත්‍ර හයෙහි පාංශු උෂ්ණත්වය වර්ෂාපතනය සහ පසේ තෙතමනය යන දත්ත වල වෙනස්කම් මඟින් වටපණුවන්ගේ චර්යාව වටපණු ඝනත්වය සහ රෝග ලක්‍ෂණ පිළිබඳව අධ්‍යයනය කරන ලදී.

එම ක්ෂේත්‍රවල පවත්වා ගෙන ගිය TRI 2024 පැළ උදුරා ඒවායේ වර්ධනය පිළිබඳ හා මුලේ වටපණු ගහණය පිළිබඳ දත්ත අධ්‍යයනය කරන ලදී. පැළයේ  උස, පත්‍ර සංඛ්‍යාව, මල් හා ඵල සංඛ්‍යාව, ශාකයේ හා මුල් වල බර, මුලේ දිග යන පරාමිතික අධ්‍යයනය කරන ලදී. මුලේ සම්පූර්ණ දිග හා මුලේ ශ්වසනය පිළිබඳ දත්තද අධ්‍යයනය කෙරිණ. මුලේ කැඩී ගිය කුඩා කොටස්ද පරීක්ෂාවට ලක් කරන ලදී.

**ප්‍රැටිලෙන්චස් ලුසයි වටපණු ගහණයේ විවිධ රූපාකාරයන්  අධ්‍යයනය**

ඉහත සඳහන් කල ක්ෂේත්‍රවලින් ලබාගත් ප්‍රැටිලෙන්චස් ලුසයි වටපණුවාගේ රූපාකාරය අධ්‍යයනයෙන් ලද ප්‍රතිඵල වලට අනුව පරීක්ෂාවට ලක් කල ප්‍රැටිලෙන්චස් ලුසයි වටපණු ගහණ හය කණ්ඩායම් හතරකට බෙදිය හැකි විය. මෙහිදී PL 2 හා PL 4 වටපණු ගහණ අනෙකුත් ගහණයන්ගෙන් වෙනස් බව අනාවරණය විය.

**ප්‍රැටිලෙන්චස් ලුසයි වටපණු ගහණයේ ජාන විද්‍යාත්මක අධ්‍යයනය**

ඉහත සඳහන් කල ක්ෂේත්‍රවලින් ලබාගත් ප්‍රැටිලෙන්චස් ලුසයි වටපණුවන්ගේ ජාන විද්‍යාත්මක  අධ්‍යයනය ඔස්ට්‍රේලියාවේ මර්ඩොක් විශ්ව විද්‍යාලයේදී සිදු කෙරිණ. මෙහිදී ලද ප්‍රතිඵල වලට අනුව පරීක්ෂාවට ලක් කල ප්‍රැටිලෙන්චස් ලුසයි වටපණු ගහණ හය කණ්ඩායම් හතරකට බෙදිය හැකි විය. මෙම ප්‍රතිඵල එම වටපණු ගහණයන්ගේ රූපාකාරය අධ්‍යයනයෙන් ලද ප්‍රතිඵල සමඟ නැඹුරුතාවයක් පෙන්වන ලදී.

සියලු අධ්‍යයන ප්‍රතිඵල වලට අනුව පරීක්ෂාවට ලක් කල ප්‍රැටිලෙන්චස් ලුසයි වටපණු ගහණයන් රූපාකාරය, ජානමය, රෝගකාරක හැකියාව මෙන්ම ආසාදනයට ලක් කිරීම නිසා තේ ගසේ පෙන්වන රෝග ලක්ෂණ යනාදී කරුණු අතින් වෙනස් බව නිර්ණය කරන ලදී.

*කීර්ති මොහොට්ටි, පී පී ඩී එස් අමරසේන සහ ඒ කේ ප්‍රේමතුංග*

**කාලගුණික දත්ත රැස් කිරීම**

C/MET ව්‍යාපෘතියෙහි දත්ත එකතු කිරීම, විශ්ලේෂණය, හා තලවාකැලේ, මහනුවර, රත්නපුර, දෙනියාය, කොට්ටව, පස්සර යන ස්ථාන වල කෘෂි කාලගුණික මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සිදුකෙරේ. වර්ෂාපතනයේ හිරු එළියෙ හි මාසික සාරාංශ ගත දත්ත ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත යැවීම සිදු කෙරිණි.



**ව්‍යාපෘතිය 20.8 යාන්ත්‍රික දලු නෙලීම කෙරෙහි තේ (*Camellia sinensis)* බෝගයේ අස්වැන්න සහ වර්ධනය දක්වන ප්‍රතිචාරය පිලිබඳ ශාක කායික විද්‍යාත්මක අධ්‍යයනය (2013)**

**පර්යේෂණය : තේ දලු නෙලන යන්ත්‍රවල ඇති ගැටළු හඳුනාගැනීම**
මෙහි දී වෙලඳපලෙ හි ඇති තේ දලු නෙලන යන්ත්‍ර තුනක් සාමාන්‍ය අතින් දලු නෙලීම සමග සසඳන ලදී. පර්යේෂණ ප්‍රතිකාරක පහත පරිදි විය.

1. අතින් දලු නෙලීම (දලු වටය දින 7යි) (පාලකය)
2. පෙට්‍රල් මගින් ක්‍රියාකරන කවසාකි යන්ත්‍රය (දලු වටය දින 14යි)
3. බැටරියෙන් ක්‍රියාකරන කවසාකි යන්ත්‍රය (දලු වටය දින 14යි)
4. බැටරියෙන් ක්‍රියාකරන හෝබිස් ඇන්ඩ් වෝකර් යන්ත්‍රය (දලු වටය දින 14යි)

අතින් දලු නෙලීමේ දී ලැබෙන නිම් තේ අස්වැන්න යන්ත්‍ර වලින් ලැබෙන අස්වැන්නට සාපේක්ෂව ඉතා ඉහල අගයකි. එක් එක් යන්ත්‍රය මගින් ලබාදුන් වාර්ෂික අස්වනු වල සැලකියයුතු වෙනසක් දක්නට නොවිය. අතින් නෙලීමට සාපේක්ෂව එක් එක් යන්ත්‍රය වසර පුරා භාවිතා කිරීම නිසා සිදුවූ අස්වනු හානිය 46%ක් (පෙට්‍රල් - කවසාකි) 54%ක් (බැටරි - කවසාකි) සහ 51%ක් (බැටරි - හෝබිස්) ලෙස සටහන් විය. එක් එක් යන්ත්‍රය මගින් තේ අමු දලු අස්වැන්නට එකතු වූ මේරූ කොල/නටු කැබලි ආදිය හෝබිස් යන්ත්‍රයේ අවම අගයක් (7.13%) වූ අතර බැටරියෙන් ක්‍රියාකරන කවසාකි යන්ත්‍රයේ එය උපරිම අගයක් (14.84%) විය. පෙට්‍රල් මගින් ක්‍රියා කරන කවසාකි යන්ත්‍රය අතරමැදි අගයක් (11.67%) වාර්තා කරන ලදී. ද්විතික අතු වල වට ප්‍රමාණය අතුවල විශ්කම්භය ලෙස වර්නියර් කැලිපරයකින් මනින ලදී. මෙය ශාකයේ වර්ධනය පිලිබඳව අදහසක් ලබා දෙන මිම්මකි. ප්‍රතිඵලය අනුව, අතින් දලු නෙලීමේදී අතු වල වට ප්‍රමාණය සැලකියයුතු ඉහල අගයක් වන බව පෙනේ. පර්යේෂණය ආරම්භයේ මුල්වල අඩංගු පිෂ්ඨ සංචිතවල කිසිදු වෙනසක් නිරීක්ෂණය නොකරන ලදී. සය මසකට පසුව අතින් නෙලීමට සාපේක්ෂව කවසාකි යන්ත්‍ර (පෙට්‍රල් / බැටරි) භාවිතා කල තේ පඳුරු වල පිෂ්ඨ සංචිත වල අඩුවක් දක්නට වූ අතර, පර්යේෂණය අවසානයේ (මාස 12කට පසු) සියළු යන්ත්‍ර මගින් එසේ පිෂ්ඨ සංචිත අඩු කරන බව නිරීක්ෂණය කරන ලදී.

**දලු නෙලන තලයේ උස වෙනස් වීම**

දලු නෙලන තලයේ උස වැඩිවීම යනු එහි ඉහල ස්ථරයට අළුතින් පත්‍ර එකතු වීමයි. පර්යේෂණය ආරම්භකර මාස 6කට පසුව දලු මට්ටටමේ උස උපරිමයක් වාර්තා කලේ අතින් දලු නෙලීම මගිනි. සියළු යන්ත්‍ර එයට වඩා අඩු ප්‍රමාණයකින් දළු තලයේ උස වැඩිකර තිබිණ. බැටරියෙන් ක්‍රියා කරන ෆෝබිස් යන්ත්‍රය, යන්ත්‍ර අතරින් ඉහලම අගය වාර්තා කල අතර, අවමය බැටරි බලයෙන් ක්‍රියා කරන කවසාකි යන්ත්‍රයෙන් වාර්තා විය. වසරක් අවසානයේදී එම අගය අතින් නෙලූ තේ පඳුරු වල උපරිමයක් වූ අතර කවසාකි යන්ත්‍ර දෙකම අවම අගයක් පෙන්වන ලදී. ෆොබිස් යන්ත්‍රය අතරමැදි අගයක් වාර්තා කරන ලදී. මෙසේ, යන්ත්‍ර මගින් නඩත්තු පත්‍ර කපා ඉවත් කිරීමක් සිදුවන බව වාර්තා විය.

**දලු නෙලීමට ගතවූ කාලය සහ වියදම් වූ ඉන්ධන ප්‍රමාණයන්**

අතින් දලු නෙලීමේදී දිනකට හෙක්ටයාර 0.158 (අක්කර 0.39) ක් ද, ෆෝබිස් යන්ත්‍රය මගින් 0.168 (අක්කර 0.42) ක් ද බැටරියෙන් ක්‍රියා කරන කවසාකි යන්ත්‍රය මගින් 0.246 (අක්කර 0.61) ක් ද පෙට්‍රල් වලින් ක්‍රියා කරන කවසාකි යන්ත්‍රය මගින් 0.474 (අක්කර 1.18) ක්ද ආවරණය කල හැකි බව රැස් කරගත් දත්ත ආශ්‍රයෙන් ගණනය කරන ලදී. පෙට්‍රල් බලයෙන් ක්‍රියා කරන යන්ත්‍රය සඳහා දිනකට පෙට්‍රල් ලීටර 4.5 – 5.5 ක් වියදම් වූ අතර, බැටරි බලයෙන් ක්‍රියා කරන යන්ත්‍ර වල බැටරි එක් වරක් (පැය 12-8) ආරෝපණය කල පසු, පැය 7-5ක් පමණ ක්‍රියා කරවිය හැකි විය. අවශ්‍ය දත්ත එකතු කරගැනීම අවසන් කර පර්යේෂණය නතර කරන ලදී.

*එස් ආර් ඩබ් පතිරණගේ සහ පී ප්‍රේමතුංග*

**ව්‍යාපෘතිය A 20.3. කුඩා තේ වතු කෙෂ්ත්‍රවල යන්ත්‍ර ප්‍රචලිත කිරීම**

2013 වර්ෂයේ අයවැය ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 100 ක් මෙම ව්‍යාපෘතියට වෙන් කරන ලදී. වැවිලි කර්මාන්ත අමාත්‍යංශයේ අධීක්ෂණයෙන්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය, කුඩා තේ වතු සමිති සම්මේලනය හා එක්ව ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය මෙම ව්‍යාපෘතිය මෙහෙයවනු ලැබේ. මේ සඳහා වෙන් කල මුළු මුදලින් රුපියල් මිලියන 48 ක් ශ්‍රී ලංකා පර්යේෂණායතනයට ලැබී තිබේ.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ දළු නෙලන යන්ත්‍ර, කප්පාදු යන්ත්‍ර හා වලවල් හාරන යන්ත්‍ර භාවිතය ප්‍රචලිත කිරීම, කුඩා තේ ඉඩම් හිමියන් ඒ සඳහා පුහුණු කිරීම, දැනට වෙළඳපොලේ පවතින යන්ත්‍රවල අඩුපාඩු පිළිබඳව සොයා බලා ඒවාට පිලියම් යෝජනා කිරීම ආදියයි. මේ සඳහා දළු නෙලන කතුරු, දළු නෙලන යන්ත්‍ර , කප්පාදු යන්ත්‍ර හා වලවල් හාරන යන්ත්‍ර තේ පර්යේෂණායතනයෙන් මිලට ගෙන කුඩා තේ වතු සමිතිවලට හා අමු දලු මිලට ගන්නා තේ කර්මාන්තශාලාවලට බෙදා දී ඇත.

අදාල වර්ෂය තුලදී පාර්ශ්වකරුවන් හා එක්ව සාකච්ඡා වට කිහිපයක් පැවැත් වූ අතර භාවිතා නොවන යන්ත්‍ර නැවත ලබාගෙන විශාල ඉඩම් හිමි තේ වැවිලි කරුවන්ට ලබාදීමට කටයුතු යොදා තිබේ. සීමාසහිත හේලීස් සමාගම, ෆිගාරෝ සමාගම හා ෆාම්ලයිට් සමාගම මගින් සපයන ලද තනි පුද්ගලයකු සහ දෙදෙනෙකු විසින් හසුරුවන වලවල් හාරන යන්ත්‍ර කෙෂ්ත්‍ර පරීක්ෂාවට ලක් කරන ලදී .

තනි පුද්ගලයකු හසුරුවන යන්ත්‍රයේ කාර්යක්ෂමතාව පැයකට වලවල් 100-150 ක් වන අතර දෙදෙනෙකු හසුරුවන යන්ත්‍ර සඳහා එම ප්‍රමාණය 150-225 ක් අතර විය. ඉන්ධන භාවිතය පිලිවෙලින් පැයකට ලීටර් 1.5 - 0.8 ක් හා 2.7 - 1ක් වේ. ඉතිරි වී ඇති මුදල් ප්‍රතිපාදන සලකා බලා තනි පුද්ගලයෙකු හසුරුවන වලවල් හාරන වලවල් හාරන යන්ත්‍ර 18 ක් මිලට ගැනීමට කටයුතු යොදා ඇත. මීට අමතර ව ශෂ්‍ය විද්‍යා අංශයේ නිලධාරීන් විසින් පහතරට තේ වැවිලි කරුවන්ගේ සංගමයේ නියෝජිතයන් කණ්ඩායමක් හා කහවත්ත වැවිලි සමාගමේ දලු නෙලන්නියන් 200 ක් පමණ තේ දළු නෙලන කතුරු භාවිතයට පුහුණු කරන ලදී .

ක්ෂේත්‍ර ක්‍රියා යාන්ත්‍රීකරණයේ අවශ්‍යතාව හා වාසි විදහා දැක්වෙන පෝස්ටර් සකස් කර තේ වවන ප්‍රදේශවල පවත්වන ලද ප්‍රදර්ශන සඳහා භාවිතා කරන ලදී. ශෂ්‍ය විද්‍යා අංශය මගින් කතුරු මගින් දළු නෙලීම හා ගැඹුරට පොහොර යොදනය ආශ්‍රිතව සකස් කල ප්‍රදර්ශන ආකෘති බණ්ඩාරණායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ අගෝස්තු 11-13 පැවති ප්‍රදර්ශනයට එක් කරන ලදී. යන්ත්‍රානුසාරයෙන් දළු නෙලීම පිළිබඳව තේ කර්මාන්තයේ පාර්ශ්වකරුවන් විශාල ගණනක් මෙහි දී දැනුවත් කරන ලදී .

*එම් ඒ විජේරත්න, එස් රත්නායක සහ එස් ආර් ඩබ් පතිරණගේ*



**ව්‍යාපෘතිය A 53.2. තවාන් මලුවල ප්‍රමාණය තේ (*Camellia sinensis . L*) ශාකයේ වර්ධනයට සිදු කරන බලපෑම අධ්‍යයනය කිරීම**

අවම පස් ප්‍රමාණයක් යොදාගනිමින් ගුණාත්මක තත්වයේ ඇති තවාන් පැලයක් සාදා ගැනීම සඳහා පර්යේෂණයක් 2013 වසරේදී TRI 4052 ප්‍රභේදය යොදා ගනිමින් ශාන්ත කුම්බිස් වත්තේ ආරම්භ කරන ලදී. තෙවන වසරේදී පහත ප්‍රතිඵල දැකිය හැකි විය.

| ප්‍රතිකාර තවාන් මල්ල (අඟල්) | නිමි තේ අස්වැන්න (kg/ha) |
|---|---|
| 3 X 5 | 2982.7[a] |
| 5 X 5 | 2958.1[a] |
| 3 X 6 | 2831.4[a,b] |
| 3 X 9 | 2754.5[a,b,c] |
| 5 X 9 | 2698.2[a,b,c,d] |
| 4 X 5 | 2598.9[a,b,c,d] |
| 5 X 7 | 2563.5[a,b,c,d] |
| 4 X 9 | 2477.8[b,c,d] |
| 5 X 6 | 2451.5[b,c,d] |
| 4 X 7 | 2410.4[b,c,d] |
| 4 X 6 | 2283.2[c,d] |
| 3 X 7 | 2270.3[d] |

**පරිසර හිතකාමී වර්ධන මාධ්‍යයන්ගේ බලපෑම තේ ශාක වර්ධනයට සහ පාංශු තත්වයන් කෙරෙහි දක්වන බලපෑම**

මෙම පරීක්ෂණය යටතේ අඟුරු, දහයියා සහ කසල තේ වලින් සාදන ලද ජෛව අඟුරු, තේ තවාන් මල්ලේ පහල කොටසේ තවාන් මිශ්‍රණයක් ලෙස යොදා ගැනීම අධ්‍යයනය කරන ලදී. ප්‍රතිපල වලින් පෙනී යන ලද්දේ අඟුරු 1.2 අනුපාතයෙන් මිශ්‍ර කිරීම හොඳින් පාංශු තෙතමනය රැක ගැනීම සඳහා උදවු වන අතර, එමගින් නියඟ තත්ත්ව යටතේ අඩු මරණ සංඛ්‍යාවක් වාර්තා කරන ලද බවය.



**තේ කර්මාන්ත ශාලා සහ ඒවායේ තේ නිෂ්පාදනයට භාවිත යන්ත්‍ර සූත්‍රවල තත්ත්වය වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම.**
**තේ කර්මාන්ත ශාලාවල සහ තේ යන්ත්‍රෝපකරණ වල තත්ත්වය වැඩි දියුණු කිරීම**
**තේ නිෂ්පාදනය ස්වයංක්‍රීය කිරීමට සහ නිෂ්පාදන පිරිවැය අඩු කර ගැනීම සඳහා ක්‍රමෝපායයන් සංවර්ධනය කිරීම.**

**ව්‍යාපෘතිය A 48.3. ද්‍රෝණිකාවල තව් මැරීමේ ක්‍රියාවලියේදී වැය වන විද්‍යුත් ශක්තියේ කාර්යක්ෂමතාවය ප්‍රශස්ත කරලීම පිණිස තත්කාලීන තාප හා ස්කන්ධ හුවමාරුව සඳහා සකස් කල ගණිතමය ආදර්ශය ප්‍රයෝජනයට ගැනීම**
බොහෝ කර්මාන්ත ශාලා වල තව් මැරීමේ ක්‍රියාවලිය නිසි අවධානයකින් තොරව සිදු කිරීම නිසා ඒ සඳහා වැය වන බලශක්තිය අපතේ යන අතර එමගින් තව් මැරූ දලුවල ගුණාත්මක බවට ද හානි සිදු වේ. මෙම ක්‍රියාවලිය පහසුවෙන් පාලනය කිරීමට වැදගත් වන තව් මැරූ දලු වල තත්කාලීන තෙතමන ප්‍රමාණය (real time moisture) නිර්ණය කිරීම පිණිස ගණිතමය ආදර්ශයක් ගොඩ නගන ලදී.

තව් මැරීමේ ක්‍රියාවලියට අවශ්‍ය කරන පරාමිතීන් පාලනය කිරීම සඳහා ස්වයංක්‍රීයව පාලනය වන තව් මැරීමේ පාලන පද්ධතියක් නිර්මාණය කිරීම පිණිස පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම ඉංජිනේරු දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. ජාතික විද්‍යා පදනම (N.S.F) මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍යමය ප්‍රතිපාදන සැපයීම තව දුරටත් සිදු කරනු ලැබේ.

$25^0$C සහ $28^0$C වියලි බල්බ උෂ්ණත්වයන්ට පයිතන් පරිඝණක භාෂාව (Python Language) මගින් සංවර්ධනය කරන ලද ආකෘතියට අනුව විවිධ සාපේක්ෂ ආර්ද්‍රතාවයන් සඳහා සම්මත තව් මැරීමේ වක්‍ර ලබා ගන්නා ලදී. තවද,තව් මැරීමේ ක්‍රියාවලියේදී බලපාන ස්ථිතික පීඩනය හා වායු ධාරාව සම්බන්ධ කරමින් ආනුභවිත ආදර්ශයක් සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී. පයිතන් පරිඝණක භාෂාව උපයෝගි කර ගනිමින්ම සමීකරණ නිර්මාණය කර අවශ්‍ය කරන ඉලෙක්ට්‍රොනික උපාංග ද නිර්මාණය කර ඇත. උෂ්ණත්වයන් හා සාපේක්ෂ ආර්ද්‍රතා අගයයන් ලබා ගැනීමට ප්‍රතිසම සංඛ්‍යාංක අනුවර්තකයක් (Analogue to Digital Converter - ADC pi plus) අදාල ගබඩා තුල ස්ථාපනය කිරීමට ඉලෙක්ට්‍රොනික යාකරණයක් (Electronic Interface Unit) නිර්මාණය කරන ලදී. උෂ්ණත්ව සහ සාපේක්ෂ ආර්ද්‍රතා දත්ත අනුව තත්කාලීන තෙතමන ප්‍රමාණය ලබා ගනිමින් මෙම පයිතන් පරිඝණක වැඩ සටහනේ නිරවද්‍යතාවය තහවුරු කරන ලදී.

තවද, තව් මැරීමේ දී භාවිතා වන වායු ධාරාව පාලනය කිරීමට සුළං පංකාවේ මෝටරයට සවිකර ඇති විචල්‍ය වේග පාලකය (V.S.D) වෙත ලබා දෙන වෝල්ටීයතාවය, ස්කන්ධ විතර මාපකයක් (Pulse width modulation) හරහා ලබා දීමට ඉලෙක්ට්‍රොනික පරිපථයක් සංවර්ධනය කරන ලදී.මෙම පාලන පද්ධතිය තහවුරු කිරීමේ තත්ත්ව පරීක්ෂණ මගින් නැවතත් සුසර කරනු ලැබේ.

*ඩබ් එස් බොතේජු, කේ රවීන්ද්‍රන්, තම්මිට ඒ එස් අනුරාධ, ඩබ් එම් එස් වීරවර්ධන*
*සහ සනත් අමරතුංග*

**ව්‍යාපෘතිය D/TECH. දෝණිකා තව් මැරීම සඳහා යොදා ගැනෙන මෝටර් වලට සම්බන්ධ කර ඇති විචල්‍ය වේග පාලකය ස්වයංක්‍රීයව පාලනය කිරීම සඳහා අඩු පිරිවැයකින් යුතු රැහැන් රහිත මන්ද කිරීමේ පාලක පද්ධතියක් (Wireless monitoring device) ගොඩ නැගීම**

තේ කර්මාන්ත ශාලාවල තව් මැරීමේ දෝණිකා වලට වැය වන විද්‍යුත් ශක්තිය අඩු කර ගැනීමට සහ පාලනය කිරීමට විද්‍යුත් මෝටර වලට විචල්‍ය වේග පාලක (VSD) සම්බන්ධ කර ඇත. එනමුත් මෙම වායු පංකාවල වේගය අතින් (Manual) පාලනය කිරීමට යාමේදී මනා අධීක්ෂණයකින් පාලනය නොකිරීම නිසා බලශක්ති සංරක්ෂණය නියමිත පරිදි සිදු නොවේ. එමෙන්ම තව් මැරීමේ දී භාවිතා කරන වාතයේ ආර්ද්‍රතාවය අවශ්‍ය ප්‍රමාණයට පවත්වා නොගැනීම නිසා ඒ සඳහා වැය වන තාප ශක්තිය ද අපතේ යයි. එම නිසා ඉහත සඳහන් තව් මැරීමට අදාල වන පරාමිතීන් පාලනය කිරීම සඳහා විචල්‍ය වේග පාලකයට ක්ෂුද්‍ර පාලකයක් (Micro controller) මගින් ක්‍රියාත්මක වන පාලන පද්ධතියක් වැඩි දියුණු කිරීමට මෙම ව්‍යාපෘතිය මගින් සැලසුම් කරනු ලැබේ.

මෙම පද්ධතිය මගින් තව් මැරීමේ දෝණිකාව තුළ ඇති පුරක කුටීරයේ (Plenum Chamber) ආන්තරික ස්ථිතික පීඩනය සහ දලු හරහා ගමන් ගන්නා වායු ධාරාව නිරීක්ෂණය කරමින් ඊට අදාලව වායු පංකාවේ වේගය පාලනය වන පරිදි නිර්මාණය කර ඇත. දලු හරහා ගමන් කරන වායු ධාරාව මැන ගැනීමට උපකාරි වන වායු ධාරා මානයක් ද මේ වන විට නිර්මාණය කර ඇත.

තව් මැරීමට යොදා ගන්නා වායු ධාරාවේ ආර්ද්‍රතාවය මැන ගැනීමට අවශ්‍ය වන උෂ්ණත්වමාන හා ආර්ද්‍රතාමාන ද පාලන පද්ධතියට ඇතුලත් වන අතර එමගින් උණුසුම් වායුව පාලනය කිරීම සිදු වේ. මෙම පාලන පද්ධතිය විචල්‍ය වේග පාලකය හා අනුබද්ධව වායු පංකාවේ මෝටරය පාලනය කිරීම සිදු වේ. මෙම පාලන පද්ධතිය ඉහත සඳහන් උපකරණ වලට අමතරව Atmel-AVR Wifi උපාංගයක් හා NODE-Mcu ක්ෂුද්‍ර පාලකයකින් (Micro controller) සමන්විත වේ. මෙම පාලන පද්ධතිය උණුසුම් වායුව පාලනය කිරීමේ පද්ධතියට සම්බන්ධ කෙරේ. මෙම වැඩි දියුණු කල උපකරණ පද්ධතිය සාම්ප්‍රදායික පරිඝණකයක් හා Wifi ක්‍රමයට සම්බන්ධ විය හැකිය.

*තම්මිට ඒ එස් අනුරුද්ධ, ඩබ් එන් කේ එම් එස් ධනවර්ධන සහ කේ රවීන්ද්‍රන්*

**ව්‍යාපෘතිය A 48.6. ඕතඩොක්ස් රොටවේන ක්‍රමයට නිෂ්පාදිත තේ වියලීම සඳහා භාවිතා කරන තරල පත්ල වියැලීම සිදු කිරීමට කාර්යක්ෂමව ක්‍රියා කල හැකි සහ දත්ත එක් රැස් කර පාලනය කිරීමට සුදුසු පද්ධතියක් සංවර්ධනය කිරීම (2014)**

තේ වියැලීමේදී වියැලුන තේ පිටවන ස්ථානයේ, තේ ස්ථරයේ උෂ්ණත්වයට අනුකූලව වියලනයට ඇතුල් කරන තෙත තේ කුඩු ප්‍රමාණය අතින් (Manual) සීරු මාරු කරමින් වියලීම පාලනය කරනු ලබයි. එමෙන්ම වියලි තේ වල පිටවන උෂ්ණත්වය විචලනය වීමට අනුව ප්‍රතිචාර දැක්වීමට පමාවීම නිසා වියලනයෙන් පිටවන තේ කුඩු වල තෙතමනය අනුමත ප්‍රමාණයට (2.5 – 3.0% W/W wet basis) වඩා වෙනස් අගයක් ගනී. එම නිසා මෙම තේ වියැළුම් ක්‍රියාවලිය ස්වයංක්‍රීයව සිදුකිරීමට PLC (Programmable logic control) භාවිතා කර දත්ත එක්රැස් කිරීම හා පාලනය කිරීම සඳහා පද්ධතියක් ගොඩනගා ඇත.

ප්‍රමාණවත් පරිදි තේ කුඩු වියලනයට ලබා ගැනීමට අවශ්‍ය අමතර රොටවේනයක්, කැට කඩනයක් (Beater Box) සහ ඇඹරුම් කඩනයක් (Roll Breaker) ලබා දී ඇති අතර මෙමගින් පාලන පද්ධතියේ ක්‍රියාවලිය නොකඩවා සිදු කිරීමට හැකි වනු ඇත. මීට අමතරව වියැළුම් ක්‍රියාවලිය ප්‍රශස්ථ කරලීම සඳහා තරල පත්ල වියලනය සඳහා උණු ජල උත්පාදකයක් (Hot Water Generator) අලුතින් ස්ථාපනය කරන ලදී. ස්වයංක්‍රීයව පද්ධතියේ දත්ත ලබා ගැනීම සහ පාලන ක්‍රියාවලිය අධ්‍යයනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා පරීක්ෂණ 12 ක් සිදු කරන ලදී. පාලන පද්ධතිය මගින් වියලන ක්‍රියාවලියට නියමිත තෙතමන ප්‍රමාණය වන 2.5% -3.0% මට්ටමට පාලනය කිරීම කාර්යක්ෂමව සිදු වේ.

**ව්‍යාපෘතිය B 110. "ගොවීන්ගේ ක්ෂේත්‍ර පාසල් " සංකල්පය සමඟ කොන්ත්‍රාත් වගා පද්ධති පිළිබඳ විශ්ලේශණය - සමර්සෙට් වතුයාය**

**ව්‍යාපෘති කාල සීමාව - 2017**

වර්තමානයේදී තේ වතු වල පවතින ශ්‍රමික හිගය කළමනාකරණය කිරීම සඳහා විවිධ වූ විකල්ප ශ්‍රමිකයන් යෙදවීමේ ක්‍රම වේදයන් භාවිතය දක්නට ලැබේ. මෙම අධ්‍යයනය සඳහා පාදක වූ "ගොවීන්ගේ ක්ෂේත්‍ර පාසල්" සංකල්පය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වන වතුයායක් ලෙස, උඩරට පිහිටි සමර්සෙට් වතුයාය තෝර ගැනින. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ගොවීන්ගේ ක්ශේත්‍ර පාසල් සංකල්පය මගින් කොන්ත්‍රාත් වගා කරුවන්ගේ තේ පිළිබඳව දැනුම සඳහා වන බලපෑම විශ්ලේෂණයයි.

ගොවීන්ගේ ක්ෂේත්‍ර පාසල් සංකල්පය සඳහා එක් වූ කොන්ත්‍රාත් වගාකරුවන් 60 දෙනෙකු හා එම පුහුණු වැඩසටහන්වලට සම්බන්ධ නොවූ වතු සේවකයන් 60 දෙනෙකුගෙන් අධ්‍යයනයට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට පූර්ව පර්යේෂිත ප්‍රශ්නාවලියක් යොදා ගන්නා ලදී. තවද වතු වාර්තා මගින් අවශ්‍ය ද්විතියික දත්ත රැස් කෙරින. දළු නෙලීම, වල් මර්ධනය, රෝග හා පළිබෝධ මර්ධනය, පාංශු සංරක්ෂණය, කප්පාදුව හා සෙවණ කළමනාකරණය යන කරුණු පිළිබඳව දෙපාර්ශවයේ දැනුම සංසන්දය කරන ලදී.

ප්‍රතිඵලයන්ට අනුව කොන්ත්‍රාත් වගාකරුවන්ගේ තේ පිළිබඳ දැනුම ඉහළ මට්ටමක පැවතින. මේ අනුව ගොවීන්ගේ ක්ෂේත්‍ර පාසල් සංකල්පය මගින් වගා කරුවන්ගේ දැනුම සඳහා සැලකිය යුතු ධනාත්මක බලපෑමක් සිදුකරන බවට අධ්‍යයනයෙන් තහවුරු විය.

වගුව 8. පුහුණු වැඩසටහන් වලට සම්බන්ධ වූ හා සම්බන්ධ නොවූ දෙපාර්ශවයේ දැනුම සංසන්දය

| දැනුම මට්ටම | කොන්ත්‍රාත් වගාකරුවන් (%) | සාමාන්‍ය වතු සේවකයන් (%) |
|---|---|---|
| අවම | 0 | 3.57 |
| මධ්‍යම | 22.64 | 42.86 |
| ඉහළ | 77.36 | 53.57 |

*කේ ඩබ් එන් නදීශානි, එච් ඩබ්ලිව් ශ්‍යාමලී, පී ටී පී ලක්ෂානි, අයි එච් ටී චතුරංග*

**ව්‍යාපෘතිය B 111. පහත රට කුඩා තේ වතු හිමියන්ගේ තාක්ෂණික නිපුණත්වය හා ඵලදායිතා විචලනය සඳහා හේතුවන නිර්ණායකයන් හඳුනා ගැනීම**

**ව්‍යාපෘති කාල සීමාව 2015-2017**

ඵලදායිතාවය යනු ඒකක යෙදවුම් ප්‍රමාණයකට (ප්‍රාග්ධනය ශ්‍රමිකයන් අමුද්‍රව්‍ය වැනි) ලැබෙන නිෂ්පාදන හා සේවා ප්‍රමාණයයි. නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ අවස්ථාවන් සඳහා ඵලදායිතාවය ගණනය කළ හැක. යෙදවුම් එනම් අමුද්‍රව්‍ය මගින් නිෂ්පාදිත නිපදවීමේ ක්‍රියාවලිය කොතරම් කාර්යක්ෂමව සිදු කරන්නේද යන සාධකය ඵලදායිතා විචලනය සඳහා හේතු වේ. මෙම සාධකයන්ද සැලකිල්ලට ගනිමින් කුඩා තේ වතු හිමියන්ගේ ඵලදායිතාවය පිළිබඳව අධ්‍යයනයක් සිදු කිරීමට යෝජනා විය. මේ අනුව දීප ව්‍යාප්ත සමීක්ෂණයක් මගින් ඵලදායිතා විචලනය, ඒ සඳහා බලපාන්නාවූ නිර්ණායකයන් හඳුනාගැනීම හා එමගින් කුඩා තේ වතු හිමියන්ගේ තාක්ෂණික නිපුණත්වය නිර්ණය, යන අරමුණු ඔස්සේ අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. තෝරාගත් විචල්‍යයන්ගේ සම්බන්ධතාවය හඳුනාගැනීම සඳහා කොබ් ඩොග්ලස් (Cobb-Douglas) හා ප්‍රතිලඝු නිෂ්පාදන (Trans log models) මොඩලයන් භාවිතයෙන්, අනුමානික ප්‍රත්‍යන්ත ශ්‍රිතය (Stochastic frontier production function) නිමාණය කරන ලදී. මෙම ක්‍රම දෙකෙන්ම අසමාර්තතාව සඳහා වන ශ්‍රිතය සමාන විය. ප්‍රතිඵලයන්ට අනුව කොබ් ඩොග්ලස් නිෂ්පාදන මොඩලයට වඩා ප්‍රතිලඝු මොඩලය මගින් යෙදවුම් හා නිමැවුම් අතර සම්බන්ධතාවය විස්තර වන බව තහවුරු විය.

ඵලදායිතාවය සඳහා කුලී ශ්‍රමිකයන් පවුලේ ශ්‍රමය කෘෂි රසායන හා පොහොර භාවිතය මගින් සෘජුවම ඉහළ බලපෑමක් ඇති කරන බව පෙනී යයි.

පවුලේ ශ්‍රමය හා කුලී ශ්‍රමිකයන් සඳහා නිර්යාති ප්‍රත්‍යස්ත (output elasticity) අගයන් අනෙකුත් විචල්‍යයන්ගේ එම අගයට වඩා සැලකිය යුතු ඉහල අගයක් පෙන්වීය. ඒ අනුව ශ්‍රමිකයන් ඵලදායීතාවය කෙරෙහි සුවිශේෂි බලපෑමක් සිදු කරන බව පිළිබිඹු වේ.

**තේ නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන විකල්ප බල ශක්ති ප්‍රභවයන් ඇගයීම.**

**ප්‍රධාන ව්‍යාපෘතිය A 25. තේ නිෂ්පාදනයේ දී භාවිතා වන බල ශක්තීන්ගේ පිරිවැය අඩු කර ගැනීමට අවශ්‍යය තාක්‍ෂණය දියුණු කිරීම.**

**ව්‍යාපෘතිය A 25.6. අධෝරක්ත කිරණ (IR) සහ තරල පත්ල (FBD) ඒකාබද්ධ තේ වියලීම මගින් වියැලුම් පිරිවැය සහ නිමි තේ වල ගුණාත්මයට වන බලපෑම සාමාන්‍ය තරල පත්ල වියලනය සමඟ සංසංදනය කර බැලීම**

ඕතඩොක්ස් රොටවේන තේ නිෂ්පාදනයේදී තේ වියලා ගැනීමට තරල පත්ල වියලනය භාවිතා කරන අතර දැවවල ගුණාත්මක තත්ත්වයේ වෙනස්වීම් නිසා නිමි තේ කි.ග්‍රෑම් 1 ක් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය දැව ඉන්ධන ප්‍රමාණය එනම් දැවවල විශිෂ්ඨ පරිභෝජන අගය (Specific Firewood Consumption) කි.ග්‍රෑම් 0.7-1.0 දක්වා අගයක් ගනී. ඕතඩොක්ස් රොටවේන තේ වියලීම සඳහා අධෝරක්ත කිරණ (IR) සහ තරල පත්ල (FBD) ඒකාබද්ධ වියලීම සම්බන්ධව කරන අධ්‍යයනය තව දුරටත් කර ගෙන යනු ලැබේ. තරල පත්ල වියලනයට තේ කුඩු දැමීමට ප්‍රථම මූලික වියලීම සිදු කිරීමට අධෝරක්ත මාපකයේ උෂ්ණත්වය වෙනස් කර ගත හැකි පද්ධතියක් සහිත පරීක්‍ෂණාගාර මට්ටමේ අධෝරක්ත වියලනයක් සැලසුම් කර නිර්මාණය කරන ලදී. මෙම වියලනයේ තේ රැඳීමේ කාල සීමාව, තේ ස්ථරයේ උස ප්‍රමාණය සහ උෂ්ණත්වය පාලනය කිරීමට හැකි වන පරිදි තව දුරටත් සංවර්ධනය කිරීමට කටයුතු ආරම්භ කර ඇත.

*කේ රවීන්ද්‍රන්, එල් ජයසිංහ, ඩබ් එම් එස් වීරවර්ධන, එස් එච් ප්‍රියන්ති,*
*තම්මිට ඒ එස් අනුරුද්ධ සහ ඩබ් එන් කේ එම් එස් ධනවර්ධන*

**ව්‍යාපෘතිය A 25.3. දැනට පවත්නා තේ වියලන යන්ත්‍රවල දර උඳුන් සඳහා පද්ධති වැඩි දියුණු කිරීම (2017)**

බොහෝ තේ කර්මාන්ත ශාලාවල දැව සැපයීමේ දුර්වලතාවය, දැව කැපීමට අවශ්‍ය යන්ත්‍ර (Power Saw/ Spliter) නොතිබීම, මූල්‍යමය දුෂ්කරතා වැනි විවිධ හේතූන් නිසා දැව ඉන්ධන භාවිතය මනා කළමනාකරණයකින් සිදු කර ගැනීමට නොහැකි අතර 60% පමණ දැව ඉන්ධන නාස්ති වීමක්ද සිදු වේ. මේ වන විට බොහෝ කර්මාන්ත ශාලා දැව ඉන්ධන ලබා ගැනීමේ දුෂ්කරතාවයනට ද මුහුන පා ඇත. පවතින වායු තාපක වලට සුදුසු ගිනි මැස්සක් (Fire Grate) සහ කැබලි දර (Wood Chip) උඳුනට ඇතුල් කිරීමට පාලන පද්ධතියක් සහිත ක්‍රම වේදයක් සංවර්ධනය කර නිර්මාණය කිරීම පිණිස ජාතික ඉංජිනේරු සහ පර්යේෂණ මධයස්ථානය (NERDC) සමග සම්බන්ධව ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

කැබලි දැව ඉන්ධන සපයන්නන් දිරිමත් කිරීමත් තෙතමන ප්‍රමාණය 25%ට අඩු කර දැව සැපයීමට ධෛර්යමත් කිරීමත් මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙමගින් දැව ඉන්ධන අපතේ යාම අඩු කර ගැනීම, දැව ඉන්ධන හිඟය යම් කිසි ප්‍රමාණයකට අඩු කර ගැනීම අපේක්ෂිතයි. මෙම ව්‍යාපෘතිය සඳහා තේ පර්යේෂණායතනය, ජාතික ඉංජිනේරු සහ පර්යේෂණ මධ්‍යස්ථානය (NERDC) අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

තෙතමන ප්‍රමාණය අවශ්‍ය මට්ටමට අඩු කරන ලද කැබලි දර, දැව ඉන්ධන සපයන මධ්‍යස්ථාන වලින් මිලදී ගෙන සැලසුම් කරන ලද ගිනි මැස්ස සහිත වායු තාපකයට යොදා අත් හදා බැලීමට නියමිතයි.

*එස් කෝනේශ්වරමූර්ති, නන්දන එදිරිසිංහ සහ කේ රවීන්ද්‍රන්*

**ව්‍යාපෘතිය B123. වියලීමට ප්‍රථම අඹරන තේ දලු වල ඇති නාරටි (Stalks) සහ කෙඳි (Fibre) ඉවත් කර ගැනීමට හැකිදැයි සොයා බැලීම (2017)**

කළු තේ නිෂ්පාදනයේ දී තේ පත්‍ර අතර ඇති දඬු (Internode) වලින් ලැබෙන දුඹුරු පැහැති නාරටි (Stalk) සහ කෙඳි (Fibre) තේ වර්ග කිරීමේ අතරතුර කසල තේ (Refuse) ලෙස ඉවත් වේ. තේ කර්මාන්ත ශාලාවට ලැබෙන අමු දලු වල ප්‍රමිතිය 50% ට වඩා වැඩියෙන් පවත්වා ගත නොහැකි විට එහි අඩංගු මෝරන ලද දලු ප්‍රතිශතය අධික නිසා නිමි තේ වල අඩංගු නටු සහ කෙඳි වල ප්‍රතිශතය ඉහල යන අතර එමගින් කසල තේ ප්‍රමාණයද 12% දක්වා ඉහළ යා හැක. ඇඹරූ දලු වල අඩංගු නාරටි සහ කෙඳි වලින් කිසියම් හෝ ප්‍රතිශතයක් වියැළීමට පෙර වෙන් කර ගත හැකි වේ නම් වියැළුම් පරිවැය අඩු කර ගැනීමට හැකි වේ. වියලනයට යොමු කිරීමට පෙර මෙම තෙත තේ කුඩු වලින් නාරටි සහ කෙඳි වෙන් කර ගැනීම පිළිබඳව අධ්‍යයනය කිරීමට මෙම ව්‍යාපෘතිය නිර්මාණය කරන ලදී.

විද්‍යාත්මක උපදේශන කමිටුවේ (SAC) සහ පර්යේෂණ සඳහා වන උපදේශණ කමිටුවේ (CCR) සාමාජික පරාක්‍රම ජයසිංහ මහතා සමග මෙම අධ්‍යයනය සිදු කිරීමට අවශ්‍ය ක්‍රමවේදය සහ තේ නිෂ්පාදනය පිළිබඳව සොයා බැලීමට රත්නපුර පිහිටි හිදැල්ලන තේ කර්මාන්ත ශාලාවට නිරීක්ෂණ චාරිකාවක් සිදු කරන ලදී.

*එම් ඒ චමින්ද*

**ව්‍යාපෘතිය D/TECH. කුඩා ප්‍රමාණයේ අමු දළු සාම්පල වලින් තේ නිෂ්පාදනය**

ශෂ්‍ය විද්‍යා, කීට වේදී, වටපණු වේදී, ජෛව රසායන, ශාක අභිජනන, යන අංශ වලින් විවිධ පර්යේෂණ සඳහා යොමු කරන ලද අමු දලු සාම්පල 206 ක් පමණ කුඩා ප්‍රමාණයේ තේ නිෂ්පාදන යන්ත්‍ර භාවිතා කරමින් නිමි තේ සකස් කර, පිරිසිදු කර, වර්ග කර, අසුරා අදාල අංශ වලට බාර දෙන ලදී.

## නිෂ්පාදිත තේ වල තත්වය වැඩි දියුණු කිරීම

**නිමි තේ වල ගුණාත්මක බව වැඩි දියුණු කිරීම**

**නිමි තේ වල ගුණාත්මක බව සහ ගුණාත්මක බව රඳවා ගැනීම වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන තාක්ෂණය සංවර්ධනය කිරීම**

**ව්‍යාපෘතිය A 46.5. පහත රට තේ නිෂ්පාදනයේ තේ වර්ග කිරීමේ ක්‍රියාවලියේ විවිධ අදියර වලදී තේ වලට තෙතමනය අවශෝෂණය වීම වලක්වා ගැනීම පිළිබඳ විමර්ශනය කිරීම (2014)**

තේ ජලාකර්ශක ද්‍රව්‍යයක් බැවින් පහතරට තේ වර්ග කිරීමේ ක්‍රියාවලියේ දී වියලන ලද තේ සති දෙකක පමණ කාලයක් පරිසරයට නිරාවරණය වීම නිසා තේ වලට ජලය උරා ගනී. සාන්ද්‍ර ලවණ ක්‍රමවේදය භාවිතා කරමින් $25^0$C, $30^0$C සහ $35^0$C වියලි බල්බ උෂ්ණත්වයන් සහ 45%, 53%, 75% සහ 84% සාපේක්ෂ ආර්ද්‍රතාවයන් යටතේ පහත රට තේ වර්ග 10 ක් සඳහා ඒවාට ක්ෂුද්‍ර ජීවී හානි වීමකින් තොරව අවශෝෂණය කරගත හැකි උපරිම තෙතමන (Maximum permissible moisture content) ප්‍රමාණය නිර්ණය කිරීම පිණිස මෙම අධ්‍යයනය ආරම්භ කරන ලදී.

ඇසිටික් අම්ලය ($CH_3COOK$), සෝඩියම් බ්‍රෝමයිඩ් (NaBr), සෝඩියම් ක්ලෝරයිඩ් (NaCl), පොටෑසියම් ක්ලෝරයිඩ් (KCl) යන සාන්ද්‍ර ලවණ භාවිතා කරමින් ලබා ගන්නා ලද ප්‍රතිඵල වලට අනුව තිබිය හැකි උපරිම තෙතමන ප්‍රමාණය 5.8 – 7.9% අතර වේ.

*ඩබ් එස් බොතේජු, එම් ඒ චමින්ද, එස් එච් ප්‍රියන්ති සහ එල් ජයසිංහ*

**ව්‍යාපෘතිය A 46.7. හරිත තේ නිෂ්පාදනය සඳහා සම්මත ක්‍රමයක් හඳුන්වා දීම**

ශ්‍රී ලංකාවේ වෙළඳපොලෙහි ඇති හරිත තේ වල ගුණාත්මක භාවය අධ්‍යයනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කල අතර නිෂ්පාදිත දිනයන් වෙනස්වූ කාණ්ඩ 4 ක, හරිත තේ වර්ග 20 ක කායික, සංවේදක, රසායනික සහ ක්ෂුද්‍ර ජීවී පරාමිතින් නිර්ණය කර ඒවා වෙනත් රටවල ඇති හරිත තේ වර්ග 20 ක මෙම පරාමිතීන් සමග සංසන්දනය කරන ලදී.

මෙම අධ්‍යයනයේදී රසායනික පරාමිතින් වන සම්පූර්ණ පොලිෆීනෝල, ඇමයිනෝ අම්ල, තියාෆේලේවින් සහ තියාරුබිජින් ප්‍රමාණයන් නිර්ණය කරන ලදී. ඒ අනුව දේශීය සාම්පල වල ඇති සම්පූර්ණ පොලිෆීනෝල ප්‍රමාණය වැඩි බවත් ඇමයිනෝ අම්ල ප්‍රමාණය අඩු බවත් හෙලිවිය.

*එස් ඒ ඩී පී එස් ජයවර්ධන, එන් සී වීරකෝන්, එච් බී තරංගිකා සහ කේ එම් මෙවන්*

**ව්‍යාපෘතිය B 106. පොලිෆීනෝල සාන්ද්‍රණය කෙරෙහි බලපාන කරුණු අධ්‍යයනය සහ පොලිෆීනෝල වැඩි කළු තේ නිෂ්පාදනය කිරීම පිණිස අධ්‍යයනය කිරීම**

ශ්‍රී ලංකාවේ විවිධ කලාපවල නිෂ්පාදනය කරන තේ වල රසායනික, කායික සහ සංවේදක පරාමිතීන් අතර වෙනසක් පවතී. මෙයට පසේ ස්වභාවය, කාලගුණික තත්වය සහ කෘෂිකාර්මික පිළිවෙත් බලපෑම් ඇති කරයි. එම නිසා ශ්‍රී ලංකාවේ තේ වගා කරන ප්‍රදේශවල මෙම පරාමිතීන්ගේ වෙනස්කම් අධ්‍යයනය සඳහා මෙම ව්‍යාපෘතිය

ආරම්භ කල අතර ඒ සඳහා සාම්පල එකතු කිරීම කෘෂි පාරිසරික කලාපීය මට්ටමින් සිදු කල අතර එහිදී පසේ ස්වභාවය, වගා දිස්ත්‍රික්කය, වැව්ලි සමාගම යන කරුණු සැලකිල්ලට ගන්නා ලදී.

නුවර එළිය කලාපය ලෙස සැලකෙන $WU_3$ කෘෂි පාරිසරික කලාපයෙන් කර්මාන්ත ශාලා 3 ක් තෝරා ගෙන සමාන නිෂ්පාදිත දිනවල සාම්පල එකතු කර කායික, රසායනික සහ සංවේදක පරාමිතීන් අධ්‍යයනය කරන ලදී. මෙම අධ්‍යයනය පහත රට කලාපයද ආවරණය කරමින් පවත්වා ගෙන යයි.

*එම් එස් සී ප්‍රනාන්දු, ඊ එන් යූ එදිරිසිංහ, එච් බී තරංගිකා සහ ඒ එස් ගවුස්*

**ව්‍යාපෘතිය B 107. වෙළඳපොලෙහි පවතින අපමිශ්‍රණය කරන ලද කළු තේ හඳුනා ගැනීම සඳහා සරල ක්‍රම වැඩිදියුණු කිරීම**

**පර්යේෂණය 1: සීනි වලින් අපමිශ්‍රණය කරන ලද තේ හඳුනා ගැනීම සඳහා ක්‍රමයක් වැඩිදියුණු කිරීම**

කළු තේ සීනි වලින් අපමිශ්‍රණය කල විට වෙනස් වන ප්‍රධානම සාධකය සම්පූර්ණ සීනි සාන්ද්‍රණය බව මීට පෙර කරන ලද අධ්‍යයනයන් මගින් සොයා ගන්නා ලදී. වර්ණමිතික ක්‍රම වන ඇන්ත්‍රෝන්, ෆීනෝල් සල්ෆියුරික්, ලේන් සහ ඉනෝන් ක්‍රම මගින් සීනි සාන්ද්‍රණය නිර්ණය කල හැකි අතර එවා සීනි වලින් අපමිශ්‍රණය කරන ලද නිදර්ශක හඳුනා ගැනීමටද භාවිතා කල හැක. නමුත් HPLC ක්‍රමයක් හා සැසඳීමේදී මෙම ක්‍රමවල නිරවද්‍යතාවය අඩු අතර මෙම ක්‍රම මගින් නිර්ණය කල හැක්කේ සම්පූර්ණ සීනි සාන්ද්‍රණය පමණි. නමුත් HPLC ක්‍රමයක් මගින් ග්ලූකෝස්, ෆරක්ටෝස්, සුක්‍රෝස් සහ තවත් සීනි වර්ගවල සාන්ද්‍රණයන් වෙන වෙනම නිර්ණය කළ හැක. මේ නිසා තේ වල පවතින සීනි ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා HPLC තාක්ෂණය පාදක කර ගත් ක්‍රමයක් වැඩිදියුණු කර ස්ථාපනය කරන ලදී. ඉන්පසු මෙම ක්‍රමය භාවිතා කර නිමි තේ වල පවතින සීනි සාන්ද්‍රණය සඳහා දත්ත ස්ථාපනය කිරීම ආරම්භ කරන ලදී. මේ සඳහා පහතරට තේ වගා කරන ප්‍රදේශ ආවරණය කරමින් කර්මාන්ත ශාලා 30 කින් නිදර්ශක 300 ක් එකතු කල අතර මෙය නිෂ්පාදන ක්‍රියාවලිය පුරා කර්මාන්ත ශාලාව තුල රැඳෙමින් සිදු කරන ලදී. දැනට මෙම සාම්පල වැඩිදියුණු කරන ලද ක්‍රමය භාවිතයෙන් විශ්ලේෂණය කරමින් පහතරට ප්‍රදේශයේ තේ වල ස්වභාවිකව පවතින සීනි ප්‍රමාණය නිර්ණය කරමින් පවතී.

*එස් ඒ ඩී පී එස් ජයවර්ධන, එම් එස් සී ප්‍රනාන්දු, ඊ එන් යූ එදිරිසිංහ, එච් බී තරංගිකා,*
*ඒ එස් ගවුස් සහ කේ එම් මෙවන්*

**ව්‍යාපෘතිය D / Bioch ජෛව රසායන අංශයේ ක්‍රියාකාරකම්.**

**පර්යේෂණය 1 5000 කාණ්ඩයට අයත් තේ දළු වල රසායනික සංඝටක විශ්ලේෂණය කිරීම**

තේ දළු වල අන්තර්ගත ජෛව රසායනික සංඝටක මගින් නිමි තේ වල ගුණාත්මක භාවය පිළිබඳ අදහසක් ලබා ගැනීම මෙහි අරමුණයි. මේ සඳහා ශාක අභිජනන අංශය මගින් නිදර්ශක ප්‍රතිවලිත 4 ක් සහිතව ලබා දෙන ලදී. මෙම නිදර්ශක උඩරට කලාපය හා ඌව කලාපය සඳහා පරීක්ෂා කරන 5000 කාණ්ඩයට අයත් නිදර්ශක වේ. මේවායේ සම්පූර්ණ පොලිෆීනෝල, සම්පූර්ණ ඇමයිනෝ අම්ල, තෙතමනය, ක්ලෝරෝෆිල් ප්‍රමාණය, කැරටිනොයිඩ් ප්‍රමාණය, කැෆේන් ප්‍රමාණය සහ කැටකින වල එක් එක් සංඝටකයේ ප්‍රමාණය විශ්ලේෂණය සිදු කරන ලදී.

*එම් එස් සී ප්‍රනාන්දු සහ එච් බී තරංගිකා*

**පර්යේෂණය 2: Bio kad රසායනික පොහොර වලින් තේවල ගුණාත්මකභාවය සඳහා බලපාන පරාමිතීන් වල වෙනසක් සිදු වේදැයි අධ්‍යයනය කිරීම**

Bio kad යනු පත්‍ර වලට යොදන ඇමයිනෝ අම්ල මත පදනම් වූ ශාක පෝෂක රසායනිකයකි. මෙමගින් තේ ශාකයේ වර්ධනයට, නිෂ්පාදකතාවයට සහ ගුණාත්මකභාවයට බලපෑමක් ඇත්දැයි අධ්‍යයනය කිරීම මෙම පරීක්ෂණයේ අරමුණ වේ. මෙමගින් තේ ශාකයේ වර්ධනයට ඇති බලපෑම සහ නිෂ්පාදකතාවය ඇති බලපෑම ශාක පෝෂක අංශය විසිනුත් ගුණාත්මකභාවයට ඇති බලපෑම ජෛව රසායන අංශය විසිනුත් අධ්‍යයනය කිරීම සිදු කරන ලදී. මෙම පරීක්ෂණය මාස 6 ක් පුරා මසකට වරක් නිදර්ශක එකතු කර තේ දළු වල සම්පූර්ණ පොලිෆීනෝල, සම්පූර්ණ ඇමයිනෝ අම්ල සහ සම්පූර්ණ කැටකින ප්‍රමාණයත් පර්යේෂණාගාරය තුල නිෂ්පාදනය කල නිමි තේ වල සම්පූර්ණ පොලිෆීනෝල, සම්පූර්ණ ඇමයිනෝ අම්ල සහ සම්පූර්ණ කැටකින, තියාෆ්ලෙවින් සහ තියාරුබීජින් වර්ණය සහ දීප්තිය යන පරාමිතීන්ගේ ප්‍රමාණයනුත් විශ්ලේෂණය සිදු කරන ලදී.

මෙම රසායනිකය යෙදීම මගින් තේ දළු වල සහ නිමි තේ වල ගුණාත්මකභාවයේ සැලකිය යුතු වෙනසක් ඇති නොවන බව සොයා ගන්නා ලදී.

*එම් එස් සී ප්‍රනාන්දු සහ ඊ එන් යූ එදිරිසිංහ*

**ව්‍යාපෘතිය A 30.5 කසල තේ භාවිතා කර ප්‍රෝටීන නිස්සාරණය කිරීම**

පටල පෙරන තාක්ෂණය භාවිතයෙන් කසල තේ වලින් සාන්ද්‍ර ප්‍රෝටීන නිස්සාරකයක් ලබා ගැනීමට ක්‍රමවේදයක් දියුණු කරන ලදී. එහි 24% ප්‍රෝටීන 12% සම්පූර්ණ අළු 0.4% ඊතර නිස්සාරක 0.4% අවු තන්තු සහ 7% පොලිෆීනෝල සංයුතියක් අඩංගුවේ. මෙම නිෂ්පාදනය පර්යේෂණාගාර තුළදී මීයන් තුළ ක්‍රියාකරණ අන්දම අධ්‍යයනය කිරීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය සමග පර්යේෂණ කටයුතු කරමින් පවතී.

*එම් එස් සී ප්‍රනාන්දු, ඊ එන් යූ එදිරිසිංහ, එච් බී තරංගිකා සහ කේ එම් මෙවන්*

**ව්‍යාපෘතිය D / Bioch 2 නිමි තේ සඳහා ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම**

GC/MS තාක්ෂණය භාවිතයෙන් නිමි තේ වල ඇන්ත්‍රොක්විනෝන් තිබේ දැයි නිර්ණය කිරීම සඳහා ක්‍රමයක් වැඩි දියුණු කර ස්ථාපනය කරන ලදී.

GC/MS යන්ත්‍රය මගින් විභින්න නොකරන ලද තත්වයේදී වර්ණ ලේඛනය සිදු කරන ලදී. HP-5MS ක්ෂුද්‍ර කොළම භාවිතයෙන් සංඝටක වෙන් කරන ලද අතර වාගත වායුව වශයෙන් හීලියම් (He) 1.0 $\mathrm{ml min^{-1}}$ ප්‍රවාහ වේගයකින් භාවිතා කරන ලදී. මෙම ක්‍රමය මගින් නිමි තේ වල ඇන්ත්‍රොක්වීනෝන් 10ppb මට්ටම දක්වා නිර්ණය කල හැක. ඇන්ත්‍රොක්විනෝන් සහ අනෙකුත් කෘෂි රසායනික එක් වරකින් නිර්ණය කිරීම සඳහා ක්‍රමයක් වැඩි දියුණු කිරීමට කටයුතු කරමින් පවතී.

*එම් එස් සී ප්‍රනාන්දු, එස් ඒ ඩී පී එස් ජයවර්ධන, ඊ එන් යූ එදිරිසිංහ, ඒ එස් ගවුස් සහ කේ එම් මෙවන්*

**තේ කර්මාන්තශාලා සඳහා උපදේශන සේවා**

තාක්ෂණ අංශයේ නිලධාරීන් විසින් තේ කර්මාන්තශාලා වලට තේ නිෂ්පාදනය ආශ්‍රිත විවිධ උපදේශණයන් උදෙසා නිරීක්ෂණයන් 64 ක් සිදු කරන ලදී.




තේ කර්මාන්තය වනා හි ශ්‍රමිකයන් විශාල වශයෙන් අවශ්‍ය වන කර්මාන්තයකි. එහි ඵලදායිතාවය කෙරෙහි බලපාන වැදගත් සාධකයක් ලෙස ශ්‍රමය හඳුන්වාදිය හැක. ශ්‍රමික ඌනතාවය තේ කර්මාන්තයේ දෛනික කෘෂි ක්‍රියාකාරකම් සඳහා මෙන් ම නව වගාවන්, නැවත වගාවන් හා පාලු සිටුවීම වැනි ඉඩම් සංවර්ධන ක්‍රියාවන් සඳහා බලපා ඇත. පූර්ව පරීක්ෂිත ප්‍රශ්නාවලියක් යොදා ගනිමින් ශ්‍රමික හිඟයෙ හි තීව්‍රතාවය හඳුනා ගැනීම සඳහා මහ වතුවල දීපව්‍යාප්ත සමීක්ෂණයක් දියත් කරන ලදී.

මෙහි දී සියළුම තේ වතු කාණ්ඩ හතරකට වෙන් කර එක් එක් කාණ්ඩය පිලිබඳව සූක්ෂමව අධ්‍යයනය කරන ලදී. පළමු කාණ්ඩය ශ්‍රමික අවශ්‍යතාවයෙන් 50% කට වඩා අඩුවෙන් ශ්‍රමිකයන් සිටින වතු හෙවත් ශ්‍රමික හිගය තීව්‍ර කාණ්ඩයයි. දෙවනුව ශ්‍රමික අවශ්‍යතාවයෙන් 50%- 75% ත් අතර ඇති සාමාන්‍යය වතු කාණ්ඩයට අයත් වේ. තෙවන කාණ්ඩය ශ්‍රමික හිගය අඩු එනම් අවශ්‍යතාවයෙන් 75% ට වඩා වැඩි සේවකයන් පිරිසක් සිටින වතු වන අතර සිව්වන කාණ්ඩය වනුයේ ශ්‍රමිකයන් අතිරික්තයක් පවතින වතු වේ.

අධ්‍යයනයේ ප්‍රතිඵල වලට අනුව බහුතරයක් වතු (එනම් 49% පමණ) අයත් වනුයේ සාමාන්‍යය කාණ්ඩයට වේ. එය තේ වගා කලාපයන්ට අනුව මෙය වෙනස් නොවීම විශේෂත්වයකි. ඒ අනුව උඩරට පහතරට මැදරට හා ඌව යන කලාපයන් හතරෙහිම සාමාන්‍යය ශ්‍රමික හිඟය අවශ්‍යතාවයෙන් 51%- 75%ක් ලෙස පෙන්වා දිය හැක.

මැදරට කලාපය අනෙකුත් කලාපයන්ට වඩා වැඩියෙන් ශ්‍රමික හිඟ තත්වයක් පෙන්නුම් කරයි (39%). මේ අනුව මැදරට කලාපයේ පවතින වතු වලින් 78% එනම් වතු 40ක පමණ ශ්‍රමික අවශ්‍ය තාවයෙන් 25% මට්ටමක හිඟයක් ඇති බවට තහවුරු විය. තව ද 39% ක උච්ච ශ්‍රමික හිඟයක් එනම් අවශ්‍යතාවයෙන් 50%ක් පමණක් සේවකයන් සිටින බව හඳුනාගන්නා ලදී.

පහතරට වතු වලින් 49% ක්ද, ඌව කලාපයේ වතු වලින් 60% ක්ද, සාමාන්‍යය කාණ්ඩයට අයත් වේ. එමෙන්ම උච්ච ශ්‍රමික හිඟයක් පවතින වතු අවම ප්‍රමාණයක් ඇත්තේ උඩරට කලාපයේ බව ප්‍රතිඵල වලින් සනාථ විය එය. 8% පමණ ප්‍රමාණයක් වේ. තවද උඩරට කලාපයේ වතු වලින් 5% ක එනම් වතු 14ක පමණ සේවක අතිරික්තයක් පවතින බවට තහවුරු විය.

වගුව 1. ශ්‍රමික හිඟයෙහි උග්‍රතාවය

| කාණ්ඩ | කලාපය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මැද රට | | පහත රට | | ඌව | | උඩ රට | | එකතුව | |
| | වතු සංඛ්‍යාව | % | වතු සංඛ්‍යාව | % | වතු සංඛ්‍යාව | % | වතු සංඛ්‍යාව | % | වතු සංඛ්‍යාව | % |
| උග්‍ර ශ්‍රමික හිඟයක් පවතින (අවශ්‍යතාවයෙන් 50%ට වඩා අඩුවෙන් ශ්‍රමිකයන් සිටින) | 20 | 39 | 18 | 25 | 6 | 11 | 10 | 8 | 54 | 18 |
| සාමාන්‍යය (අවශ්‍යතාවයෙන් 50-75 % අතර ශ්‍රමිකයන් සිටින) | 20 | 39 | 36 | 49 | 33 | 60 | 61 | 48 | 150 | 49 |
| ශ්‍රමික හිඟය අවම (අවශ්‍යතාවයෙන් 75 % ට වඩා ශ්‍රමිකයන් සිටින) | 8 | 16 | 16 | 22 | 16 | 29 | 49 | 38 | 89 | 29 |
| ප්‍රමාණවත්/ අතිරික්ත | 3 | 6 | 3 | 4 | 0 | 0 | 8 | 6 | 14 | 5 |
| එකතුව | 51 | 100 | 73 | 100 | 55 | 100 | 128 | 100 | 307 | 100 |

තව ද 1 වගුවෙහි පෙන්නුම් කර ඇති අන්දමට හෙක්ටයාරයකට සිටින සේවකයන් ගණන සඳහා වන අවම අගය ද හෙක්ටයාරයකට අවම ශ්‍රමික හිඟයක් පෙන්වන්නේද ඌව කලාපයෙහි. එකම කලාපයෙන් මෙම අගයන් දෙකම සඳහා අවමයක් පෙන්නුම් කිරීම විමතියට කරුණකි. එනමුත් එම කලාපයේ ඵලදායිතා මට්ටම හා ඉඩම් ඒකකයක් සඳහා අවශ්‍ය ශ්‍රමිකයන් ගණන මෙම තත්වයට හේතු වන්නට ඇතැයි අනුමාන කල හැක.

එමෙන් ම හෙක්ටයාරයකට ඇති ශ්‍රමික අනුපාතය එකකට වඩා අඩු අගයක් පෙන්වන වතු වැඩිම ප්‍රමාණයක් (52%) පිහිටා ඇත්තේද ඌව කලාපයෙහි වේ. ශ්‍රමික හිඟය සඳහා වැඩිම අගයක් එනම් 0.92 පෙන්නුම් කරන ලද්දේ පහතරට කලාපයෙනි. මෙම රික්තකය පිරවීම අත්‍යාවශ්‍ය කාරණාවකි. හෙක්ටයාරයකට ශ්‍රමික අනුපාතය එකකට වඩා අඩු අගයක් පෙන්නුම් කරන වතු අවම සංඛ්‍යාවක් එනම් 3.9% පමණ ඇත්තේ උඩරට කලාපයෙහිය. තවද එම අනුපාතය දෙකට වඩා වැඩි අගයන් පෙන්වන වතු 43.3% ක් මෙම කලාපයෙහි ඇත.

යාන්ත්‍රීකරණය මගින් ශ්‍රමික හිඟයෙහි බලපෑම අවම කරගැනීමට උත්සහ ගන්නා වූ වතු හඳුනා ගැනීමටද සමීක්ෂණයෙන් හැකි විය. එමෙන්ම අනෙකුත් කලාපයන්ට සාපෙක්ෂව උඩරට කලාපයෙහි යන්ත්‍ර භාවිතාව 46% කින් වැඩි බව ගම්‍ය විය. සමස්ථ වශයෙන් සේවයට යොදා ගැනීමට ප්‍රමාණවත් තරම් සේවකයන් සිටිනුයේ ශ්‍රමික අවශ්‍යතාවයෙන් 50% - 75% අතර එනම් සාමාන්‍යය මට්ටමකි.

වගුව 2. වැඩට යෙදවිය හැකි සේවකයින් ප්‍රමාණය හා යාන්ත්‍රීකරණය සඳහා ප්‍රවණතාවය

| කලාපය | උඩරට | මැදරට | පහතරට | ඌව |
|---|---|---|---|---|
| සාමාන්‍ය ශ්‍රමිකයන්/හෙක් | 2 | 1.24 | 1.5 | 1.1 |
| සාමාන්‍ය ශ්‍රමික පැමිණීම | 78.61 | 75.78 | 74.01 | 77.9 |
| ශ්‍රමික හිඟය/හෙක් (සාමාන්‍ය ) | 0.8 | 0.71 | 0.92 | 0.6 |
| යන්ත්‍ර භාවිතය (දළු නෙළීම හා කප්පාදු කිරීම) | 46 | 0.5 | 13.6 | 27.3 |
| හෙක්ටයාරයකට ශ්‍රමිකයන් සංඛ්‍යාව<1 වතු % | 3.9 | 45 | 38.4 | 52.7 |
| හෙක්ටයාරයකට ශ්‍රමිකයන් සංඛ්‍යාව 1-2 වතු % | 50.8 | 40 | 42.5 | 45.5 |
| හෙක්ටයාරයකට ශ්‍රමිකයන් සංඛ්‍යාව >2 වතු % | 45.3 | 15 | 19.2 | 1.8 |

තවද උග්‍ර ශ්‍රමික හිගතාවය මැදරට 20% වශයෙන්ද පහතරට 25% වශයෙන්ද දැක් විය හැක. අවසාන වශයෙන් විවිධ කලාපයන් සඳහා ශ්‍රමික හිගය උඩරට 0.8 මැදරට 0.7 පහතරට 0.9 සහ ඌව කලාපයේ 0.6 ක් ලෙස දැක්විය හැක.

**ව්‍යාපෘතිය A 31.5. වතු සේවකයන් සේවයට වාර්තා නොකිරීම හා දෛනිකව සේවයට පැමිණීමේ ප්‍රවණතාවය අධ්‍යයනය කිරීම (ව්‍යාපෘති කාල සීමාව 2015-2018)**

වතු සේවකයන් සේවයට වාර්තා නොකිරීම හා දෛනිකව සේවයට පැමිණීමේ ප්‍රවණතාවය පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීම තේ ක්ෂේත්‍රයේ දියුණුව හා පැවැත්ම සඳහා ඉතා වැදගත්ය. මෙම අවශ්‍යතාවය හොඳින් තේරුම් ගනිමින් පහත අරමුණු ඔස්සේ පර්යේෂණයක් ආරම්භ කරන ලදී.

1. ශ්‍රමික හිඟය මහ වතු කෙරෙහි ඇති බලපෑම අධ්‍යයනය කිරීම.
2. සේවකයන් දෛනිකව සේවයට වාර්තා කිරීමට හා නොකිරීමට බලපාන්නාවූ සමාජ ආර්ථික ක්‍රියාදාමයන් හඳුනා ගැනීම.
3. සේවකයන් වතු තුල රඳවා ගැනීමට යොදා ගත හැකි ක්‍රමෝපායන් යෝජනා කිරීම.

මෙම අධ්‍යයනය සියලු තේ වගා කරන දිස්ත්‍රික්කයන් හා සියළුම වතු සමාගම් යටතේ පවතින තේ වතු ආවරණය වන පරිදි සිදු කිරීමට නියමිත වේ. අවශ්‍ය නියැදිය අනුපාතිකව අහඹු ලෙස තෝරා ගනු ලැබේ.

ප්‍රථමයෙන් තොරාගන්නා ලද වතු වල සේවකයන් කාණ්ඩ තුනක් යටතේ හඳුනා ගනු ලැබේ. එනම් සාමාන්‍යය ලෙස සේවයට පැමිණෙන, සේවයට නොපැමිණෙන හා සංක්‍රමණික සේවකයින් වේ. මෙම කාණ්ඩ වලින් අනුපාතිකව අහඹු ලෙස අවශ්‍ය නියැදිය තෝරා ගනු ලැබේ.

ද්විතික දත්ත වාර්තා හා සටහන් මගින් ද, ප්‍රාථමික දත්ත සේව්‍ය හා සේවක පාර්ශවයන් සඳහා වෙන් වූ ප්‍රශ්නාවලියක් මගින් ද රැස් කරනු ලැබේ. එහි දී ජන විකසන සාධක, සමාජ ආර්ථික, අනෙකුත් සාධක හා රැකියා තෘප්තිය මෙන්ම සේවකයන් මුහුණ පාන්නාවූ ගැටළු පිළිබඳව ද තොරතුරු රැස් කරනු ලබයි. වැඩිදුරටත් සේවකයන් රඳවා ගැනීමට හා සේවයට පැමිණීම ඉහළ නැංවීමට සේව්‍ය පාර්ශවයෙන් යොදා ගන්නා ලද ක්‍රමෝපායන් පිළිබඳවද මෙහිදී අධ්‍යයනය කෙරේ.



රැස් කර ගන්නා ලද දත්ත SPSS මෘදුකාංගය යොදා ගනිමින් විශ්ලේෂණය කරනු ලැබේ. එමගින් ශ්‍රමික හිඟයක් පවතින හා ශ්‍රමික හිඟයක් නොපවතින වතුවල සාමාන්‍යය ඵලදායීතාවය සැලකිය යුතු විෂමතාවයක් පවතී ද යන්න පරීක්ෂා කිරීම සඳහා නිර්යුග්මග T (Unpaired t-test) පරීක්ෂණය යොදා ගනු ලැබේ. තව ද අපවර්තය ප්‍රතික්‍රමණ මොඩලයක් යොදා ගනිමින් සේවක පැමිණීම හා නොපැමිණීම සඳහා බලපාන්නා වූ සාධක හඳුනා ගනු ලැබේ. උඩරට කලාපයේ වතු 30 ක ප්‍රාථමික හා ද්විතියික දත්ත පහතින් සාරාංශ ගත කර ඇත. ප්‍රස්තාර අංක 1 හි පෙන්වා ඇති පරිදි කාලයත් සමග උඩරට වැවිලි සමාගම්වල ශ්‍රම බලකායෙ හි ක්‍රමික අඩුවීමක් දක්නට ලැබේ.

**කාලයත් සමග වැවිලි සමාගම්වල ශ්‍රම බලකායෙහි විචලනය**

ලබා ගත් දත්ත විශ්ලේෂණයෙන් ලබා ගත් තොරතුරු වලට අනුව තෝරාගත් නියැදියෙන් 12% ක් සේවයට නොපැමිණීමේ අනුපාතිකය 50% වඩා වැඩි අගයක් පෙන්නුම් කරන ලදී. තවද 30% ක ප්‍රමාණයක් 50%- 26% පරාසයක වූ අතර 43% ක් 25%-11% පරාසයක විය. අවසාන වශයෙන් සේවයට පැමිණීම 10% වඩා අඩු අගයක් පවතිනුයේ 15% ක පමණක් බව නිරීක්ෂණය විය.

වගුව 3. උඩරට කලාපයේ වතු සේවකයන් සේවයට නොපැමිණීමේ ප්‍රවණතාවය

| නොපැමිණීමේ ප්‍රවණතාවය | % |
|---|---|
| >50 % | 12 |
| 50%-26% | 30 |
| 25%-11% | 43 |
| 10%-5% | 8 |
| <5% | 7 |

සේවකයන්ගේ වයස සේවයට නොපැමිණීමට බලපාන්නාවූ සාධකයක් ලෙස හඳුන්වාදිය හැක. වතු ජනගහණය වයස්ගත වීම, ශ්‍රමික හිඟය උත්සන්න වීමට ප්‍රධාන වශයෙන් බලපා ඇති බවට හඳුනාගෙන ඇත. ඉදිරියේදී ඉතා කෙටි කාලයක් තුලදී බහුතරයක් වතු සේවකයන් විශ්‍රාම යාමට නියමිතය. තෝරාගත් වතුවල ජනගහණ තොරතුරු වලට අනුව 50%ක් පමණ අවුරුදු 40 සීමාව පසු කර ඇත, ඒ අතුරින් 16% ක් අවුරුදු 50 - 59 කාණ්ඩයට අයත්ය. 0.7% අවුරුදු 60 වඩා වැඩි බව පෙනී යයි. තවද අවුරුදු 30-39 අතර 39.9% ක්ද, අවුරුදු 19- 29 වයස් කාණ්ඩයට 10.4% අයත් වේ. තෝරා ගත් නියැදියෙහි උපරිමය අවුරුදු 70 වූ අතර, අවමය අවුරුදු 19 විය. මධ්‍යයනය ලෙස අවුරුදු 40 හඳුනාගත හැකි විය.

වගුව 4. වතු සේවක වයස් කාණ්ඩයන් පිළිබඳ තොරතුරු

| වයස් කාණ්ඩයන් | % |
|---|---|
| 19-29 | 10.4 |
| 30-39 | 39.2 |
| 40-49 | 33.5 |
| 50-59 | 16.3 |
| < 60 | 0.7 |

වතුකරයේදී, උගත් තරුණ ප්‍රජාවෙහි ආශාවන් හා බලාපොරොත්තු ඉෂ්ඨ කිරීමට ඉඩකඩ අවම වේ. තවද සමාජයේ තිබෙන ආකල්පයන් හා රැකියාවේ ගෞරවාන්විතභාවය පිළිබඳව තිබෙන්නාවූ දුර්මතයන් නිසා තරුණ පරම්පරාව වතු ක්ෂේත්‍රයෙන් බාහිර රැකියාවන් සඳහා යොමු වේ.

සමීක්ෂණයෙන් ලද තොරතුරුවලට අනුව තෝරාගත් නියැදියෙහි වැඩිපුර ප්‍රතිශතයක් (39.5%) 1-5 ශ්‍රේණි වලට අධ්‍යාපනය සීමා වී ඇත. මධ්‍යම මට්ටමේ එනම් 6-10 ශ්‍රේණි වල අධ්‍යාපනය ලබා ඇති ප්‍රමාණය 37.9% කි. තවද 14.3% ක් ද්විතියික මට්ටම නිම කර ඇත. එමෙන්ම 8.5% කිසිම අධ්‍යාපනයක් ලබා නොමැත.

වගුව 5. අධ්‍යාපන සුදුසුකම්

| කාණ්ඩය | % |
|---|---|
| පාසල් ගොස් නොමැති | 8.5 |
| ප්‍රාථමික 1-5 ශ්‍රේණි | 39.5 |
| මධ්‍යම මට්ටමේ එනම් 6-10 ශ්‍රේණි | 37.9 |
| ද්විතියික මට්ටම 10-12 ශ්‍රේණි | 14.3 |

නිධන්ගත රෝගී තත්වයන් හා ආබාධිත තත්වයන්ද වතු සේවකයන් සේවයට පැමිණීමට බාධාවක් වී ඇති බව සමීක්ෂණයෙන් හෙළිදරව් විය. තෝරා ගත් නියැදියෙන් 31.5% මොනයම් හෝ නිධන්ගත රෝගයකින් පෙළෙන බවට තහවුරු විය.

වගුව 6. නිධන් ගත රෝගී තත්වයන් හා ආබාධිත තත්වයන්

| තත්වයන් | වාර ගණන | % |
|---|---|---|
| මොනයම් හෝ නිධන්ගත රෝගයකින් පෙළෙන හා ආබාධිත තත්වයන් | 347 | 31.5 |
| නිධන්ගත රෝගී තත්වයක් හෝ ආබාධිත තත්වයක් නොමැති | 760 | 68.5 |

රැකියා පළපුරුද්ද එකිනෙකාගේ කාර්යඵලය කෙරෙහි බලපායි. රැකියා පරිපූර්ණත්වය කාර්යඵලය ඉහළ නැංවීමට හේතු වේ. සමීක්ෂණයෙන් ලද තොරතුරු වලට අනුව බහුතරය (38.7) අවුරුදු 11-20 අතර වතු ක්ෂේත්‍රයේ රැකියාවෙහි නියතු වූවන් වේ. 25.89% පමණ අවුරුදු 1-10 අතර පරාසයට අයත් වේ. තවද 22% ප්‍රමාණයක් අවුරුදු 21-30 පිරිසට අයත්ය. එමෙන්ම අවුරුදු 30 ට වඩා වැඩි පළපුරුදු පුද්ගලයන් 12.81% ප්‍රමාණයක් වාර්තා විය.

වගුව 7. රැකියා පළපුරුද්ද

| අවුරුදු ගණන | % |
|---|---|
| 1-10 | 25.89 |
| 11-20 | 38.70 |
| 21-30 | 22.61 |
| <30 | 12.81 |

*ඩී එම් එන් සී කරුණාරත්න, එච් එම් සී පී පිලපිටිය, එච් ඩබ්ලිව් ශ්‍යාමලී,*
*පී ටී පී ලක්ෂානී සහ අයි එච් ටී චතුරංග*

**ව්‍යාපෘතිය A31.8. භූමි පරිභෝජනය හා භූමි ආවරණය වෙනස් වීමේ ස්වභාවය හා ගමන්පථය අධ්‍යයනය තුලින් තේ ආශ්‍රිත කුඩා වගා පද්ධති දර්ශ හඳුනාගැනීම. (ව්‍යාපෘති කාල සීමාව 2017-2018)**

කුඩා තේ වතු හිමියන් බොහෝමයක් තේ වගාවට සමගාමීව විවිධ භෝග වගාවන් මෙන්ම විවිධ රැකියාවන්හිද නියුතු වේ. වර්තමානයේ තේ වගාව ඒකභෝග සංකල්පයෙන් මිදී බහු භෝග වගා පද්ධති කෙරෙහි යොමු වන නැඹුරුතාවක් පවතී. මෙලෙස ගොඩ නැගුනා වූ විවිධ වගා පද්ධති හා ඒවායේ ස්වභාවය හඳුනාගැනීම කාලීන මාතෘකාවක් වේ. කුඩා තේ වතු හිමියන්ගේ ජීවන තත්වය සමාජ හා ආර්ථික ක්‍රියාකාරකම් මගින් ගොඩනැංවුනා වූ විවිධ වගා පද්ධති අධ්‍යයනය තුලින්, වඩාත් ලාභදායි පරිසර හිතකාමී තිරසාර වගා පද්ධතීන් හඳුනාගැනීම මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වේ.

දත්ත රැස් කිරීම සඳහා පූර්ව පර්යේෂිත ප්‍රශ්නාවලියක් යොදා ගනිමින් සමාජ ආර්ථික සමීක්ෂණයක් සිදු කරනු ලැබේ. තවද භූගෝලීය තොරතුරු තාක්ෂණ පද්ධති හා චන්ද්‍රිකා ඡායාරූප විශ්ලේෂණ ක්‍රමවේදයන් අධ්‍යයනය සඳහා යොදා ගැනේ. ග්‍රාමීය මට්ටමෙන් තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව අවශ්‍ය නියැදිය (400) තෝරා ගන්නා ලදී.

*කේ ඩබ් එන් නදීශානි සහ එච් ඩබ්ලිව් ශ්‍යාමලී*

**තේ පිළිබඳ දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම හා යාවත්කාලීන කිරීම**

**ව්‍යාපෘති කාලසීමාව - දීර්ඝ කාලීන**

2000 සිට 2016 දක්වා ප්‍රකාශිත ලේඛන උපයෝගී කර ගනිමින් දත්ත යවත්කාලීන කරන ලදී. ශ්‍රී ලංකාව, කෙන්යාව, ඉන්දියාව, චීනය, ඉන්දුනීසියාව, ජපානය, බංගලාදේශය වැනි ප්‍රධාන තේ නිෂ්පාදන රටවල් හා තේ පරිභෝජනය කරන රටවල් වල තේ වෙළඳපොල හැසිරීම නිරීක්ෂණය කිරීම එම රටවල ඵලදායිතාව ඉහළ නැංවීමට යොදා ගන්නා ක්‍රමෝපායන් පුරෝකථනය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරන කාර්යයන් වේ.

*එච් ඩබ්ලිව් ශ්‍යාමලී, පී ටී පී ලක්ෂානී සහ අයි එච් ටී චතුරංග*

**ව්‍යාපෘතිය B 110. "ගොවීන්ගේ ක්ෂේත්‍ර පාසල් " සංකල්පය සමඟ කොන්ත්‍රාත් වගා පද්ධති පිළිබඳ විශ්ලේෂණය - සමර්සෙට් වතුයාය**

**ව්‍යාපෘති කාල සීමාව - 2017**

වර්තමානයේදී තේ වතු වල පවතින ශ්‍රමික හිඟය කළමනාකරණය කිරීම සඳහා විවිධ වූ විකල්ප ශ්‍රමිකයන් යෙදවීමෙ ක්‍රම වේදයන් භාවිතය දක්නට ලැබේ. මෙම අධ්‍යයනය සඳහා පාදක වූ "ගොවීන්ගේ ක්ෂේත්‍ර පාසල්" සංකල්පය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වන වතුයායක් ලෙස, උඩරට පිහිටි සමර්සෙට් වතුයාය තෝර ගැනින. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ගොවීන්ගේ ක්ශේත්‍ර පාසල් සංකල්පය මගින් කොන්ත්‍රාත් වගා කරුවන්ගේ තේ පිළිබඳව දැනුම සඳහා වන බලපෑම විශ්ලේෂණයයි.

ගොවීන්ගේ ක්ෂේත්‍ර පාසල් සංකල්පය සඳහා එක් වූ කොන්ත්‍රාත් වගාකරුවන් 60 දෙනෙකු හා එම පුහුණු වැඩසටහන්වලට සම්බන්ධ නොවූ වතු සේවකයන් 60 දෙනෙකුගෙන් අධ්‍යයනයට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට පූර්ව පර්යේෂිත ප්‍රශ්නාවලියක් යොදා ගන්නා ලදී. තවද වතු වාර්තා මගින් අවශ්‍ය ද්විතියික දත්ත රැස් කෙරින. දළු නෙලීම, වල් මර්ධනය, රෝග හා පළිබෝධ මර්ධනය, පාංශු සංරක්ෂණය, කප්පාදුව හා සෙවණ කළමනාකරණය යන කරුණු පිළිබඳව දෙපාර්ශවයේ දැනුම සංසන්දය කරන ලදී.

ප්‍රතිඵලයන්ට අනුව කොන්ත්‍රාත් වගාකරුවන්ගේ තේ පිළිබඳ දැනුම ඉහළ මට්ටමක පැවතින. මේ අනුව ගොවීන්ගේ ක්ෂේත්‍ර පාසල් සංකල්පය මගින් වගා කරුවන්ගේ දැනුම සඳහා සැලකිය යුතු ධනාත්මක බලපෑමක් සිදුකරන බවට අධ්‍යයනයෙන් තහවුරු විය.

වගුව 8. පුහුණු වැඩසටහන් වලට සම්බන්ධ වූ හා සම්බන්ධ නොවූ දෙපාර්ශවයේ දැනුම සංසන්දය

| දැනුම මට්ටම | කොන්ත්‍රාත් වගාකරුවන් (%) | සාමාන්‍ය වතු සේවකයන් (%) |
|---|---|---|
| අවම | 0 | 3.57 |
| මධ්‍යම | 22.64 | 42.86 |
| ඉහළ | 77.36 | 53.57 |

*කේ ඩබ් එන් නදීශානි, එච් ඩබ්ලිව් ශ්‍යාමලී, පී ටී පී ලක්ෂානී, අයි එච් ටී චතුරංග*

**ව්‍යාපෘතිය B 111. පහත රට කුඩා තේ වතු හිමියන්ගේ තාක්ෂණික නිපුණත්වය හා ඵලදායිතා විචලනය සඳහා හේතුවන නිර්ණායකයන් හඳුනා ගැනීම**

**ව්‍යාපෘති කාල සීමාව 2015-2017**

ඵලදායීතාවය යනු ඒකක යෙදවුම් ප්‍රමාණයකට (ප්‍රාග්ධනය ශ්‍රමිකයන් අමුද්‍රව්‍ය වැනි) ලැබෙන නිෂ්පාදන හා සේවා ප්‍රමාණයයි. නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ අවස්ථාවන් සඳහා ඵලදායිතාවය ගණනය කළ හැක. යෙදවුම් එනම් අමුද්‍රව්‍ය මගින් නිෂ්පාදිත නිපදවීමේ ක්‍රියාවලිය කොතරම් කාර්යක්ෂමව සිදු කරන්නේද යන සාධකය ඵලදායිතා විචලනය සඳහා හේතු වේ. මෙම සාධකයන්ද සැලකිල්ලට ගනිමින් කුඩා තේ වතු හිමියන්ගේ ඵලදායිතාවය පිළිබඳව අධ්‍යයනයක් සිදු කිරීමට යෝජනා විය. මේ අනුව දීප ව්‍යාප්ත සමීක්ෂණයක් මගින් ඵලදායිතා විචලනය, ඒ සඳහා බලපාන්නාවූ නිර්ණායකයන් හඳුනාගැනීම හා එමගින් කුඩා තේ වතු හිමියන්ගේ තාක්ෂණික නිපුණත්වය නිර්ණය, යන අරමුණු ඔස්සේ අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. තෝරාගත් විචල්‍යයන්ගේ සම්බන්ධතාවය හඳුනාගැනීම සඳහා කොබ් ඩොග්ලස් (Cobb-Douglas) හා ප්‍රතිලඝු නිෂ්පාදන (Trans log models) මොඩලයන් භාවිතයෙන්, අනුමානික ප්‍රත්‍යන්ත ශ්‍රිතය (Stochastic frontier production function) නිමාණය කරන ලදී. මෙම ක්‍රම දෙකෙන්ම අසමාර්තතාව සඳහා වන ශ්‍රිතය සමාන විය. ප්‍රතිඵලයන්ට අනුව කොබ් ඩොග්ලස් නිෂ්පාදන මොඩලයට වඩා ප්‍රතිලඝු මොඩලය මගින් යෙදවුම් හා නිමැවුම් අතර සම්බන්ධතාවය විස්තර වන බව තහවුරු විය.

ඵලදායිතාවය සඳහා කුලී ශ්‍රමිකයන් පවුලේ ශ්‍රමය කෘෂි රසායන හා පොහොර භාවිතය මගින් ඍජුවම ඉහළ බලපෑමක් ඇති කරන බව පෙනී යයි.

පවුලේ ශ්‍රමය හා කුලී ශ්‍රමිකයන් සඳහා නිර්යාති ප්‍රත්‍යස්ත (output elasticity) අගයන් අනෙකුත් විචල්‍යයන්ගේ එම අගයට වඩා සැලකිය යුතු ඉහල අගයක් පෙන්වීය. ඒ අනුව ශ්‍රමිකයන් ඵලදායීතාවය කෙරෙහි සුවිශේෂි බලපෑමක් සිදු කරන බව පිළිබිඹු වේ.

වගුව 9. අනුමානික ප්‍රත්‍යන්ත නිෂ්පාදන ශ්‍රිතයෙහි විචල්‍යයන් සඳහා සංඛ්‍යාන සාරාංශය

| විචල්‍යය | මධ්‍යනය | සම්මත අපගමනය | අවම අගය | උපරිම අගය |
|---|---|---|---|---|
| නිෂ්පාදනය (අමු දළු- කිලෝ/වසර) | 7846.71 | 9774.18 | 780 | 72000 |
| ඉඩමේ ප්‍රමාණය | 1.69 | 1.93 | 0.25 | 18 |
| පොහොර (කිලෝ/වසර) | 1518.71 | 2392.4 | 100 | 25000 |
| පවුලේ ශ්‍රමය (මිනිස් දින/වසර) | 69.62 | 123.23 | 0 | 900 |
| කුලී ශ්‍රමිකයන් (මිනිස් දින/වසර) | 412.78 | 731.05 | 0 | 6000 |
| කෘෂි රසායන (වියදම/වසර) | 1176.25 | 3155.53 | 0 | 25000 |
| සින්ක් (වියදම/වසර) | 189.36 | 1306.54 | 0 | 21000 |
| වයස (අවුරුදු) | 54 | 0.6 | 20 | 82 |
| පළපුරුද්ද (අවුරුදු) | 23 | 10.8 | 2 | 55 |
| වගාවේ වයස (අවුරුදු) | 16 | 11.66 | 4 | 76 |

මෙම අධ්‍යයනය කුඩා තේ වතු හිමියන් මූලික කර ගනිමින් සිදු කරන ලදී. මෙහිදී ඉඩම් ප්‍රමාණයේ බලපෑම විස්තර වන්නේ ප්‍රතිලෝමවය. ඉඩම් ප්‍රමාණය ඉහළ යාමේදී කළමනාකරණය කිරීම අපහසුතාවය ඵලදායීතාවය කෙරෙහි ඍණාත්මකව බලපාන බව මෙයින් පෙනී යයි.

සින්ක් භාවිතය ඵලදායිතාවය කෙරෙහි බලපාන අතර පොහොර යෙදීම අනුලෝම සමානුපාතිකත්වයක් පෙන්නුම් කරන ලදී. කෙසේ නමුත් රසායනික භාවිතය ඵලදායිතාවයට ඍණාත්මක වන බව තහවුරු විය. එනමුදු වල් මර්ධනය සඳහා රසායනික මෙන්ම යන්ත්‍ර හා අතින් උදුරා දැමීමේ ක්‍රම භාවිතා කරන බව දක්නට ලැබුනි. තවද බොහෝමයක් දෙනා ඵලදායිතාවය වැඩි ඉඩම් වල වල් මර්ධනය සඳහා වල්පැල අතින් උදුරා දැමීම සිදු කරයි. මෙසේ රසායනිකයන්ට වැය වන මුදල් ඉතිරිය ඵලදායීතාවය ඉහළ නැංවීමට ද හේතුවක් වේ.

ප්‍රති ලඝු ශ්‍රිතයෙ හි අසමර්ථතාවය පිලිබඳ සූත්‍රය ප්‍රතිඵල අනුව පළපුරුද්ද, අධ්‍යාපනය, රැකියාව, තේ ප්‍රභේදය හා අන්තර් වගාවන් අසමර්ථතාවය සඳහා ඍණාත්මක සම්බන්ධතාවක් පෙන්නුම් කරයි. එනම් මෙම සාධකයන් ප්‍රවීණත්වයට ධනාත්මකව බලපායි. පළපුරුද්ද ඉතාමත් වැදගත් සාධකයක් වේ, එනම් පළපුරුද්දෙන් ඉහළ ගොවි මහතුන් ප්‍රවීණත්වයෙන්ද ඉහළ වේ. තවද අධ්‍යාපන මට්ටම ප්‍රවීණත්වය වැඩි වීමට හේතු වේ. පූර්ව කාලීනව වගාවෙහි නියුතු වූවන් නිපුණත්වයෙන් ඉහලය. නිර්දේශිත ප්‍රභේදයන් භාවිතය අන්තර් වගාවන් පැවතීම ප්‍රවීණත්වය ඉහළ යාමට හේතු වේ.

වගුව 10. ප්‍රතිලඝු ක්‍රමය අනුව අසමාර්ථතාවය සඳහා බලපාන්නාවූ නිර්ණායකයන්

| විචල්‍යය | පරාමිතිය | සංගුණකය | සම්මත දෝෂය | t value |
|---|---|---|---|---|
| නියතය | $\delta_0$ | -1.52 | 1.04 | - 1.45** |
| වයස | $\delta_1$ | 0.002 | 0.003 | 0.64 |
| පළපුරුද්ද | $\delta_2$ | -0.017 | 0.007 | -2.33* |
| අධ්‍යාපනය | $\delta_3$ | -0.009 | 0.006 | -1.6** |
| රැකියාව | $\delta_4$ | -0.013 | 0.009 | -1.43** |
| තේ ප්‍රභේදය | $\delta_5$ | -0.016 | 0.01 | -1.54** |
| අන්තර් වගාවන් | $\delta_6$ | -0.013 | 0.009 | -1.44** |

*Significant at five percent probability level, **Significant at 10% probability level

ගොවි මහතුන්ගෙන් බහුතරයක් 70 - 80% නිපුනතා මට්ටමකට අයත්ය මධ්‍යයනය 68.81% වේ අවමය 15% සහ උපරිමය 93.43% කි. මේ අනුව යෙදවුම් ඉහළ නැංවීමක් නොමැතිව නිපැවුම් 31.19% මට්ටමකින් ඉහළ නැංවීමට සම්භාවිතාවක් පවතී.

නවක ගොවීන් පළපුරුදු ගොවි මහතුන් සමග දැනුම හුවමාරු කර ගැනීමට අවස්ථා උදා කර දීම ප්‍රයෝජනවත්ය. තවද නව තාක්ෂණ සොයා ගැනීම් තොරතුරු බෙදාහැරීම තව දුරටත් කාර්යක්ෂම විය යුතු වේ. නිර්දේශිත තේ ප්‍රභේදයන් පිළිබඳව පුළුල් ලෙස ගොවීන් දැනුවත් කිරීම වැදගත්ය.

වගුව 11. තාක්ෂණික නිපුණත්වය වෙනස් වීමේ රටාව

| තාක්ෂණික නිපුණත්වය | ගොවීන් සංඛ්‍යාව |
|---|---|
| 10 – 20 | 2 |
| 20 – 30 | 8 |
| 30 – 40 | 18 |
| 40 – 50 | 20 |
| 50 – 60 | 33 |
| 60 – 70 | 53 |
| 70 – 80 | 83 |
| 80 – 90 | 75 |
| 90 – 100 | 8 |

*එච් එම් සී ජී පිලපිටිය, බී එම් එන් සී කරුණාරත්න සහ එච් ඩබ්ලිව් ශ්‍යාමලී*

**ව්‍යාපෘතිය D/Econ 2. පර්යේෂණ නිර්දේශ පිළිබඳ ආර්ථික විශ්ලේෂණයන්, තේ ක්ෂේත්‍රය පිළිබඳ ක්ෂුද්‍ර ආර්ථික විශ්ලේෂණයන් සහ සංතුලිත ශ්‍රමික ඵලදායිතා මට්ටම නිර්ණය කිරීම**

**ව්‍යාපෘති කාල සීමාව - 2017**

ශ්‍රී ලාංකේය තේ කර්මාන්තයේ තරගකාරීත්වය, ලාභදායිභාවය හා තිරසාර පැවැත්ම සඳහා දුර්ලභ සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතය ඉතා වැදගත් වේ. අනෙකුත් ස්වභාවික සම්පත් මෙන්ම තේ කර්මාන්තයේදී මානව සම්පත්ද ඵලදායී ලෙස කළමනාකරණය කල යුතු වැදගත් සම්පතකි. මක් නිසාද යත් තේ නිෂ්පාදන ක්‍රියාවලියේ නිෂ්පාදන වියදමෙන් 40% - 45% ප්‍රමාණයක් අයත් වන්නේ දළු නෙලීම සඳහා වේ. එම නිසා කම්කරුවන්ගේ වේතනය පියවා ගැනීමට ලබා ගත යුතු අවම වැඩ ප්‍රමාණය නිර්ණය මගින් මනා ලෙස ශ්‍රමිකයන් කළමනාකරණය හා ඔවුන්ගේ ඵලදායීතාව ඉහල නැංවීමට මෙම නිර්ණයන් වැදගත් වේ.

මෙහිදී දළු නෙලීම සඳහා වියදම් ගණනය කිරීමට දළු නෙලන්නන්ගේ දෛනික කුලිය (දෛනික වේතනය + වෙනත් ප්‍රතිලාභ) කන්කානිවරුන් සංඛ්‍යාව හා ඔවුන්ගේ දීමනාවන් මලු ඔසවන්නන් සංඛ්‍යාව හා ඔවුන්ගේ දීමනාවන් ද්‍රව්‍ය හා භාණ්ඩ සඳහා වියදම්, වැඩිපුර කඩන දළු කිලෝ ගණන හා එම දළු කිලෝවකට ගෙවන මුදල වැනි කරුණු සලකා බලන ලදී.

ක්ෂේත්‍රයේ ඵලදායීතාවය, දළු රවුමක් සඳහා ගතවන කාලය, එක් ශ්‍රමිකයෙක් දිනකට නෙලිය යුතු අවම දළු ප්‍රමාණය, දෛනිකව වැඩෙහි යෙදෙන ශ්‍රමිකයන් සංඛ්‍යාව, සහ දළු නෙලීමේ ක්‍රමය වැනි සාධක මත දෛනික දළු නෙලන්නන්ගේ අවශ්‍යතාවය රඳා පවතී. එමෙන්ම විවිධ කලාපයන් අනුව තේ පඳුරක වයස, වර්ගය ,ඵලදායීතාවය හා කාලගුණික වෙනස් වීම්, මෙන්ම කප්පාදු චක්‍රයෙහි කාලය දෛනිකව අවශ්‍ය දළු නෙලන්නන් සංඛ්‍යාව වෙනස් වන අනෙකුත් සාධක වේ. මෙම සාධක සියල්ල අතරින් දළු නෙලන්නන්ගේ ඵලදායීතාවය දෛනිකව සේවයට පැමිණෙන ශ්‍රමිකයන් ගණන ආදිය තීරණාත්මක සාධක වේ.

නිෂ්පාදන වියදමෙන් 45% ප්‍රමාණයක් වැය වන්නේ දළු නෙළීම සඳහා ලෙස සලකමින් තේ කිලෝවකට විකුණුම් මිලට අනුව කම්කරුවන්ගේ වේතනය පියවා ගැනීමට හැකි උපරිම දළු නෙලීමේ වියදම පහත දැක්වේ.

වගුව 12. විකුණුම් මිලට අනුව කම්කරුවන්ගේ වේතනය පියවා ගැනීමට උපරිම දළු නෙලීමේ වියදම

| තේ කිලෝවක විකුණුම් මිල | වේතනය පියවා ගැනීමට හැකි උපරිම දළු නෙලීමේ වියදම (කිලෝවකට) |
|---|---|
| 400 | 180.00 |
| 425 | 191.25 |
| 450 | 202.50 |
| 475 | 213.75 |
| 500 | 225.00 |
| 550 | 247.50 |

උපරිම දළු නෙලීමේ වියදම අනුව පවත්වා ගත යුතු අවම දළු නෙලීමේ ඵලදායීතාව පහත ආකාරයට විවිධ ඵලදායීතා මට්ටම් සඳහා ගණනය කරන ලදී

වගුව 13. විකුණුම් මිලට සරිලන උපරිම දළු නෙලීමේ වියදම සඳහා පවත්වා ගත යුතු අවම දළු නෙලීමේ ඵලදායීතාව

| තේ කිලෝවකට විකුණුම් මිල | 700 - 1500 නිමි තේ/ හෙක්/ වර්ෂ | 1500 -2000 නිමි තේ/ හෙක්/ වර්ෂ | 2000 - 2500 නිමි තේ/ හෙක්/ වර්ෂ | 2500 - 3000 නිමි තේ/ හෙක්/ වර්ෂ | 3000 සහ ඉහළ නිමි තේ/ හෙක්/ වර්ෂ | වත්තක සාමාන්‍ය |
|---|---|---|---|---|---|---|
| | එක් අයෙක් නෙළන දළු ප්‍රමාණය (දිනකට අමු දළු කිලෝ) | | | | | |
| 400 | 45 | 42 | 39 | 35 | 31 | 38 |
| 425 | 38 | 36 | 33 | 30 | 26 | 32 |
| 450 | 33 | 31 | 28 | 26 | 23.5 | 29 |
| 475 | 29 | 28 | 25 | 23 | 22.5 | 26 |
| 500 | 26 | 25 | 22 | 21.5 | 21 | 24 |
| 550 | 21 | 20 | 19.5 | 19 | 19 | 20 |

*එච් ඩබ්ලිව් ශ්‍යාමලී*

**ව්‍යාපෘතිය A 49.3 තේ ඉඩම් සිතියම් ගත කිරීම**

1988 දී සකස් කරන ලද තේ ඉඩම් සහිත සිතියම් යාවත්කාලීන කිරීම පිණිස 2011 දී මේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. තේ පර්යේෂණායතනය 2011 දී සකස් කල ව්‍යාපෘති වාර්තාව පසුව වැඩිදියුණු කර රබර් ඉඩම් ද සිතියම් ගත කිරීම ආරම්භ කරන ලදී. වැවිලි කර්මාන්ත අමාත්‍යංශයේ හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශවලට අනුව ගාලු දිස්ත්‍රක්කයේ නියමු ව්‍යාපෘතියක් ලෙස මෙය 2012 වර්ෂයේදී ආරම්භ විය. මිනුම් දෙපාර්තමේන්තුව හා ඉඩම් ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව මගින් ගාල්ල දිස්ත්‍රික්කයේ තේ/රබර් ඉඩම් සිතියම් ගත කර අවසන් කිරීමෙන් පසු රත්නපුර, කළුතර, මාතර, කෑගල්ල හා මහනුවර දිස්ත්‍රික්කවල ඉඩම් ද සිතියම් ගත කිරීම සිදු කරන ලදී. ගාල්ල දිස්ත්‍රික්කයට අදාළ සිතියම් වැවිලි කර්මාන්ත අමාත්‍යංශයට ලබා දී ඇත. 2018 අයවැය සඳහා ද තවත් ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කලද ඒ සඳහා මුදල් වෙන් කිරීමක් සිදු නොවීය. ශෂ්‍ය විද්‍යා අංශයේ නිලධාරීන් මෙම ව්‍යාපෘතිය සඳහා අදාල දෙපාර්තමේන්තුවලට සහාය ලබා දේ. මෙම සියලුම දෙපාර්තමේන්තු සමග ඉඩම් සිතියම් ගත කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන්නේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගිනි.

*එම් ඒ විජේරත්න*



**ප්‍රධාන ව්‍යාපෘතිය D/ADV: උපදෙස් සහ ව්‍යාප්ති වැඩසටහන්**
**ව්‍යාපෘතිය D/ADV 1: සාමාන්‍ය උපදෙස් සහ ව්‍යාප්ති වැඩසටහන්**
**ප්‍රධාන අරමුණ**

සහභාගිත්ව ප්‍රවේශය මත තේ වතු වල වගා කටයුතු ආශ්‍රිත ගැටළු නිරාකරණය කිරීම, තේ වගා කරුවන් දැනුවත් කිරීම සහ පුහුණු කිරීම සහ තේ වගාකරුවන් වෙත තොරතුරු සහ තාක්ෂණය ප්‍රචාරණය කිරීම.

මහ වතු අංශයෙන් මෙන්ම ඉඩම් හිමි වැවිලි කරුවන් හා කුඩා තේ වතු අංශයෙන්ද යොමු කරන ලද සියලුම ඉල්ලීම් ඉටු කරමින් අදාල උපදෙස් සහ ව්‍යාප්ති ක්‍රියාකාරකම් සාර්ථකව නිම කරන ලදි. කුඩා තේ වතු අංශයෙන් ලද ගැටළු හඳුනා ගැනීම කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහභාගිත්වයෙන් සිදු කරන ලදී.

තලවාකැලේ, රත්නපුර, සහ මහනුවර තේ. ප. ආ. උපදෙස් සහ ව්‍යාප්ති අංශ විසින් නිම කරන ලද ප්‍රධාන උපදෙස් සහ ව්‍යාප්ති කටයුතුවල ප්‍රගතිය පහත පරිදි වේ.

වගු අංක 1. උපදෙස් හා ව්‍යාප්ති කටයුතුවල ප්‍රගතිය

| ප්‍රධාන ක්‍රියාකාරකම් | තලවාකැලේ | රත්නපුර | මහනුවර | මුළු ගණන |
|---|---|---|---|---|
| අංශය වෙත පැමිණි අමුත්තෝ | 7517 | 296 | 656 | 8469 |
| උපදෙස් ලිපි | 638 | 358 | 127 | 1123 |
| උපදෙස් චාරිකා | 57 | 531* | 24 | 612 |
| කණ්ඩායම් පුහුණු | 75 | 45 | 38 | 158 |
| ප්‍රකාශන බෙදා හැරීම | 1324 | 154 | 8 | 1486 |
| pH සඳහා පස් සාම්පල පරීක්ෂා කිරීම | - | 671 | 530 | 1201 |
| වාණිජ තේ තවාන් පරීක්ෂා | | | | |
| අනුවර්ති පර්යේෂණ/අනෙක් චාරිගකා | 0 | 14 | 17 | 31 |

*නියදි සමීක්ෂණය මගින් තොරතරු රැස් කිරීම සඳහා සිදකල ක්ෂෙත චාරිකා ද ඇතුලත්ව

වගු අංක 2. කාර්තුවල සිදුකළ උපදෙස් හා ව්‍යාප්ති කටයුතුවල ප්‍රගතිය

| ප්‍රධාන ක්‍රියාකාරකම් | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | මුළු ගණන |
|---|---|---|---|---|---|
| අංශය වෙත පැමිණි අමුත්තෝ | 5470 | 1354 | 997 | 648 | 8469 |
| උපදෙස් ලිපි | 257 | 280 | 207 | 379 | 1123 |
| උපදෙස් චාරිකා | 26 | 77 | 364 | 145 | 612 |
| කණ්ඩායම් පුහුණු | 55 | 25 | 41 | 37 | 158 |
| ප්‍රකාශන බෙදා හැරීම | 336 | 259 | 318 | 573 | 1486 |
| pH සඳහා පස් සාම්පල පරීක්ෂා | 416 | 210 | 516 | 59 | 1201 |
| වාණිජ තේ තවාන් පරීක්ෂා | | | | | |
| අනුවර්ති පර්යේෂණ චාරිකා | 4 | 11 | 3 | 13 | 31 |
| රැස්වීම් | 31 | 39 | 35 | 23 | 128 |



**උපදෙස් චාරිකා:** තලවාකැලේ, රත්නපුර, සහ මහනුවර ප්‍රදේශවල උපදෙස් සහ ව්‍යාප්ති කාර්යය මණ්ඩලය විසින් වගාව සම්බන්ධයෙන් වූ ගැටළු හඳුනා ගැනීමට හා විසඳුම් ලබා දීමටත්, වතු සංවර්ධන කටයුතුවල සැලසුම් සකස් කිරීමට වතු කළමණාකාරීත්වයට සහය වීම සඳහාත් චාරිකා සිදු කරන ලදී. 2017 වසර තුල උඩරට ප්‍රදේශයේ තේ අස්වැන්න අඩු වීම පිළිබඳ සොයා බැලීම සඳහා බොහෝ ඉල්ලීම් ලද අතර ඒවා අධීක්ෂණය කෙරුනු අතර අස්වැන්න අඩුවීම අවම කර ගැනීම සඳහා උපදෙස් ලබා දෙන ලදී. පහතරට ප්‍රදේශවල ප්‍රධාන ගැටළුව වූයේ පඳුරු දුර්වල වීම බැවින් රත්නපුර මධ්‍යස්ථානයේ උපදෙස් සහ ව්‍යාප්ති කාර්යය මණ්ඩලය ඒ සඳහා යොමු විය. තවද පහතරට උපදෙස් සහ ව්‍යාප්ති කාර්යය මණ්ඩලය විසින් කුඩා තේ වගාවන්හි ගං වතුර හානි, නායයාම් හා පස් කඳු කඩා වැටීම් නිසා සමාගම් වතු තේ ඉඩම් වලට සිදු වූ හානි පිළිබඳව ද ගවේෂණය කරන ලදී.

**උපදෙස් ලිපි**: සමාගම් වතු, ඉඩම් හිමි වැවිලි කරුවන්ගේ වතු හා කුඩා තේ වතු වෙත සිදු කරන ලද උපදෙස් චාරිකා වලින් අනතුරුව ඒ සඳහා යොමු කරන ලද උපදෙස් ලිපි ද ඇතුලත් ව විවිධ විෂයයන් සම්බන්ධයෙන් සකසන ලද උපදෙස් ලිපි ගණන 1,123 ක් විය.

**කණ්ඩායම් පුහුණු වැඩ සටහන්**: තලවාකැලේ, රත්නපුර සහ මහනුවර සමාගම් වතු, ඉඩම් හිමි වැවිලි කරුවන්ගේ වතු හා කුඩා තේ වතු සඳහා පුහුණු වැඩ සටහන්, සම්මන්ත්‍රණ, වැඩ මුළු ආදිය 158 ක් පවත්වන ලදී. තේ පසු මැරීමේ ගැටළුව බහුලව ඇති බලංගොඩ ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන්, යහපත් කෘෂිකාර්මික ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීම සඳහා රත්නපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ උපදෙස් සහ ව්‍යාප්ති කාර්යය මණ්ඩලය විසින් ඒ වෙනුවෙන්ම සකසන ලද පුහුණු වැඩසටහන් රාශියක් පවත්වන ලදී.

**නේවාසික පුහුණු වැඩ සටහන්**

**ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන (NVQ Level 4)**

පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය මාස 4 ක නේවාසික NVQ Level 4 පුහුණු වැඩ සටහනක් 2016 වසරේ අවසන් කාලසීමාව තුලදී ආරම්භ කල අතර එය 2017 වසරේ මුල් මාස 2 තුල නිම කරන ලදී. ජ්‍යේෂ්ඨ උපදේශක නිලධාරී ජානක මහින්දපාල මහතා වැඩසටහන මෙහෙයවන ලදී. තේ තවාන් හා අලුත් තේ වගාවන් පවත්වා ගෙන යාම, දලු නෙලීම අධීක්ෂණය කිරීම, පරිණත තේ වගාවන් පාලනය, පරිපාලන වාර්තා පවත්වා ගෙන යාම, අමු දලු පරිහරණය හා ඒ පිළිබඳ අධීක්ෂණය වැනි තේ වගාව පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම මෙම වැඩසටහන මගින් සහභාගී වූවන්ට ලබා දෙන ලදී.

**වැවිලි කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව**

උපදේශක නිලධාරී, ටී. ජී. එන්. මහින්ද මහතාගේ සම්බන්ධීකරණය යටතේ තේ පර්යේෂණ ආයතනයේ පර්යේෂණ හා උපදේශක කාර්යය මණ්ඩලය මගින් සකස් කරන ලද NIPM හි වැවිලි කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාවේ දුරස්ථ පුහුණු මොඩියුලයට අදාල පළමු පාඨමාලාව මෙම වසර තුල සාමාජිකයන් 12 දෙනෙකු සඳහා දුරස්ථ ක්‍රමය මගින් පවත්වන ලදී. මෙම වැඩ සටහනේ සම්බන්ධීකරණ සැසි දෙකක් රත්නපුර හා තලවාකැලේදී පවත්වන ලදී.

**වැවිලි කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව**

ජූලි මස 6 සිට 13 දක්වා සහ ජූලි මස 18 සිට 26 දක්වා වැවිලි කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාවේ තේ මොඩියුලයේ සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යය දින 7 වැඩසටහන් දෙකක් තලවාකැලේ තේ පර්යේෂණ ආයතනයේදී පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා පාසල් හැර යන්නන් 31 ක් සහභාගී වූ අතර උපදේශක නිලධාරිනී හිරෝමි නිෂාන්ති මහත්මිය සිංහල මාධ්‍යය වැඩ සටහනද උපදේශක නිලධාරී සී. ජේ. ලියනාරච්චි මහතා ඉංග්‍රීසි මාධ්‍යය වැඩසටහන ද සම්බන්ධීකරණය කරන ලදී.

**ප්‍රාදේශීය තාක්ෂණික සහ ව්‍යාප්ති සංසදය (RTEF)**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කළමනාකාර ප්‍රදේශ 8 ම ආවරණය වන ලෙස කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහභාගීත්වයද ඇතිව ප්‍රාදේශීය තාක්ෂණික සහ ව්‍යාප්ති සංසද 13 ක් 2017 වසරේදී පවත්වන ලදී. මෙම සංසද තුලින් මතුවන විශේෂ කරුණු ප්‍රතිපත්ති සැලසුම්කරණය සඳහා පර්යේෂණ හා ව්‍යාප්ති සංසදයේදී තවදුරටත් සාකච්ඡා කෙරේ.

**ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු රැස්වීම් (RSC)**

රත්නපුර/කළුතර සහ මහනුවර ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු වැඩසටහන් 3 ක් පවත්වන ලදී.

**කුඩා තේ වතු අංශය සඳහා පර්යේෂණ සහ ව්‍යාප්ති සංසද**

2017 වසර තුල තලවාකැලේ හා රත්නපුර තේ පර්යේෂණ ආයතන වලදී කුඩා තේ වතු අංශය සඳහා පර්යේෂණ සහ ව්‍යාප්ති සංසද සැසි 2 ක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා තේ කම්හල් හිමියන්ගේ සංගමය සහ තේ සංවර්ධන සමිති නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විනි. කුඩා තේ වතු අංශයේ පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදය සම්බන්ධීකරණ කරන ලද්දේ උපදේශක නිලධාරී සී. ජේ. ලියනආරච්චි මහතා විසිනි. 2017 සැසි දෙකේ ඉදිරිපත් කිරීම් වල ප්‍රධාන මාතෘකා පහත දැක්වේ

**පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදය (කුඩා තේ වතු අංශය) 36 වැනි සභා රැස්වීම 2017 ජුනි 30**

- ආරාධිත දේශනය: ආන්තික තේ ඉඩම්වල ඵලදායිතාව ඉහල නැංවීම සඳහා අපනයන කෘෂි බෝග වගා කිරීම - ජේ එල් කේ වීරලාල් මහතා, අධ්‍යක්ෂ (සංවර්ධන), අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- පහතරට ප්‍රදේශයේ තේ පඳුරු දුර්වල වීමේ තත්වයට පාදක වී ඇති මූලික කරුණු- ආචාර්ය කේ එම් මොහොට්ටි මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (නිෂ්පාදන) තේ පර්යේෂණ ආයතනය
- කාබනික ද්‍රව්‍ය භාවිතා කිරීම මගින් පහතරට ප්‍රදේශයේ තේ පඳුරු දුර්වල වීම කළමනාකරණය කිරීම - ඩබ් එම් එස් විජයතුංග මහතා, පර්යේෂණ නිලධාරී, පාංශු සහ ශාක පෝෂණ අංශය
- පහතරට ප්‍රදේශයේ තිරසාර තේ වගාවක් සඳහා සුදුසු ප්‍රභේද තෝරාගැනීමට අත්වැලක් - එම් ඒ බී රණතුංග මහතා, ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිලධාරී, ශාක අභිජනන අංශය

**පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදය (කුඩා තේ වතු අංශය) 37 වැනි සභා රැස්වීම 2017 දෙසැම්බර් 22**

- ආරාධිත දේශනයː බීජ පනත සහ එය ක්‍රියාත්මක කිරීම - නිහාල් ප්‍රේමකුමාර මයා, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂක (සංවර්ධන) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- පහතරට තේ වගාකරුවන් මුහුණ පා ඇති දුෂ්කරතාවයන්
- ස්වභාවික උවදුරු හේතුවෙන් තේ වගාවට ඇතිවන ගැටළු

**රත්නපුර ප්‍රදේශයේ වටාපොත, දොලොස්වල, කිරිඇල්ල, පඹේගම, කීරගල, ස්ප්‍රින්ග්වුඩ්, ගලබොඩ සහ පොරොනුව වතුවල තේ වගා බිම් වල නායයාම් හා භූ පැලීම් වාර්තා වීම**

මෙම ගැටළුව හේතුවෙන්, එවැනි ක්ෂේත්‍රවල වැඩ කිරීමේ අවදානම නිසා සමහර තේ වගා බිම් අතහැර දමා ඇත. උපදේශක කාර්යය මණ්ඩලය සමග ශෂ්‍ය විද්‍යාත්මක අංශයේ කාර්යය මණ්ඩලය එවැනි ක්ෂේත්‍රවල සංචාරය කර නිරීක්ෂණ වාර්තා ගත  කරන ලදී. මෙම නායයාම් අතුරින් විශාලතම සහ බැරෑරුම් සිදුවීම වන වැඩිම මරණ සංඛ්‍යාවක් පොරොනුව වතුයායේ කිරිබත්ගල ක්ෂේත්‍ර අංක 3 සහ 13 හි වාර්තා විය. කෙසේ වුවද, මිනිසුන් විසින් අවභාවිතා කරන ලද වනාන්තර, නායයාම් සඳහා මූලික හේතුවකි. බොහෝ අවස්ථාවන්හි අනුමත කල නොහැකි ඉඩම් පරිහරණය සහ අතිරික්ත වැසි ජලය ගලා යාමට සුදුසු ජලාපවහන පද්ධතිවල හිඟ බව පොදු නිරීක්ෂණ ලෙස වාර්තා විය.

**ග්‍රැවිලියා සෙවන ශාක පසු මැරීම**

රත්නපුර දිස්ත්‍රික්කයේ හැදර්ලි වතුයායේ උන්නතාංශය මුහුදු මට්ටමේ සිට 400m වටා (Stubton කොටසේ - ක්ෂේත්‍ර අංක 3,14,12,10,9 A) සහ Alerton කොටසේ (ක්ෂේත්‍ර අංක 5, 1A) ප්‍රථම වරට ග්‍රැවිලියා (*Grevillea robusta*) පසු මැරීම වාර්තා විය. මෙම ගස් බොහෝමයක් වයස අවුරුදු 20ට වඩා පැරණි  වන අතර වට ප්‍රමාණය අඟල් 60-70 වේ. පහත දැක්වෙන ලක්ෂණ සහිතව පසු මැරීමේ තත්ත්වය ඇති වී ඇති බව නිරීක්ෂණය කරන ලදී.

- ප්‍රධාන කඳේ/ශාඛාවන්වල පැලීම්, පසුව කඳ පිළිකා ඇතිවීම
- පොත්තේ ආසාධනය වූ ප්‍රදේශ කළු පැහැයට හැරීම
- ඇලෙන සුළු ද්‍රව්‍යයන් ස්‍රාවය වීම
- අවසානයේ ඉහල සිට පත්‍ර හැලීයාම සහ තවදුරටත් ශාක පසු මැරීම

මෙම තත්ත්වය ඌව ප්‍රදේශයේ ශාක වල වාර්තා වී ඇති ග්‍රැවිලියා පසු මැරීමේ තත්ත්වයට සමාන බව විශ්වාස කෙරේ.

**කම්බිළි පණුවාගේ පැතිරීම**

ගල්ලැල්ල තේ පරීක්ෂක කලාපයේ කුඩා තේ වතුවල පාංශු පුනරුත්ථාපනය කරන ලද ඉඩම්වල කම්බිළි පණුවන්ගේ පැතිරීම වාර්තා විය.

**පහතරට කලාපයේ සිදුකරන ලද විශේෂ අධ්‍යයනය/සමීක්ෂණ**

**කුඩා තේ වතු වල තේ පඳුරු දුර්වල වීම පිළිබඳ අධ්‍යයනය**

පහතරට තෝරාගත් තේ පරීක්ෂක කලාපවල, ගැටළු සහගත තත්ත්වයන් හඳුනා ගැනීම සඳහා නියැදි සමීක්ෂණ සිදු කරන ලදී.

සමීක්ෂණයේ නිශ්චිත අරමුණු වූයේ,

- ගැටළුවේ ප්‍රමාණය සහ කලාපයේ ව්‍යාප්තිය හඳුනා ගැනීම
- ගැටළුවේ උපලක්ෂණ හඳුනා ගැනීම
- වටපණු ආසාධන තත්ත්වයන්ට අදාල ලක්ෂණ හඳුනා ගැනීම
- ඉක්මනින් ආසාධනය වීමට නැඹුරු වන වයස් කාණ්ඩය තීරණය කිරීම
- දරාසිටීමේ හැකියාවක් ඇති/ නැඹුරුතාවයක් දක්වන තේ ප්‍රභේද හඳුනා ගැනීම
- ගැටලුවේ ආර්ථික හානිය ඇස්තමේන්තු කිරීම

තේ පරීක්ෂක කලාප 9 ක ස්ථරීභූත, අහඹු සහ පොකුරු නියැදි ක්‍රමය අනුගමනය කර දත්ත රැස්කිරීම සම්පූර්ණ කරන ලදී. මෙතෙක් ලබාගත් දත්ත වලට අනුව ගැටළු විවිධ මුහුණුවරින් යුක්ත වූ අතර ප්‍රදේශයට අනුව අතු පිළිකා රෝගය, කඳ විදින ගුල්ලා, කඳ දිරායාම සහ වටපණු රෝගයන් සඳහා රෝගකාරක හඳුනා ගැනීමට හැකිවනු ඇත. සමීක්ෂණය තවදුරටත් සිදුකරමින් පවතී.

## සමාගම් වතුවල තේ අස්වැන්න පහත වැටීම පිළිබඳ අධ්‍යයනය

පහතරට තේ වගා කරන දිස්ත්‍රික්කයන්හි අස්වැන්නේ නැඹුරුතාවය තහවුරු කිරීමට සහ අස්වැන්න අඩුවීමට හා පඳුරු අඩුවීමට හේතුසාධක හඳුනා ගැනීමට නිරීක්ෂණ සිදුකරන ලදී. පසුගිය අවුරුදු 10 ක වතු වාර්තා වලට අනුව තේ අස්වැන්න සහ කම්කරුවන්ගේ ප්‍රමාණය පිළිබඳ දත්ත එකතු කරන ලදී. දත්ත විශ්ලේෂණය සඳහා රෝග විනිශ්චය පිළිබඳ සමීක්ෂණයේ දී ලබාගත් දත්තයන් ද භාවිතා කරන ලදී.

මෙම කලාපයන් හි මුළු තේ නිෂ්පාදනයේ හා සාමාන්‍ය අස්වැන්නේ අඩුවීම ප්‍රතිඵල මගින් අනාවරණය විය. රත්නපුර දිස්ත්‍රික්කයේ මුළු අස්වැන්නෙන් 13% ක් අඩු වී ඇති අතර සාමාන්‍ය අස්වැන්න 13% කින් අඩු වී ඇත. කෑගල්ල දිස්ත්‍රික්කයේ මුළු අස්වැන්නෙන් 24% ක අඩුවීමක් පෙන්වන ලද අතර ගාල්ල දිස්ත්‍රික්කයේ මුළු තේ නිෂ්පාදනයේ හා සාමාන්‍ය අස්වැන්නේ අඩුවීම 45% හා 7% ලෙස ද මාතර දිස්ත්‍රික්කයේ මුළු තේ නිෂ්පාදනයේ හා සාමාන්‍ය අස්වැන්නේ අඩුවීම 32% හා 6% ක් වේ.

පහතරට තේ නිෂපාදනය අඩුවීමට තේ පඳුරු වයස්ගත වීම, නැවත වගාකිරීම් අවම වීම, කම්කරු හිඟය, කඳ පිළිකා තත්ත්වයන්, කඳ කුණු වීම සහ කඳ ගුල්ලාගේ හානිය යන හේතූන් බලපාන බව ප්‍රතිඵලවලට අනුව තහවුරු වේ. පසුගිය අවුරුදු 10 ක කාලය තුළ පහතරට තේ නිෂ්පාදනය 27.7% ක සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇති බව ද සොයාගෙන ඇත.

## ගංවතුර තත්වය නිසා රත්නපුර දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන්ට සිදු වූ බලපෑම

රත්නපුර දිස්ත්‍රික්කයේ කුඩා තේ වතුවල ගංවතුරට පෙර හා පසු තේ අස්වැන්න හා වර්ධනයේ ප්‍රතිචාරය අධ්‍යයනය කිරීමට සමීක්ෂණයක් දියත් කරන ලදී. රත්නපුර දිස්ත්‍රික්කයේ තේ පරීක්ෂක කලාපයේ 2017 මැයි මාසයේ ගංවතුරෙන් හානි වූ කුඩා තේ වතු හිමියන් 98 ක් අහඹු ලෙස තෝරා ලබාදුන් ප්‍රශ්නාවලියක් මඟින් දත්ත හා නිරීක්ෂණයන් රැස් කර ගන්නා ලදී.

මෙම අධ්‍යයනයන්ට අනුව බොහෝමයක් බලපෑම් ඇති වූ ඉඩම් ස්වභාවික දියපාරවල සිට 100m අරයකින් පිහිටා ඇති අතර එම ඉඩම් සම්පූර්ණයෙන් ජලයෙන් යටවී ඇත. 50% ක් පමණ ඉඩම් ප්‍රමාණයක් දින 5 ක් පමණ ජලයෙන් යටවී තිබේ. බොර පැහැ ජලයෙන් යටවීමේ ප්‍රතිඵලයක් ලෙස තේ පත්‍ර මත රොන් මඩ තැන්පත් වන අතර ඒවා සති 2 ක පමණ කාලයක් තිබී ඇත. සමහර අවස්ථාවන් වලදී මාසයකට වඩා වැඩි කාලයක් පැවතී ඇත.

ගංවතුරෙන් යට වූ තේ ඉඩම් වල පත්‍ර හැලීයාම සිදු වූ අතර, 40% ක පමණ තේ ඉඩම් වල 20% ට වඩා පත්‍ර හැලී ගොස් තිබුණි. පත්‍ර හැලී යාම සිදු වූ 75% ක පමණ තේ පඳුරු වල නව අංකුර ඇතිවීමට මාසයකට වඩා කාලයක් ගත වන අතර, දරුණු ලෙස බලපෑමට ලක් වූ තේ පඳුරු වලට (80% ට වඩා) ඒ සඳහා මාස 2 ක ට ත් වඩා කාලයක් ගත වේ. ගංවතුරෙන් මාස 6 ක ට පසු, බලපෑමට ලක් වූ තේ පඳුරු වලින් 40% ක්, අවම වශයෙන් 50%ක් යථා තත්ත්වයට පත් වේ. ගංවතුරට යටවූ 40% ක පමණ ඉඩම්වල් 20% ක් පමණ වූ තේ පඳුරු ප්‍රමාණයක් මැරී ගොස් තිබූ අතර ඒවායින් වැඩි ප්‍රමාණයක් වයස වසර පහකට වඩා අඩුය. වයස සමඟ ගස් මැරීයාම හා පත්‍ර හැලීයාම අතර පැහැදිලි සම්බන්ධයක් දක්නට ලැබුණි. (සහසම්බන්ධ සංගුණකය -0.524 සහ -0.304 p= 0.05)

ගංවතුරෙන් බලපෑම් ඇති වූ තේ ඉඩම් වල (ගංවතුරෙන් මාස 6 කට පසු) අස්වැන්න අඩුවීමක් දක්නට ලැබුණු අතර අස්වැන්න පහත වැටීම සහ ගංවතුරෙන් යට වූ දින ගණන අතර සහසම්බන්ධයක් දක්නට ලැබුණි. (සම්මත අපගමනය 30% සහ සහසම්බන්ධ සංගුණකය 0.894, p=0.05 )

## අස්වැන්න අඩුවීම සහ පහතරට තේ පඳුරු දුර්වල වීම අවම කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශය

වගු අංක 2. ක්‍රියාකාරකම් සැලැස්ම හා 2017 වර්ෂය අවසානය වන විට ක්‍රියාකාරකම් වල ප්‍රගතිය

| | ක්‍රියාකාරකම සහ ප්‍රගතිය |
|---|---|
| 01 | වැඩසටහන හඳුන්වා දීම සඳහා සමාරම්භක වැඩමුළුව පවත්වන ලදී |
| 02 | පොදු ජනතාව දැනුවත් කිරීම සඳහා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රාදේශීය ආයතන සහ ප්‍රාදේශීය නිලධාරීන් අතර බැනර් බෙදා හරින ලදී. (ප්‍රගතිය 100%) |
| 03 | පඳුරු දුර්වල වීමට හේතුවූ වටපණුවන්ගේ බලපෑම හඳුනා ගැනීම සහ පඳුරු දුර්වල වීම සඳහා රෝගකාරක හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණ ආරම්භ කරන ලදී. බලාපොරොත්තු වූ තේ |

| | |
|---|---|
| | පරීක්ෂක කලාප 17න් 9ක සමීක්ෂණ සම්පූර්ණ කරන ලදී. (ඇල්ලරාව, ගල්ලෑල්ල, වේවැල්වත්ත, කලවාන, පොතුපිටිය, නෙළුව, උඩුගම, මතුගම සහ දැරණියගල) (ප්‍රගතිය 55%) |
| 04 | කලාපය තුල ආදර්ශණ අත්හදා බැලීම් 7ක් පිහිටුවන ලදී (ප්‍රගතිය 40%) |
| 05 | තේ වගාකරුවන් දැනුවත් කිරීම සඳහා කුඩා බෝග සායන, ප්‍රදර්ශන 2 ක් සහ බලංගොඩ ප්‍රදේශයේ නැවත වගාකිරීමේ ආදර්ශණ වැඩසටහන් 6 ක් පවත්වනු ලැබීය. (ප්‍රගතිය 45%) |
| 06 | පෝස්ටර් 5000 ක් සහ අත්පත්‍රිකා 5000 ක් මුද්‍රණය කර ප්‍රදේශය තුල තේ වගාකරුවන් අතර බෙදා හරින ලදී (ප්‍රගතිය 50%) |
| 07 | කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ සහ කුඩා තේ වතු හිමියන්ගේ නියෝජිතයන්ගේ දැනුම වර්ධනය කිරීමට RTEF වැඩසටහන් 7 ක් සහ පර්යේෂණ හා ව්‍යාප්ති වැඩසටහන් (කුඩා තේ වතු අංශය) පවත්වන ලදී (ප්‍රගතිය 90%) |
| 08 | සමාගම් වතු අංශයේ තේ වගාවන්හි වැවිලිකරුවන්ගේ දැනුම වර්ධනය කිරීමට පර්යේෂණ හා ව්‍යාප්ති වැඩසටහන් (සමාගම් වතු අංශය) සහ RSC වැඩසටහනක් පවත්වන ලදී. (ප්‍රගතිය 70%) |
| 09 | පෞද්ගලික ව්‍යාප්ති සේවකයන්ගේ සහ කෘෂිරසායන වෙළඳුන්ගේ දැනුම වර්ධනය කිරීමට රත්නපුර තේ පර්යේෂණ ආයතනයේ දී දින දෙකක වැඩමුළුවක් පවත්වන ලදී. (ප්‍රගතිය 25%) |
| 10 | කුඩා තේ වතු හිමියන්ගේ ගැටළු පිළිබඳව අඛණ්ඩව දැනුවත් කිරීම සඳහා ජංගම දුරකථන හරහා කෙටි පණිවිඩ යවන ලදී. (ප්‍රගතිය 50%) |
| 11 | ගැටළු සහ විසඳුම් පිළිබඳ පොදු ජනතාව දැනුවත් කිරීමට “සාර ප්‍රභාගිර” ගුවන්විදුලි වැඩසටහන, පුවත්පත් සාකච්ඡා, ප්‍රකාශයට පත් කල පුවත්පත් වාර්තා වැනි ජනමාධ්‍ය පහසුකම් භාවිතා කිරීම. (ප්‍රගතිය 70%) |
| 12 | තේ වගා කරන්නන් සඳහා නව වටපණු නාශක හඳුනාගැනීම සඳහා කටයුතු කිරීම. (ප්‍රගතිය 35%) |

### රත්නපුර ප්‍රදේශයේ දුර්වල වූ තේ නැවත වගා කිරීමේ යෝජනාව

“වටපණු හානිය, පඳුරු දුර්වල වීම හා පසුමැරීමේ රෝගි තත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ බලංගොඩ, ඉඹුල්පේ, රත්නපුර, කලවාන, පැල්මඩුල්ල හා කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල කුඩා තේ ඉඩම් නැවත වගා කිරීම” යන මාතෘකාව යටතේ ව්‍යාපෘති යෝජනාව සැකසීමට ජ්‍යේෂ්ඨ උපදේශක නිලධාරී ජානක මහින්දපාල මහතා දායක විය. මෙම යෝජනාව අමාත්‍යංශය හරහා STaRR ව්‍යාපෘතියට ඉදිරිපත් කර ඇත.

### ඉන්දියාවේ පූනේ හි *STIHL* පෞද්ගලික සමාගමේ යන්ත්‍ර පිලිබද චාරිකාවෙන් ලබාගත් අත්දැකීම්

ඉහත චාරිකාවෙන් කප්පාදු කිරීම, වලවල් හෑරීම,  තෘණ කැපීම, රසායන ද්‍රව්‍ය ඉසීමට භාවිතා වන යන්ත්‍ර රැසක් නිරීක්ෂණය කිරීමේ අවස්ථාවට සහ පුහුණු සහ අන්තර් ක්‍රියාකාරී සැසි සඳහා සහභාගී වීමට එස්. පී රත්නායක මහතාට අවස්ථාව ලැබුණු අතර විශේෂයෙන් තෘණ කපන යන්ත්‍රය, ද්‍රව ඉසිනය, බහුකාර්ය පෙට්‍රල් /2T යන්ත්‍රය වැනි යන්ත්‍ර පිළිබඳ දැනුම ඉතා ප්‍රයෝජනවත් විය. සෑම යන්ත්‍රයකම සුවිශේෂී අංගයන් වීඩියෝ දර්ශන සමඟ ප්‍රායෝගිකව සාකච්ඡා කරන ලදී. ඉන්ධන දාමයන්, ඉලාස්ටෝ ස්විච්චය, මැග්නීසියම් මිශ්‍ර ආවරණ වැනි නවීන තාක්ෂණික ලක්ෂණ ප්‍රයෝජනවත් මෙන් ම ආර්ථිකව ද වැදගත් විය. තේ කර්මාන්තයේ දී වර්තමානයේ මුහුණ දෙන සහ අනාගතයේ දී මුහුණදීමට සිදුවන කම්කරු ගැටළුවලට මෙම යන්ත්‍ර බොහෝමයක් ඉතා ප්‍රයෝජනවත් වේ.

2015 වසරේ යන්ත්‍ර හඳුන්වාදීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ Figaro ආයතනයෙන් (ශ්‍රී ලංකාවේ *STIHL* යන්ත්‍ර ඒජන්තවරු) මිලදී ගත් තේ කප්පාදු යන්ත්‍රය කුඩා තේ වතු හිමියන් සාර්ථකව භාවිතා කල යන්ත්‍රයකි. ඒ බව පිරිවැය/ප්‍රතිලාභ විශ්ලේෂණයන්ට අනුව හා යන්ත්‍රයේ භාවිතය/කාර්යක්ෂමතාව පිළිබඳ දත්තවලට අනුව පෙන්නුම් කරයි. *STIHL* යන්ත්‍රවල මිල ගණන් දේශීය වෙළඳපොල තුල ඉහළ මට්ටමක පවතින අතර එය සැලකිල්ලට ගත යුතු කරුණක් බව පෙන්වා දෙන ලදී.

මෙම යන්ත්‍ර ශ්‍රී ලංකාවේ තත්ත්වයන්වලට අනුගත කිරීමට අවශ්‍ය වෙනස්කම් කිරීම සඳහා ANDREAS STIHL පුද්ගලික සමාගමේ නිලධාරීන් සමඟ ඵලදායී අන්තර් ක්‍රියාකාරී සැසි පැවැත්විණි. යාන්ත්‍රීකරණ ව්‍යාපෘතිය අතරතුර දී පුහුණු කරන්නන් පුහුණු කරවීමේ සැසි (TOT) වලදී ලබාගත් ප්‍රතිචාර සහ කුඩා තේ වතු හිමියන් විසින් ඔවුන්ගේ අවශ්‍යතාවය සහ ශ්‍රී ලංකාවේ දැනටමත් පවතින යන්ත්‍ර උපකරණ භාවිතයත් සමඟ මුහුණ දී ඇති ගැටළු පිළිබඳව ආකෘති පත්‍රයක් තුලින් ප්‍රතිචාර ලබාගත් අතර ඒවා නිෂ්පාදකයන්ට ඉදිරිපත් කරන ලදී. අප විසින් ඉදිරිපත් කරන ලද අදහස් වලට සමාගමේ නිලධාරීන් ධනාත්මක ව ප්‍රතිචාර දැක් වූ අතර අනාගතයේ ශ්‍රී ලංකාවේ තත්ත්වයන්ට වඩාත් ගැලපෙන හා උසස් තත්ත්වයේ යන්ත්‍ර සැපයීමටද ඔවුන් බලාපොරොත්තු වේ.

### ව්‍යාප්ති හා පර්යේෂණ සම්බන්ධීකරණ සංසදය

මෙම වසර තුළදී ව්‍යාප්ති හා පර්යේෂණ සම්බන්ධීකරණ සංසදයක් ආචාර්ය වී.එස්. සිදාකරන් මහතාගේ සම්බන්ධීකරණයෙන් සංවිධානය කරන ලදී.

### පස්, ශාක හා පොහොර සාම්පල විශ්ලේෂණ සේවාව

මෙහි ප්‍රධාන පරමාර්ථය වන්නේ සේවාදායකයන්ට ඔවුන්ගේ පස්, ශාක, රසායනික පොහොර සහ කාබනික පොහොර සඳහා විශ්ලේෂණ පහසුකම් ලබාදීමයි.

2017 වසරේ දි තලවාකැලේ, වලහන්දුව සහ හන්තාන විශ්ලේෂණාගාර මගින් කරන ලද පස්, ශාක, රසායනික පොහොර සහ කාබනික පොහොර සඳහා විශ්ලේෂණ සංඛ්‍යාව පිළිවෙලින් 15,557, 2189, 3008 සහ 130 වේ. මෙම සියලු විශ්ලේෂණ අතරින් වැඩිම විශ්ලේෂණ සංඛ්‍යාවක් පරීක්ෂා කර ඇත්තේ පාංශු pH අගය (6927) සහ කාබන් ප්‍රතිශතය (5026) සඳහාය. 2017 වසරේ කරන ලද මුළු විශ්ලේෂණ සංඛ්‍යාව 20,884 ක් විය.

### වෙනත් විශ්ලේෂණ සේවා

මහා පරිමාණයේ වතුවලට හා කුඩා තේ වතුහිමියන්ට වටපණුවන්ගේ හානිය හඳුනා ගැනීම, වටපණු විශ්ලේෂණ සේවාව, වටපණු ආසාදන වැළැක්වීම හා පාලනය පිළිබඳ අදාල උපදෙස් හා නිර්දේශ ලබා දීම තලවාකැලේ, රත්නපුර හා හන්තාන යන මධ්‍යස්ථානවල කීට විද්‍යා හා වට පණු විද්‍යා අංශය මගින් සිදුකරනු ලැබිණි.

තලවාකැලේ, රත්නපුර හා හන්තාන යන මධ්‍යස්ථානවලින් සපයන ලද එම සේවාවන් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

වගු අංක 3. වටපණු ආසාදන පිළිබඳව කීට විද්‍යා හා වට පණු විද්‍යා අංශය මගින් සිදුකළ විශ්ලේෂණයන්

| වටපණු විශ්ලේෂණ සේවාව | තලවාකැලේ | හන්තාන | රත්නපුර |
|---|---|---|---|
| මහා පරිමාණ වතු | 16 | 11 | 71 |
| කුඩා තේ වතු | 2 | 2 | 20 |
| පහතරට තේ වගාවේ අස්වනු අඩු වීම, තේ පඳුරු මැරී යාම අධ්‍යයනය සඳහා සිදුකරන ලද සමීක්ෂණය | 142 | 180 | 230 |
| මුළු එකතුව | 160 | 193 | 321 |

බලංගොඩ, කලවාන හා දෙනියාය ප්‍රදේශවල අස්වැන්න අඩුවීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කෙරිණි.

ශාක කායික විද්‍යා අංශය මගින් කප්පාදුවට පෙර සිදු කල යුතු මුල් වල පිශ්ඨ පරීක්ෂණ තිස් හයක් සිදුකරන ලද අතර, ඒ අනුව කප්පාදු කිරීම සඳහා තේ ගස සුදුසු තත්වයක පවතීද යන්න පිළිබඳව උපදෙස් අදාල වතු සඳහා ලබාදෙන ලදී.

කළු තේ සාම්පල 32ක්, හරිත තේ සාම්පල 63ක්, ජල සාම්පල 5ක්, මුල් සාම්පල 7ක් සහ පස් සාම්පල 3ක් ශාක ව්‍යාධි විද්‍යා අංශය මගින් පරීක්ෂා කර ඇත

### වෙනත් පුහුණු කටයුතු

කීටවිද්‍යා හා වටපණු විද්‍යා අංශය මගින් මහා පරිමාණයේ වතුවලට හා කුඩා තේ වතුහිමියන්ට කෘමින් හා මයිටාවන් ගේ හානිය හඳුනාගැනීම හා අදාල උපදෙස් ලබා දීම තලවාකලේ, රත්නපුර, හන්තාන යන මධ්‍යස්ථානවල පිහිටි විද්‍යාගාර මගින් සිදුකරනු ලැබිණි.

- තේ කොල කන දළඹුවන් විශේෂයක් (*Somena scintillans*) තංගකැලේ වත්තෙන් සොයාගන්නා ලද අතර පාලනය කර ගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් පසු උපදෙස් දෙන ලදි.
- ඉඹුල් පිටිය වත්තෙ හි වේයන්ගේ හානිය පාලනය කර ගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් පසු උපදෙස් දෙන ලදී.
- ෆර්න්ලෑන්ඩ් වත්තෙ හි වේයන්ගේ හානිය පාලනය කර ගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් පසු උපදෙස් දෙන ලදී.
- නායපාන වත්තෙ හි වේයන්ගේ හානිය පාලනය කර ගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් පසු උපදෙස් දෙන ලදී.

– මාවුස්සාකැලේ වත්තෙ හි කුහුඹුවන්ගේ හානිය පාලනය කර ගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් පසු උපදෙස් දෙන ලදී.

## ප්‍රකාශන ඒකකය

ආයතනයේ සඟරා, වාර සඟරා, පොත්, උපදෙස් චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ මුද්‍රණය කිරීම, ප්‍රසිද්ධ කිරීම හා නිකුත් කිරීම ආයතනයේ ප්‍රකාශන අංශය මගින් සිදු කර ඇත.

පහත සඳහන් ප්‍රකාශන මෙම වර්ෂය තුළ නිකුත් කරන ලදී.

- "තේ ඉඩම්වල පස සංරක්ෂණය"
- "Integrated Soil fertility Management Strategies for Tea Stakeholders"
- "Synopsis of the contributions of tea research towards the sustainable development of the tea industry in Sri Lanka"
- ශ්‍රී ලංකා තේ සඟරාව - වෙළුම. 81, 1 සහ 2 කොටස, 2015
- තේ විවරනිකාව, වෙළුම. 24,1 සහ 2 නිකුතුව, 2015
- තේ ක්ෂේත්‍රයෙහි පළිබෝධ නාශක භාවිතය පිළිබඳ PU1 නව උපදෙස් චක්‍රලේඛය
- මෙහෙයුම් ක්‍රම විධි පිළිබඳ මාර්ගෝපදේශනය අංක 1/ 17 ප්‍රකාශයට පත් කිරීම
- වාර්ෂික වාර්තාව 2015 (ඉංග්‍රීසි, සිංහල, දෙමළ)

ප්‍රකාශන අලෙවියෙන් ලැබූ ආදායම රුපියල් 204,335.00 කි.

| අංක | ප්‍රකාශනය | අලෙවි කල ප්‍රමාණය | ආදායම (රු.) |
|---|---|---|---|
| 1 | Handbook on Tea | 52 | 90,500.00 |
| 2 | Twentieth Century Tea Research in Sri Lanka | 03 | 6,000.00 |
| 3 | Monograph No. 5 | 31 | 10,850.00 |
| 4 | Monograph No. 6 | 08 | 800.00 |
| 5 | Monograph No. 7 | 20 | 2,000.00 |
| 6 | Shoot Growth & Harvesting of Tea | 17 | 1,700.00 |
| 7 | ක්ෂේත්‍ර අත් පොත (දෙමළ) | 19 | 2,375.00 |
| 8 | රසායනික ක්‍රම මගින් පළිබෝධ පාලනය (ඉංග්‍රීසි) | 19 | 2,850.00 |
| 9 | රසායනික ක්‍රම මගින් පළිබෝධ පාලනය (දෙමළ) | 02 | 100.00 |
| 10 | Tea & Health | 08 | 6,000.00 |
| 11 | Tea for Health | 77 | 7,700.00 |
| 12 | තේ වගාවේ පිරිවැය තවානේ සිට ක්ෂේත්‍රය දක්වා | 10 | 4,000.00 |
| 13 | උපදෙස් චක්‍රලේඛ ෆෝල්ඩර්ස් (ඉංග්‍රීසි) | 38 | 22,800.00 |
| 14 | උපදෙස් චක්‍රලේඛ ෆෝල්ඩර්ස් (සිංහල) | 27 | 13,500.00 |
| 15 | ශ්‍රී ලංකාවේ තේ ඉඩම්වල වල් පැළෑටි | 26 | 5200.00 |
| 16 | Correction of Nutrient Deficiency Symptoms in Tea (English) | 10 | 150.00 |
| 17 | Correction of Nutrient Deficiency Symptoms in Tea (Tamil) | 07 | 105.00 |
| 18 | Correction of Nutrient Deficiency Symptoms in Tea (Sinhala) | 05 | 75.00 |
| 19 | Wall Chart on Major Pests of Tea in Sri Lanka | 19 | 1,900.00 |
| 20 | සැවැන්දරා මගින් පස සංරක්ෂණය කිරීම පෝස්ටරය (ඉංග්‍රීසි) | 01 | 30.00 |
| 21 | සැවැන්දරා මගින් පස සංරක්ෂණය කිරීම පෝස්ටරය (දෙමළ) | 02 | 60.00 |
| 22 | සැවැන්දරා මගින් පස සංරක්ෂණය කිරීම පෝස්ටරය (සිංහල) | 03 | 90.00 |
| 23 | සුව රැකුමට තේ | 34 | 4,250.00 |
| 24 | ශ්‍රී ලංකා තේ සඟරාව | 01 | 100.00 |

| | | | |
|---|---|---|---|
| 25 | තේ විවරනිකාව | 10 | 500.00 |
| 26 | තේ සම්බන්ධ සංයුක්ත තැටි | 02 | 500.00 |
| 27 | පසේ ඵලදායිතාවය පෝස්ටරය (දෙමළ) | 01 | 50.00 |
| 28 | නුවරඑළිය දිස්ත්‍රික්කයේ සංවර්ධන සැලැස්ම | 01 | 150.00 |
| 29 | Integrated Soil fertility Management Strategies for Tea Stakeholders | 38 | 19,000.00 |
| 30 | වාර්ෂික වාර්තාවන් | 10 | 1000.00 |
| | එකතුව | | 204,335.00 |

## පුස්තකාලය

තේ පර්යේෂණායතනය එහි පුස්තකාල සේවාවන් සිය කාර්යය මණ්ඩලය වෙත මෙන් ම තේ පර්යේෂණායතනයට අනුයුක්තව තම අධ්‍යයන ව්‍යාපෘතිවල නියැලෙන උපාධි අපේක්ෂක සහ අනෙකුත් කෘෂිකර්ම පාඨමාලා හදාරන සිසුන් සඳහා ලබාදෙන අතර ලිඛිත ඉල්ලීම් මත පිටස්තර විද්වතුන්ට හා පුස්තකාලවලට ද සේවාවන් ලබා දීම සිදු කරයි.

පොත් පත් අයත් කර ගැනීම, සුචිගත කිරීම, වර්ගීකරණය, පුස්තකාල පොත් බැහැර දීම, අන්තර් පුස්තකාල කටයුතු, ඡායා පිටපත් සේවය මෙන්ම පුවත්පත් ලිපි ගොනුව පවත්වාගෙන යාම යනා දී කටයුතු වර්ෂය තුළ දී සිදු කරන ලදී.

දැනට පවතින 4741 ක් වූ පොත් එකතුව සඳහා මෙම වර්ෂය තුළ එකතු වූ පොත් සංඛ්‍යාව අටකි. වාර්ෂික දායකත්වය මත හා පරිත්‍යාග / හුවමාරු ක්‍රමය යටතේ වාර සඟරා 30 ක් ලැබුනු අතර මින් 7 ක් වාර්ෂික දායකත්වය මත ලබා ගත් විදේශ වාර ප්‍රකාශන වේ.

වර්ෂය තුළ අධ්‍යක්ෂකතුමා වෙත ලබාදෙන ලද පුවත්පත් ලිපි සංඛ්‍යාව 591 කි. අන්තර් පුස්තකාල හුවමාරුව යටතේ පර්යේෂණ ලිපි තුනක් අප පර්යේෂණ කාර්යය මණ්ඩලය වෙත සපයා දෙන ලදී. පර්යේෂණ සහ අනෙකුත් කාර්යය මණ්ඩලය වෙත පිටු 2135 ක ඡායා පිටපත් ප්‍රමාණයක් බැදි වාර සඟරා එකතුවෙන් හා අනෙකුත් පොත්පත් වලින් වර්ෂය තුළ දී ලබා දෙන ලදී. තම අධ්‍යයන කටයුතු වෙනුවෙන් පුස්තකාලය පරිහරණය කරණු ලැබූ සිසුන් සංඛ්‍යාව 22 කි.

## තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකය

### ආයතනික වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වා ගෙන යෑම

තේ වගාකිරීම සහ නිෂ්පාදනය පිළිබඳව තාක්ෂණික තොරතුරු සේවාදායකයා වෙත සන්නිවේදනය කිරීම ආයතනික වෙබ් අඩවියේ ප්‍රමුඛ අරමුණයි. එම අරමුණ සාක්ෂාත් කර ගනු වස් මෙම වසර තුල පහත සඳහන් තොරතුරු ඇතුළත් කරමින් වෙබ් අඩවිය යාවත්කාලීන කරන ලදී.

2017 වසරේ රාජකාරී ආරම්භය සැමරුම, "පහතරට තේ ඉඩම් වල වටපණු ආසාධන තර්ජන අවම කිරීම සඳහා ඒකාබද්ධ ක්‍රියාපිළිවෙත් අනුගමනය කිරීම ප්‍රචලිත කිරීමේ වසර" ලෙස නිල වශයෙන් ප්‍රකාශයට පත් කිරීම, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ තලවාකැලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතන ප්‍රධාන කාර්යාලයේ සංචාරය, "තිරසර යුගයක හරිත උදානය" ජාතික ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ සහභාගිත්වය, "ජාතික පාරිසරික සතිය - 2017" සමාරම්භක වැඩසටහන, චීනයේ ගරු කෘෂිකාර්මික උප ඇමතිතුමාගේ සහ ගරු වැවිලි කර්මාන්ත ඇමති නවීන් දිසානායක මැතිතුමාගේ තේ පර්යේෂණ ආයතන සංචාරය, ලංකා තේ (Ceylon Tea) සඳහා වසර 150ක් සපිරීම නිමිත්තෙන් ජූලි 6 වන දින පැවති ලෝක තේ පැන් සාදය (World Tea Party), අගෝස්තු 11 සිට 13 දක්වා පැවති පොල්, රබර් සහ තේ වෙළෙඳපොළ සහ ප්‍රදර්ශනය (CRT Trade Fair & Exhibition) සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ සහභාගිත්වය, අගෝස්තු 12 සහ 13 දිනවල පැවති ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ අන්තර් රාජ්‍ය කණ්ඩායම් (FAO-IGG) වාර රැස්වීම,

උඩරට කලාපය සඳහා වැඩිදියුණු කරන ලද TRI 5000 කාණ්ඩයේ තේ ප්‍රභේද 4ක් නිල වශයෙන් නිකුත් කිරීම, ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් සංවිධානය කරන ලද "කෘෂිකාර්මික පර්යේෂණ 2017" ජාතික සම්මාන උළලේදී තේ පර්යේෂණ ආයතන විද්‍යාඥයින් වැවිලි කර්මාන්ත අංශයේ ප්‍රථම ස්ථානයෙන් පිදුම් ලැබීම ආදිය වෙබ් අඩවියේ "මුල් පිටුවේ" (Home Page), "කාලීන තොරතුරු" (What's New) යටතේ පල කරන ලදී.

තේ පර්යේෂණ මණ්ඩලය, පර්යේෂණ උපදේශක කමිටුව, වතුයාය සහ උපදෙස් අංශය සඳහා වන උපදේශක කමිටුව සහ විගණන හා කළමණාකරන කමිටු සාමාජිකත්වයේ සිදුවන වෙනස්වීම් මෙන්ම ශාක කායික විද්‍යා අංශයෙහි තොරතුරු සහ සේවක මණ්ඩලයෙහි සිදුවන වෙනස්වීම් ඒ ඒ අවස්ථාවන් වලදී ඇතුලත් කරන ලදී. 232 වන පර්යේෂණ හා ව්‍යාප්ති සංසදයේ රැස්වීම් වාර්තාව (proceedings) මෙන්ම 233 සහ 234 රැස්වීම් වල පූර්ව ප්‍රචාරක පණිවුඩ සහ ඒවායෙහි ඉදිරිපත්කිරීම් (presentations) "තාක්ෂණ ප්‍රචාරණ" (Technology Dissemination) යටතේ ඇති "ව්‍යාප්ති වැඩසටහන් " (Extension Events) පිටුවේ පළ කරන ලදි.

නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන), කළමණාකරන සහායක (මුදල් අයකැමි), පිළිගැනීමේ නිලධාරී සහ දුරකතන ක්‍රියාකරු, යන්ත්‍රශිල්පී, කණිෂ්ඨ සහකාර ලිපිකරු, අභ්‍යන්තර විගණක, නේවාසික ඉංජිනේරු, ඉංජිනේරු සහකාර (යාන්ත්‍රික), නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති), ජ්‍යේෂ්ඨ ගණකාධිකාරී, පරිගණක ජාල පරිපාලක, පරිපාලන නිලධාරී (මානව සම්පත් සංවර්ධන), සභාපතිගේ පුද්ගලික සහකාර, තාක්ෂණික නිලධාරී (විදුලි), තාක්ෂණික නිලධාරී (යාන්ත්‍රික), ජ්‍යේෂ්ඨ උපදෙස් නිලධාරීන්, ව්‍යාප්ති නිලධාරීන්, කළමණාකරන සහකාර (ගබඩා භාරකරු), කළමණාකරන සහකාර (ගිණුම්) යන රැකියා ඇබෑර්තු දැන්වීම් පළ කරන ලදී.

### යටිතල පහසුකම් සංවර්ධනය සහ නඩත්තුව

- වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සහ ආයතනික අවශ්‍යතාවය මත මිලදී ගත් මේසය මත තබන පරිගණක 21 ක්, ජංගම පරිගණක 8 ක්, පරිපූර්ණ දෙපැති ලේසර් මුද්‍රක 12 ක්, බහුකාර්ය ලේසර් මුද්‍රක 2 ක්, බහුකාර්ය වර්ණ තීන්ත ක්ෂෙප (inkjet) මුද්‍රක 2 ක්, තිත් න්‍යාස (dot matrix) මුද්‍රක 2 ක්, පැතලි මතුවක (flatbed) පරිලෝකන යන්ත්‍ර 3 ක්, පුස්තක පරිලෝකන යන්ත්‍ර (book scanner) යක්, 650VA අඛණ්ඩ විදුලි සැපයුම් (UPS) යන්ත්‍ර 29 ක් සහ 1200VA අඛණ්ඩ විදුලි සැපයුම් යන්ත්‍ර 4 ක් ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය/ ව්‍යාප්ති මධ්‍යස්ථාන අතරේ බෙදා හරින ලදී.
- කැස්ප'ස්කි (Kasperskey®) ප්‍රතිවෛරස මෘදුකාංගයේ බලපත්‍ර 111 ක් මිළදී ගෙන ප්‍රධාන කාර්යාලය සතු මේසය මත තබන හා ජංගම පරිගණක තුල ස්ථාපනය කරන ලදි.
- අන්තර්ජාල සබඳතාවය සහ භාවිතය කළමනාකරණය කිරීම සඳහා භාවිතා කරන පරිශීලක ක්‍රියා සෝදිසි කිරීමේ සහ අවදානම කළමනාකරණ කිරීමේ මෘදුකාංගයේ (Cyberoam®) බලපත්‍රය අළුත් කරන ලදී.
- පරිගණක සහ එම උපාංගවල දෝෂ නිරාකරණය මෙන්ම පරිගණක ජාලයේ දෝෂ නිරාකරණය කිරීම යටතේ ප්‍රධාන කාර්යයන් 90 ක් නිමකර ඇත.

### වෙනත් සේවාවන්

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකය ආයතනයේ අනෙකුත් අංශ, ඒකක, ප්‍රාදේශීය සහ ව්‍යාප්ති මධ්‍යස්ථාන මෙන්ම තේ.ප.ආ. තේ වතු යායන් සඳහාද පහත සඳහන් සේවාවන් ලබා දී තිබේ.

- වසම් නාම පද්ධති (Domain Name System), විද්‍යුත් තැපැල් සහ ගොනු ගබඩා (File Server) යන සේවා පරිගණක පරිපාලනය සහ නඩත්තුව
- කාර්යය මණ්ඩලය සඳහා අන්තර්ජාල පහසුකම් සැපයීම සහ භාවිතය පිළිබඳව සෝදිසි කිරීම
- විවිධ වාර්තා, ඉදිරිපත් කිරීම්, ලිපි ලේඛන සහ පරිගණක චිත්‍රක ආදිය සකස් කිරීම සඳහා කාර්යය මණ්ඩලයට උපකාර කිරීම

යූ. ඩී. අලගියවඩු මහතා පහත සඳහන් කාර්යයන් සඳහා වසර පුරා සේවය ලබාදෙන ලදී.

- ප්‍රධාන කාර්යාලයේ සහ පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ඇඟිලි සළකුණු යන්ත්‍ර සහ එහි මෘදුකාංගය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම
- පරිගණක, උපාංග සහ එම මෘදුකාංග සඳහා වන ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර පවත්වා ගෙන යාම
- සී. සී. ටී. වී. කැමරා පද්ධතිය නඩත්තු කිරීම

- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ විෂයට අදාල ප්‍රසම්පාදන සඳහා තාක්ෂණික පිරිවිතරයන් සකස් කිරීම සහ එම තාක්ෂණික ඇගයීම් කමිටු නියෝජනය කිරීම

**විශේෂ කාර්යයන්**

**තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකයේ හඳුනාගත් ප්‍රධාන සේවාවන් සඳහා බාහිර පාර්ශවයක සේවය ලබා ගැනීම**

ලංකා කොමියුනිකේෂන් සර්විසස් පෞද්ගලික සමාගම (Lanka Communication Services Private Limited) ඔවුන්ගේ සේවාව තවදුරටත් මෙම වසර පුරාවටම ලබා දෙන ලදී.

## තේ පර්යේෂණායතන ප්‍රාදේශීය මධ්‍යස්ථාන














## පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය - රත්නපුර


**එම්. ඒ. විජේරත්න**
**කෘෂිකර්ම විද්‍යාවේදී (රුහුණ, ශ්‍රී ලංකාව), දර්ශන ශූරී (ලන්ඩන්)**
**ස්ථාන භාර නිලධාරී**


### කාර්ය මණ්ඩල වෙනස්වීම්

කේ. ඒ. ඩී. සුදත් ප්‍රදීප් (කලමනාකරණ සහකාර - ගිණුම්) සහ ජේ. එම්. ජී. ඩබ්. ජයවීර (විදුලි කාර්මික) යන මහත්වරුන් අප්‍රේල් මස 3 වන දින සහ ජුනි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රධාන කාර්යාලයට ස්ථාන මාරු ලැබිය. ජේ. එම්. ආර්. කේ. බණ්ඩාර මයා (විදුලි කාර්මික) ජුනි මස 1 වන දින සිට රත්නපුර මධ්‍යස්ථානය ට පැමිණියේය. එස්. කෝනේෂ්වරමූර්ති මහතා (ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී) 2017 මැයි මස සිට ප්‍රධාන කාර්යාලයේ සිට රත්නපුර මධ්‍යස්ථානයට ස්ථාන මාරුවක් ලැබීය. කමලණාත් ගුණවර්ධන මහතා (වැඩ පරීක්ෂක) අගෝස්තු මස මැදරට ස්ථානයට ස්ථාන මාරුවක් ලැබීය. එච්. එස්. එන්. පීරිස් (අත්හදා බැලීමේ නිලධාරී) අවරුදු 30 ක සේවා කාලයකට පසුව විශ්‍රාම යන ලදී. ඩී. ඩී. ජී. එස්. ජයසිංහ මහතා (කළමනාකරණ සහායක) සැප්තැම්බර් මස සේවයෙන් ඉල්ලා අස්වූ අතර එච්. එන්. හිරුනි දයානන්ද මහත්මිය (ව්‍යාප්ති නිලධාරී) නොවැම්බර් මස 2 වන දින සේවයෙන් ඉල්ලා අස් විය. රියදුරු පී. ජී. අමරතුංග මහතා නොවැම්බර් මස 24 දින සේවයෙන් විශ්‍රාම යන ලදී.

### පර්යේෂණ හා ව්‍යාප්ති කටයුතු

පර්යේෂණ අංශවල නිලධාරීන් අදාල වර්ෂය තුල දී පර්යේෂණ 101ක නිරත වී ඇත. ඒ පිළිබඳ පූර්ණ විස්තර අදාල අංශ ප්‍රධානීන්ගේ වාර්තාවල සටහන් කොට තිබේ. උපදෙස් හා ව්‍යාප්ති නිලධාරීන් තේ වතු සඳහා චාරිකා 252 ක් ද, පුහුණු වැඩසටහන් 75 ක් ද නිමකර ඇත. අදාල වර්ෂය තුල උපදෙස් ලිපි හා වාර්තා 337 ක් යවා ඇති අතර පස් සාම්පල් 520 ක pH අගය නිර්ණය කර වාර්තා ලබා දී තිබේ. ඔවුන් තේ වගා සම්මන්ත්‍රණ 11 ක් පවත්වා ඇති අතර පෝස්ටර, අත්පත්‍රිකා, වීඩියෝ චිත්‍රපට 11 කට වැඩි ගණනක් තේ ගොවීන්ට ලබා දීමට කටයුතු කර ඇත. තේ පිරි සැකසුම් තාක්ෂණ අංශය මගින් කර්මාන්තශාලා 19 ක චාරිකා කරමින් යන්ත්‍ර සූත්‍ර හා නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳවත් බලශක්ති භාවිතය පිළිබඳවත් අවශ්‍ය උපදෙස් ලබා දුනි. ඔවුන් කර්මාන්තශාලා නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් 5 ක් පවත්වා තිබේ. සැප්තැම්බර් මාසයේදී කලවාන, පොතුපිටිය, ගල්ලෑල්ල, වේවැල්වත්ත, නෙළුව හා ගාල්ල යන ප්‍රදේශ ආවරණය කරමින් කුඩා තේ වතුවල ක්ෂේත්‍ර සමීක්ෂණ සිදු කරන ලදී. මෙම සමීක්ෂණය අයගම, කිරිඇල්ල, ඇලපාත සහ දැරණියගල ප්‍රදේශ ආවරණය කරමින් ඔක්තෝම්බර් මාසය තුලදිද කෑගල්ල සහ කළුතර දිස්ත්‍රික්ක ආවරණය කරමින් නොවැම්බර් මාසය තුලදීද ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව මීතිරිගල, රණාල සහ කෑගල්ල යන ප්‍රදේශවල කුඩා තේ ඉඩම්වල ක්ෂේත්‍ර නිරීක්ෂණයන් අවසන් කොට ඇත.

පහතරට වතුවල වතු අධිකාරීන් සහ සහකාර වතු අධිකාරීන් වෙනුවෙන් ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටු සම්මන්ත්‍රණයක් නොවැම්බර් 16 දින පැවැත් වූ අතර කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන්, සහ කුඩා තේ වතු සමිති වෙනුවෙන් ප්‍රාදේශීය තාක්ෂණ හා ව්‍යාප්ති සම්මන්ත්‍රණ 2 ක් අප්‍රේල් 20 සහ දෙසැම්බර් 5 වන දිනවල පහතරට මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී. කෘෂිකර්ම විද්‍යාලවල සිසුන් සඳහාද පුහුණු වැඩමුළුවක් පැවැත්වීය. ගාල්ල හා කළුතර පහතරට වතු හිමියන්ගේ සංගමය වෙනුවෙන් නේවාසික පුහුණු වැඩසටහන් 2 ක් සංවිධානය කරන ලදී.

තේ මණ්ඩලයේ නිලධාරීන් වෙනුවෙන් තේ සැකසීම පිළිබඳව පුහුණු වැඩසටහන් ජුනි සහ ඔක්තෝම්බර් මාස වලදී පවත්වන ලදී. කුඩා තේ වතු අංශ සඳහා පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය ජුනි මස 30 වන දින පහතරට ස්ථානයේදී පවත්වන ලදී. කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණය හදාරණ සිසුන් සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මීට අමතරව, සබරගමුව විශ්ව විද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සහ කරපිංච කෘෂි විද්‍යාලයේ සිසුන් සඳහා ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

රත්නපුර ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන්ට සහ වේරගල කුඩා තේ වතු සමිති සාමාජිකයින් සඳහා ද සම්මන්ත්‍රණ පවත්වන ලදී. වැවිලි කළමනාකරණ ආයතනයේ සිසුන් මාස 3 ක පුහුණු පාඨමාලාවක් රත්නපුර මධ්‍යස්ථානයේදී නිමා කලෝය. ශෂ්‍ය විද්‍යා අංශයේ නිලධාරීන් විසින් 270 ක් පමණ වන කුඩා තේ වතු හිමියන් හා වතු කම්කරුවන්ට යන්ත්‍ර භාවිතය පිළිබඳව පුහුණුවක් ලබා දෙන ලදී. මෙයින් 200 ක් පමණ කහවත්ත වැවිලි සමාගමේ දළු නෙලන්නියන් වේ. ව්‍යාප්ති අංශය මගින් ර/ෆර්ගසන් උසස් විද්‍යාලයේ මාර්තු 27-31 දක්වා පවත්වන ලද ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටියක් ලබා දුනි. ශෂ්‍ය විද්‍යා අංශය බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේ මාර්තු 31 සිට අප්‍රේල් 4 දක්වා පැවැත් වූ කාලගුණික වෙනස්කම්වල බලපෑම් පිළිබඳ ප්‍රදර්ශනයට සහභාගි විය. කළුතර ජාතික පාසලේ සහ යටියන්තොට මහා විද්‍යාලයේ පැවැත්වූ ප්‍රදර්ශන සඳහා පහතරට ස්ථානයේ නිලධාරීන් සහභාගී විය. අගෝස්තු මස 11-13 දක්වා බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වූ CRT ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රදර්ශන භාණ්ඩ 4 ක් (කතුරු මගින් දළු නෙලීම, පොහොර දැමීමේ යන්ත්‍රය, ජල සම්පාදනය හා ස්වයං පිරිසිදු කිරීමේ තේ හලනය) ඉදිරිපත් කරන ලද අතර ඒවාට නරඹන්නන් ගෙන් ඉතා ඉහළ ප්‍රතිචාර ලැබුණි.

**මානව සම්පත් සංවර්ධනය හා පුහුණු කිරීම්**

ජේ. එච්. එන්. පියසුන්දර (පර්යේෂණ නිලධාරී, ශාක අභිජනන අංශය) සහ එස්. ආර්. ඩබ්. පතිරණගේ (පර්යේෂණ නිලධාරී,ශෂ්‍ය විද්‍යා අංශය) යන මහත්වරුන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ පශ්චාත් උපාධි කටයුතුවල නිරත විය.

ජේ. එච්. එන්. පියසුන්දර මයා (පර්යේෂණ නිලධාරී, ශාක අභිජනන අංශය) චීනයේ යුනාන් කෘෂි විද්‍යා ඇකඩමියේ ඔක්තෝම්බර් 22 සිට නොවැම්බර් 10 දක්වා පැවැත් වූ තේ වගාව හා නිෂ්පාදනය පිළිබද පුහුණු වැඩමුළුවකට සහභාගී විය. ශෂ්‍ය විද්‍යා අංශයේ පර්යේෂණ නිලධාරී එස්. ආර්. ඩබ්. පතිරණගේ මයා ඉන්දියාවේ පුනේ හි STIHL කර්මාන්ත ශාලාවේ යන්ත්‍ර සූත්‍ර පිළිබඳව පුහුණු වැඩසටහනකට නොවැම්බර් මස 2-5 දිනවල සහභාගී විය. පරිපාලන නිලධාරී මධුර බස්නාගොඩ මහතා මැලේසියාවේ හෙල්ප් විශ්ව විද්‍යාලයේ නායකත්ව පුහුණු වැඩමුළුවකට දෙසැම්බර් 2-6 දක්වා සහභාගී විය. පර්යේෂණ නිලධාරී එම්. ඒ. චමින්ද මහතා අන්තර්ජාතික තේ කමිටු රැස්වීමක් සඳහා දෙසැම්බර් මස 13-15 දක්වා එක්සත් රාජධානිය බලා පිටත් විය.

හාර්ඩි උසස් අධ්‍යාපන ආයතනයේ නයිවල උසස් තාක්ෂණ ආයතනයේ සිසුන් 30 ක් සහ උපාධි අපේක්ෂකයින් 6 දෙනෙක් පුහුණු කටයුතු නිම කරන ලදී. මීට අමතරව NAITA සහ තාක්ෂණ විද්‍යාලයේ සිසුන් දෙදෙනෙක් ද මාස 6 ක පුහුණු පාඨමාලා නිම කරන ලදී .

**අනෙක් වැඩ සටහන් හා විවිධ කටයුතු**

ශාක අභිජනන අංශයේ නිලධාරීන් බීජ තේ උයන් නඩත්තු කරමින් ගොවීන්ට තේ බීජ ලබාදීම සඳහා අඛණ්ඩව ක්‍රියා කරන ලදී. ඔවුන් ශාන්ත ජෝකීම් වත්තේ ස්ථාපනය කර ඇති ජාන ප්ලාස්ම එකතුවේ නඩත්තු කටයුතු වලද නිරත විය. ශෂ්‍ය විද්‍යා අංශය මගින් සෙවන ශාකවල සහ පාංශු පුනරුත්තාපන තෘණවල රෝපණ ද්‍රව්‍ය තේ වගාකරුවන්ට සපයන ලදී. මැයි මස 26-28 කාලය තුල ලැබුන අධික වැසි හේතුවෙන් ආයතනයේ නිල නිවාස 4 ක් හා ක්‍රීඩා සමාජ ශාලාව ගංවතුරෙන් යටවිය. පහතරට ස්ථානයේ නිලධාරීන් හා සේවක මණ්ඩලය ගංවතුරෙන් හානි වූ අවට ගම්වැසියන්ට ආධාර සපයන ලදී. ඒ වගේම ඔවුන් ගංවතුරෙන් යට වූ ප්‍රදේශවල පාසල් 2 ක් පිළිසකර කර දීමට ශ්‍රම දායකත්වය ලබා දුනි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් යහපත් කෘෂි වගා පිළිවෙත් පිළිබඳ වැඩමුළුවක් රත්නපුර මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. ප්‍රදේශයේ සෞඛ්‍ය නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් ඩෙංගු මර්ධන වැඩසටහන් ද පවත්වන ලදී. රිටෙල් තොරතුරු තාක්ෂණ ආයතනය මගින් මිනුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා GPRS භාවිතය පිළිබඳ වැඩමුළුවක් පහතරට ස්ථානයේදී පවත්වන ලද අතර තේ පර්යේෂණායතන නිලධාරීන් ද ඒ සඳහා සහභාගී කරවන ලදී.

පාසල් ගණනාවක විශාල සිසුන් සංඛ්‍යාවක් ආයතනය නැරඹීම හා විස්තර ලබාගැනීම පිණිස පැමිණ ඇත. විශේෂිත අවශ්‍යතා ඇති දරුවන් වෙන් වෙන් පුහුණු වැඩසටහනක් පැවැත්වීම සඳහා ජූලි 27-31 දින වලදී දරුවන් රැක බලාගන්නා මධ්‍යස්ථානයකට පහතරට ස්ථානය පහසුකම් සපයන ලදී.

ජනවාරි 2 වන දින ආගමික වතාවත් සිදු කර නව වසරේ වැඩ ආරම්භ කරන ලදී .පහතරට ක්‍රීඩා සමාජය විසින් නිලධාරීන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් නත්තල් සාදය හා අලුත් අවුරුදු උළෙල පවත්වන ලදී. වෙසක් සතිය නිමිති කරගෙන බෞද්ධ සංගමය මගින් මැයි මස 9 දින ධර්ම දේශනා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

**යටිතල පහසුකම් සංවර්ධනය**

**ගොඩනැගිලි හා ආයතන පරිශ්‍රය**

සී-2 හා සී-8 නිවාස පින්තාරු කරන ලදී රෝද 2 ට්‍රැක්ටර් ටේලරය අලුත්වැඩියා කරන ලදී. දරුවන් භාවිතා කරන සෙල්ලම් පිටියේ හා කාලගුණ මධ්‍යස්ථානයේ උපකරණ අලුත්වැඩියා කර තීන්ත ආලේප කරන ලදී. බුදු මැදුරේ වහලය හා සිවිලිම අලුත්වැඩියා කර තීන්ත ආලේප කරන ලදී.

ප්‍රධාන ආරක්ෂක කුටියේ හා ගේට්ටුවේ තීන්ත ආලේප කල අතර, සී - 9 නිවාසයේ සිවිලිම වැසි වතුර ගලා යන පීලි හා බට පද්ධතිය අලුත්වැඩිය කරන ලදී. ගබඩා කාමරය, ඩී 1, ඩී 2, ඩී 3, ඩී 4 හා ඩී 5 නිවාසවල නඩත්තු හා අලුත්වැඩියා කටයුතු නිමකරන ලදී. කාර්යාලය හා දේශන ශාලාවල පිරිසිදු කිරීම් සිදු කරන ලදී. ශෂ්‍ය විද්‍යා අංශයේ පොකුණ, සංචාරක නිවාසයේ පේවිමන්ට් ඇතුළු අනෙක් ස්ථානවල නඩත්තු කටයුතු සිදු කරන ලද අතර වෙනත් සුළු නඩත්තු හා අලුත්වැඩියා කටයුතු සාර්ථකව නිම කරන ලදී.

**විදුලි සැපයුම් හා නඩත්තු සේවා**

අධික වැසි සමගින් කඩා වැටුන විදුලි සැපයුම් පද්ධතිය ඉක්මනින් යථා තත්වයට පත්කරන ලද අතර ඒ සඳහා නව විදුලි කණුවක්ද ස්ථාපනය කිරීමට සිදු විය. ජල ගැල්මෙන් හානි වූ ක්‍රීඩා සමාජ ශාලාවේ පවත්වාගෙන යන කුඩා දරුවන් රැක බලා ගන්නා කාමරයේ විදුලි සැපයුම යථා තත්වයට පත්කරන ලදී. දේශන ශාලාවල තිබූ වායු සමීකරණ 8 ක් අලුත්වැඩියා කරන ලදී. තේ කර්මාන්ත ශාලාවේ තේ රැගෙන යන යන්ත්‍රයක් සඳහා නව විදුලි සැපයුමක් ලබාදෙන ලදී. වෙසක් සතිය නිමිති කරගෙන ආයතන පරිශ්‍රය ආලෝකමත් කිරීමට කටයුතු යොදන ලදී. ජල ගැල්මෙන් හානි වූ MCCB හා RCCB ඇතුළු අනෙක් විදුලි පද්ධති වෙනුවට නව අමතර කොටස් යොදන ලදී මීට අමතරව වෙනත් දෛනික නඩත්තු හා සේවා කටයුතු සාමාන්‍ය පරිදි සිදු කරන ලදී .

**ප්‍රවාහන සේවා**

පහතරට ස්ථානයේ වාහනවල නඩත්තු හා සේවා කටයුතු සතුටුදායක මට්ටමෙන් සිදු කරන ලදී. GE- 6379 හා 59-530 වාහනවල අලුත්වැඩියාවන් සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කලද, ප්‍රමාණවත් මුදල් හා වසර අවසානයේ කාලය ප්‍රමාණවත් නොවීමෙන් එම කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය.

**අමුත්තන්**

පහතරට ස්ථානයට පැමිණි අමුත්තන් ගණන 679 ඉක්මවිය.

**කාලගුණය**

වර්ෂය තුල ලැබුණු මුළු වර්ෂාපතනය මි.මි. 4776.9 ක් වූ අතර මැයි හා සැප්තැම්බර් මාසවලදී උපරිම වර්ෂාපතනය අගයන් එනම්, මි.මි 912.9 හා මි.මි 790.5 ක් වාර්තා විය.

අධික වැසි හේතුවෙන්, මැයි මාසයේදී පහත් බිම් හා ඒ ආශ්‍රිත තේ ඉඩම් ගංවතුරෙන් යටවී හානියට පත්විය. ජනවාරි හා පෙබරවාරි මාසවල සාමාන්‍ය පරිදි වියලි කාලගුණයක් පැවති අතර ඒ මාසවල ලැබුන වර්ෂාපතන අගයන් වන්නේ පිළිවෙලින් මි.මි. 44 ක් සහ මි.මි. 37.2 කි. අධික වර්ෂාපතනයත් සමග අඩු වූ හිරු එළියත් පසුව එලඹුණ වියලි කාලගුණ තත්වයනුත් පහතරට ප්‍රදේශවල තේ අස්වැන්න අඩු වීමට හේතු පාදක විය.

# මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය

**කේ. ආර්. ඩබ්ලිව්. බී. කහඳව**
**කෘෂිකර්ම විද්‍යාවේදී (පේරාදෙණිය ශ්‍රී ලංකාව), විද්‍යාපති (පේරාදෙණිය ශ්‍රී ලංකාව)**
**වැඩ බලන ස්ථාන භාර නිලධාරී**

ආයතනයේ පර්යේෂණ සහ උපදේශකත්ව වැඩසටහන මැදරට තේ වගාවන් තුල ක්‍රියාත්මක කිරීම සඳහා මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය, මහනුවර හන්තානේ පිහිටුවා ඇත. මෙම මධ්‍යස්ථානය සතුව පාංශු හා ශාක පෝෂණ, ශෂ්‍ය විද්‍යා, සහ කීට විද්‍යා හා වටපණු විද්‍යා අංශවල විද්‍යාගාර හතරක් සහ උපදෙස් හා ව්‍යාප්ති අංශයක් පවතී. සේවා ලාභීන්ට වැඩි සේවාවක් ලබාදෙමින් කෘෂි ආර්ථික විද්‍යා අංශයේ ඒකකයක්ද මෙහි පිහිටුවා ඇත. මේ වසරේදී ත් මෙම ආයතනය මහනුවර හා මාතලේ දිස්ත්‍රික්ක වල සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොටසක සිදු කරන ලද පර්යේෂණ හා ව්‍යාප්ති වැඩසටහන් වල සක්‍රීය ලෙස නිරත විය.

| **භූමි පරිහරණය** | **හෙක්ටයාර** |
|---|---|
| බීජ තේ | 2.00 |
| රිකිලි තේ | 5.50 |
| රිකිලි තේ නැවත වගාව | 1.50 |
| නොමේරූ තේ | 1.00 |
| මව් ශාක | 2.75 |
| තවාන | 0.20 |
| මානා තෘණ වගාව | 1.50 |
| පලතුරු ශාක | 0.40 |
| පොල් | 0.81 |
| වන වගාව | 1.20 |
| වගුරු බිම් | 0.62 |
| ගොඩනැගිලි, ගෙවතු මං මාවත් | 5.77 |
| **එකතුව** | **23.25** |

## කාර්ය මණ්ඩල වෙනස්වීම්

1) ගිණුම් ලිපිකාරිණී බී. කේ. එස්. හේරත් මිය ප්‍රධාන කාර්යාලයේ සිට මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයට 2017 අප්‍රේල් 17 දින ස්ථාන මාරුවක් ලැබීය.
2) රියදුරු ආර්. සී. ඒ. ජයසිංහ මයා ප්‍රධාන කාර්යාලයේ සිට මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයට 2017 මැයි 2 දින සිට ස්ථාන මාරුවක් ලැබීය.
3) ගිණුම් ලිපිකාරිණි ජී. ඒ. එස්. ගුණසේකර මිය තේ පර්යේෂණ ආයතනයේ සේවයෙන් 2017 ජූනි 17 දින සිට විශ්‍රාම ලැබීය.
4) වැඩ පරීක්ෂක කේ.ගුණවර්ධන මයා පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ සිට මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයට 2017 අගෝස්තු 24 දින සිට ස්ථාන මාරුවක් ලැබීය.
5) පොදු සේවක එම්. කමලරූබන් මයා ප්‍රධාන කාර්යාලයේ සිට මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයට 2017 ජූනි 1 දින ස්ථාන මාරුවක් ලැබීය.
6) තාක්ෂණ නිලධාරී එම්. ජී. එම්. ජේ. කුමාර මයා 2017 සැප්තැම්බර 9 දින සිට තේ පර්යේෂණ ආයතනයේ සේවයෙන් ඉල්ලා අස් විය.

## උපදෙස් හා ව්‍යාප්ති වැඩසටහන්

මහ වතු අංශයේ සහ කුඩා තේ වගා කරුවන් සඳහාත් ශිෂ්‍යයන් සඳහාත් මධ්‍යස්ථානය විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් විවිධ තේමාවන් ඔස්සේ සංවිධානය කරන ලදී. ඒ අතර කොත්මලේ ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන් සඳහා හරංගල තේ කම්හලේ සහයෝගය ඇතිව වැඩසටහන් හතක් සංවිධානය වූ අතර කුඩා තේ වතු හිමියන් 300 කට පමණ මේ මගින් සේවා සලසනු ලැබීය. පුස්සැල්ලාව කලාපයේ මහ වතු වල වේගවත් නැවත වගා වැඩසටහන යටතේ ඔවුන්ගේ ඉල්ලීම මත ඉඩම් යෝග්‍යතා පරීක්ෂණ රැසක් සිදු කරන ලදී. මීට අමතරව නැවත වගාව පිළිබඳව විශේෂ සම්මන්ත්‍රණයක් පුස්සැල්ලාව සහ අගලවත්ත වැවිලි සමාගම් වල උඩරට සහ මැදරට වතු කළමණාකාරවරුන් හට පවත්වන ලදී. ජනවසම වැවිලි සමාගමේ සියලුම විධායක නිලධාරීන් හට

භූමි ආවරණ කළමනාකරණය පිළිබඳ විශේෂ ඉදිරිපත් කිරීමක් මෙම මධ්‍යස්ථානයේදී පැවැත්වූ එම සමාගමේ කළමණාකාර වරුන්ගේ රැස්වීමේ දී සිදු කරන ලදී.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සහ කුඩා තේ වතු සංවර්ධන සමිති තනතුරු හොබවන්නන් සඳහා ප්‍රාදේශීය තාක්ෂණ හා ව්‍යාප්ති සංසද දෙකක් පවත්වන ලදී. මෙම වැඩසටහන් වලදී තේ වගාවේ රෝග පළිබෝධ මර්ධනය හා කප්පාදුව පිළිබඳ ඔවුන්ව දැනුවත් කරන ලදී. මීට අමතරව මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්ක වල සියලුම වාණිජ තවාන් කරුවන් සඳහා විශේෂ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. පේරාදෙණිය විශ්ව විද්‍යාලීය කෘෂි විද්‍යා පීඨය, කුණ්ඩසාලේ, පැල්වෙහෙර, වව්නියාව, අරලගංවිල, අනුරාධපුර සහ නවයාලතැන්න පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම විද්‍යාල සහ කෘෂිකර්ම මධ්‍යස්ථාන වල ජාතික වෘත්තීය නිපුණතා මට්ටම් 4 සහ 5 සිසුන් සඳහා පුහුණු වැඩසටහන් රාශියක් පවත්වන ලදී. තේ වගාවේ විවිධ කෘෂිකාර්මික ක්‍රියා පිළිබඳව මොවුන් දැනුවත් කරන ලදී. තේ වගාකරුවන් දැනුවත් කිරීම සඳහා වූ තේ පර්යේෂණ ආයතන කෙටි පණිවුඩ සේවාව ආරම්භ කර පවත්වාගෙන යාමද උපදෙස් හා ව්‍යාප්ති අංශ නිලධාරීන් විසින් සිදුකරන ලදී.

උපදෙස් හා ව්‍යාප්ති අංශය විසින් ප්‍රදේශයේ මහ වතු වලට සහ කුඩා තේ වතු හිමියන්ට වගා උපදෙස් සැපයීම, ක්ෂේත්‍ර චාරිකා වැනි එදිනෙදා සේවාවන් සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය වැනි ආයතන වල වැඩ සටහන් සඳහා සහභාගි වන අතරම ඉහත සියලු වැඩසටහන් පර්යේෂණ කාර්යය මණ්ඩලයේද සහයෝගය ඇතිව සංවිධානය කර පවත්වන ලදී.

කොළඹදී පවත්වන ලද පොල් තේ සහ රබර් ප්‍රදර්ශනයට සහ පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් මඩවල මදීනා ජාතික පාසලේ පවත්වන ලද අධ්‍යාපන ප්‍රදර්ශණයටද ඔවුන් සක්‍රියව දායක විය. ශාක අභිජනන අංශය විසින් ස්ථාපනය කරන ලද ගලහ, නාවලපිටිය, හගුරුගම සහ සෝගම වත්තේ පිහිටි අනුවර්ති පර්යේෂණයන්ද උපදෙස් හා ව්‍යාප්ති පර්යේෂණ වැඩසටහන් අංශයේ කාර්යය මණ්ඩලය විසින් නිරතුරුවම නිරීක්ෂණය කරන ලදී.

## පර්යේෂණ වැඩසටහන්

### ශෂ්‍ය විද්‍යා අංශය

පශ්චිම නිර්ගමන වල්නාශකයක් වන පැලගොනික් අම්ලය රත්වත්ත වතුයායේදී පරීක්ෂා කරන ලද අතර එම දත්තයන් විශ්ලේෂණය සඳහා යොමු කරන ලදී. තෙත් කාලගුණික තත්ව යටතේ සිදු කරන ලද ඔක්සිෆ්ලුවොරොෆෙන් සහ දියරමය ඩයියුරොන් පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණද මෙම කාලසීමාව තුල සිදු කරන ලදී. ශෂ්‍ය විද්‍යාත්මක සහ අතින් සිදු කරන ලද පැල තේ වගාවේ වල් මර්ධනය පිළිබඳ නිරීක්ෂණ මට්ටමේ අත්හදා බැලීම්ද මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර තුල ක්‍රියාත්මක විය. මධ්‍යස්ථානයේ කාලගුණ විද්‍යා දත්ත වාර්තා කිරීමද මෙම අංශය මගින් සිදු විය.

### කීට විද්‍යා හා වට පණු විද්‍යා අංශය

කඳ ගුල්ලාගේ හානිය කළමනාකරණය කිරීම සඳහා වූ කඳ ආරක්ෂක ද්‍රව්‍ය ඇගයීම සඳහා වූ ප්‍රතිකාරක 6 ක් සහිත පොල් තෙල් සහ රබර් කිරි යොදාගෙන ප්‍රතිවලිත අත්හදා බැලීමක් එම්.ඊ 68 යටතේ නිරීක්ෂණ අත්හදා බැලීමක සහ ප්‍රතිවලිත අත්හදා බැලීම් දෙකක ප්‍රතිඵල පදනම් කරගෙන ආරම්භ කරන ලදී. පර්යේෂණය ඉදිරියටත් පැවැත්වේ.

5000 කාණ්ඩයේ ප්‍රවේශකයන් 8ක් සම්මත ප්‍රභේද සමග ප්‍රැටිලෙන්චස් ලූසයි වටපණුවාට එරෙහිව පරීක්ෂා කරන ලද අතර අවසන් ඇගයීම සිදුකර දත්ත විශ්ලේෂණය සඳහා යොමු කරන ලදී. සම්මන්ත්‍රණ, පර්යේෂණ සහ ව්‍යාප්ති සංසද, ප්‍රාදේශීය තාක්ෂණ සහ ව්‍යාප්ති සංසද සඳහාද කාර්යය මණ්ඩලය සහභාගි වූ අතර පළිබෝධ පාලනය පිළිබඳ ඉදිරිපත් කිරීමද සිදු කරන ලදී.

### පාංශු සහ ශාක පෝෂණ අංශය

සාම්ප්‍රදායික පොහොර භාවිතය අවම කිරීම සඳහා ජෛව කාබනික ඛනිජ පොහොර සංවර්ධනය කිරීමට අදාලව ස්ථාන හයක ක්ෂේත්‍ර පර්යේෂණ අරඹන ලදී. ශාක පෝෂක ලෙස කම්හල් දර අළු යොදා ගැනීම පිළිබඳව පුණරුත්ථාපන තෘණ සහ පරිණත තේ සඳහා වූ ක්ෂේත්‍ර පර්යේෂණ, පිළිමතලාව කුරුගම වත්තේදී තවදුරටත් ක්‍රියාත්මක විය. සෙමෙන් නිදහස් වන පොහොර පිළිබඳ ක්ෂේත්‍ර පර්යේෂණය, විවිධ පෝෂක තත්වයන් යටතේ කැළෑබොක්ක වත්තේ දී තවදුරටත් ක්‍රියාත්මක විය.

**යටිතල පහසුකම් සංවර්ධනය.**
මධ්‍යස්ථානයේ ප්‍රධාන පිවිසුමේ නව මුරකුටියක් ඉදි කරන ලදී. උපදෙස් හා ව්‍යාප්ති අංශයේ පිවිසුම අමුත්තන්ගේ පහසුව සැලසෙන පරිදි නවීකරණය කරන ලදී. නව ශ්‍රව්‍ය දෘෂ්‍ය ආම්පන්න කට්ටලයක් ශ්‍රවණාගාරය සඳහා ලබා ගනු ලැබීය.

සංචාරක නිවාසයේ සහ නිල නිවාස වල තීන්ත ආලේප කිරීම සහ අවශ්‍ය නඩත්තු කටයුතු ද වාහන සංචිතයේ අවශ්‍ය අළුත්වැඩියාවන් ද සිදුකරන ලදී. පී.එල් 340 ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර අංක 3 හි හෙක්ටයාර 0.5 ක පාංශු සංරක්ෂණ ක්‍රම ස්ථාපනය කරන ලද අතර 5000 කාණ්ඩයේ මව් වගා ස්ථාපනය සඳහා මානා තෘණ වගා කරන ලදී.

**පුහුණුවන්නන්**
කෘෂිකර්ම උසස් තාක්ෂණ ඩිප්ලෝමාව හදාරන කුණ්ඩසාලේ කෘෂිකර්ම පාසලේ සිසුන් සිව්දෙනෙක් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හරහා සිය පුහුණුව විවිධ විෂයන් යටතේ මෙම වසරේ දී සම්පූර්ණ කරන ලදී.

**විශේෂ කරුණු**
බෝ නොවන රෝග වැළැක්වීම සඳහා තේ සහ මිනිස් සෞඛ්‍යය කෙරෙහි කෘෂි රසායන වල බලපෑම යන මැයෙන් වැඩමුළුවක් ආයතනයේදී පවත්වන ලද අතර තේ පර්යේෂණ මණ්ඩල සභාපතිතුමා, තේ පර්යේෂණ ආයතන අධ්‍යක්ෂකතුමා, විද්‍යාඥයින්, පේරාදෙණිය විශ්ව විද්‍යාලීය වෛද්‍ය පීඨ ආචාර්යවරුන්, මහනුවර මහ රෝහලේ විශේෂඥ වෛද්‍යවරුන් සහ තවත් ප්‍රමුඛ පෙළේ කෘෂි හා වෛද්‍ය වෘත්තිකයින් කිහිපදෙනෙක්ම මෙයට සහභාගී විය.

වැඩ බලන ස්ථාන භාර නිලධාරී/උපදේශක නිලධාරී කේ.ආර්.ඩබ්ලිව්.බී.කහඳව මහතා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වෙළඳ සේවයේ 2017.07.23 දින ප්‍රචාරය වූ සාරප්‍රභාගිර සජීවී ගුවන්විදුලි සාකච්ඡා වැඩසටහනට සහභාගී විය. තේ වවන්නන් හට යහපත් කෘෂි කාර්මික ක්‍රමවේදයන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මෙම වැඩසටහනට අනුග්‍රහය දැක්වීය.

**අස්වැන්න**
2017 වසර තුල නෙලූ අමු තේ දළු අස්වැන්න පහත දැක්වේ.

| මාසය | නෙලූ/ විකිණූ අස්වැන්න (කි.ග්‍රෑ) | ඒකක මිල (රු./කි.ග්‍රෑ) | ලැබූ ආදායම (රු.) |
|---|---|---|---|
| ජනවාරි | 1239 | 80.00 | 99,120.00 |
| පෙබරවාරි | 1111 | 80.00 | 88,880.00 |
| මාර්තු | 2999 | 86.66 | 259,893.34 |
| අප්‍රේල් | 2577 | 90.00 | 231,930.00 |
| මැයි | 1912 | 88.80 | 169,785.60 |
| ජූනි | 1913 | 80.00 | 153,040.00 |
| ජූලි | 1535 | 72.97 | 112,008.95 |
| අගෝස්තු | 1682 | 75.74 | 127,394.68 |
| සැප්තැම්බර් | 1638 | 82.20 | 134,643.60 |
| ඔක්තෝම්බර් | 2157 | 84.76 | 182,827.32 |
| නොවැම්බර් | 113 | 90.00 | |
| | 1482 | 85.00 | 136,140.00 |
| දෙසැම්බර් | 201 | 86.13 | |
| | 968 | 81.13 | 95,845.97 |
| **එකතුව** | **21,527** | | **1,791,509.46** |

**ආදායම (රුපියල්)**

| | |
|---|---|
| තේ රිකිලි විකිණීමෙන් ලද ආදායම (342,500) | 342,500 |
| රිකිලි තේ පැල විකිණීමෙන් ලද ආදායම (19,571) | 469,704 |
| අමු දළු විකිණීමෙන් ලද ආදායම (කිලෝ 21,527) | 1,791,509.46 |
| ආගන්තුක නිවාස නවාතැන් ගාස්තු | 121,700 |
| පස් ආම්ලිකතා පරීක්‍ෂාවන් | 73,150 |
| පොහොර පරීක්‍ෂාවන් | 91,200 |
| තේ.ප.ආ ප්‍රකාශන අලෙවිය | 70,845 |
| ශ්‍රවණාගාර ගාස්තු | 75,000 |
| විවිධ ආදායම් | 53,285 |
| **එකතුව** | **3,088,893.46** |

**මධ්‍යස්ථානය වෙත ආ අමුත්තන්**.

| | |
|---|---|
| තේ වැවිලි කරුවන් | 352 |
| ශිෂ්‍යයන් (උසස් අධ්‍යාපන) | 423 |
| විදේශ අමුත්තන් | 23 |
| සාමාන්‍ය අමුත්තන් | 125 |
| **එකතුව** | 923 |

# ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානය - පස්සර

**ඒ. එල්. රෝහිත යූ. කුමාර**
**කෘෂිකර්ම විද්‍යාවේදී (පේරාදෙණිය, ශ්‍රී ලංකාව) විද්‍යාපති (පේරාදෙණිය, ශ්‍රී ලංකාව)**
**ස්ථානභාර නිලධාරී**

**හැඳින්වීම**

තේ පර්යේෂණ ආයතනයේ ඌව මධ්‍යස්ථානය මූලික වශයෙන් උපදෙස් හා ව්‍යාප්ති කටයුතු සිදු කරන අතර එය පිහිටවනු ලැබුවේ 1931 වර්ෂයේ දීය. මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යභාරයන් ලෙස හඳුනාගෙන ඇත්තේ ඌව පළාතේ තේ වගාකරුවන් සඳහා ව්‍යාප්ති කටයුතු, පුහුණු වැඩසටහන් පැවැත්වීම, පාංශු විශ්ලේෂණ කටයුතු සහ රෝපණ ද්‍රව්‍ය ලබා දීමයි. මෙම ආයතනයේ සේවාවන් සෘජුව හෝ වක්‍රව මහා පරිමාණ වතුවල හෙක්ටයාර 25,000 ක් දක්වා ද කුඩා තේ වතු හිමියන් සඳහා හෙක්ටයාර 11,870 ක් දක්වා ද විහිදෙයි.

මෙම ව්‍යාප්ති මධ්‍යස්ථානය සතුව කුඩා පරිමාණ පර්යේෂණාගාරයක් ඇති අතර එ මගින් පසේ ආම්ලිකතාවය සහ කාබන් ප්‍රතිශතය විශ්ලේෂණය සිදු කරනු ලැබේ. හෙක්ටයාර 14.98 කින් යුත් භූමිභාගය ක්ෂේත්‍ර අත්හදා බැලීම්, මව් ශාක වගාව, මේරූ තේ වගාව ආදී වශයෙන් පහත ආකාරයට ස්ථාපිත වී ඇත.

| **භූමි පරිහරණය** | **හෙක්ටයාර** |
|---|---|
| මේරූ තේ වගාව | 3.80 |
| නොමේරූ තේ වගාව (අත්හදා බැලීම්) | 0.70 |
| මව් ශාක වගාව | 2.03 |
| බීජ උයන | 0.16 |
| මානා තෘණ | 1.80 |
| ගොඩනැගිලි/ මාර්ග | 1.24 |
| කැළෑ /වන වගාව /තෘණ භූමි | 5.23 |
| කාළගුණ මධ්‍යස්ථානය | 0.01 |
| තේ තවාන | 0.01 |
| **සම්පූර්ණ එකතුව** | **14.98** |

**උපදෙස් හා ව්‍යාප්ති සේවා**

උපදෙස් හා ව්‍යාප්ති අංශයේ අංශ ප්‍රධානීගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ ඌව පළාතේ මහා පරිමාණ හා කුඩා තේ වතු හිමියන් සඳහා උපදෙස් හා ව්‍යාප්ති චාරිකා, පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ ක්ෂේත්‍ර දින වැඩසටහන් පවත්වන ලදී.

ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති කමිටු වැඩසටහන් දෙකක් ඉතාමත් සාර්ථක ලෙස පවත්වන ලද අතර ඒ සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සහ කුඩා තේ වතු සංවර්ධන සමිති නියෝජනය කරමින් සාමාජිකයන් සහභාගී විය. මෙහි දී ''තේ නිෂ්පාදන විවිධාංගීකරණය හා කාබනික තේ නිෂ්පාදනය: ඌව කලාපය සඳහා වැදගත්කම'' ''කඳ ගුල්ලා පාලනයට නව ප්‍රවේශ'' ''ඒකාබද්ධ පෝෂක කලමනාකරණය'' සහ ''ඌව ප්‍රදේශයට උචිත තේ ප්‍රභේද හා සාර්ථක තේ තවානක් පිළියෙල කර ගැනීම'' යන මාතෘකා සාකච්ඡා කරන ලදී. 2017 නොවැම්බර් මස 24 දින පැවැත්විමට තිබූ ප්‍රාදේශීය විද්‍යාත්මක කමිටුව, බදුලු දිස්ත්‍රික්කයේ වැවිලිකරුවන්ගේ සංගමයේ ඉල්ලීම මත කල් දැමීමට සිදු විය.

ඌව පළාතේ මහා පරිමාණ වතු සඳහා විශේෂ පුහුණු වැඩසටහන් මාලාවක් මහා පරිමාණ වතු වලින් තෝරා ගත් අතුරු ව්‍යාප්තිකාරකයන් (para trainers) සඳහා එම වතු වල වතු අධිකාරීන්ගේද සහයෝගය ඇතිව සිදු කරන ලදී. මෙහිදී ''සාර්ථක ව්‍යාප්තිකාරකයෙකු වන්නේ කෙසේද, ක්ෂේත්‍ර ගොවි පුහුණු පාසැල තේ වගාවට අදාල සියලුම කෘෂි පිළිවෙත් සහ පසු අස්වනු හානිය අවම කිරීම වැනි කරුණු ඇතුළත් වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. මෙම වසරේ මෙම විශේෂ පුහුණු වැඩසටහන් මගින් ඌව පළාතේ ඇති මඩොල්සිම, බලංගොඩ, ආගරපතන සහ නමුණුකුල යන වැවිලි සමාගම්වලින් තෝරා ගත් අතුරු ව්‍යාප්තිකාරකයන් 140 දෙනෙකු සාර්ථකව පුහුණු

කරන ලදී. මෙම වැඩසටහනේ සම්පත් දායකයින් ලෙස ආචාර්ය වී. එස්. සිධාකරන්, ඒ. එල්. ආර්. යූ. කුමාර, සී. ජේ. ලියනආරච්චි සහ පී. එස් ප්‍රදීප් සහභාගී විය.

මෙම වසරේ පස්සර ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක කළ උපදෙස් හා ව්‍යාප්ති වැඩසටහන් සහ වෙනත් සේවාවන් වල සාරාංශයක් පහත දැක්වේ.

| | |
|---|---|
| මහ වතු අංශයේ / කුඩා වතු අංශයේ නිරීක්ෂණ චාරිකා | 33 |
| උපදේශාත්මක ලිපි නිකුත් කිරීම | 221 |
| පැවැත්වුණු සම්මන්ත්‍රණ /ක්ෂේත්‍ර දින/පුහුණු වැඩසටහන් | 24 |
| ප්‍රාදේශිය සම්මන්ත්‍රණ | 2 |
| පාංශු ආම්ලිකතා විශ්ලේෂණ | 1,419 |
| පාංශු කාබනික ප්‍රතිශත විශ්ලේෂණ | 645 |
| අලෙවි කළ තේ රිකිලි ප්‍රමාණය | 376,640 |
| අලෙවි කළ රිකිලි තේ පැළ ප්‍රමාණය | 16,640 |
| අලෙවි කළ ප්‍රකාශන ප්‍රමාණය | 59 |
| වාණිජ තේ තවාන් පරීක්ෂණ සංඛ්‍යාව | 37 |

**අනුවර්තී පර්යේෂණ**

5000 කාණ්ඩයේ තේ ප්‍රභේද සඳහා වාණිජ වශයෙන් ඇගයීමේ අනුවර්තී පර්යේෂණ 2 ක් ඌව පලාතේ කන්දේගෙදර සහ වැලිමඩ ප්‍රදේශවල කුඩා තේ වතු වල පිහිටුවන ලද අතර, ඒවා ඇගයීමේ කටයුතු ශාක අභිජනන අංශය සමග එක්ව සිදුකරනු ලැබේ.

**ක්ෂේත්‍ර පර්යේෂණ**

පහත සඳහන් ක්ෂේත්‍ර පර්යේෂණ අදාල අංශයන්ගේ සුපරීක්ෂණය යටතේ මෙම මධ්‍යස්ථානය තුළ ක්‍රියාත්මක වේ.

- ක්ෂේත්‍ර අංක 3 හි ඇති ජාන ජ්ලාස්ම එකතුව තව දුරටත් නඩත්තු වේ.
- ක්ෂේත්‍ර අංක 3 හි සහ 4 ඇති බීජ තේවල ඇගයීම් කටයුතු තව දුරටත් සිදුකරනු ලැබේ.
- වටපණු හා කීට විද්‍යා අංශයේ අධීක්ෂණය යටතේ 5000 කාණ්ඩයේ ප්‍රභේද සඳහා වට පණුවන්ගේ ප්‍රතිරෝධිතාවය සඳහා ඇගයීම් කටයුතු සිදු කෙරේ.
- ක්ෂේත්‍ර අංක 2 හි PPPB UVP 11 පර්යේෂණය ක්‍රියාත්මක වේ.
- ක්ෂේත්‍ර අංක 3 හි PPPB UVP 12 සහ PPPB UVP 13 අත්හදා බැලීම් ක්‍රියාත්මක වේ.
- ක්ෂේත්‍ර අංක 3 හි 5000 කාණ්ඩයේ නව ප්‍රභේද සඳහා මුල්වල වර්ධනය පිළිබඳ ඇගයීම් කටයුතු ශාක කායික විද්‍යා අංශයේ අධීක්ෂණය යටතේ සිදු කෙරෙමින් පවතී.
- ක්ෂේත්‍ර අංක 2 හි ශාක අභිජනන අංශය මගින් PPPB UVP 14 පර්යේෂණ ක්‍රියාත්මක වේ.
- බහු ක්ලෝන බීජ උයනේ පර්යේෂණ හා ඇගයීම් කටයුතු ශාක අභිජනන අංශයේ අධීක්ෂණය යටතේ මෙම මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර අංක 4 හි ක්‍රියාත්මක වේ.

**ADB මව් ශාක ව්‍යාපෘතිය**

වැඩි දියුණු කල නව ප්‍රභේද තේ ගොවියන්ට බෙදා හැරීම මෙම මධ්‍යස්ථානය සිදු කරන වැදගත් සේවාවන්ගෙන් ප්‍රධාන එකකි. මෙහිදී රිකිලි 400,000 ලබා දීමේ ඉලක්කයෙන් රිකිලි 376,640 ප්‍රමාණයක් තේ වගාකරුවන් සඳහා නිකුත් කරන ලදී. මෙය ඉලක්ක ගත ප්‍රමාණයෙන් 94% ක සැපිරීමකි.

**විශේෂ ක්‍රියාකාරකම් /රැස්වීම්**

- ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සිසුන් සඳහා 2014 ජනවාරි 14 දින රත්නපුර තේ පර්යේෂණ මධ්‍යස්ථානයේදී පැවැති පුහුණු කිරීමේ සම්පත් දායකයකු ලෙස ඒ.එල්.රෝහිත යූ. කුමාර මහතා සහභාගී විය.
- ලෝක ආහාර වැඩසටහන (FAO) යටතේ ක්‍රියාත්මක ''මධ්‍යම කඳුකරයේ කෘෂි වගාබිම් වල පාංශු පුනරුත්ථාපන ව්‍යාපෘතිය'' සඳහා බදුලු දිස්ත්‍රික් ලේකම් සහ ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමන්ලාගේ ප්‍රධානත්වයෙන් පැවැති කමිටු රැස්වීම් සඳහා ආයතනය නියෝජනය කරමින් ඒ.එල්. රෝහිත යූ. කුමාර මහතා සහභාගී විය.

- බදුල්ල දිස්ත්‍රික් ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට ආයතනය නියෝජනය කරමින් ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස ඒ. එල්. රෝහිත යූ. කුමාර මහතා සහභාගී වූ අතර එහිදි ඌව පළාතේ තේ වගා කරුවන්ට තේ පර්යේෂණ ආයතනය මගින් සිදු කළ ක්‍රියාකාරකම් පිළිබඳ ඉදිරිපත් කිරීමක් කරන ලදී.
- කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ බවර් සමාගම එක්ව සංවිධානය කරන ලද ඌව පළාතට අදාළව මාර්තු 23 සහ 24 දින වල ඇටම්පිටිය සහ වැලිමඩ පැවති ''රන් දල්ලයි අරුණෑල්ලයි'' ගුවන් විදුලි ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් සඳහා විනිශ්චය මණ්ඩල සාමාජිකයෙකු ලෙස ඒ.එල්.රෝහිත යූ. කුමාර මහතා සහභාගි විය.
- තේ කර්මාන්තයට වසර 150 ක් සපිරීම නිමිත්තෙන් 2017 ජුනි 30 සහ ජූලි 1 දින බදුල්ල විලිස් පාර්ක් ක්‍රීඩා පිටියේ පැවති ප්‍රදර්ශනය සඳහා පර්යේෂණ ආයතනයට අදාලව පරිපූර්ණ ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කරමින් සක්‍රිය ලෙස දායක විය.
- තේ කර්මාන්තයට වසර 150 ක් සපිරීම නිමිත්තෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය සංවිධානය කරන ලද ඌව පළාතට අදාලව ''හොදම දළු නෙලන්නිය/නෙලන්නා'' තෝරාගැනීමේ තරග සඳහා විනිශ්චය මණ්ඩල සාමාජිකයෙකු ලෙස ඒ. එල්. රෝහිත යූ. කුමාර මහතා සහභාගී විය.
- ලෝක ආහාර වැඩසටහන (FAO) යටතේ ක්‍රියාත්මක ''මධ්‍යම කඳුකරයේ කෘෂි වගාබිම් වල පාංශු පුනරුත්ථාපන ව්‍යාපෘතිය''සඳහා නිර්දේශිත තිරසාර භූමි කළමනාකරණයට අදාල වන ලෙස වගා ආදර්ශන පිහිටුවීම හා පස්සර තේ පර්යේෂණ උප මධ්‍යස්ථානය පිළිබඳව ඉදිරිපත් කිරීමක් 2017 නොවැම්බර් 27 දින ගන්නොරුව ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ ශ්‍රවනාගාරයේදී ව්‍යාපෘතියට අදාල තාක්ෂණ කමිටුව ඉදිරියේ ස්ථාන භාර නිලධාරී ඒ. එල්. රෝහිත යූ. කුමාර මහතා සිදු කරන ලදී.

**අමුත්තන්ගේ පැමිණීම**

2017 වර්ෂයේදී අමුත්තන් 715 ක් පස්සර තේ පර්යේෂණ උප මධ්‍යස්ථානය වෙත විවිධ අවශ්‍යතා සඳහා පැමිණ ඇත.

| | |
|---|---|
| විදේශිකයින් | 5 |
| වැවිලිකරුවන් | 246 |
| කුඩා තේ වතු හිමියන් | 231 |
| පාසැල් සිසුන් | 31 |
| උපාධි අපේක්ෂකයින් | 11 |
| වෙනත් | 67 |
| තේ.ප.ආ. නිලධාරීන් | 124 |
| **එකතුව** | **715** |

**යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තුව**

- ගෝනකැලේ වතුයායෙන් හෙක්ටාර 2 ක භූමි ප්‍රමාණයක් 5000 කාණ්ඩයේ මව් ශාක ව්‍යාපෘතිය සහ පර්යේෂණ කටයුතු සඳහා පස්සර මධ්‍යස්ථානය වෙත ලබා ගන්නා ලදී.
- පස්සර මධ්‍යස්ථානය හා ඊට අදාල සියලුම භූමි පිළිබඳ මිනුම් කටයුතු සිදු කර පිඹුරු පතක් (survey plan) සකස් කරන ලදී.
- අලුතින් ලබා ගත් හෙක්ටයාර 2 භූමි ප්‍රමාණයේ අදාළ වගා කටයුතු සඳහා මූලික බිම් සැකසීම ඇතුලු අනෙකුත් කටයුතු සිදු කරමින් පවතී.
- මෙම මධ්‍යස්ථානයේ ගොඩනැගිලි සහ උපකරණ අකුණු වලින් ආරක්ෂා කරගැනීම සඳහා අකුණු සන්නායකයක් සවි කරන ලදී.
- එදිනෙදා ආයතනික නඩත්තුව සාර්ථකව සිදුකරන ලදී .

**තේ අස්වැන්න**

මෙම මධ්‍යස්ථානයේ තේ ක්ෂේත්‍ර වලින් මාසිකව නෙලූ අමු දළු ප්‍රමාණය සහ ඊට කර්මාන්ත ශාලාවෙන් ලැබුණු මිල ගණන් පහත දක්වා ඇත.

| මාසය | අමු දළු කි.ග්‍රෑ. | ඒකක මිල (රු) | මුළු මුදල (රු) |
|---|---|---|---|
| ජනවාරි | 1806 | 80.00 | 144,480.00 |
| පෙබරවාරි | 2602 | 80.36 | 209,096.72 |
| මාර්තු | 3841 | 86.55 | 332,438.55 |
| අප්‍රේල් | 4676 | 88.78 | 415,135.28 |
| මැයි | 4516 | 84.52 | 381,692.32 |
| ජූනි | 3215 | 80.94 | 260,222.10 |
| ජූලි | 4005 | 78.11 | 312,830.55 |
| අගෝස්තු | 3833 | 74.61 | 285,980.13 |
| සැප්තැම්බර් | 3771 | 80.05 | 301,868.55 |
| ඔක්තොම්බර් | 3016 | 80.19 | 241,853.04 |
| නොවැම්බර් | 2840 | 74.76 | 212,318.40 |
| දෙසැම්බර් | 1895 | 77.71 | 147,260.00 |
| එකතුව | 40,016 | | 3,245,176.09 |

**ආදායම**

පසුගිය අවුරුදු ගණනාවක කාලය පුරාවටම ලැබූ වැඩිම ආදායම 2017 වර්ෂයේදී ලබා ගැනීමට හැකි වූ අතර ඊට අදාල ආදායම් තොරතුරු පහත දක්වා ඇත.

| ප්‍රභවය | ආදායම රු. |
|---|---|
| අමු දළු අලෙවිය (කි.ග්‍රෑ. 40,016) | 3,245,176.09 |
| තේ රිකිලි අලෙවිය | 376,000.00 |
| තේ පැල අලෙවිය | 399,360.00 |
| පාංශු විශ්ලේෂණ ගාස්තු | 299,280.00 |
| ප්‍රකාශන අලෙවිය | 32,915.00 |
| සංචාරක නිවාසයේ නැවතීමේ ගාස්තු | 28,100.00 |
| දර විකිණීම | 37,392.00 |
| දැව විකිණීම | 250,000.00 |
| වෙනත් | 1,837.00 |
| මුළු ආදායම | 4,670,700.09 |

**කාලගුණය**

මෙම වසරේ වගා කටයුතු සඳහා යෝග්‍ය දේශගුණික තත්වයක් දක්නට ලැබුණි. මෙම මධ්‍යස්ථානයට ලද වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර 2,446.4 ක් වූ අතර එය අවුරුද්ද පුරා පැතිරුණු ස්වභාවයක් ගන්නා ලදී. එබැවින් ඉලක්ක ගත අස්වැන්න නෙලා ගැනීමට ද හැකි විය. 2017 වර්ෂයට අදාල සාරාංශගත කාලගුණ දත්ත මෙම වාර්ෂික වාර්තාවේ වෙනම දක්වා ඇත.

# ව්‍යාප්ති මධ්‍යස්ථානය - ගාල්ල

ටී. ජී. එන්. මහින්ද
කෘෂිකර්ම විද්‍යාවේදී (පේරාදෙණිය, ශ්‍රී ලංකාව), විද්‍යාපති (පේරාදෙණිය, ශ්‍රී ලංකාව)
ස්ථාන භාර නිලධාරී / උපදේශක නිලධාරී

දකුණු පළාතේ ගාල්ල ප්‍රදේශය සඳහා උපදෙස් හා ව්‍යාප්ති සේවය සැලසීමේ මූලික අරමුණ පෙරදැරි කරගෙන, තේ පර්යේෂණායතනයේ ගාල්ල, කොට්ටව ව්‍යාප්ති මධ්‍යස්ථානය වර්ෂ 1961 දී ස්ථාපිත කරන ලදී. උපදෙස් හා ව්‍යාප්ති කටයුතු සැලසීම මෙන්ම පසේ pH අගය නිර්ණය කිරීම සඳහා කුඩා පරිමාණයේ රසායනාගාරයක් සහ කාලගුණ දත්ත රැස් කරන මධ්‍යස්ථානයක් ද මෙහි ස්ථාපිතකර ඇත. පිඹුරුපත් අංක GA/YKK/2012/66 ට අනුව මෙහි හෙක්ටයාර් 31.73 ක ඉඩම් පරිහරණ සැලැස්ම පහත පරිදි වේ.

| ඉඩම් පරිහරණය | හෙක්ටයාර |
|---|---|
| දළු නෙලන පරිණත තේ වගාව | 5.31 |
| නව තේ වගාව | 3.04 |
| මව් වගාව (නොමේරූ කොටස් ද ඇතුලත්ව) | 2.09 |
| රිකිලි තේ පැල තවාන | 0.50 |
| නැවත වගාව සඳහා වෙන්කල ඉඩම් | 1.20 |
| පාංශු පුනරුත්ථාපන තෘණ | 1.90 |
| ශක්තිමය දැව ප්‍රභවයක් ලෙස ග්ලිරිසීඩියා | 0.40 |
| බීජ තේ උද්‍යානය | 0.33 |
| පොල් සහ අනෙකුත් බෝග | 1.50 |
| වගුරු බිම් | 1.20 |
| වන වගාව | 5.36 |
| ගොඩනැගිලි, ගෙවතු, පාරවල්, කාලගුණ මධ්‍යස්ථානය | 8.90 |

අංශ ප්‍රධානීන්ගේ උපදෙස් සහ මග පෙන්වීමට අනුව ප්‍රදේශයේ සමාගම් වතු, පෞද්ගලික වතු මෙන් ම කුඩා තේ වතු අංශය තුල විවිධ පර්යේෂණ හා ව්‍යාප්ති කටයුතු මෙම මධ්‍යස්ථානය මඟින් සිදුකරගෙන යනු ලබයි.

**මධ්‍යස්ථානය මගින් 2017 වර්ෂය තුල සිදුකරන ලද ප්‍රධාන ව්‍යාප්ති ක්‍රියාකාරකම්**

- කුඩා තේ වතු හිමියන් සඳහා, "තේ ඉඩම් වල වටපණු හානි අවම කර ගැනීම" යන මාතෘකාව යටතේ එක් දින පුහුණු වැඩසටහනක්, රත්නපුර මධ්‍යස්ථානයේ වටපණු විද්‍යා අංශයේ නිලධාරීන් සමග එක්ව, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ද සහයෝගය ඇතිව නෙළුව ප්‍රදේශයේ දී පවත්වන ලදී.
- ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ (NIPM) දුරස්ථ ඉගෙනුම් මොඩියුල (Distance learning Modules) සැකසීමේ සම්බන්ධීකාරක ලෙස මෙන්ම පාඨමාලාවේ සම්බන්ධීකාරක ලෙසද ස්ථාන භාර නිලධාරී කටයුතු කරන ලදී.
- ගාල්ල-කළුතර වතු හිමියන් සඳහා, "තේ වගාවේ ආර්ථිකමය පැතිකඩ සහ නියඟයෙන් වන හානි අවම කර ගැනීම" යන මාතෘකාව යටතේ පුහුණු වැඩසටහනක්, තේ පර්යේෂණායතනයේ විද්‍යාඥයින්ගේ සහයෝගය ඇතිව පිටිගල ප්‍රදේශයේදී පවත්වන ලදී.
- ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ ඩිප්ලෝමා සිසුන් සඳහා වූ න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් ස්ථාන භාර නිලධාරී විසින් රත්නපුර තේ පර්යේෂණායතනයේදී පවත්වන ලදී.
- කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් සංවිධානය කරන ලද "දිවියට අරුණලු" ප්‍රශ්න විචාරාත්මක රේඩියෝ වැඩසටහනෙහි තරග විනිශ්චය සඳහා ස්ථාන භාර නිලධාරී සහ ව්‍යාප්ති නිලධාරී සහභාගි වන ලදී.
- කුඩා තේ වතු අංශය සඳහා වන ප්‍රාදේශීය තාක්ෂණ හා ව්‍යාප්ති සංසදයේ පළමු සහ දෙවන සැසිවාර 2017 අප්‍රේල් සහ දෙසැම්බර් මාස වලදී සාර්ථක අන්දමින් පවත්වන ලදී.

- පිටිගල ප්‍රදේශයේ තේ කර්මාන්තශාලා වල සේවයේ නියුතු ව්‍යාප්ති නිලධාරීන් සඳහා"තේ වගාවේ කෘෂිකාර්මික පිළිවෙත් සහ සෙවණ කළමනාකරණය" යන මාතෘකාව යටතේ පුහුණු වැඩසටහනක් (TOT) පවත්වන ලදී.
- බටපොල ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන් සඳහා, "තේ වගාවේ යාන්ත්‍රීකරණය" යන මාතෘකාව යටතේ පුහුණු වැඩසටහනක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහය ඇතිව පිටිගල ප්‍රදේශයේදී පවත්වන ලදී.
- රත්නපුර තේ පර්යේෂණායතනයේ නිලධාරීන්ගේ සහයෝගය ඇතිව, තේ පඳුරු දුර්වලවීම සහ මිය යාම සම්බන්ධව සමීක්ෂණයක්, නෙළුව සහ උඩුගම තේ පරික්ෂක කොට්ඨාශයන්හි අහඹු ලෙස තෝරාගත් කුඩා තේ වතු 110 ක පවත්වන ලදී.
- ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයට වසර 150 ක් පිරීම නිමිත්තෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සංවිධානයෙන් නෙළුව ප්‍රදේශයේ පවත්වන ලද "අධ්‍යාපනික සහ වෙළෙඳ" ප්‍රදර්ශනය සහ ගාල්ල-රිච්මන්ඩ් විද්‍යාලය විසින් සංවිධානය කරන ලද "හරිත උදාන" ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටි සකසා සක්‍රියව දායකත්වය සපයන ලදී.
- කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව හිනිදුම, හබරකඩ සහ බද්දෙගම තේ පරීක්ෂක කොට්ඨාශයන්හි වාණිජ තේ තවාන් හිමියන් සඳහා වූ න්‍යාත්මක හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් මධ්‍යස්ථානය තුල පවත්වන ලදී.
- උඩුගම, හෝමදොල වතුයායේ (RPC) තේ දළු නෙලන්නියන්, කංකානම්වරු සහ නිලධාරීන් සඳහා වු ප්‍රායෝගික පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් එම වතුයාය තුල පවත්වන ලද අතර දළු නෙලීම ඇගයීමේ/පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් (Plucking assessment) හඳුන්වා දෙන ලදී.
- තේ ව්‍යවසායකයින් ඉදිරි වසර 50 සඳහා බලගැන්වීමේ අරමුණින්, ගාල්ල - මාතර වැවිලි හිමියන්ගේ සංගමය විසින්, රුහුණ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පීඨයේ සහයෝගයද ඇතිව සංවිධානය කරන ලද සම්මන්ත්‍රණය සඳහා ස්ථාන භාර නිලධාරී සම්පත් දායකයකු ලෙස සහභාගී විය.
- 2017 මැයි මස ඇතිවූ ගංවතුරෙන් බලපෑමට ලක්වූ තේ ඉඩම් යථා තත්වයට පත්කිරීම සඳහා වූ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහනක්, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව යටලමත්ත සහ වවුලුගල යන ප්‍රදේශවලදී පවත්වන ලදී.

**උපදෙස් හා ව්‍යාප්ති ක්‍රියාකාරකම්**

| | |
|---|---|
| ලිපි මගින් උපදෙස් සැපයීම | 173 |
| උපදෙස් සහ ව්‍යාප්ති චාරිකා | 110 |
| පුහුණු වැඩසටහන්/සම්මන්ත්‍රණ/සාමූහික සාකච්ඡා/ක්ෂේත්‍ර දින/ආදර්ශන | 53 |
| සහභාගි වූ රැස්වීම් | 55 |
| ප්‍රකාශන /පත්‍රිකා/පොත් නිකුත් කිරීම (නොමිලේ ලබාදෙන ලද ඒවා ද ඇතුලත්ව) | 326 |
| අලෙවිකරන ලද තේ රිකිලි (cuttings) ගණන | 297,025 |
| අලෙවිකරන ලද රිකිලි තේ පැළ ගණන | 8,982 |
| pH අගය නිර්ණය කිරීම සඳහා පරීක්ෂා කරන ලද පස් සාම්පල ගණන | 200 |
| ප්‍රදර්ශන/බෝග සායන | 2 |
| පර්යේෂණ චාරිකා (අනුවර්තී පර්යේෂණ ද ඇතුලත්ව) | 29 |

**අනුවර්තී පර්යේෂණ**

මෙම වසරේ ද විවිධ කෘෂි දේශගුණික කලාප වලට අයත් ප්‍රදේශ වල ස්ථාපනය කරන ලද අනුවර්තී පර්යේෂණ වලට අයත් වගාවන් පරීක්ෂා කිරීම, තේ පර්යේෂණායතනයේ අදාල අංශ සමග සිදුකරන ලද අතර ඉඩම් හිමියන්ගේ අදහස්ද සමග ඒවායේ සාර්ථකත්වය පරීක්ෂා කිරීම සිදුකරන ලදී. මාවනාන, උනන්විටිය, කොට්ටව සහ අක්මීමණ තේ පරීක්ෂක කොට්ඨාශවල ස්ථාපිත 5000 ශ්‍රේණිය හඳුන්වාදීමට කරන මෙම පර්යේෂණ කොටු වල අස්වනු වාර්තා අදාල ඉඩම් හිමියන් විසින් තබා ගන්නා අතර තේ පර්යේෂණායතනයේ නිලධාරීන් විටින්විට ඒවා පරීක්ෂා කරන ලදී.

**පර්යේෂණ ව්‍යාපෘති (දැනට පවත්නා පර්යේෂණ, අත්හදාබැලීම්)**

මෙම මධ්‍යස්ථානය තුළ පහත සඳහන් පර්යේෂණ/අත්හදාබැලීම් තේ පර්යේෂණායතනයේ අදාළ අංශයන් හි සහයෝගිත්වය ඇතිව සිදුකරනු ලබයි.

**(අ) ශාක අභිජනන අංශය**

(i) TRI 5000 කාණ්ඩයේ පර්යේෂණ කොටු 4 ක් ක්ෂේත්‍ර අංක 2 තුල ස්ථාපිත කර ඇති අතර මේ වන විට දළු නෙලීම ආරම්භ කර ඇත.

**(ආ) කීට විද්‍යා හා වටපණු විද්‍යා අංශය**

(i) පහතරට සජීවී දැව වේයාගේ හානිය පාලනයට කප්පාදු මුහුණත්වල ගැල්වීම සඳහා නව රසායන ද්‍රව්‍යයක් (බිටුමික්ස් කන්ඩාසන්) හඳුන්වා දීම - ක්ෂේත්‍ර අංක 6.

(ii) යහපත් කෘෂිකාර්මික වත්පිළිවෙත් (GAPs) අනුගමනය කිරීම තුලින් පහතරට සජීවී දැව වේයාගේ හානිය පාලනය කිරීම- යක්කලමුල්ල, කරාගොඩ ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියකුගේ ඉඩමකි.

(iii) කම්බිළි පණුවාගේ හානිය පාලනය කිරීම සඳහා කෘතිම වසුනක් හඳුන්වා දීම - ක්ෂේත්‍ර අංක 1.

**(ඇ) ශෂ්‍ය විද්‍යා අංශය**

(i) විවිධ පාංශු පුනරුත්ථාපන තෘණ වර්ගවල ක්‍රියාකාරිත්වය ඇගයීම - ක්ෂේත්‍ර අංක 2 හි පර්යේෂණය සම්පූර්ණ කර ඇති අතර අදාල නිර්දේශ ලබා දීමට නියමිතයි.

(ii) නව උස් සෙවන ශාක විශේෂයක් ලෙස ඩෙරිස් ශාකයෙහි (*Derris macrophylla*) ප්‍රභේද 2 ක් හඳුන්වා දීම - ක්ෂේත්‍ර අංක 4 හි හොඳින් ස්ථාපනයවී ඇත.

**ආසියානු සංවර්ධන බැංකු ආධාර මත ක්‍රියාත්මක වන මව් වගා ව්‍යාපෘතිය**

වැඩිදියුණු කරන ලද රිකිලි තේ ප්‍රභේදවලින් මෙම වසරෙ හි නිෂ්පාදනය කරන ලද සම්පූර්ණ රිකිලි කැබලි ගණන 303,700 ක් වූ අතර එය හෙක්ටයාර් 2.09 ක මව් වගාවෙන් ලබා ගන්නා ලදි. මෙය ගාල්ල මධ්‍යස්ථානය මගින් ප්‍රදේශයේ තේ වගාකරුවන්හට ලබා දෙන ලද ප්‍රධාන සේවාවක් වන අතර විශේෂයෙන් ප්‍රාදේශීයව පවතින රෝග-පළිබෝධ හානිවලට ඔරොත්තු දෙන TRI 3000 සහ 4000 කාණ්ඩයේ රිකිලි තේ ප්‍රභේද වගාකරුවන් අතර ප්‍රචලිත කිරීම මෙහි අරමුණකි.

මධ්‍යස්ථානය තුළ ස්ථාපිත කරන ලද තේ පැළ තවානේ රිකිලි තේ පැළ 33,910 ක් ප්‍රචාරණය කරන ලදි. තේ පැළ 8,982 ක් ප්‍රදේශයේ තේ වගාකරුවන්හට අලෙවි කරන ලද අතර තේ පැළ 9,909 ක් මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර තුල තේ නැවත වගාවට සහ පාළු සිටුවීමට යොදා ගැනුනි.

**මධ්‍යස්ථානයට පැමිණි අමුත්තන්**

උපදෙස් ලබා ගැනීම, පුහුණු වැඩසටහන්, රිකිලි තේ අතු සහ පැළ ලබා ගැනීම සඳහා මධ්‍යස්ථානයට පැමිණි අමුත්තන් සංඛ්‍යාව පහත පරිදි වේ.

| | |
|---|---|
| • සමාගම් වතු/පෞද්ගලික වතු, කුඩා තේ වතු හිමියන් | 539 |
| • විශ්ව විද්‍යාල/ඩිප්ලෝමා ශිෂ්‍යයින්, අනෙකුත් | 148 |
| මුළු ගණන | 687 |

**පුහුණුවන්නන්/ශිෂ්‍යයින්**

ගාල්ල උසස් තාක්ෂණ ආයතනයේ ශිෂ්‍යාවක් මාස 6 ක පුහුණු කාලය සාර්ථකව නිම කරන ලදී.

**යටිතල පහසුකම් දියුණු කිරීම හා නඩත්තුව**

- නව කාර්යාල ගොඩනැගිල්ලෙහි තීන්ත ආලේප කිරීම සහ නාන කාමර කට්ටල සවිකිරීම
- කාර්යාල ගොඩනැගිල්ලෙහි නැවත විදුලි රැහැන් එලීම (re-wiring)
- D1 සහ D2 කාර්ය මණ්ඩල නිල නිවාසයන්හි සිවිලිම අලුතෙන් සවිකිරීම
- ඇතැම් සේවක නිල නිවාස වල අත්‍යවශ්‍ය අලුත්වැඩියාවන් සිදුකිරීම

**ක්ෂේත්‍ර සංර්ධන කටයුතු**

පාංශු පුනරුත්ථාපනය සඳහා ක්ෂේත්‍ර අංක 1,2,3 සහ 5 හි හෙක්ටයාර 1.5 ක පමණ වපසරියක මානා තෘණ වගාකර නඩත්තු කිරීම.

ක්ෂේත්‍ර අංක 1 සහ 4 හි හෙක්ටයාර 0.6 ක පමණ වපසරියක් TRI 2022 සහ TRI 4049 යන රිකිලි තේ ප්‍රභේදවලින් නැවත වගා කිරීම.

### වෙනත් විවිධ කටයුතු

වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු නවීන් දිසානායක මැතිතුමා ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි වූ “නැවුම් තේ මංගල්‍යය”  උත්සවයට උපදෙස් හා ව්‍යාප්ති කාර්යය මණ්ඩලය සහභාගි විය. මෙම උත්සවය ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් දෙනියාය, කොටපොල ප්‍රදේශයේ සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින්, “ජාතික තේ සම්මාන - 2017” උත්සවයට සමගාමීව ඉමදුව ප්‍රදේශයේ සංවිධානය කරන ලද “හොඳම දළු නෙලන්නිය/නෙලන්නා” - ගාල්ල අවසන් තරගයේ විනිශ්චය සඳහා උපදෙස් හා ව්‍යාප්ති කාර්යය මණ්ඩලය සහභාගි විය.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද “ජාතික තේ සම්මාන - 2017” උත්සවයට ස්ථාන භාර නිලධාරී සහභාගි විය.
2017 පෙබරවාරි මස 17 දින ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි වූ, දකුණු පළාත් රාජ්‍ය නිලධාරින් සඳහා වූ සංසදයට ස්ථාන භාර නිලධාරි සහභාගි විය.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් සංවිධානය කරන ලද, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අග්‍රමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි වූ, මෙම වසරේ මැයි මස ඇතිවූ ගංවතුර තත්වයෙන් ආපදාවට ලක්වූ තේ වගාකරුරවන්ට සහ තේ කර්මාන්තශාලා හිමියන්හට වන්දි මුදල් ලබා දීමේ උත්සවය සඳහා ස්ථාන භාර නිලධාරි සහභාගි විය.

### අමු දළු අස්වැන්න

| මාසය | අස්වැන්න | ලැබුන මිල (කිලෝවකට රු. ශත) | මාසික ආදායම (රු. ශත) |
|---|---|---|---|
| ජනවාරි | 2,961 | 93.5 | 276,853.50 |
| පෙබරවාරි | 2,067 | 94.04 | 194,384.81 |
| මාර්තු | 2,311.5 | 100.00 | 231,150.00 |
| අප්‍රේල් | 2,515 | 104.00 | 261,560.00 |
| මැයි | 2,502.5 | 107.00 | 267,767.50 |
| ජුනි | 4,109 | 104.00 | 427,336.00 |
| ජුලි | 3,289.5 | 104.00 | 342,108.00 |
| අගෝස්තු | 4,461.5 | 105.00 | 468,457.50 |
| සැප්තැම්බර් | 3,694.5 | 107.00 | 395,311.50 |
| ඔක්තෝබර් | 3,969 | 108.00 | 428,652.00 |
| නොවැම්බර් | 4,680 | 104.00 | 486,720.00 |
| දෙසැම්බර් | 4,091.5 | 103.00 | 421,424.50 |
| එකතුව | 40,652 | | 4,201,725.31 |

### ආදායම

| ප්‍රභවය | ආදායම (රු. ශත) |
|---|---|
| අමු දළු විකිණීම | 4,201,725.31 |
| තේ රිකිලි විකිණීම | 297,025.00 |
| තේ පැළ විකිණීම | 215,568.00 |
| පාංශු නියැදි වල pH අගය නිර්ණය කිරීම | 17,100.00 |
| ප්‍රකාශන විකිණීම | 9,935.00 |
| සංචාරක බංගලාවේ නවාතැන් සැපයීම | 27,250.00 |
| විවිධ ආදායම් | 12,520.00 |
| එකතුව | 4,781,123.31 |

### කාලගුණය

2017 වසර තුළ වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 3251.5 ක් වූ අතර එය පසුගිය වසර 10 හි සාමාන්‍යයට වඩා 3.5% කි. මාසික වර්ෂාපතනයේ පැතිරීම අසමාකාර වූ අතර මැයි සහ නොවැම්බර් මාසවල එය පිළිවෙලින් මිලි මීටර් 702.9 ක් සහ 623.4 ක් විය. මැයි මස අවසානයේ අධික වර්ෂාපතනයක් ලැබුන අතර එම නිසා දකුණු පළාතේ ඇතිවූ ගංවතුර සහ නායයාම් හේතුවෙන් තේ වගා කරන ලද බොහෝ ප්‍රදේශවලට ද හානි සිදුවිය.

වාර්ෂික සූර්ය දීප්ත පැය ගණනේ සහ වාෂ්පීකරණයේ පැහැදිලි වෙනස්කම් දක්නට නොලැබුන අතර නොවැම්බර් මස එය පිළිවෙලින් 31% කින් සහ 24% කින් අඩු විය.

# දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානය

**එස්. පී. රත්නායක**
**කෘෂිකර්ම විද්‍යාවේදී උපාධිය (රුහුණ විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකාව)**
**පශ්චාත් උපාධිය (චූටි චීනය)**
**ස්ථාන භාර නිළධාරී**

**පොදු කරුණු**

දෙනියාය රත්නපුර මාර්ගයේ පිහිටි තේ පර්යේෂණායතන ව්‍යාප්ති මධ්‍යස්ථානය ප්‍රධාන වශයෙන් උපදෙස් සහ ව්‍යාප්ති කටයුතු සිදුකරනු ලබයි. එය සතුව කුඩා ප්‍රමාණයේ විද්‍යාගාරයක්ද ඇති අතර එහි පසෙහි ආම්ලිකතාවය, කාබන් විශ්ලේෂණය සහ පසෙහි වට පණුවන් පරීක්ෂාව සිදු කරයි. මෙම ආයතනයට අයත් භූමිය අක්කර 5 ක පමණ වපසරියකින් යුක්ත වන අතර භූමි පරිහරණ විස්තර පහත දක්වා ඇත.

| **ඉඩම් පරිහරණය** | **අක්කර** |
|---|---|
| පරිණත වගාව (දළු නෙළන) | 0.3 |
| අළුත් තේ වගාව (දළු නෙලීම ආරම්භ කර ඇත) | 0.4 |
| මව් වගාව සඳහා වෙන්කල කොටස | 1.0 |
| පුනරුත්ථාපනය කරන ලද ක්ෂෙත්‍ර (මානා තෘණ) | 1.0 |
| ගොඩනැගිලි, උද්‍යාන සහ අභ්‍යන්තර මාර්ග | 2.3 |
| **මුළු බිම් ප්‍රමාණය (අක්කර)** | **5.0** |

තේ පර්යේෂණායතනයේ ප්‍රධාන කාර්යාලයේ උපදේශනය මත පහතරට ප්‍රදේශයට අයත් මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි පිහිටි විශාල තේ ඉඩම් ප්‍රමාණයක (කුඩා තේ ඉඩම්, පෞද්ගලික වතු සහ සමාගම් වතු) ක්ෂෙත්‍ර පරීක්ෂණ කටයුතු සිදුකරනු ලබන අතර කුඩා තේ වතු හා පෞද්ගලික වතු සහ සමාගම් වතු ඉඩම් පරීක්ෂාකර උපදෙස් ලබාදීම, පුහුණු වැඩමුළු සහ සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීම සිදු කරනු ලබයි. පවත්වන ලද ක්ෂෙත්‍ර පුහුණු පාඨමාලා බොහොමයක් ආයතනය තුලදී සහ පිටත ස්ථාන වලදී ඉතා සාර්ථකව පවත්වන ලදී. මෙම අවස්ථාවන් වලදී තේ තවාන් පාලනය, තේ වගාවේ පස සහ සෙවන කළමනාකරණය, දළු නෙලීම, කප්පාදුව (යාන්ත්‍රික සහ මිනිස් ශ්‍රමය මඟින්), රෝග සහ පළිබෝධ පාලනය සහ දෙනියාය ප්‍රදේශයේ තේ පඳුරු දුර්වලවීම පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. පසේ සාරවත් බව කළමනාකරණය සම්බන්ධව විශේෂ අවධානය යොදවමින් නිසි කෘෂිකාර්මික ක්‍රම අනුගමනය කිරීම සහ ක්‍රමානුකූලව දළු නෙළීමක් තුලින් තේ නිෂ්පාදනය ඉහළ නැංවීම සහ දෙනියාය මධ්‍යස්ථානය සතුව ඇති කාලගුණ මධ්‍යස්ථානය මගින් කාලගුණ දත්ත ලබාගැනීමත් ඒ සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩ සටහන්වලටද ඉහළ ප්‍රමුඛතාවයක් දෙමින් කටයුතු කරනු ලැබීය.

**කාර්යය මණ්ඩල වෙනස්වීම්**

දෙනියාය මධ්‍යස්ථානයේ සේවයේ නියුතුව සිටි ව්‍යාප්ති නිලධාරී ආර් ජේ කේ රාජපක්ෂ මහතා 2016 නොවැම්බර් මස 30 දින සිට සේවයෙන් ඉල්ලා අස්වූ අතර ඉදිරියේදී නව පත්වීම් සිදුකිරීමට නියමිතය.

**උපදෙස් සහ ව්‍යාප්ති ක්‍රියාකාරකම්**

**වසරේ වැඩ සටහන්වල ප්‍රගතිය 2017**

| අයිතමය | ප්‍රමාණය |
|---|---|
| ආගන්තුකයින්ගේ පැමිණීම (වතු අංශය/කුඩා තේ වතු අංශය/ශිෂ්‍ය ශිෂ්‍යාවන්/විදේශිකයින්/වෙනත්) | 855 |
| සියළුම ලිපි (උපදෙස් වාර්ථා, ව්‍යාප්ති කටයුතු සහ පරිපාලන කටයුතු සම්බන්ධව) | 401 |
| උපදෙස් චාරිකා (ඉල්ලීම් සහ නිත්‍ය චාරිකා) සමාගම්/පෞද්ගලික වතු සහ කුඩා තේ වතු අංශය සඳහා | 67 |
| පුහුණු පාඨමාලා/සම්මන්ත්‍රණ/කණ්ඩායම් සාකච්ජා/ක්ෂෙත්‍ර දින/අධ්‍යාපන වැඩ සටහන්/ආදර්ශන/දැනුවත් කිරීම් සහ රැස්වීම් | 52 |
| ප්‍රකාශන/පත්‍රිකා/කුඩා පොත් නිකුත්කිරීම | 278 |
| පසේ pH අගය පරීක්ෂාව | 474 |
| පසේ කාබන් ප්‍රතිශතය පරීක්ෂාව | 23 |
| පසෙහි වට පණුවන් පරීක්ෂාව | 21 |
| තේ අතු ලබාදීම | - |

| | |
|---|---|
| අමු දළු අස්වැන්න (වසර ආරම්භයේ පැවති නියං තත්ත්වය, විවේක ගැන්වීම සහ කප්පාදුව) | 401 |
| වාණිජ තේ තවාන් පරීක්ෂාව | 32 |
| ප්‍රදර්ශන | 01 |
| අත්හදා බැලීම් සඳහා දායකත්වය | 07 |
| තේ පැළ ලබාදීම | - |

### කුඩා තේ වගාකරුවන්ගේ ඉඩම්වල නිෂ්පාදනය වර්ධනය කිරීමේ වැඩසටහන්

පොල් වගාකිරීමේ මණ්ඩලයේ මාතර ප්‍රාදේශීය කාර්යාලය හා සම්බන්ධව තේ පර්යේෂණායතනය කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මාතර ප්‍රාදේශීය කාර්යාලය සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය හා එක්ව තෝරාගත් කුඩා තේ වගාකරුවන්ගේ ඉඩම්වල තේ වගාව සමග මිශ්‍ර බෝග වගාවන් ලෙස පොල්, කුරුඳු සහ ගම්මිරිස් වගාවන් ඇති කොට ඔවුන්ගේ ඉඩම්වල නිෂ්පාදනය වර්ධනය කිරීමේ වැඩසටහනක් දෙනියාය කොට්ඨාශය මුල්කරගනිමින් ආරම්භ කල අතර සෑම තේ පරීක්ෂක කොට්ඨාශයකම එක් ආදර්ශනය බැගින් ස්ථාපිත කිරීමට  සැලසුම් කර ඇත.

### කුඩා තේ වතු ක්ෂෙත්‍රයේ දළු නෙළීම යාන්ත්‍රීකරණය කිරීම ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති සම්බන්ධීකාරක ලෙස කටයුතු කරනු ලබන උපදෙස් සහ ව්‍යාප්ති අංශයට අනුබද්ධිත උපදේශක නිලධාරී එස්.පී. රත්නායක මහතා විසින් 2017 වර්ෂයට අදාල පසු විපරම් රැස්වීම් දෙකක් පැවැත්වීමට කටයුතු කරන ලදී. ආර්ථික සමීක්ෂණය පලමු අදියර යටතේ ලබා දුන් භාවිතයට නොගන්නා සහ භාවිතය ඉතාමත් අඩු යන්ත්‍ර නැවත ලබාගෙන වෙනත් සමිති වලට ලබාදීම සහ දෙවැනි අදියර යටතේ ඇණවුම් කර ඇති වලවල් හෑරීමේ යන්ත්‍ර ලබාදීමට නියමිතය. 2018 ජුනි මස මේ සම්බන්ධව නැවතත් සම්පූර්ණ සමීක්ෂණයක් සිදුකිරීමට නියමිතයි.

### කර්මාන්තශාලා පාදක කොටගත් ව්‍යාප්ති වැඩසටහන්

තේ කර්මාන්තයේ උන්නතිය උදෙසා කුඩා තේ වතු හිමියන්, පෞද්ගලික තේ කර්මාන්තශාලාවල අමු දළු සැපයුම්කරුවන් (ලුම්බිණි තේ කම්හල, දැවෝරා තේ කම්හල් සමූහය, ලියෝන්ටා තේ කම්හල, උරුවල තේ කම්හල, නන්දන තේ කම්හල, බටුවන්ගල තේ කම්හල සහ කළුබෝවිටියාන තේ කම්හල) මූලික කොටගෙන  කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේද සහභාගිත්වයෙන් තේ දළු නෙලීම, තවාන් පාලනය, පාංශු සංරක්ෂණය, පොහොර භාවිතය සහ සෙවන නඩත්තුව සම්බන්ධව පුහුණු පාඨමාලා සහ ක්ෂෙත්‍ර දින වැඩසටහන් 26 ක් ඉතා සාර්ථකව සිදු කරන ලදී.

### ප්‍රදේශයේ දක්නට ඇති වෙනත් විශේෂ ගැටළු

කොරපොතු කෘමියාගේ හානිය අකුරැස්ස ප්‍රදේශයේ කුඩා තේ ඉඩම් හිමියන්ගේ වගාවන්  කිහිපයක වාර්තා වූ අතර ඒ සඳහා හුණු සහ ගෙන්දගම් ප්‍රතිකාරය යොදන ලද අතර එමගින් පළිබෝධ හානිය සාර්ථකව පාලනය කිරීමට හැකි විය.

තේ වගාව වයස්ගත වීම, රෝග හා පළිබෝධ වලට පාත්‍රවීම සහ අඩු හෝ වැඩි වශයෙන් නිසි කෘෂිකාර්මික ක්‍රම උපයෝගී කර නොගැනීම තුල පඳුරු දුර්වලවීම් සම්බන්ධ ගැටළු කොටපොල ජ්‍යේෂ්ඨ තේ පරීක්ෂක කොට්ඨාශය තුල විශේෂයෙන් දක්නට ලැබුණි.

### උපයෝගිතා අත්හදාබැලීම්

1. තේ පර්යේෂණායතනයේ ශාක අභිජනන අංශය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා සම්බන්ධව මාතර දිස්ත්‍රික්කයේ මොරවක සහ අකුරැස්ස ප්‍රදේශවල කුඩා තේ ඉඩම් හිමියන් දෙදෙනෙකුගේ ඉඩම් වල 5000 වර්ගයේ තේ ප්‍රභේදවල යෝග්‍යතාවය  සෙවීමේ උපයෝගිතා අත්හදා බැලීම් 2 ක් ආරම්භ කර ඇත.

2. තේ පර්යේෂණායතනයේ ශාක අභිජනන අංශය හා සම්බන්ධව 5000 කාණ්ඩයේ තේ  ප්‍රභේදවල  යෝග්‍යතාවය සොයා බැලීම සඳහා දෙනියාය තේ පර්යේෂණායතනයේ ක්ෂෙත්‍ර දෙකක ද වගාව ස්ථාපිත කර ඇත.

3. කුඩා තේ වතු ක්ෂෙත්‍රයේ දළු නෙළීම යාන්ත්‍රීකරණය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ දෙනියාය මධ්‍යස්ථානයට ලැබී ඇති යන්ත්‍ර (බැටරි මගින් සහ ඉන්ධන මගින් ක්‍රියාකරන දළු නෙලීමේ යන්ත්‍ර සහ තෝරා දළු නෙලීමේ කතුර) භාවිතයෙන් උපයෝගිතා අත්හදාබැලීමක් මොරවක ප්‍රදේශයේ පෞද්ගලික තේ ඉඩමක සිදුකරන ලද අතර එය අවසාන කර ඇත.

### පර්යේෂණ අත්හදාබැලීම්
පහත සඳහන් අත්හදා බැලීම් අදාල පර්යේෂණ අංශ හා සහයෝගිත්වයෙන් පවත්වාගෙන යමින් පවතී.

### ශාක අභිජනන අංශය
1) TRI 5000 වර්ගයේ තේ ප්‍රභේද - පහත රට වර්ධක ප්‍රචාරන අදියර III ඉන්දොල වත්ත, කිරුවානාගඟ වත්ත සහ දෙනියාය වත්තෙහි ස්ථාපිත කර ඇත.

11) වැඩි දියුණු කල ඇට තේ වගාවක් වරාපිටිය කුඩා තේ ඉඩම් හිමියකුගේ ඉඩමක සහ කිරුවානා ගඟ වත්තේ ස්ථාපිත කර ඇත.

### වට පණු සහ කීට විද්‍යා අංශය
1) TRI 5000 ප්‍රභේදවල තේ පැල වටපණුවන්ට දක්වන ප්‍රතිචාරය සොයා බැලීම සඳහා පර්යේෂණ අත්හදා බැලීමක් දෙනියාය තේ පර්යේෂණායතන භූමියේ ස්ථාපිත කර ඇත.

### ආගන්තුකයින්
පහත දැක්වෙන පරිදි ආගන්තුකයින් 855 දෙනෙක් සේවා ලබාගැනීම සඳහා දෙනියාය මධ්‍යස්ථානයට පැමිණ ඇත.

| | |
|---|---|
| විශාල වතු කළමණාකාරිත්වය සහ කුඩා තේ ඉඩම් හිමියන් | 612 |
| විශ්ව විද්‍යාල/කෘෂිකර්ම විද්‍යාල/පාසල් සිසුන් සහ වෙනත් අය | 243 |

### පුහුණු කටයුතු
ලබුදූව උසස් තාක්ෂණ ආයතනයේ කෘෂිකර්ම ඩිප්ලෝමාධාරී ශිෂ්‍යාවන් දෙදෙනෙක් (මාස 6 ක පුහුණුව සමග) පර්යේෂණ ව්‍යාපෘතිය සිදු කිරීම හා නිබන්ධනය ලිවීම උපදේශක නිලධාරි එස්.පී. රත්නායක මහතාගේ සුපරීක්ෂණය යටතේ සාර්ථකව සම්පූර්ණ කරන ලදී.

### යටිතල පහසුකම් සංවර්ධනය සහ නඩත්තු කටයුතු
2017 වසරේ අනුමත ඇස්තමේන්තුවට අදාලව නිල නිවාස තුනක ආරක්ෂක පැති බැම් බැඳීම, නිල නිවාස, සංචාරක නිවාසය සහ කාර්යාලයේ වහලවල තීන්ත ආලේප කිරීම සහ දළු මඩුව ඉදිකිරීම 2018 වසරේ පළමු කාර්තුවේ අවසන් කල හැකි වනු ඇත. මෙම මධ්‍යස්ථානය සතු වාහන, නිල නිවාස, ආගන්තුක නිවසේ සහ කාර්යාලයේ නඩත්තුව සහ අලුත්වැඩියාවන්ද මාර්ග සහ පරිසරය පිරිසිදු කිරීම සහ නඩත්තුවද නිසි පරිදි සිදුකෙරිණි.

### මධ්‍යස්ථානයේ කටයුතු වලින් ලද සම්පූර්ණ ආදායම - 2017

| ක්‍රියාකාරකම | ආදායම (රු) |
|---|---|
| ප්‍රකාශන විකිණීම | 12,125 |
| පස්වල පීඑච් අගය පරීක්ෂාව | 45,030 |
| පස්වල කාබන් ප්‍රතිශතය පරීක්ෂාව | 510 |
| අමු තේ දළු විකිණීම | 40,555 |
| විවිධ ආදායම් | 67,776 |
| එකතුව | 165,996 |

### කම්කරුවන් ගණන
වෙක්රෝල් කම්කරුවන් - 3

# කළුතර ව්‍යාප්ති මධ්‍යස්ථානය

**හැරන් ජයවීර**
**ස්ථානභාර නිලධාරී**

**හැඳින්වීම**
ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ කළුතර උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය, මතුගම, නිව්තිගල කැලේ, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතන පරිශ්‍රයේ පිහිටා ඇත. මෙම මධ්‍යස්ථානය මගින් උපදෙස් හා ව්‍යාප්ති සේවා සිදුකරන අතර එයට අමතරව පාංශු pH විශ්ලේෂණය සඳහා කුඩා විද්‍යාගාරයක්ද ඇත.

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ උපදෙස් හා ව්‍යාප්ති අංශයේ, අංශ ප්‍රධානීන්ගේ මග පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන මෙම මධ්‍යස්ථානය කළුතර, ගම්පහ සහ කොළඹ යන දිස්ත්‍රික්කයන්හි තේ වගාකරුවන් සඳහා සේවාවන් සැපයීම සිදුකරයි. ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන්ගේ සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් වල නිලධාරීන්ගේ/සේවකයින්ගේ තේ වගා පිළිබඳ දැනුම, කුසලතා වර්ධනය කිරීම සහ නව තාක්ෂණික දැනුම සම්ප්‍රේෂණය කිරීම සඳහා පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර දින, තේ වගා වැඩමුළු ආදී වැඩසටහන් රාශියක් කළුතර ව්‍යාප්ති මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලබයි. මේ යටතේ තේ වගාවේ පාංශු සංරක්ෂණය, සෙවණ කළමනාකරණය, රෝග හා පළිබෝධ පාලනය, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඇත.

මෙම මධ්‍යස්ථානය මගින් සිදුකරන ව්‍යාප්ති වැඩසටහන් අතර කුඩා තේ වතු හිමියන් සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන ප්‍රාදේශීය තාක්ෂණික හා ව්‍යාප්ති සංසදය, විශේෂ තැනක් ගන්නා අතර, තේ වගාවේ වල් මර්දනය සඳහා නව නිර්දේශ, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාවලින් තුලින් ඵලදායිතාව වැඩි කර ගැනිම, පාංශු හා ජල කළමණාකරනය, තේ වගාවේ ඵලදායිතාවයට බලපෑම, කුඩා තේ වතු ඉඩම් වල පාංශු හා ජල සංරක්ෂණය තුළින් පාංශු පෝෂක තත්ත්වය වර්ධනය කරගැනිම කුඩා තේ වතු වල වල් පැළෑටි පාලනය, රෝග හා පළිබෝධ පාලනය, ප්‍රධාන මාතෘකා ලෙස සාකච්ජා කරන ලදී. තවද මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහකාර කළමණාකාරතුමා සහ ප්‍රදේශයේ සිටින වැවිලිකරුවන් ද සහභාගී විය.

කළුතර හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි තුල ඇති ප්‍රාදේශිය වැවිලි සමාගම් වලට අයත් වතු අධිකාරීන් සහ සහකාර වතු අධිකාරීන් වෙනුවෙන් පවත්වන ප්‍රාදේශීය විද්‍යාත්මක සමුළුව රත්නපුර තේ පර්යේෂණ ආයතනය සමග ඒකාබද්ධව සංවිධානය කරන ලදී. කළුතර දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම හා කළුතර දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම සඳහා ස්ථාන භාර නිලධාරී ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදෙන ලදී. තවද ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග ඒකාබද්ධව කර්මාන්තශාලා සහ දළු එකතු කරන්නන් සහ කුඩා තේ වතු හිමියන් සඳහා සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කරන ලදී.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ඉල්ලීම පරිදි ස්ථානභාර නිලධාරී "රන්දල්ලක අරුණළු" ගුවන් විදුලි වැඩසටහනේ විනිශ්චය මණ්ඩලයේ සාමාජිකයකු ලෙසද සහභාගී විය. තව ද තේ කර්මාන්තයට වසර 150ක් පිරීම නිමිත්තෙන් තේ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද කළුතර දිස්ත්‍රික්කයේ හොඳම තේ වැවිලි කරුවා, හොඳම තේ කර්මාන්ත ශාලාව සහ හොඳම තේ ඉඩම තේරීමේ විනිශ්චය මණ්ඩල විනිසුරුවරයා ලෙස ස්ථානභාර නිලධාරී ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදෙන ලදී. කළුතර උපදෙස් හා ව්‍යාප්ති අංශය මගින් වත්මන් තේ කර්මාන්තය සඳහා තේ වල ගුණාත්මය වර්ධනය කිරීම සඳහා මහවතු සහ කුඩා තේ වතු හිමියන් සඳහා දළු නෙලීමේ පුහුණු වැඩසටහන් හා යන්ත්‍රෝපකරණ පිළිබඳ පුහුණු වැඩසටහන් 23 කට අධික ප්‍රමාණයක් සාර්ථකව සිදු කරන ලදී. ස්ථානභාර නිලධාරී ගාල්ල හා කළුතර වතු හිමියන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද අතුකෝරල තේ කර්මාන්ත ශාලාවේ පැවති පාංශු සංරක්ෂණ වැඩමුළුව සඳහා සහභාගි විය. බදුරලිය, තුන්දොල, ගල්අතර, පැලවත්ත, පිටිගල, කැටන්දොල යන ප්‍රදේශ වල කර්මාන්තශාලා පරීක්ෂණ හා විගණන වැඩසටහන් සඳහා තේ මණ්ඩලය සමග ස්ථානභාර නිලධාරී ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදෙන ලදී. තවද ස්ථානභාර නිලධාරී කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ඉල්ලීම පරිදි වාණිජ තේ තවාන්වල අවසාන පරීක්ෂණ 40 කට වඩා වැඩි සංඛ්‍යාවකට සහභාගි විය. කළුතර උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ සියලු කාර්යය මණ්ඩලය පහතරට කලාපයේ අස්වැන්න අඩුවීම සහ තේ පඳුරු මියයෑම පිළිබඳ සමීක්ෂණය සඳහා රත්නපුර තේ පර්යේෂණායතනයේ නිලධාරීන් සමග සහභාගි විය.

තේ කර්මාන්තයට වසර 150ක් පිරීම නිමිත්තෙන් තේ මණ්ඩලය විසින් නෙළුම් පොකුණ රඟහලේ සංවිධානය කරන ලද සම්මාන ප්‍රධානෝත්සවය සඳහා ස්ථානභාර නිලධාරී ඉතා ක්‍රියාකාරී ලෙස සහභාගි විය. ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය විසින් සංවිධානය කරන ලද සම්මාන උලෙළේ දී තේ කර්මාන්ත ක්ෂේත්‍රයේ වසර 29 ක දායකත්වය සම්පූර්ණ කිරීම වෙනුවෙන් මතුගම ස්ථානභාර නිලධාරීට ප්ලැටිනම් පදක්කමක් පරිනමන ලදී.

මතුගම ස්ථානභාර නිලධාරී මැලේසියාවේ පවත්වන ලද නායකත්ව හා මානව සම්පත් කළමනාකරණ විදේශිය පුහුණු වැඩසටහනට සහභාගි වන ලදී. මතුගම ස්ථානභාර නිලධාරී කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමග කළුතර දිස්ත්‍රික්කයේ ගංවතුරෙන් හානියට පත් කුඩා තේ වතු හිමියන්ගේ මානසික තත්ත්වය නංවාලීම සඳහා අධ්‍යාපනික සංවර්ධන වැඩසටහන් සංවිධානය කරන ලදී. එමෙන්ම ඔවුන් සඳහා ගරු වැව්ලි කර්මාන්ත ඇමතිතුමා, මගින් සංවිධානය කරන ලද ආධාර බෙදා දිමේ වැඩසටහනට ද මතුගම ස්ථානභාර නිලධාරී ද සහභාගි විය. මතුගම උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරී සහ කාර්යය මණ්ඩලය කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට අලුතින් බඳවාගත් තේ පරීක්ෂක මහතුන් සහ නුවරඑළිය තරුණ කුඩා තේ වතු හිමියන් හට තේ කර්මාන්තයේ යාන්ත්‍රිකරණ ක්‍රියාවලිය සඳහා ඉතා සාර්ථක පුහුණු වැඩසටහනක් හන්තාන කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ දී පවත්වන ලදී.

### කාර්යය මණ්ඩල වෙනස්වීම්

කළමනාකරණ සහකාර ඩී.ජී.එල් අමරතුංග මහත්මිය සැප්තැම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙණියාය මධ්‍යස්ථානයට ස්ථාන මාරුකරනු ලැබූ අතර නැවත 2017 ඔක්තෝම්බර් මස 12 වන දින සිට මතුගම උපදෙස් හා ව්‍යාප්ති මධ්‍යස්ථානය වෙත අනියුක්ත කරන ලදී.

### උපදෙස් හා ව්‍යාප්ති ක්‍රියාකාරකම්

| ක්‍රියාකාරකම් | වැඩසටහන් ගණන |
|---|---|
| උපදෙස් සමීක්ෂණ වාර්තා | 352 |
| ක්ෂේත්‍ර චාරිකා | 58 |
| පුහුණු වැඩසටහන් | 23 |
| ප්‍රකාශන විකුණුම් | 150 |
| පස් පරීක්ෂා කිරීම | 110 |
| වාණිජ තේ තවාන් පරීක්ෂණ | 08 |
| සමීක්ෂණ | 100 |
| අනුවර්තී පර්යේෂණ | 20 |
| සහභාගී වූ රැස්වීම් | 41 |

### අනුවර්තී පර්යේෂණ සහ ආරම්භ කිරීම්

රත්නපුර තේ පර්යේෂණ ආයතනයේ ශාක අභිජනන අංශයේ සහයෝගය ඇතිව කළුතර දිස්ත්‍රික්කය තුළ 5000 කාණ්ඩය සහ වැඩිදියුණු කල බීජ ප්‍රභේද වල අනුවර්තී පර්යේෂණ තුනක් පැලවත්ත, හොරණ, මීගහතැන්න යන ප්‍රදේශ වලින් තෝරා ගත් කුඩා තේ වතු හිමියන් තිදෙනෙකුගේ ක්ෂේත්‍ර තුළ ස්ථාපනය කරන ලදී.

### අත්හදා බැලීම්

- යාන්ත්‍රික දළු නෙලීම පිළිබඳ අත්හදා බැලීමක් රත්නපුර ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ශෂ්‍ය විද්‍යා අංශයේ සහයෝගීත්වයෙන් මීගහතැන්න සොයිසා වතුයායේ ස්ථාපනය කරන ලදී.
- මහකළුපහන ප්‍රදේශයේ තේ වගාවට හානි කල වටපණු ගහණය පිළිබඳ අත්හදා බැලීමක් තලවකැලේ සහ රත්නපුර ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ කීට විද්‍යා අංශය සමග සිදු කරන ලදී.

### ආදර්ශ වගාබිම

කළුතර ප්‍රදේශයේ තේ වගා කරුවන්ගේ නව වගා ප්‍රභේද පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා 4000, 5000 කාණ්ඩයේ තේ වගා ආදර්ශයක් රත්නපුර ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ශාක අභිජනන අංශයේ නිලධාරින්ගේ සහයෝගය ඇතිව ප්‍රාදේශීය මධ්‍යස්ථානය තුල ස්ථාපිත කර ඇත.

### අමුත්තන්ගේ පැමිණීම

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ කළුතර ව්‍යාප්ති මධ්‍යස්ථානයට පැමිණි අමුත්තන් ගණන 120 ක් වන අතර එය පහත සඳහන් පරිදි සාරාංශ ගත කර ඇත.

| කාණ්ඩය | ප්‍රමාණය |
|---|---|
| වැවිලි සමාගම් | 24 |
| කුඩා වතු හිමියන් | 82 |
| විශ්ව විද්‍යාල සිසුන් | 02 |
| කෘෂි විද්‍යාල සිසුන් | 08 |
| පාසල් සිසුන් | 04 |
| එකතුව | 120 |

**යටිතල පහසුකම් සංවර්ධන හා නඩත්තුව**

විද්‍යාගාරය, කාර්යාලය, හා දේශන ශාලාව යනාදිය සහ නිල රථය නිසි ලෙස නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම සිදු කර ඇති අතර ආයතන පරිශ්‍රයද, වඩා පිරිසිදුව හා සේවාදායකයන්ට ආකර්ශනීය ලෙස පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත.

**ආදායම**

කළුතර තේ පර්යේෂණ ආයතනය ලැබූ ආදායම හා ඊට අදාල ක්‍රියාකාරකම් පහත පරිදි දැක්විය හැක.

| ක්‍රියාකාරකම් | ආදායම (රු.) |
|---|---|
| ප්‍රකාශන විකිණීම | 9,585.00 |
| පස් පරීක්ෂා කිරීම | 10,450.00 |
| තේ දළු විකිණීම | 1,950.50 |
| එකතුව | 21,985.50 |

# සම්මාන, ප්‍රතිපාදන, අධ්‍යයන වැඩ සටහන්, ප්‍රකාශන සහ විශේෂ ඉදිරිපත් කිරීම්

## උපදෙස් හා ව්‍යාප්ති අංශය

**සම්මාන/ප්‍රදාන**

තේ පර්යේෂණ ආයතනය වෙත ලබාදුන් දායකත්වය හා සේවාවන් වෙනුවෙන් උපදෙස් හා ව්‍යාප්ති අංශයේ පහත සාමාජිකයින් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අතින් ඇගයීම් සම්මාන ලැබූ හ.

- වසර 25කට වැඩි කාලයක් පුරා තේ පර්යේෂණ ආයතනයේ කැපවීමෙන් සේවය කිරීම අගයමින් ආචාර්ය බී. ඒ. ඩී සමන්සිරි මහතා, ආචාර්ය වී. එස්. සිදාකරන් මහතා සහ ජේ. සී. කේ. රාජසිංහ මහතා ප්ලැටිනම් සම්මාන ලබා ගැනීම.
- තේ කර්මාන්තය සඳහා පර්යේෂණ දායකත්වය අගයමින් ආචාර්ය බී. ඒ. ඩී සමන්සිරි මහතා සහ ආචාර්ය වී. එස්. සිදාකරන් මහතා රන් සම්මාන ලබා ගැනීම
- තේ පර්යේෂණ ආයතනය වෙනුවෙන් සිදුකල වසර 18 ක සේවය වෙනුවෙන් කේ. ආර්. ඩබ්. බී. කහඳව මහතාට රිදී පදක්කමක් පිරිනමන ලදී.

**අධ්‍යයන හා පුහුණු වැඩ සටහන්**

ව්‍යාප්ති නිලධාරී සී.ඊ. මුණසිංහ මහතා කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2016 මැයි 23 ආරම්භ කල ඔහුගේ දර්ශනපති (M Phil) උපාධි කටයුතු ඉදිරියට පවත්වාගෙන යනු ලබයි.

බී. ඒ. ඩී. සමන්සිරි මහතා, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ දි “සංවර්ධනය සඳහා සන්නිවේදනය” යන මාතෘකාව යටතේ ඔහුගේ දර්ශනශූරී (Ph D) පශ්චාත් උපාධි කටයුතු සම්පූර්ණ කරන ලදී. ශ්‍රී ලංකාවේ තේ වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා තොරතුරු ව්‍යාප්ත කිරීමේ දී ඒකාබද්ධ තොරතුරු තාක්ෂණ පද්ධතියක් තුලින් ඵලදායී උපදේශන සේවා ලබාදීම යන්න ඔහුගේ නිබන්ධනය විය.

**ප්‍රකාශන**

Mr Janaka Mahindapala 2017. "Some key pests and diseases status in tea plantations in Ratnapura and Kegalle Districts", TRI Update.

**විශේෂ ඉදිරිපත් කිරීම් සහ දේශන**

ජානක මහින්දපාල මහතා ජූලි 28 දින කොළඹ පැවති පර්යේෂණ හා ව්‍යාප්ති සැසියේ පහතරට තේ වගාවන්හි අස්වැන්න අඩුවීම සහ පඳුරු දුර්වල වීම පිළිබඳව ඉදිරිපත් කිරීමක් කරන ලදී.

ජානක මහින්දපාල මහතා “පහතරට තේ වගාවන්හි අස්වැන්න අඩුවීම සහ පඳුරු දුර්වල වීම” පිළිබඳව නොවැම්බර් 15 රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්කවල වැවිලි සමාගම් සඳහා පැවති සැසි සඳහා ඉදිරිපත් කිරීම් කරන ලදී.

ජානක මහින්දපාල මහතා “රත්නපුර දිස්ත්‍රික්කයේ තේ වගාව සඳහා ගංවතුර බලපෑවේ කෙසේද” යන්න පිළිබඳව ඉදිරිපත් කිරීම් කරන ලදී.

ජානක මහින්දපාල මහතා “රත්නපුර දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු අංශයේ තේ වගාවන්ට මෑත කාලයේ ගංවතුරේ බලපෑම්” පිළිබඳ දෙසැම්බර් 22 දින තලවාකැලේ තේ පර්යේෂණ ආයතනයේ පැවති පර්යේෂණ හා ව්‍යාප්ති සංසදයේ දී ඉදිරිපත්කිරීමක් සිදු කරන ලදී.

එස්. පී. රත්නායක මහතා කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරන ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය වෙනුවෙන් තේ වගාවේ පාංශු සාරවත් බව සහ සෙවණ පාලනය පිළිබඳ විශේෂ ඉදිරිපත් කිරීම් කරන ලදී.

කේ. ආර්. ඩබ්. බී. කහඳව මහතා ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය මගින් BMICH හි පවත්වන ලද "තේ - ඉදිරි ගමන" සම්මන්ත්‍රණයේ ප්‍රාරම්භක දේශනය සිදු කරන ලදී.

ඒ. එල්. ආර්. යූ. කුමාර මහතා දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුවේ සාමාජිකයෙකු ලෙස සහභාගී වෙමින් තේ පර්යේෂණ ආයතනය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව ඌව ප්‍රදේශයේ වැවිලිකරුවන් සඳහා ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

**වෙනත් ක්‍රියාකාරකම්**

ආචාර්ය බී. ඒ. ඩී. සමන්සිරි මහතා FAO හි තිරසාර ඉඩම් කළමනාකරණ වැඩසටහනෙ හි තාක්ෂණික විද්වත් කමිටුවෙහි සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

ආචාර්ය බී. ඒ. ඩී. සමන්සිරි මහතා, ප්‍රකාශන හා ඉදිරිපත් කිරීමේ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ද, තේ පර්යේෂණ ආයතනයේ කෘෂි රසායන සහ යන්ත්‍රෝපකරණ පරීක්ෂණ කමිටුවෙහි සාමාජිකයෙකු ලෙසද තවදුරටත් කටයුතු කරයි.

ආචාර්ය බී. ඒ. ඩී. සමන්සිරි මහතා, වැවිලි කළමනාකරණ ජාතික ආයතනයෙන් පලකරන සඟරාවේ සංස්කරණ සාමාජිකයකු ලෙස ද, වැවිලි කළමණාකරන ජාතික ඩිප්ලෝමා ආයතනයේ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ද, වැවිලි කළමනාකරණය පිලිබඳ සහතික පත්‍ර කළමණාකාර පාඨමාලාව අධ්‍යයන මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි.

ආචාර්ය බී. ඒ. ඩී. සමන්සිරි මහතා, එස් එම් ප්‍රකාශකයන් විසින් ප්‍රකාශයට පත්කරන Planter සඟරාවේ තාක්ෂණික විද්වත් කමිටු සාමාජික ලෙස කටයුතු කරයි.

ජේ.සී.කේ. රාජසිංහ මහතා, ආසියානු සංවර්ධන බැංකු මව් ශාක ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක ලෙස තවදුරටත් කටයුතු කරයි.

ජේ. සී. කේ. රණසිංහ මහතා තේ කර්මාන්තයේ 150 වන සංවත්සර ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන ද්‍රව්‍ය පිලියෙළ කිරීමේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කල අතර ප්‍රදර්ශන කටයුතු සඳහා අවශ්‍ය ඡායාරූප සහ තොරතුරු සපයන ලදී.

ජේ. සී. කේ. රාජසිංහ මහතා 2017 සිට 2022 කාලයේ 5000 කාණ්ඩයේ මව් ශාක වැඩසටහනේ හෙක්ටයාර 30 ක මව්ශාක ප්‍රතිස්ථාපනය කිරීමේ සම්බන්ධීකාරක ලෙස පත්කරන ලදී.

ජේ. සී. කේ. රණසිංහ මහතා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් සිදුකරන තේ ප්‍රශ්ණ විචාරක රේඩියෝ වැඩසටහන සඳහා තේ වගාව සහ සාමාන්‍ය කෘෂිකර්මාන්තය පිළිබඳ ප්‍රශ්න සපයමින් එම වැඩසටහන් දෙකක් සඳහා සහභාගී විය.

ජේ.සී.කේ. රාජසිංහ මහතා 150 වන සංවත්සර සැමරුමේ නොවැම්බර් මස පැවැත්වූ "හොඳම තේ ඉඩම" තරගයේ තේරීම් මණ්ඩලය සඳහා සහභාගී විය.

ආචාර්ය වී.එස්. සිදාකරන් මහතා තේ පර්යේෂණ මණ්ඩලයේ වතු සහ උපදේශක සේවා කමිටුවේ කැඳවුම්කරු / ලේකම් ලෙස තවදුරටත් කටයුතු කරයි.

ආචාර්ය වී.එස්. සිදාකරන් මහතා ව්‍යාප්ති හා පර්යේෂණ සම්බන්ධතා සංසදයෙ හි සම්බන්ධීකාරක ලෙස තවදුරටත් කටයුතු කරයි.

ආචාර්ය වී.එස්. සිදාකරන් මහතා ශාන්ත කූම්බ්ස් වතුයායේ අධීක්ෂණ කමිටුවේ සභාපති ලෙස තවදුරටත් කටයුතු කරයි.

ජානක මහින්දපාල මහතා තේ පර්යේෂණ ආයතනයේ "තේ නතු පුවත් සඟරාවේ" සංස්කාරක ලෙස තවදුරටත් කටයුතු කරයි.

එස්.පී. රත්නායක මහතා 2017 නොවැම්බර් මස 2 සිට 5 දක්වා ඉන්දියාවේ පූනේ හි STIHL (Pvt) Ltd නිෂ්පාදන පුහුණුවකට හා පහසුකම් නැරඹීමේ චාරිකාවකට සහභාගී විය.

එස්. පී. රත්නායක මහතා කුඩා තේ වතු අංශයේ යාන්ත්‍රීකරණ ව්‍යාපෘතියේ තේ පර්යේෂණ ආයතන සම්බන්ධීකාරක සහ යන්ත්‍ර පරීක්ෂා කිරීමේ කමිටුවේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.

එස්. පී. රත්නායක මහතා Tea Bulletin හි සම්බන්ධීකාරක ලෙස තවදුරටත් සේවය කරයි.

කේ.ආර්.ඩබ්ලිව්.බී. කහඳව මහතා උපදෙස් හා ව්‍යාප්ති සේවා සංසදයෙහි කැඳවුම්කරු ලෙසට කටයුතු කරන ලදී.

උපදේශක නිලධාරිනී හිරෝමි නිශාන්ති මහත්මිය විසින් නුවරඑළිය ප්‍රාදේශිය තාක්ෂණ හා ව්‍යාප්ති සංසදයේ (RTEF) කැඳවුම්කරු ලෙසට කටයුතු කරන අතර එහි සම්මන්ත්‍රණයක් ද සංවිධානය කරන ලදී.

උපදේශක නිලධාරිනී හිරෝමි නිශාන්ති මහත්මිය විසින් ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් සංවිධානය කරන ලද වැවිලි කළමනාකරණය පිලිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව සම්බන්ධීකරණය කරන ලදී.

කේ. ආර්. ඩබ්. බී. කහඳව මහතා “බෝ නොවන රෝග වැළැක්වීම සඳහා තේ සහ මානව සෞඛ්‍යයට කෘෂි රසායන වල බලපෑම” යන මැයෙන් දියත්කල ව්‍යාපෘතියේ සත්කාරක ලෙස කටයුතු කරන ලදී.

කේ. ආර්. ඩබ්. බී. කහඳව මහතා ශ්‍රී ලංකාවේ නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් සංවිධානය කරන ලද ජූනි 10 වන දින නුවර දී පැවති මධ්‍යම පළාත් නව නිපැයුම්කරුවන් ඇගයීමේ වැඩසටහනේ විනිශ්චය මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

කේ. ආර්. ඩබ්. බී. කහඳව මහතා නොවැම්බර් 25 වන දින මහනුවර වාරියගල දී පටිගත කරන ලද “තේ දල්ලයි අරුණැල්ලයි” රේඩියෝ වැඩසටහනේ විනිශ්චය මණ්ඩල සාමාජිකයෙකු ලෙස සහභාගි විය.

ඒ. එල්. ආර්. යූ. කුමාර මහතා GEF/FAO මගින් සංවිධානය කරන ලද ඌව පළාත් දිස්ත්‍රික් ලේකම්තුමාගේ මගපෙන්වීම යටතේ පැවති “මධ්‍යම උස් බිම්වල හායනයට ලක්වූ කෘෂිකාර්මික බිම් පුණරුත්ථාපනය” වැඩසටහනේ කමිටු සාමාජිකයෙකු ලෙස සහභාගි විය.

ඒ. එල්. ආර්. යූ. කුමාර මහතා 2017 මාර්තු 23 වන දින හා 24 වන දින වලදී වැලිමඩ ඇටම්පිටියේ පැවති රන් දල්ලයි අරුණැල්ලයි රේඩියෝ වැඩසටහනේ සම්පත් දායකයෙකු ලෙස කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ කර්මාන්තයේ 150 වන සංවත්සරය සඳහා ඌව ප්‍රදේශයේ සංවිධානය කරන ලද දළු නෙලීමේ තරගය සඳහා විනිශ්චය මණ්ඩල සාමාජිකයෙකු ලෙස ඒ. එල්. ආර්. යූ. කුමාර මහතා සහභාගි විය.

## කෘෂි ආර්ථික විද්‍යා අංශය

### සම්මාන/ප්‍රදාන

තේ පර්යේෂණ ආයතනය වෙත ලබාදුන් දායකත්වය හා සේවාවන් වෙනුවෙන් එච්. ඩබ්ලිව් ශ්‍යාමලී සහ කේ ඩබ්ලිව් එන් නදීශානි මහත්මීන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අතින් ඇගයීම් සම්මාන ලැබූ හ.

### අධ්‍යයන හා පුහුණු වැඩ සටහන්

කේ ඩබ්ලිව් එන් නදීශානි මහත්මිය 2017 දෙසැම්බර් 01 දින සිට පේරාදෙණිය විශ්ව විද්‍යාලීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේදී දර්ශනපති උපාධියේ අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී.

ජුලි මස 13 වන දින සිට 27 වන දින දක්වා ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධ්‍යයන කේන්ද්‍රය විසින් පවත්වන ලද සමීක්ෂණ නියැදීම් පිළිබඳ දින 5 වැඩමුළුව සඳහා එච්. ඩබ්ලිව් ශ්‍යාමලී මහත්මිය සහ එච්. එම්. සී. ජී. පිලපිටිය මෙනෙවිය සහභාගී විය.

කෘෂිකර්ම ප්‍රතිපත්ති පිළිබඳ ශ්‍රී ලංකා කවුන්සිලය (CARP) විසින් පවත්වන ලද ව්‍යාපෘති යෝජනා සැකසීම පිළිබඳව එක් දින වැඩමුළුව සඳහා එච්.එම්.සී. ජී පිලපිටිය මෙනෙවිය සහභාගි විය.

බී. එම්. එන්. සී. කරුණාරත්න මෙනෙවිය සහ අයි.එච්.ටී. චතුරංග මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සංඛ්‍යාලේඛන හා පරිගණක විද්‍යා දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද දත්ත විද්‍යාව හා කාල ශ්‍රේණි විශ්ලේෂණය පිළිබඳ දින 3 වැඩමුළුව සඳහා සහභාගි විය.

ජාතික විද්‍යා පදනම විසින් පවත්වන ලද ඵලදායී ලෙස පර්යේෂණ යෝජනා සැකසීම පිළිබඳ එක් දින වැඩමුළුව සඳහා සහ ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් පවත්වන ලද මූලික දත්ත විශ්ලේෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවට පී .ටී. පී. ලක්ෂානී මහත්මිය සහභාගි විය.

එච්. ඩබ්ලිව් ශ්‍යාමලී මහත්මිය 2017 අගෝස්තු 24 දින IPS ආයතනයේ පවත්වන ලද වැඩමුළුවට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධ්‍යයන කේන්ද්‍රය විසින් පවත්වන ලද ˜E-Views in Advanced Ecometrics˜ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවට සහභාගී විය. 2017 අප්‍රේල් 28 දින කොළඹ ජාතික විද්‍යා පදනමේදී පවත්වන ලද පර්යේෂණ කළමනාකරණය පිළිබඳ වැඩමුළුව සඳහා එච්. ඩබ්ලිව්. ශ්‍යාමලී සහභාගී විය.

**ප්‍රකාශන**

Shyamalie. H.W., H.M.C.G. Pilapitiya, B.M.N.C. Karunarathna, N.N.K.Wellala, 2017. submitted a paper on Labour Shortage in Tea Plantations: How Big the “Crisis” Is? for TRI Update.

Abeysinghe I S.B, HW Shyamalie. 2017. Country Perspective. Current status and advances in tea sector of Sri Lanka. pp 52-64. Proceedings of International Conference on Advances in Tea, 12-13 August 2017, Sri Lanka.

Ranathunga, M.A.B., I.S.B Abeysinghe and H.W.Shyamalie. 2017, The Tea Research Institute of Sri Lanka and Research Focus. TREASUREISLAND.LK. PP 26-31. Vol. 03. Issue 03.

Shyamalie. H.W., H.M.C.G. Pilapitiya, B.M.N.C. Karunarathna, 2017. Determinants of productivity variation and technical efficiency of tea smallholders in Low country, Sri Lanka. Journal of Agriculture and Environment for International Development (Submitted)

**විශේෂ ඉදිරිපත් කිරීම් සහ දේශන**

බී. එම්. එන්. සී. කරුණාරත්න මෙනෙවිය විසින් 2017 පෙබරවාරි මස 18 වන දින ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුවේදී රාජ්‍ය තක්සේරු කරුවන් සඳහා තේ කර්මාන්තය පිළිබඳව ඉදිරිපත් කිරීමක් කරන ලදී.

එච්. ඩබ්ලිව් ශ්‍යාමලී මහත්මිය විසින් ”වගා සඳහා ඩිජිටල් පිරිවැය ගණනය කිරීමේ ආකෘතිය” පිළිබඳව 2017 පෙබරවාරි 20 වන දින කොට්ටව දී වතු හිමියන්ගේ සංගමයට ඉදිරිපත් කිරීමක් කරන ලදී. ඇය 2017 ජුනි 21 වන දින තලවකැලේ තේ පර්යේෂණායතනයේදී වතු හිමියන්ගේ සංගමයට තේ පර්යේෂණායතනයේ පර්යේෂණ ක්ෂේත්‍රයන් පිළිබඳවද ඉදිරිපත් කිරීමක් කරන ලදී.

එච්. ඩබ්ලිව් ශ්‍යාමලී මහත්මිය විසින් කෘෂිකර්ම ප්‍රතිපත්ති පිළිබඳ ශ්‍රී ලංකා කවුන්සිලය (CARP) වෙත 2017 ඔක්තෝබර් 27 වන දින කොළඹදී ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රගති සමාලෝචනය ඉදිරිපත් කරන ලද අතර 2017 මැයි 31 දින තලවකැලේ තේ පර්යේෂණායතනයෙ ශ්‍රවණාගාරයේදී තේ කර්මාන්තය හා එහි වැදගත්කම පිළිබඳ ඉදිරිපත් කිරීමක් කරනු ලැබුවාය.

**වෙනත් ක්‍රියාකාරකම්**

එච්. ඩබ්ලිව් ශ්‍යාමලී 2017 ජනවාරි මස 14 වන දින තලවකැලේදී හවාඩ් විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාඥයන් සමග පවත්වන ලද රැස්වීමකට සහභාගී විය. 2017 ජුනි 6 වන දින තලවකැලේ තේ පර්යේෂණ ආයතනයේ දී පවත්වන ලද පර්යේෂණ ප්‍රතිපත්ති සැසිවාරයට එච්. ඩබ්ලිව්. ශ්‍යාමලී සහභාගි විය. ඇය 2017 ජුනි 7 වන දින කොළඹ කෘෂිකර්ම ප්‍රතිපත්ති පිළිබඳ ශ්‍රී ලංකා කවුන්සිලය (CARP) හිදී පවත්වන ලද පර්යේෂණ දීමනා පිළිබඳ උප කමිටු රැස්වීම සඳහා සහභාගී විය.

එච්. ඩබ්ලිව්. ශ්‍යාමලී 2017 ජුනි මස 30 වන දින පහතරට කලාපීය මධ්‍යස්ථානයේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලද පර්යේෂණ හා ව්‍යාප්ති සංසදය (කුඩා තේ වතු අංශය) සඳහා සහභාගී විය. ඇය ග්ලිපොසේට් පිළිබඳ ප්‍රගති සමාලෝචනය සඳහා 2018 අගෝස්තු 01 වන දින වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දී සහභාගී වූ අතර 2017 අගෝස්තු මස 20 වන දින සාරප්‍රභාගිර ගුවන් විදුලි වැඩසටහනටද සහභාගී විය.

එච්. ඩබ්ලිව්. ශ්‍යාමලී 2017 අගෝස්තු මස 15 වැනි දින වැවිලි කර්මාන්ත අමාත්‍යංශයේදී පැවති පර්යේෂණ තේමාවන් පිළිබඳ රැස්වීම සඳහා සහභාගී වූ අතර 2017 අගෝස්තු මස 18 වන දින කොළඹ කෘෂිකර්ම ප්‍රතිපත්ති පිළිබඳ ශ්‍රී ලංකා කවුන්සිලය (CARP) හිදී පවත්වන ලද ශ්‍රී ලංකා ආර්ථික හා ප්‍රතිපත්ති විශ්ලේෂක කණ්ඩායම් රැස්වීමටද සහභාගී විය. 2017 නොවැම්බර් මස 15 වන දින පවත්වන ලද ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ වාර්ෂික සැසිවාරය 2017 නොවැම්බර් 27 වන දින වැවිලි කර්මාන්ත අමාත්‍යංශයේ දී පැවති ක්‍රියාකාරකම් සැලැස්ම පිළිබඳ රැස්වීමට හා 2017 නොවැම්බර් මස 28 වැනි දින IPS කොළඹ විසින් සංවිධානය කරන ලද පර්යේෂණ කළමනාකරණය පිළිබඳ වැඩමුළුවට එච්. ඩබ්ලිව්. ශ්‍යාමලී සහභාගී විය. මිචිගන් විශ්ව විද්‍යාලයේ පර්යේෂකයින් සමග සහයෝගී සමාජීය ආර්ථික පර්යේෂණ පැවැත්වීම සඳහා සාකච්ඡාවකට සහ ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ කෘෂිකාර්මික ඉඩම් සඳහා තිරසාර කළමනාකරණ භාවිතයන් පිළිබඳ සාකච්ඡාවක් සඳහා එච්. ඩබ්ලිව්. ශ්‍යාමලී සහභාගී විය.

2017 ජනවාරි මස 21 වන දින තේ පර්යේෂණායතනයේ ජනාධිපතිතුමා පැමිණි උත්සවයට එච්. ඩබ්ලිව්. ශ්‍යාමලී, එච්. එම්. සී. ජී. පිලපිටිය, බී. එම්. එන්. සී. කරුණාරත්න කේ ඩබ්ලිව් එන් නදීශානි පී.ටී. පී. ලක්ෂානී යන අය සහභාගී වූහ.

2017 ජනවාරි මස 27 වන දින හා 2017 දෙසැම්බර් මස 22 වැනි දින තලවකැලේ තේ පර්යේෂණායතනයේ පැවති පර්යේෂණ හා ව්‍යාප්ති සංසදයන්ට එච්. ඩබ්ලිව්. ශ්‍යාමලී, එච්. එම්. සී. ජී. පිලපිටිය, බී. එම්. එන්. සී. කරුණාරත්න යන අය සහභාගී වූහ.

2017 මැයි මස 23 සහ 24 යන දිනවල පවත්වන ලද පර්යේෂණ සහ උපදේශන සම්බන්ධතා රැස්වීම සඳහා එච්. ඩබ්ලිව්. ශ්‍යාමලී, එච්. එම්. සී. ජී. පිලපිටිය, බී. එම්. එන්. සී. කරුණාරත්න කේ ඩබ්ලිව් එන් නදීශානි සහ පී .ටී. පී. ලක්ෂානී සහභාගි විය.

එච්. ඩබ්ලිව්. ශ්‍යාමලී, එච්. එම්. සී. ජී. පිලපිටිය, බී. එම්. එන්. සී. කරුණාරත්න 2017 ජූලි 2 දින කොළඹ විශ්ව විද්‍යාලයේ අලෙවිකරණ පීඨයේ කාර්යය මණ්ඩලය සමග සාකච්ඡාවට සහ 2017 ජූලි 29 දින පර්යේෂණ හා ව්‍යාප්ති සංසද රැස්වීම සඳහා සහභාගි විය.

2017 අගෝස්තු මස 11 වැනි දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති ජාත්‍යන්තර තේ සම්මේලනය සඳහා එච්. ඩබ්ලිව්. ශ්‍යාමලී, එච්. එම්. සී. ජී. පිලපිටිය, බී. එම්. එන්. සී. කරුණාරත්න කේ ඩබ්ලිව් එන් නදීශානි පී.ටී. පී. ලක්ෂානී සහ අයි. එච්. ටී. චතුරංග සහභාගී වූහ.

2017 සඳහා තේ පර්යේෂණ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම / ක්‍රියාකාරකම් සැලැස්ම හා 2018 සඳහා තේ පර්යේෂණ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණ කරන ලදී. තේ පර්යේෂණායතනයේ ප්‍රගතිය එක් එක් කාර්තු සඳහා සම්පාදනය කර වැවිලි කර්මාන්ත අමාත්‍යංශය වෙත ඉදිරිපත් කරන ලදී. විශේෂ ව්‍යාපෘතිවල මාසික ප්‍රගතිය හා කාර්යය සාධනය ඉහළ නංවා ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවන් පිළියෙල කර වැවිලි කර්මාන්ත අමාත්‍යංශය වෙත ඉදිරිපත් කරන ලදී.

පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම සඳහා NASTEC ආයතනය වෙත තොරතුරු සම්පාදනය සේවක ඇගයීම පිළිබඳ වාර්තා සැකසීම හා 2008 - 2015 අතරතුර සිදු කරන ලද පර්යේෂණ පිළිබඳව වාර්තා සකස් කර ඇත

උපරිම දළු නෙලීමේ වියදම අනුව පවත්වා ගත යුතු අවම දළු නෙලීමේ ඵලදායීතාව පිළිබඳ මාර්ගෝපදේශයක් සකස් කර ඇත.

පර්යේෂණ හා පර්යේෂණ සංවර්ධන පිළිබඳ සමීක්ෂණයක් සඳහා දත්ත පද්ධතියක් සකස් කර ජාතික විද්‍යා පදනම වෙත ඉදිරිපත් කරන ලද අතර මිචිගන් විශ්ව විද්‍යාලය හා තේ පර්යේෂණායතනය අතර සහයෝගී සමාජීය ආර්ථික පර්යේෂණ පැවැත්වීම සඳහා අවබෝධතා ගිවිසුමක් සකස් කරන ලදී.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කෘෂි ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ හදාරන, සිසුන් දෙදෙනෙක් හා වයඹ විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂක සිසුන් දෙදෙනෙකු ඔවුන්ගේ ආයතනික පුහුණු පාඨමාලාව පවත්වාගෙන යන ලදී.

ස්ප්‍රින්වැලි වතුයායේ හා කුඩා තේ වතු ක්ෂේත්‍ර සඳහා වන්දි ගණනය කර වාර්තා සකසන ලද අතර ශාන්ත කුම්බිස් වත්ත හා තේ කර්මාන්තයේ ආර්ථික වැදගත්කම පිළිබඳ වාර්තා ඉදිරිපත් කරන ලදී.

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්මාන්ත සංගමයේ අරමුදල් සඳහා ලංකාවේ මධ්‍යම කඳුකරයේ තේ ඉඩම් සඳහා තිරසාර ඉඩම් කළමනාකරණය පිළිබඳ යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.

තේ වගාවේ පිරිවැය පිළිබඳ අත්පොතේ පරිච්ඡේද තුනක් සංශෝධනය කර ඇත.

පර්යේෂණ කාර්යය මණ්ඩල විදේශ පුහුණුව සඳහා කෘෂිකර්ම ප්‍රතිපත්ති පිළිබඳ ශ්‍රී ලංකා කවුන්සිලය (CARP) වෙත ලේඛනයක් සකසා ඇත.

## ශෂ්‍ය විද්‍යා අංශය

**සම්මාන/ප්‍රදාන**

තේ පර්යේෂණ ආයතනය වෙත ලබාදුන් දායකත්වය හා සේවාවන් වෙනුවෙන් ආචාර්ය එම්.එස්.ඩී.එල් ද සිල්වා, ආචාර්ය එම් ඒ විජේරත්න, ආචාර්ය ශ්‍යාමන්ත බණ්ඩාර, එස්. ආර්. ඩබ්. පතිරණගේ, එච්.එස්.එන් පීරිස්, යූ පී අබේසේකර, එස්.එන් විජේසේකර, පද්මිනී ප්‍රේමතුංග සමන්ති ජයසිංහ සහ එම්.ජී.එස් ලියනගේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අතින් ඇගයීම් සම්මාන ලැබූහ.

**අධ්‍යයන හා පුහුණු වැඩ සටහන්**

එස්. ආර්. ඩබ්. පතිරණගේ මහතා අධ්‍යයන චාරිකාවක් සඳහා (SIHL Facility) ඉන්දියාව බලා පිටත් විය.

එම්. ජී. එස්. ලියනගේ මහතා චීනයේ ෂැංහොවු අධ්‍යාපන ආයතනය විසින්, සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා සංවිධානය කරන ලද තේ සහ ආහාර නිෂ්පාදන තාක්ෂණික වැඩමුළුවට 2017 සැප්තැම්බර් 28 සිට නොවැම්බර් 15 දක්වා සහභාගීවන ලදී.

ගතවූ වසර තුළ දී එක් උපාධි අභ්‍යාසලාභියෙකු, උසස් ජාතික ඩිප්ලෝමාධාරීන් දෙදෙනෙකු තලවාකැලේ ශෂ්‍ය විද්‍යා අංශයේදී පුහුණු කෙරිණි. එක් උපාධි අභ්‍යාසලාභියෙකු හා ඩිප්ලෝමාධාරීන් 13ක් පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ දී පුහුණුව නිම කරන ලදී.

ශ්‍රී ලංකා හා ඇමරිකා එක්සත් ජනපද සහයෝගිතා වැඩසටහන මගින් පවත්වන ලද වැඩමුළුවට ආචාර්ය එම් ඒ විජේරත්න මහතා සහභාගී විය.

**ප්‍රකාශන**

Luxmei De Silva (2016). Weed management strategies in tea in the absence of total weed killers. TRI Update. Vol 15 No 1-2, December 2016 4-5.

WHDU Pushpakumari, RMA Madusanka, MSDL De Silva (2017). Soil properties as affected by chemical and non-chemical weeding in Tea Lands: a case study at Labukelle Estate, Nuwara Eliya. Proceedings of the 1st International Symposium on Agriculture, Faculty of Agriculture, Eastern University. Pp 186-191

Wijeratne, M.A. (2017). Planting and cultivation of tea. In: Global tea science. Current status and future needs. Shrama, V. S. and Kumudini Gunasekare, M.T. (Eds.). Burleigh Dodds Science Publishing, Cambridge, UK.

Piyasundera, J.H.N., Gunasekara, M.T.K., Ranathunga, M.A.B. Mudalige, A.K., Wijeratne, M.A. and Wickramasinghe, I.P. (2016). Why concerted efforts are necessary for proper management of tea seed gardens? an update. Tea Bulletin, 25 (1/2): 21-28.

Kottawa Arachchi, J. D. and Wijeratne, M.A. (2017). Climate Change Impacts on bio diversity and ecosystems on Sri Lanka: A Review. *Nature Conservation Research* 2, (3)

Bandara, N P S N 2017. Digital Strategies for Marketing Sri Lanka Tea. Tea Bulletin 26: 1-10

Bandara, N P S N 2017. "ගෝලීය උරුමයක් කල යුතු ශ්‍රී ලංකාවේ තේ සංස්කෘතිය" දිවයින 2017 ඔක්තෝම්බර් 25

**විශේෂ ඉදිරිපත් කිරීම් සහ දේශන**

බණ්ඩාරණායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සහ කොට්ටව උපදෙස් මධ්‍යස්ථානයේ දී දේශගුණික විපර්යාසවල බලපෑම් හා ඒවා අවම කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව දේශන ආචාර්ය එම් ඒ විජේරත්න මහතා විසින් සිදු කරන ලදී .

පහතරට වැවිලිකරුවන්ගේ සංගමයේ හා උපදෙස් සේවා සපයන පුද්ගලික ආයතනවල නිලධාරින්ට තේ වගාවේ යාන්ත්‍රිකරණය පිළිබඳ දේශන ආචාර්ය එම් ඒ විජේරත්න මහතා විසින් සිදු කරන ලදී. මීට අමතර ව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සඳහාද ආචාර්ය එම් ඒ විජේරත්න මහතා දේශන පවත්වා ඇත.

ආචාර්ය එම් ඒ විජේරත්න මහතා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ පුහුණුවන්නන්ට හා කුඩා තේ වතු ඉඩම් හිමියන් රැසකට තේ දළු නෙළීම පිළිබඳව දේශන හා පුහුණු සැසි පවත්වන ලදී.

ආචාර්ය එම් ඒ විජේරත්න මහතා හිදැල්ලන තේ කර්මාන්ත ශාලාවේ දී විදේශීය සංචාරකයින් කණ්ඩායමකට තේ වගාවේ ඉතිහාසය හා එහි ආර්ථික වටිනාකම පිළිබඳව දේශනයන් පැවැත්වීය. මීට අමතරව ඔහු වැවිලි කර්මාන්ත අමාත්‍යංශය, පරිසර අමාත්‍යංශය හා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව මගින් සංවිධානය කල වැඩමුළුවලදී දේශගුණික විපර්යාස පාංශු ඛාදනය හා යාන්ත්‍රිකරණය පිළිබඳ දේශන පවත්වා ඇත.

ආචාර්ය එම්.එස්.ඩී.එල් ද සිල්වා මිය - කළුතර ප්‍රාදේශීය තාක්ෂණ ව්‍යාපෘති වැඩසටහනට සහභාගී වූ අතර එහිදී තේ වගාවේ වල් මර්ධනය සම්බන්ධව දේශනයක් පවත්වන ලදී.

ආචාර්ය ශ්‍යාමන්ත බණ්ඩාර R.I.M.E.S සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද මෝසම් සංසදය සහභාගී වූ අතර තේ කර්මාන්තය නියෝජනය කරමින් ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

ආචාර්ය ශ්‍යාමන්ත බණ්ඩාර පාංශු සංරක්ෂණය ජල කලමනාකරණය නියං හානි අවම කර ගැනීම ආදී විෂයයන් පිළිබඳ ඉදිරිපත් කිරීම් වගා කරුවන් උදෙසා සිදු කරන ලදී.

**වෙනත් ක්‍රියාකාරකම්**

ආචාර්ය එම්.එස්.ඩී.එල් ද සිල්වා මිය - ආරක්ෂාකාරී වල් මර්ධන පිළිවෙත් පිළිබඳ පුහුණු වැඩ සටහන වටවල, හපුගස්තැන්න, මඩොල්සිම, උඩපුස්සැල්ලාව, මස්කෙලිය පුද්ගලික වැවිලි සමාගම් වල සිදු කෙරිණි.

එස්.එන් විජේසේකර මිය - වල් මර්ධන පිළිවෙත් පිළිබඳ පුහුණු වැඩසටහන රංගල, මඩොල්කැලේ වතු සමාගම් සඳහා සිදු කෙරිණි.

පාරිසරික වෙනස්කම් අධ්‍යයනය පිළිබඳව කමිටුවේ ශ්‍රී ලංකාව නියෝජනය කරන ආචාර්ය එම් ඒ විජේරත්න මහතා අගෝස්තු 12-13 දිනවල කොළඹ පැවති තේ පිළිබඳ අනතර්ජාතික සමුළුවට සහභාගී වී එහි සාකච්ඡාවලට දායකත්වය සපයා ඇත.

ආචාර්ය එම් ඒ විජේරත්න මහතා කහවත්ත වැවිලි සමාගමේ දළු නෙලන්නියන් 200 ක් සඳහා කතුරුවලින් දළු නෙලීමේ ප්‍රායෝගික පුහුණු සැසිවාර 4 ක් පවත්වා ඇත.

ආචාර්ය එම් ඒ විජේරත්න මහතා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් විකාශය කල තේ කර්මාන්තය හා තේ පර්යේෂණ පිළිබඳ වැඩසටහනට සහභාගී විය.

තිරසාර යුගයක හරිත උද්‍යානය ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටිය සකස් කිරීමට අවශ්‍ය  කටයුතු සම්පාදනය හා එය පවත්වාගෙන යාම  ආචාර්ය එම් ඒ විජේරත්න මහතාගේ අධීක්ෂණය යටතේ සිදු විය.

ආචාර්ය එම් ඒ විජේරත්න මහතා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශන හා ඉදිරිපත් කිරීම් පිළිබඳ ව උපදේශන කමිටුවේ සභාපති ලෙස තවදුරටත් සේවය ලබා දී ඇත.  ඔහු රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂි පීඨ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසත් SLCARP ආයතනයේ යාන්ත්‍රීකරණය පිළිබඳ ජාතික කමිටුවේ සභාපති ලෙසත් තවදුරටත් සේවය ලබාදේ.

ආචාර්ය එම් ඒ විජේරත්න මහතා විසින් සම්පත් පතිරණගේ හා නොයෙල් පියසුන්දර යන මහත්වරුන්ගේ පශ්චාත් උපාධි කටයුතු අධීක්ෂණය කරන ලදී.

2017 වර්ෂයේදී එස්. ආර්. ඩබ්. පතිරණගේ විසින් සම්පත් දායකතවය සැපයූ තාක්ෂණික ප්‍රචාරණ සහ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් ගණන 13කි. එම වැඩසටහන් පවත්වනු ලැබුයේ මහ වතු අංශයේ මාණ්ඩලික සහ ක්ෂේත්‍ර නිලධාරීන් (කහවත්ත, සපුමල්කන්ද, රූකාසල්, මහඔය සහ සිංහරාජ යන තේ වතු), පහතරට වැවිලිකරුවන්ගේ සංගමයේ නිලධාරීන් සහ කුඩා තේ වතු හිමියන් සඳහාය.

කතුරු භාවිතයෙන් දළු නෙලීම සඳහා සාදන ලද යාන්ත්‍රිකව ක්‍රියාත්මක කල හැකි ආදර්ශනය සහ ගැඹුරට පොහොර යොදනය ආදී ප්‍රදර්ශන භාණ්ඩ සෑදීමට ක්‍රියාකාරී දායකත්වය සැපයූ ඔහු කොළඹ BMICH හි පවත්වන ලද ජාතික මට්ටමේ ප්‍රදර්ශන දෙකකට සහභාගීත්වය සපයන ලදී. තවද තේ පර්යේෂණායතන පහතරට ස්ථානයෙහි සිදුකරන ලද වලවල් හාරන යන්ත්‍ර පරීක්ෂා කිරීමේ කටයුතු වලදී ඔහුගේ දායකත්වය වැදගත් විය.

මෙයට අමතරින් එස්. ආර්. ඩබ්. පතිරණගේ විසින් පසුගිය වසර තුලදී පුහුණු කරන ලද NVQ/NAITA  ශිෂ්‍ය සංඛ්‍යාව 13 ක් වන අතර, මෙයට අමතරින් විශ්වවිද්‍යාල අවසාන වසර සිසුවෙකුගේ පර්යේෂණ නිබන්ධනය සඳහා අධීක්ෂකවරයෙකු ලෙස කටයුතු කර ඇත.

එම්. ජී. එස්. ලියනගේ මහතා ශ්‍රී ලංකා තේ කර්මාන්තයට වසර 150 සපිරීම නිමිත්තෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් 2017 මාර්තු මස 26 වැනි දින, නුවරඑළිය වජිරඥාන මහා විද්‍යාලයේ පැවැත්වූ ප්‍රාදේශීය අධ්‍යාපනික වැඩමුළු වලට ක්‍රියාකාරී දායකත්වය ලබා දෙන ලදී.

2017 අගෝස්තු මස 11 - 13 දිනයන්හි කොළඹ බී.එම්.අයි.සී.එච් ප්‍රදර්ශන භූමියේ පැවැත්වූ සී.ආර්.ටී වෙළඳ ප්‍රදර්ශනයට ක්‍රියාකාරී දායකත්වය සපයන ලදී.

එස් එන් විජේසේකර මහත්මිය මඩුල්කැලේ හා රන්ගල වතුවල පැවැත්වූ වල් නාශක භාවිතය පිළිබඳ ප්‍රායෝගික සැසියට සහභාගී විය.

ශෂ්‍ය විද්‍යා අංශයේ නිලධාරීන් අංශයට පැමිණි දේශීය හා විදේශීය අමුත්තන් හා පාසැල් ළමුන්ට ශෂ්‍ය විද්‍යා අංශයේ පර්යේෂණ හා තේ වගාව පිළිබඳ දැනුම ලබාදෙන ලදී.

ශෂ්‍ය විද්‍යා අංශය මගින් කාලගුණ දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය කිරීම සිදුකරන ලදී.

## ජෛව රසායන විද්‍යා අංශය

### අධ්‍යයන හා පුහුණු වැඩ සටහන්

එස්. ඒ. ඩී. පී. එස්. ජයවර්ධන මෙනෙවිය කෘෂිකාර්මික සහ ජෛව වෛද්‍ය විද්‍යාත්මක පර්යේෂණ සඳහා අණුක ජීව විද්‍යාත්මක තාක්ෂණික ක්‍රම භාවිතය පිළිබඳ වැඩමුළුවකට, ඉන්දියාවේ පශු වෛද්‍ය තාක්ෂණික ආයතනයේ දී 2017 පෙබරවාරි 3 වන දා සිට 2017 මාර්තු 03 වන දා දක්වා සහභාගි විය.

ඒ. එස්. ගවුස් මහතා AAS, GC, GC-MS, LC, LC-MS සහ IC- MS යන තාක්ෂණයන් භාවිතය පිළිබඳ තෙදින වැඩමුළුවකට කාර්මික තාක්ෂණ ආයතනයේදී සහභාගි විය.

ඊ. එන්. යූ. එදිරිසිංහ මහතා චීනයේ දී පැවති පරිසර දූෂණයෙන් තොර තේ නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළුවට සහභාගි විය.

එම්. එස්. සී. ප්‍රනාන්දු මහත්මිය සහ එස්. ඒ. ඩී. පී. එස්. ජයවර්ධන මෙනෙවිය කාර්මික තාක්ෂණ ආයතනයේ පැවති දියුණු විද්‍යාත්මක උපකරණ පිළිබඳ තෙදින පුහුණුවකට සහභාගි විය.

එම්. එස්. සී. ප්‍රනාන්දු මහත්මිය සහ ඊ. එන්. යූ. එදිරිසිංහ මහතා HPLC තාක්ෂණයේ භාවිතයන් යන්නෙන් සිංගප්පූරුවේ Agilent විශ්ව විද්‍යාලයේ සිව් දිනක් පුරා පැවති වැඩමුළුවක් සඳහා සහභාගි විය.

එන්. සී. වීරකෝන් මෙනෙවිය චීනයේ පැවති තේවලින් ආහාර නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය යන්නෙන් පැවැති සමුළුව සඳහා සහභාගි විය.

ශ්‍රී ලංකා පදනම මගින් සංවිධානය කළ දත්ත විශ්ලේෂණය පිළිබඳ පාඨමාලාවකට ඒ එස් ගවුස් මහතා සහභාගි විය.

FI- NIR තාක්ෂණයේ භාවිතයන් පිළිබඳ ජර්මනියේ Bruker Optik ආයතනයේ පැවති සිව් දින වැඩමුළුවකට එම් එස් සී ප්‍රනාන්දු මහත්මිය සහ එස් ඒ ඩී පී එස් ජයවර්ධන මෙනෙවිය සහභාගි විය.

ආචාර්ය කේ. ජී. එන්. පී. පියසේන මහත්මිය IWMI හි පැවති ජෛව පොහොර සහ ජෛව පළිබෝධනාශක දියුණු කිරීම පිළිබඳ ජාතික සම්මන්ත්‍රණයට සහභාගි විය.

නයිවල උසස් තාක්ෂණික ආයතනයේ ඩබ් එන් සී විමලජීව මෙනෙවිය අම්පාර HARDY ආයතනයේ බී හේරත් සහ එන් ධනංජය රුහුණු විශ්ව විද්‍යාලයේ අවසන් වසරේ ශිෂ්‍ය එස් ආර් එදිරිසිංහ සහ කැළණිය විශ්ව විද්‍යාලයේ චමෝදි රවිහංසි පුහුණු කටයුතු සම්පූර්ණ කරන ලදී.

### ප්‍රකාශන

Kobika, C., Fernando M.S.C., Sajewani, J.W.A., (2017), Determination of physical, chemical & sensory characteristics of Nuwara Eliya regional tea to evaluate the quality of black tea, third Annual Research Session of the Institute of Food Science and Technology Sri Lanka, August 5, 2017, BMICH

### වෙනත් ක්‍රියාකාරකම්

කඳ විදින ගුල්ලා සඳහා තේ ගස තුල වර්ධනය වන දිලීර භාවිතයෙන් රසායනික සලකුණු දියුණු කිරීම සහ නව ජෛව විද්‍යාත්මක පාලන ක්‍රම දියුණු කිරීම හා තේ වගාවන්හි වල් පැළ පාලනය සඳහා පරිසර හිතකාමී ප්‍රවේශයක් යන මාතෘකා යටතේ නව ව්‍යාපෘති යෝජනා 2 ක් සකස් කර ඒවා භාරදීම සිදු කර ඇත.

එම්. එස්. සී. ප්‍රනාන්දු මහත්මිය සහ එස්. ඒ. ඩී. පී. එස්. ජයවර්ධන මෙනෙවිය කාර්මික තාක්ෂණ ආයතනයේ පර්යේෂණ සම්මන්ත්‍රණයට BMICH හිදී නොවැම්බර් 16 සහ 17 යන දෙදින තුළ සහභාගි විය.

Kawazaki kiko ආයතනය සහ ජපානයේ තේ පර්යේෂණ මධ්‍යස්ථානය නියෝජනය කරමින් කණ්ඩායමකුත්, ජාත්‍යන්තර පරමාණු බලශක්ති අධිකාරිය නියෝජිත කණ්ඩායමකුත්, Tea Times සඟරාව නියෝජනය කරමින් මාධ්‍යවේදීන් කණ්ඩායමකුත්, ඉරාන, ජර්මානු, යුරෝපීය සහ තවත් රටවල් නියෝජනය කරමින් කණ්ඩායම් කිහිපයකුත්, රුහුණු විශ්ව විද්‍යාලය, රජරට විශ්ව විද්‍යාලය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, යාපනය විශ්ව

විද්‍යාලය, වයඹ විශ්ව විද්‍යාලය, සබරගමුව විශ්ව විද්‍යාලය, Mel's ඇකඩමි සහ කෘෂිකාර්මික පාසල යන අධ්‍යාපනික ස්ථාන වලින් ශිෂ්‍ය කණ්ඩායම්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, මිචිගන් විශ්ව විද්‍යාලය නියෝජනය කරමින් කණ්ඩායම් ජෛව රසායනික අංශයේ නිරීක්ෂණ චාරිකාවල නියැලිනි.

## කීට විද්‍යා හා වටපණුවේදී අංශය

**සම්මාන හා ප්‍රදාන**

ආචාර්ය කීර්ති මොහොට්ටි මයා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ ඉංජිනේරු අධ්‍යයන අංශය සමග සම්බන්ධ වී විකල්ප රසායනික ධුමකාරක ලෙස ක්ෂුද්‍ර තරංග අධෝරක්ත කිරණ, කාබන් ඩයොක්සයිඩ් සහ වියලි අයිස් ප්‍රතිකාරක භාවිතා කිරීම සඳහා ඉදිරිපත් කල ව්‍යාපෘති යෝජනාව සඳහා රු. 1,000,000.00 ක ප්‍රදානයක් ශ්‍රී ලංකා කෘෂිකාර්මික ප්‍රතිපත්ති කොමිෂන් සභාවෙන් (SLCARP) ලබා දෙන ලදී.

**අධ්‍යයන හා පුහුණු කටයුතු**

පර්යේෂණ නිලධාරිනී පී. පී. ඩී. එස්. අමරසේන මිය ඇයගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු අවසන් කළාය.

පර්යේෂණ නිලධාරිනී පී. පී. ඩී. එස්. අමරසේන මිය ඇයගේ පශ්චාත් උපාධි අධ්‍යයන වලට අදාල පර්යේෂණ හා පුහුණුවක් ලබා ගැනීම 2017 අගෝස්තු 15 දින සිට නොවැම්බර් 30 දක්වා ඕස්ට්‍රේලියාවේ මර්ඩොක් විශ්ව විද්‍යාලයේ දී සිදු කරන ලදී.

එච්. එම්. එස්. ඩී. කුලතුංග මයා "Fundamentals of molecular biology & biotechnology" පාඨමාලාව හදාරන ලදී

එච්. එම්. එස්. ඩී. කුලතුංග සහ එන් නවරත්න මයා "Basic and intermediate data analysis" පාඨමාලාව හදාරන ලදී

**ප්‍රකාශන**

Mohotti, K. M., Prematunga, A. K., Amarasena, P. G. D. S., Navaratne, N. and Herath, U. B. 2017. Attributes of nematode infestations to bush debilitation, unusual yield decline and death of tea in low grown areas, Proceedings of the 234$^{th}$ Experiments and Extension Forum, Tea Research Institute of Sri Lanka, 45-56.

Kudagammana, S.T., K. M. Mohotti, A. Karunatilaka and R. R. Karunaratne (2017). Patterns of food consumption and nutritional status of preschool children in two high grown tea estates of Sri Lanka. Sri Lanka Journal of Medicine. 26(2), pp.20–25. DOI: http://doi.org/10.4038/sljm.v26i2.37

**විශේෂ ඉදිරිපත් කිරීම් හා දේශන**

235 වන පර්යේෂණ හා ව්‍යාප්ති සංසදයේදී ආචාර්ය කීර්ති මොහොට්ටි මහතා විසින් පහතරට තේ වගාවේ අස්වනු අඩු වීම, තේ පඳුරු මැරී යාම කෙරෙහි වටපණු හානියේ බලපෑම පිළිබඳ දේශනයක් ඉදිරිපත් කරන ලදී.

තේ වගාවට වසර 150ක් පිරීම නිමිත්තෙන් පැවති වෙළඳ ප්‍රදර්ශනය ඇතුළු වැඩසටහන් මාලාවේදී ආචාර්ය කීර්ති මොහොට්ටි මහතා විසින් 'පාංශු කාබන් කළමනාකරණය සඳහා බයෝචාර් (Biochar) භාවිතය'යන මැයෙන් දේශනයක් ඉදිරිපත් කරන ලදී.

වටපණු හානිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ගාල්ල හිනිදුම ප්‍රදේශයේ පෞද්ගලික තේ කම්හල් හිමියන් සඳහා පවත්වන ලදී.

වටපණුවන් හා සම්බන්ධ පර්යේෂණ ක්‍රමවේදයන් පිළිබඳ පුහුණු වැඩසටහනක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශාක නිරෝධායන අංශයේ නිලධාරීන් සඳහා පවත්වන ලදී.

අජන්තා අබේසේකර මහත්මිය විසින් පළිබෝධ පාලනයට බෲනෝලියම්වල වැදගත් කම පිළිබඳව තේ පරීක්ෂක නිලධාරීන් සඳහා දේශණයක් පවත්වන ලදී.

ආචාර්ය පී සේනානායක මහත්මිය විසින් තේ පළිබෝධ පාලනය පිළිබඳව තේ පරීක්ෂක නිලධාරීන් සඳහා දේශණයක් පවත්වන ලදී.

අජන්තා අබේසේකර මහත්මිය විසින් ඒකාබද්ධ පළිබෝධ පාලනය පිළිබඳව ඌව සහ මැදරට තේ පරීක්ෂක නිලධාරීන් සඳහා දේශණයක් පවත්වන ලදී.

ආචාර්ය පී සේනානායක මහත්මිය විසින් ඩිප්ලෝමා ධාරීන් සඳහා දේශණයක් පවත්වන ලදී.

**වෙනත් ක්‍රියාකාරකම්**

ශාක අභිජනන අංශය මගින් තෝරාගත් නව තේ ප්‍රජනිතයන්, ප්‍රභේද හා බීජ ප්‍රැටිලෙන්චස් ලූසයි, රැඩොෆොලස් සිමිලිස් වටපණු විශේෂයන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව / ප්‍රතිරෝධී බව අධ්‍යයනය සඳහා පර්යේෂණ පිළිබඳ විශේෂ සාකච්ඡාවක් 2017 නොවැම්බර් 20 දින පැවැත්විණ. මෙහිදී තේ පර්යේෂණ ආයතනයේ හිටපු වටපණු විද්‍යාඥ ආචාර්ය නාලිනී ඥානප්‍රගාසම් මිය හා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සත්ත්ව විද්‍යා අංශයේ ආචාර්ය එස්. මීගස්කුඹුර මිය උපදෙස් ලබාදීම සඳහා සහභාගි වූහ. මෙහිදී දැනට භාවිතා වන ක්‍රමවේදයන්ට අනුව පර්යේෂණ සිදු කිරීමට එකඟතාවයට පැමිණි අතර ඊට අමතරව ජෛව රසායනික පරාමිතීන් තුළින් ප්‍රතිරෝධී හා පාත්‍රි ප්‍රභේද හඳුනා ගැනීමේ වැදගත්කම අවධාරණය කෙරිණ.

පහත සඳහන් නව නිර්දේශයන් තාක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව ඇගයීමට ලක් කර නිර්දේශයන් ලබාදෙන ලදී. මෙම නිර්දේශයන් PU 1 හා PU 4 උපදෙස් චක්‍රලේඛයන්හි අන්තර්ගත කිරීමට නියමිතය.

1. මයිටාවන් මර්දනය සඳහා ස්වභාවික පළිබෝධ නාශකයක් ලෙස ලෝරික් අම්ලය භාවිතය

2. පහතරට සජීවී දැව වේයාගේ හානියෙන් තේ පඳුර ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රතිකාරකයක් ලෙස බෲනෝලියම් භාවිතය

3. කඳ ගුල්ලාගේ හානියෙන් තේ පඳුර ආරක්ෂා කර ගැනීම පූර්ව ප්‍රතිකාරකයක් ලෙස හුණු හා ගෙන්දගම් භාවිතය

මීට අමතරව රජරට විශ්ව විද්‍යාල සිසුන්ට පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම, පළිබෝධ පාලනය සඳහා ලොයිනොන් වත්තෙහි නිලධාරීන්ට වැඩමුළුවක් පැවැත්වීම, ඇග්ස්ටාර් ආයතනයේ නිලධාරීන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම, රුහුණු විශ්ව විද්‍යාලයේ සිසුන්ට වටපණුවේදී විද්‍යාව සම්බන්ධ ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම, ඩිප්ලෝමාලාභීන් දෙදෙනෙකු කීට හා වටපණුවේදී විද්‍යාව පිළිබඳ මාස හයක පුහුණුවක් ලබා දීම, වරකාපොල කුඩා තේ වතු සාමාජිකයන් පළිබෝධ පාලනය පිළිබඳව දැනුවත් කිරීම, වයඹ, රුහුණු, පේරාදෙණිය, යාපනය, සබරගමුව යන විශ්ව විද්‍යාල සිසුනට, පළිබෝධ පාලනය පිළිබඳ දැනුමක් ලබා දීම සහ කුලියාපිටියේ තාක්ෂණ විද්‍යාලයේ සිසුන්ට තේ පළිබෝධ පාලනය පිළිබඳ දැනුමක් ලබා දීම මෙම අංශය මගින් සිදුකර ඇත.

ආචාර්ය කීර්ති මොහොට්ටි මහතාගේ මගපෙන්වීම යටතේ බී. එම්. එල්. එම්. කරුණාරත්න මයා, රජරට විශ්ව විද්‍යාලය සහ පී. එන්. එන්. විජයංගනී මෙනෙවිය, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය යන ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් සිය අවසන් වසර පර්යේෂණ නිබන්ධන සිදු කරන ලදී.

## ශාක අභිජනන අංශය

**සම්මාන/ප්‍රදාන**

**කෘෂිකර්ම පර්යේෂණ අංශයේ විශිෂ්ටත්වය සඳහා වූ ජාතික සම්මාන 2017**

ආචාර්ය පී.ඒ.එන්.පුණ්‍යසිරි, ප්‍රධාන අන්වේෂක (නේචර්ස් බියුටි ක්‍රියේෂන්ස්),බී. ජෙගනාදන් (කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය), ධනංජය කොට්ටව ආරච්චි (ශාක අභිජනන අංශය, තේ ප ආ), ආචාර්ය එම්.ඒ.බී. රණතුංග (ශාක අභිජනන අංශය, තේ ප ආ), ආචාර්ය කුමුදුනී ගුණසේකර (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යංශය), ආචාර්ය අයි.එස්.බී.අබේසිංහ (අධ්‍යක්ෂ, තේ ප ආ), මහාචාර්ය බී.එම්.ආර්.බණ්ඩාර (විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය) 2017 දෙසැම්බර් මස 14 වන දින ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් "ශ්‍රී

ලංකා තේ ජාන ප්ලාස්මයේ රසායනික පරිවෘත්තිය සංඝටක පැතිකඩකරණය" වෙනුවෙන් "කෘෂි පර්යේෂණ අංශයේ 2017 කෘෂි පර්යේෂණ සම්මාන ප්‍රදානෝත්සවයේ පළමු ස්ථානය" පිරිනමන ලදී.

**විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජාතික පර්යේෂණ සභාව පිරිනමන ලද සම්මාන**

2015 වර්ෂයේ දී රසායන විද්‍යාව පිළිබඳ විශ්ලේෂණ ක්‍රමවේදය පිළිබඳ ජර්නලයේ ප්‍රකාශිත විද්‍යාත්මක පර්යේෂණයක් සඳහා එම්. ඒ. බී. රණතුංග මහතා සහ ජේ. ඩී. කේ. ආරච්චි මහතාට කුසලතා සම්මානයක් පිරිනමන ලදී.

එම්. ඒ. බී. රණතුංග, ජේ. එච්. එන්. පියසුන්දර, ජේ. ඩී. කේ. ආරච්චි, කේ.කේ. රණවීර, ඒ.කේ. මුදලිගේ යන මහත්වරුන් තේ කර්මාන්තයට සහ තේ පර්යේෂණ සඳහා දක්වන ලද දායකත්වය අගයා සම්මානයට පාත්‍ර වන ලදී.

**පර්යේෂණ ප්‍රදාන**

**තේ ජානමය විශ්ලේෂණය සහ තේ පත්‍ර වල අඩංගු වර්ණක පිළිබඳ ජාන සිතියම්කරණය (*Camellia sinensis*)**

**අරමුදල් ප්‍රදානය කල ආයතනය : ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, කෘෂිකර්ම අමාත්‍යංශය**

ආචාර්ය එම්.ඒ.බී. රණතුංග, කෘෂිකර්ම අමාත්‍යංශයේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව "Genetic Analysis and Linkage Mapping of Tea" (*Camellia sinensis*) පර්යේෂණ කටයුතු සඳහා 2017 අගෝස්තු සිට 2020 දෙසැම්බර් දක්වා පර්යේෂණ ප්‍රතිපාදන (රුපියල් මිලියන 2.08 ක්) ලබා දී ඇත. මෙය තේ පර්යේෂණ ආයතනය සහ කැලණිය විශ්ව විද්‍යාල විද්‍යා පීඨය සමග සහයෝගී පර්යේෂණයකි. ඉහත සඳහන් කළ මාතෘකාව පිළිබඳ පර්යේෂණ සිදු කරනු ඇති අතර මෙහි හවුල්කරුවන් වන්නේ ධනංජය කොට්ටව ආරච්චි මහතා (ශාක අභිජනන අංශය, තේ ප ආ), එම්. එස්.සී. ප්‍රනාන්දු (ජෛව රසායනික අංශය, තේ ප ආ), ආචාර්ය ටී. එල්. විජේරත්න (ශාක කායික විද්‍යා අංශය, තේ ප ආ), ආචාර්ය ආර්. එන්. අත්තනායක (කැලණිය විශ්ව විද්‍යාලයේ උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව) සහ ආචාර්ය තිස්ස අමරකෝන් (කැලණිය විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා දෙපාර්තමේන්තුව) මහතායි.

**තේ ශාකයේ වැදගත් ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ හඳුනා ගැනීම සහ ජානමය චරිතායනය කඩිනම් කිරීම සඳහා අධි තාක්ෂණික ප්‍රවේණිකරණය**

**අරමුදල් ප්‍රදානය කල ආයතනය : ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන යටතේ, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය**

"තේ ශාකයේ වැදගත් ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ හඳුනා ගැනීම සහ ජානමය චරිතායනය කඩිනම් කිරීම සඳහා අධි තාක්ෂණික ප්‍රවේණි කරණය" සඳහා 2018 සිට 2020 දක්වා ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන යටතේ, විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය විසින් රුපියල් මිලියන 5.85 ක් ප්‍රදානය කරන ලදී. ඉහත සඳහන් සහයෝගී පර්යේෂණයේ ප්‍රධාන අන්වේෂක වනුයේ ආචාර්ය ආර්. එන් අත්තනායක (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව, කැලණිය විශ්ව විද්‍යාලය) සහ සහයෝගී පර්යේෂකයින් වන්නේ ආචාර්ය එම්.ඒ.බී. රණතුංග ශාක අභිජනන අංශය, තේ පර්යේෂණායතනය) ආචාර්ය තිස්ස අමරකෝන් (කැලණිය විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා දෙපාර්තමේන්තුව), (ආචාර්ය එම්. ටී.කේ. ගුණසේකර, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යංශය). ඉන්දියාවේ ප්‍රධාන අන්වේෂක වනුයේ ආචාර්ය රාම් කුමාර් ශර්මා, ප්‍රධාන පර්යේෂක, හිමාලයේ ජෛව සම්පත් තාක්ෂණික ආයතනය, ඉන්දියාව (CSIR)

**තේ හරිත පත්‍රවල ජෛව රසායනික පරාමිතීන් භාවිතයෙන් තේවල ගුණාත්මක භාවය පුරෝකථනය සඳහා NIR වර්ණාවලිය යොදා ගැනීම**

**අරමුදල් ප්‍රදානය කල ආයතනය: එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාලය (UNU), ජපානය**

ආචාර්ය එම්.ඒ.බී. රණතුංග "තේ හරිත පත්‍රවල ජෛව රසායනික පරාමිතීන් භාවිතයෙන් තේවල ගුණාත්මක භාවය පුරෝකථනය සඳහා NIR වර්ණාවලිය යොදා ගැනීම" පිළිබඳ පර්යේෂණ කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාලය කිරින් පර්යේෂණ අධි ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2017 සිට 2019 දක්වා (ජපන් යෙන් මිලියන 1 ක් /ආසන්න වශයෙන් රු. මිලියන 1.5 ක මුදලක්) ලබා දී ඇත.

**විශේෂ ව්‍යාපෘති**

**නව තේ ප්‍රභේදයන්ගේ ගුණාත්මක රෝපණ ද්‍රව්‍යය ගුණනය සහ වැඩි දියුණු කළ බීජ ව්‍යාප්ත කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම**

**අරමුදල් ප්‍රදානය කල ආයතනය: වැවිලි කර්මාන්ත අමාත්‍යංශය**

නව තේ ප්‍රභේදයන්ගේ ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය වල ගුණනය සහ වැඩිදියුණු කළ බීජ ව්‍යාප්ත කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යංශය මගින් 2017 සිට 2021 කාලය දක්වා මිලියන 86.5 ක් ලබා දෙන ලදී.

**අධ්‍යයන හා පුහුණු වැඩසටහන්**

එම්.ඒ.බී. රණතුංග මහතා විද්‍යාව පිලිබඳ පශ්චාත් උපාධි ආයතනයේ (PGIS) පශ්චාත් උපාධි පාඨමාලාව හදාරා අවසන් කරන ලදී.

එම්.ඒ.බී. රණතුංග මහතා විසින් එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාලයේ ජාතික ආහාර පර්යේෂණ ආයතනය 2016 අප්‍රේල් මස සිට 2017 අප්‍රේල් දක්වා කිරින් පර්යේෂණ අධි ශිෂ්‍යත්ව වැඩසටහන අවසන් කරන ලදී.

ජේ.එච්.එන්. පියසුන්දර මහතා කෘෂිකර්මය පිලිබඳ පශ්චාත් උපාධි ආයතනයේ (PGIA) පශ්චාත් උපාධි පාඨමාලාව හදාරමින් සිටී.

ජේ.එච්.එන්.පියසුන්දර මහතා චීනයේ යුනාන් ප්‍රාන්තයේ කුම්ං නගරයේ පිහිටි කෘෂිකාර්මික විද්‍යාත පිළිබඳ ඇකඩමිය (TRI, YAAS) විසින් සංවිධානය කරන ලද හා දකුණු ආසියා රටවල් සඳහා තේ වගා කිරීම සහ සැකසුම් තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුවක් සඳහා සහභාගී විය.

ජේ.එච්.එන්.පියසුන්දර මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ පර්යේෂණ ක්‍රමවේදය සහ විද්‍යාත්මක ලේඛණ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා ඇත.

ජේ. ඩී. කොට්ටව ආරච්චි මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාව පිලිබඳ පශ්චාත් උපාධි ආයතනය (PGIS) විසින් සංවිධානය කරන ලද "කාල ශ්‍රේණි විශ්ලේෂණය" පිළිබඳ වැඩමුළුවකට සහභාගි විය.

සී.ජේ. රැටියලගේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය මගින් පැවැත්වූ "ජෛව තාක්ෂණ මූලධර්ම" පිළිබඳ අධ්‍යාපන වැඩසටහනකට සහභාගී විය.

ඩී එස් ජයලත් ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය සංවිධානය කරන ලද "ශාක අභිජනන තාක්ෂණය පිළිබඳ කෙටි පාඨමාලාව" හදාරන ලදී.

**ප්‍රකාශන**

Punyasiri P.A.N., Jeganathan B., Kottawa-Arachchi J.D., Ranatunga M.A.B., Abeysinghe I.S.B., Gunasekare M.T.K. and Bandara B.M.R. (2017). Genotypic variation in biochemical compounds of the Sri Lankan tea (*Camellia sinensis* L.) accessions and their relationships to quality and biotic stresses. *The Journal of Horticultural Science and Biotechnology* 92(5): 502-512

Ranatunga, M.A.B., Kottawa-Arachchi, J.D., Gunasekare, M.T.K. and Yakandawala, D. 2017. Floral diversity and genetic structure of tea germplasm of Sri Lanka. *International Journal of Biodiversity*. Volume 2017, Article ID 2957297, 11 pages

Piyasundara, J.H.N., Wickramasinghe, I.P.,Gunesekara, M.T.K., Wijeratne, M.A. Perera, S.A.C.N. , Ranathunga , M.A.B. and Mudalige, A.K. (2017). Reproductive Phenology of Tea (*Camellia sinensis* L.) Cultivars in Sri Lanka. Accepted to be published in Tropical Agriculture Research (PGIA) in October, 2017.

Kottawa-Arachchi, J.D., Dilrukshi, S., Piyasena, M., Ranatunga, M.A.B. 2017. Floral characterization of exotic tea (*Camellia sinensis* L.) germplasm in Sri Lanka. *Proceedings of the International Symposium on Agriculture and Environment 2017, University of Ruhuna, Sri Lanka*. 43-45

Kottawa-Arachchi, J.D., Ranatunga, M.A.B., Ranaweera K.K. 2016. Estate cultivars-potential sources for pest and disease tolerance: An update of current estate cultivar selection program. *Tea Bulletin* 25:1-7

Piyasundara, J.H.N., Gunasekara, M.T.K., Ranatunga, M.A.B., Mudalige, A.K., Wijeratne, M.A., Wickramasinghe, I.P. 2016. Why concerted efforts are necessary for proper management of tea seed gardens? An update. *Tea Bulletin* 25:21-28

Damayanthi, M.M.N., Ranaweera, K.K., Kottawa-Arachchi, J.D., Ranatunga, M.A.B. 2017. Screening of new tea (*Camellia sinensis* L.) accessions for drought tolerance in Uva region of Sri Lanka. *Proceedings of the first International Symposium on Agriculture- 2017. Eastern University of Sri Lanka*. 1-10

Wickramarathna, S.D.C.K., Ranaweera, K.K., Ranathunga, M.A.B., Weerasinghe, P. A. 2017. Optimization of liquid and solid media composition for somatic embryogenesis of tea, *Proceedings of Research Symposium, University of Rajarata, 2017: 64p.*

Sukirtharuban, S., Ranaweera, K.K., Ranathunga, M.A.B., Thirukkumaran, G. 2017. The Preliminary Investigation of Somatic Embryo Induction from Stem Cuttings through Direct Somatic Embryogenesis in Tea (*Camellia sinensis* (L.) O. Kuntze) Cultivar TRI 2024. *Proceedings of 3rd International Conference on dry zone agriculture University of Jaffna, 2017: 82p.*

**විශේෂ ඉදිරිපත් කිරීම් සහ දේශන**

ජේ. ඩී. කොට්ටව ආරච්චි මහතා විසින් "ශ්‍රී ලාංකීය තේ ජාන ප්ලාස්මයේ විදේශීය තේ ප්‍රභේද පුෂ්පීය චරිතායනය කිරීම (*Camellia sinensis* L.), යන මැයෙන් කෘෂිකර්ම හා පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේදී දේශනයක් ඉදිරිපත් කරන ලදී.

ජේ. එච්.එන්. පියසුන්දර ශ්‍රී ලාංකීය තේ ප්‍රභේදයන්හි ප්‍රජනක රූපාණු විද්‍යාව (*Camellia sinensis* L.). යන මැයෙන් මහනුවර පැවති කෘෂිකර්මය පිලිබඳ පශ්චාත් උපාධි ආයතනයේ (PGIA) වාර්ෂික සම්මේලනයේදී ඉදිරිපත් කිරීමක් කරන ලදී.

එම්.ඒ.බී.රණතුංග මහතා 36 වන පර්යේෂණ සහ ව්‍යාප්ති සමුළුවේදී, පහතරට වැවිලිකරුවන්ගේ සංගමයේ හා ප්‍රාදේශීය තාක්ෂණික ව්‍යාප්ති සැසියෙහි දී (RTEF) ඉදිරිපත් කිරීම් 3 ක් කරන ලදී.

**වෙනත් ක්‍රියාකාරකම්**

තේ, රබර්,පොල් වෙළඳ ප්‍රදර්ශනය සඳහා ශාක අභිජනන අංශයේ සියලු නිළධාරීන් සහභාගී විය (CRT Trade Fire - 2017).

ඒ කේ මුදලිගේ මහතා යටියන්තොට හා රිච්මන්ඩ් විද්‍යාලයේ පැවැති තේ ප්‍රදර්ශනය සඳහා සහභාගි වූ අතර 2017 ජූලි සහ සැප්තැම්බර් මාසවල දී පහත රට තේ පඳුරු දුර්වල වීම පිලිබඳ සමීක්ෂණයටද සහභාගී විය. ජේ. එච්.එන්. පියසුන්දර මහතා තේ මණ්ඩලය මගින් නෙළුවේදී පවත්වන ලද ප්‍රදර්ශනයක් සඳහා සහභාගී විය.

එම්.ඒ.බී. රණතුංග මහතා භෝග වැඩි දියුණු කිරීම සහ ශෂ්‍ය විද්‍යාව පිලිබඳ ජාතික කමිටුව, ශ්‍රී ලංකාව කෘෂි කාර්මික ජෛව තාක්ෂණය පිළිබඳ ජාතික කමිටුව, ශ්‍රී ලංකාව, ජාන සම්පත් සහ එහි ප්‍රතිලාභ බෙදාගැනීමේ ජාතික විශේෂඥ කමිටුව, ශ්‍රී ලංකාව යන ජාතික කමිටුවල සාමාජිකයෙකු ලෙස සේවය කළේය.

උපාධිධාරී සිසුන් දෙදෙනෙකු සහ ඩිප්ලෝමා සිසුන් සිව්දෙනෙකු සිය පර්යේෂණ ව්‍යාපෘති සහ ආයතනික පුහුණුව ශාක අභිජනන අංශයේදී අවසන් කරන ලදී.

පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ විද්‍යාත්මක උපදේශන කමිටුව විසින් ඇගයීමට ලක් කරන ලද අතර ප්‍රගතිය උපදේශක පර්යේෂණ කමිටුවේදී සාකච්ඡාවට ලක් කෙරිණි.

## ශාක ව්‍යාධිවේදී අංශය

**සම්මාන / ප්‍රදාන**
එන් එච් එල් ප්‍රදීපා එම් නිරංජන් සහ ජී ඩී සින්නයියා යන අය ඔවුන්ගේ පර්යේෂණ සඳහා දැක්වූ දායකත්වය වෙනුවෙන් 2017 ජනවාරි මස 27 වන දින අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමන් අතින් ස්වර්ණ සම්මාන ලබා ගන්නා ලදී.

එන් එච් එල් ප්‍රදීපා මහත්මිය තේ පර්යේෂණායතනය සඳහා ඇයගේ වසර 18 ක සේවා කාලය වෙනුවෙන් රජත සම්මානයකින් පිදුම් ලබන ලදී.

එන් එච් එල් ප්‍රදීපා මහත්මිය වෙත විද්‍යාත්මක ප්‍රකාශන සඳහා NRC මගින් කුසලතා සම්මානයක් හිමි විය.

**අධ්‍යයන හා පුහුණු වැඩසටහන්**
ජී. ඩී. සින්නයියා මහත්මිය පර්යේෂණ සය මාසික පුහුණුවක් සඳහා ඉන්දියාව බලා පිටත් විය.

එම්. නිරංජන් මහතා පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම පිණිස දකුණු කොරියාව බලා පිටත් විය.

එම්. නිරංජන් මහතා “මූලික අණුක විද්‍යාව සහ ජෛව තාක්ෂණ විද්‍යාව” සහතික පත්‍ර පාඨමාලාවකට 2017 මාර්තු මසදී සහභාගි විය.

රුහුණු විශ්ව විද්‍යාලයේ අවසන් වසර සිසුවියක් වන ඩී එම් එම් එස් දිසානායක මෙනෙවිය ඇයගේ අවසන් වසර ව්‍යාපෘතිය සාර්ථකව නිම කරන ලදී. එච්. කේ. එස්. නිරෝෂන් මහතා සහ පී. ජී. ටී. ධර්මප්‍රිය මහතා (හාර්ඩි ආයතනය- අම්පාර) ඔවුන්ගේ සය මාසික අධ්‍යයන පුහුණුව සාර්ථකව නිම කරන ලදී.

**ප්‍රකාශන**
Sinniah, G.D., Munasinghe, C.E., Mahadevan, N. Jayasinghe, S.K and Kulatunga, DCM (2017) Recent incidence of collar canker and dieback of tea (*Camellia sinensis*) caused by *Fusarium solani* species complex in Sri Lanka. Australasian Plant Dis. Notes (2017) 12: 41. https://doi.org/10.1007/s13314-017-0262-5

**විශේෂ ඉදිරිපත් කිරීම් සහ දේශන**
එන්. එච්. එල්. ප්‍රදීපා මහත්මිය විසින් 37 වන සිංහල පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදය සඳහා “තේ වගාවේ අශ්ව කෙඳි අංගමාරය පාලනය” යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

එන්. එච්. එල්. ප්‍රදීපා මහත්මිය විසින් රත්නපුර සහ කළුතර දී “පහත රට තේ වගාවේ සමෝධානික රෝග පාලනය” යන මැයෙන් ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

ඩී. ජී. එන්. කරුණාජීව මහත්මිය විසින් 37 වන සිංහල පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදය සඳහා “තේ වගාවේ බුබුළු අංගමාරය පාලනය සඳහා විකල්ප දිලීර නාශක” යන මැයෙන් ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

## ශාක කායික විද්‍යා අංශය

**සම්මාන / ප්‍රදාන**
අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තේ පර්යේෂණ ආයතනයට පැමිණීම වෙනුවෙන් පැවති උත්සවයේ දී තේ පර්යේෂණායතනයේ අඛණ්ඩ සේවා කාලය වෙනුවෙන් වී. සිධාකරන් ප්ලැටිනම් සම්මානයක් ද ඩී. එම්. එස්. නවරත්න රන් සම්මානයක් ද ටී. එල්. විජේරත්න සහ එම්. එම්. එන්. දමයන්ති ලෝකඩ සම්මානද ලබා ගන්නා ලදී. මෙහි දී ටී. එල් විජේරත්න සහ ඩී. එම්. එස්. නවරත්න විසින් විශේෂ පර්යේෂණ සම්මාන ද ලබා ගන්නා ලදී.

ටී. එල් විජේරත්න ඩබ්. ඒ .ජේ .එම්. ඩී. කොස්තා සහ එම්. ඒ. විජේරත්න විසින් රචිත ශ්‍රී ලංකාවේ තේ වගාවන්ගේ කාබන් තිර කිරීම සහ දේශගුණික විපර්යාස හමුවේ එහි ඇතිවිය හැකි වෙනස්කම් පිළිබඳ පර්යේෂණ පත්‍රිකාව සඳහා කාර්යය ඇගයීමේ ලිපියක් ශ්‍රී ලංකා පර්යේෂණ සහ ප්‍රතිපත්ති සභාව විසින් ලබාදෙන ලදී.

**අධ්‍යයන හා පුහුණු වැඩසටහන්**

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ සහ ප්‍රතිපත්ති සභාව මගින් සංවිධානය කල දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීම පිළිබඳව දැනට පවතින පර්යේෂණයන්ගේ තත්වය සහ අනාගතයේදී ඒ සඳහා පර්යේෂණයන් සිදු කළ යුතු ආකාරය පිළිබඳව වැඩමුළුවට ටී. එල්. විජේරත්න සහභාගී විය. ඇය හරිතාගාර වායු ලේඛන පිළියෙල කිරීම පිළිබඳ වැඩමුළුවකට ද සහභාගී විය.

ටී. එල්. විජේරත්න සහ ඩී. එම්. එස්. නවරත්න ප්‍රභාසංස්ලේෂණ මානය නිවැරදිව භාවිතා කිරීම පිළිබඳව කෙටි පුහුණුවක් පෙබරවාරි මස 5 සිට 11 දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ දී ලබා ගන්නා ලදී.

එස් පී එස් එස් පැකේජය භාවිතයෙන් සංඛ්‍යාත්මක දත්ත විශ්ලේෂණය කිරීම පිළිබඳ මූලික සහතික පත්‍ර පාඨමාලාවක් හැදෑරීම ඒ. ඩී. අයි. යූ. ජයවර්ධන විසින් ආරම්භ කරන ලදී.

වී. පී. ආර්. පී. වී. පතිරණ සංඛ්‍යාත්මක දත්ත විශ්ලේෂණය කිරීම පිළිබඳ එක්දින වැඩමුලුවකට සහභාගී විය.

එක් පශ්චාත් උපාධි අපේක්ෂිකාවක් සහ එක් උපාධි අපේක්ෂිකාවක් මෙම අංශය යටතේ පුහුණු කටයුතු අවසන් කරන ලදී. තවත් එක් උපාධි අපේක්ෂිකාවක් තමන්ගේ පර්යේෂණයේ දත්ත ලබාගැනීම මෙම අංශයේදී අවසන් කරන ලදී.

**ප්‍රකාශන**

Wijeratne, T.L. (2017). Assessing and reducing the environmental impact of tea cultivation. In. V. S. Sharma and M. T. K. Gunasekera (Eds.). Global Tea Science: Current Status and Future Needs. Swaston, Cambridge, Burleigh Dodds Science Publishing Limited, UK. (*in press*).

Damayanthi, M.M.N., Ranaweera, K.K., KottawaArachchi J.D. and Ranatunga, M.A.B.(2017). Screening of new tea (*Camellia sinensis*) accessions for drought tolerance in Uva region of Sri Lanka. In the Proceedings of the 1st International Symposium in Agriculture 2017 (ISA 2017) held in Faculty of Agriculture, Eastern University of Sri Lanka on 5th Ocober 2017:1-10.

Hewawasam, H. W. M. L., Wijeratne, T. L., Pathirana, V. P. R. P. V. and Warnasooriya, W. M. R. S. K. (2017). Effect of Potassium on drought stress mitigation in Tea. In the Proceedings of the 9th Annual Research Symposium 2017 "Sustainable Agriculture for Food Security and Poverty Alleviation" held in Rajarata University of Sri Lanka, Puliyankulama on 21st September 2017. pp. 54.

Wijeratne, T.L. and Bandara G. C. K. (2017). Determination of soil respiration in a high grown and a low grown tea growing environments of Sri Lanka. In the Proceedings of the 6th Symposium on Young Scientists Forum, held in University of Peradeniya, Sri Lanka on 20th January 2017.

**වෙනත් ක්‍රියාකාරකම්**

අංශයට පැමිණි වයඹ, පේරාදෙණිය, රජරට සහ සබරගමුව විශ්ව විද්‍යාලවල සිසු සිසුවියන්, ශ්‍රී ලංකා වතු හිමියන්ගේ සංගමයේ සාමාජිකයින්, ලක් පොහොර ආයතනයේ නිෂ්පාදන කළමණාකරු, උඩපුස්සැල්ලාව සහ හපුගස්තැන්න වතු සමාගම්වල සහකාර කළමණාකරුවන් සඳහා ශාක කායික විද්‍යාත්මක පර්යේෂණයන් පිළිබඳව මූලික අවබෝධයක් ලබා දෙන ලදී. මීට අමතරව චීන, ඉරාන, ජර්මන් සහ යුරෝපීය විදේශීය නියෝජිතයන් වෙත අංශයේ කාර්යය භාරය පිළිබඳව විස්තර කර දෙන ලදී.

කප්පාදුවට පෙර සිදු කල යුතු මුල්වල පිශ්ඨ පරීක්ෂණ තිස් හයක් සිදුකරන ලද අතර, ඒ අනුව කප්පාදු කිරීම සඳහා තේ ගස සුදුසු තත්වයක පවතී ද යන්න පිළිබඳව උපදෙස් අදාල වතු සඳහා ලබා දෙන ලදී.

ටී. එල්. විජේරත්න පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදයේ කැඳවුම්කරු සහ ලේකම් ලෙස කටයුතු කරන ලදී.

## තේ සැකසුම් තාක්ෂණ අංශය

**සම්මාන/ප්‍රදාන**

**අධ්‍යයන හා පුහුණු වැඩ සටහන්**

ඩබ්.එම්.එස්.වීරවර්ධන මහත්මිය - පේරාදෙණිය කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ දර්ශනපති උපාධිය හදාරමින් සිටී.

**විශේෂ ඉදිරිපත් කිරීම් සහ දේශන**

කේ. රවීන්ද්‍රන් මහතා විසින් 2017 ජනවාරි 27 වෙනි දින පැවති 233 වැනි පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදයට තේ නිෂ්පාදන යන්ත්‍ර සඳහා ඉහළ කාර්යක්ෂමතාවයකින් යුතු මෝටර් භාවිතා කිරීමේ බලපෑම පිලිබඳව සිදුකල අධ්‍යයනයේ තොරතුරු ඉදිරිපත් කරන ලදී.

එස්. කෝනේශ්වරමූර්ති මහතා විසින් 2017 ජනවාරි 27 වෙනි දින පැවති 233 වැනි පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදයට ඇඹරුම් යන්ත්‍ර සහ රොටවේන යන්ත්‍ර නිපදවීමට භාවිතා කරන තඹ මිශ්‍ර ලෝහ වාත්තු උපාංග පිලිබඳව වූ සිය අධ්‍යයනයේ සොයා ගැනීම් ඉදිරිපත් කරන ලදී.

එල්. ජයසිංහ මහතා විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට අලුතින් බඳවා ගත් තේ පරීක්ෂකවරුන් සඳහා තේ නිෂ්පාදනය පිලිබඳ දේශන පවත්වන ලදී.

**වෙනත් ක්‍රියාකාරකම්**

එම්. ඒ. චමින්ද්‍ර මහතා අන්තර්ජාතික ප්‍රමිති සංවිධානයේ රැස්වීමකට එක්සත් රාජධානිය බලා පිටත් විය.

එම්. ඒ. චමින්ද්‍ර මහතා විසින් නව විතානකන්ද, හැඩිගල්ල, ගංගානී, නායපාන යන තේ කර්මාන්ත ශාලා සඳහා විද්‍යාත්මක තේ නිෂ්පාදනය පිලිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබිය.

එම්. ඒ. චමින්ද්‍ර මහතා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශේෂ උපදේශාත්මක කමිටුවේ සාමාජිකයකු ලෙස ඔහුගේ සේවාව ලබා දේ.

එම්.ඒ. චමින්ද්‍ර මහතා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සහ ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ තේ නිෂ්පාදනය පිලිබඳව දේශන පවත්වන ලදී.

2017 තේ, පොල්, රබර් (CRT Exhibition) ප්‍රදර්ශණයට තාක්ෂණ අංශයේ නිලධාරීන් සහභාගී වු අතර ඒ සඳහා ස්වයං අවහිරතා මග හරවන තේ හලන යන්ත්‍රය, තරල පත්ල වියලන පාලන පද්ධතිය සහ තව් මැරීමේ දෝණිකා පාලන පද්ධතිය ඉදිරිපත් කරන ලදී.

තාක්ෂණ අංශයේ නිලධාරීන් විසින් තේ කර්මාන්තශාලා වලට තේ නිෂ්පාදනය ආශ්‍රිත විවිධ උපදේශණයන් උදෙසා නිරීක්ෂණයන් 64 ක් සිදු කරන ලදී.

## පාංශු හා ශාක පෝෂණ අංශය

**අධ්‍යයන හා පුහුණු වැඩසටහන්**

ජී. එල්. කේ. තෙන්නකෝන් මිය සිය ආචාර්ය උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධනයට පේරාදෙණිය විශ්ව විද්‍යාලය මගින් ආචාර්ය උපාධිය පිරිනමන ලදී.

එල්.ආර්.එම්.සී. ලියනගේ මහතා සිය දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධනයට පේරාදෙණිය විශ්ව විද්‍යාලය මගින් දර්ශනපති උපාධිය පිරිනමන ලදී.

එස්. රාගුරාජ් සහ ආර්. කේ. අමාලි මෙනෙවිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ, සංඛ්‍යාන විද්‍යා සහ පරිගණක විද්‍යා දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ සංඛ්‍යාන විද්‍යාත්මක වැඩමුළුවට 2017 දෙසැම්බර් 22 වැනි දින සහභාගි විය.

ඩබ්ලිව්. එම්. එස්. විජයතුංග මහතා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් මෙහෙය වන ලද "කාබනික ගොවිතැන පිලිබඳ පර්යේෂණ" මැයෙන් පවත්වන ලද වැඩමුළුවට 2017 සැප්තැම්බර් 15 වැනි දින සහභාගි විය.

ජී. එල්. කේ. තෙන්නකෝන් මිය, වයඹ විශ්ව විද්‍යාලයේ, කෘෂිකර්ම සහ වැවිලි කළමණාකරණ පීඨය මගින් සංවිධානය කරන ලද "ජෛව පොහොර සහ ජෛව පළිබෝධනාශක" මැයෙන් පවත්වන ලද වැඩමුළුවට 2017 නොවැම්බර් 29 - 30 සහභාගි විය.

ඕ. පී. කේ. ඒ. ගුණරත්න මහතා කාර්මික තාක්ෂණ ආයතනය මගින් සංවිධානය කරන ලද "අධි තාක්ෂණික විද්‍යාත්මක උපකරණ" මැයෙන් පවත්වන ලද වැඩමුළුවට 2017 මැයි 18 - 19 සහභාගි විය.

ඕ. පී. කේ. ඒ. ගුණරත්න මහතා චීනයේ ෂැන්ෂු විද්‍යායතනය මගින් සංවිධානය කරන ලද දියුණු වෙමින් පවතින රටවල් සඳහා තේ ආහාර නිෂ්පාදන තාක්ෂණය යන මැයෙන් පවත්වන ලද වැඩමුළුවට 2017 සැප්තැම්බර් 28 සිට නොවැම්බර් 11 දක්වා සහභාගි විය.

ඩබ්ලිව්. එම්. එස්. විජයතුංග මහතා චීනයේ යුනාන් කෘෂිකර්ම විද්‍යායතනය මගින් සංවිධානය කරන ලද තේ වගාව සහ නිෂ්පාදන තාක්ෂණය මැයෙන් පවත්වන ලද වැඩමුළුවට 2017 ඔක්තෝබර් 22 සිට නොවැම්බර් 10 දක්වා සහභාගි විය.

**ප්‍රකාශන**

P.L.K Tennakoon, "Identification and evaluation of Plant Growth Promoting Rhizobacteria associated with tea (*Camellia sinensis* (L.) O. Kuntze) and formulation of biofertilizers" Ph.D Thesis, University of Peradeniya

L.R.M. C. Liyanage "Investigations on poor fertility of tea growing soils of the low-country wet zone with special reference to nutrient dynamics" M. Phil Thesis, University of Peradeniya

**විශේෂ ඉදිරිපත් කිරීම් සහ දේශන**

ආචාර්ය පී. පී. ගුණරත්න මහතා "පස ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම" යන මැයෙන් දේශනයක් තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමයේ නිලධාරීන් සඳහා 2017 අගෝස්තු 17 වැනි දින අතුකෝරාළ තේ කර්මාන්තශාලාවේදී පවත්වන ලද අතර කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ තේ පරීක්ෂක මහතුන් සඳහා "තේ වගාවේ පොහොර භාවිතය" යන මැයෙන් පුහුණු වැඩමුළුවක් 2017 සැප්තැම්බර් 19 සහ 25 දිනවල පවත්වන ලදී.

ආචාර්ය පී. පී. ගුණරත්න මහතා "ඒකාබද්ධ පෝෂක පාලනය" යන මැයෙන් දේශනයක් ඌව ප්‍රාදේශීය තාක්ෂණික සංසදය සඳහා 2017 දෙසැම්බර් මස 24 දින පස්සර දී පවත්වන ලදී.

ඩබ්ලිව්. එම්. එස්. විජයතුංග මහතා "පසෙහි සාරත්වය සහ පොහොර යෙදීම" යන මැයෙන් පුහුණු වැඩමුළුවක් අලුතෙන් බඳවා ගත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ තේ පරීක්ෂක මහතුන් සඳහා හන්තාන රත්නසිරි වික්‍රමනායක මධ්‍යස්ථානයේදී, 2017 මාර්තු 24 දින සහ 2017 සැප්තැම්බර් 15 දින පවත්වන ලදී.

ඩබ්ලිව්. එම්. එස්. විජයතුංග මහතා "කොම්පෝස්ට් සහ කාබනික පොහොර යෙදීම" යන මැයෙන් දේශනයක් තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමයේ නිලධාරීන් සඳහා 2017 අප්‍රියෙල් 17 වැනි දින අතුකෝරාළ තේ කර්මාන්තශාලාවේදී සහ පුස්සැල්ලාව වැවිලි සමාගමේ සෝගම වතුයායේ නිලධාරීන් සඳහා 2017 සැප්තැම්බර් 14 දින පවත්වන ලදී.

ඩබ්ලිව්. එම්. එස්. විජයතුංග මහතා. "තේ වගාවේදී පාංශු පෝෂක කළමනාකරණය" යන මැයෙන් දේශනයක් සී.අයි.සී. පොහොර සමාගමේ නිලධාරීන් සඳහා 2017 දෙසැම්බර් 28 වැනි දින වාරියපොලදී පවත්වන ලදී.

එස්. රගුරාජ් මහතා "තේ වගාවේ සෙමින් පෝෂක නිකුත් කරන පොහොර භාවිතයට ඇති විභවය" යන මැයෙන් දේශනයක් රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය විද්‍යාත්මක සමුළුව සඳහා රත්නපුරයේදී 2017 නොවැම්බර් මස 16 දින පවත්වන ලදී.

ආචාර්ය ජී. එල්. කේ. තෙන්නකෝන් මිය ශාක වර්ධක ප්‍රවර්ධන බැක්ටීරියා අඩංගු ජෛව පොහොර තේ වගාවේ භාවිතා කිරීමට ඇති විභවය පිළිබඳ දේශනයක් 232 වැනි පර්යේෂණ සහ ව්‍යාප්ති සංසදයට 2017 ජූලි 29

ඉදිරිපත් කරන ලදී. ඇය බැක්ටීරියා ආමුකුලන මගින් රොක් පොස්පේට් පොහොරවල පොස්පරස් භාවිත කාර්යක්ෂමතාවය වැඩිකිරීම පිළිබඳ දේශනයක් 2017 අගෝස්තු 26 දින ශ්‍රී ලංකා පාංශු විද්‍යා සංගමය සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨයේ දි පවත්වන ලදී.

**වෙනත් ක්‍රියාකාරකම්**

විශ්ව විද්‍යාල සිසුන් සහ කෘෂිකර්ම ඩිප්ලෝමා සිසුන් 5 දෙනෙකු ඔවුන්ගේ අධ්‍යයන පුහුණුව සාර්ථකව නිම කරන ලදී.

# ශාන්ත කුම්බිස් වත්ත - තලවාකැලේ

**එම්.එම්.එල් ජයතිලක**
**වතු අධිකාරි, ශාන්ත කුම්බිස් වත්ත**

**(විද්‍යාවේදී- කළමනාකරණ, සබරගමුව, ශ්‍රී ලංකාව)**
**(විද්‍යාපති - වැවිලි බෝග කළමනාකරණ, පේරාදෙණිය, ශ්‍රී ලංකාව)**

| | නම | තනතුර |
|---|---|---|
| කාර්යාලය | ආර්.ඒ.ඩී.කැළුම් | ප්‍රධාන ලිපිකරු |
| | එම්. පී.ඩී.දිල්රුක්ෂි | ජ්‍යේෂ්ඨ සහකාර ලිපිකරු |
| | කේ.රාජ්කුමාර් | කණිෂ්ඨ සහකාර ලිපිකරු |
| | ජී.පී.රූපසිංහ | කණිෂ්ඨ සහකාර ලිපිකරු |
| | එන්.ඩබ්ලිව්.එච්.ජී.හරුණි පමල්කා | කණිෂ්ඨ සහකාර ලිපිකරු |
| | ආර්. ක්‍රිෂාන්කුමාර් | ගබඩා භාරකරු/ ලිපිකරු |
| ක්ෂේත්‍රය | එන්.ඉලන්ගේෂ්වරන් | ක්ෂේත්‍ර නිලධාරි |
| | එස්.සුරේෂ් | ක්ෂේත්‍ර නිලධාරි |
| | එස්.එල්. රොද්‍රිගෝ | ක්ෂේත්‍ර නිලධාරි |
| | එස්.ඩී.පෙරේරා | සහකාර ක්ෂේත්‍ර නිළධාරි |
| | පී.භක්තිකුමාර් | කණිෂ්ඨ සහකාර ක්ෂේත්‍ර නිළධාරි |
| | ආර්.සත්‍යරාජ් | කණිෂ්ඨ සහකාර ක්ෂේත්‍ර නිලධාරි |
| කර්මාන්ත ශාලාව | කේ.ඩබ්ලිව්.ටී.යූ.එස්. ද සිල්වා | කර්මාන්තශාලා නිලධාරි |
| | එස්.එම්.සුනිල් ශාන්ත | ජ්‍යේෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරි |
| | පී.මොහොට්ටි | සහකාර කර්මාන්තශාලා නිලධාරි |
| | එම්.සරත්කුමාර් | කණිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරි |
| | එස්.සිවම් | කර්මාන්තශාලා යන්ත්‍රශිල්පි |
| | පී.එන්.එල්.කුමාර | කණිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරි |
| රියදුරන් | එස්.ක්‍රිස්ටෝපර් | රියදුරු |
| | ටි.රාමනාදන් | රියදුරු |
| | ආර්.උදයකුමාර් | රියදුරු |
| | ඩී.සුන්දරේසන් | රියදුරු |
| සෞඛ්‍යය | එස්.එෆ්.ජයසිංහ | වතු වෛද්‍ය සහායක |
| | ඩී.පුන්‍යමූර්ති | සුභසාධක නිලධාරි |
| | පී.එන්.සිල්වෙස්ටර් | ළමා උයන් පාලිකා |
| | කේ.ජෝති | ළමා උයන් පාලිකා |
| | ටි.පොන්මනි | ළමා උයන් පාලිකා |




## කාර්යය මණ්ඩලයේ වෙනස්වීම්

- 2017.05.02 දින සිට එන්.ඩබ්ලිව්.එච්.ඒ.හරුණි පමල්කා මෙනෙවිය කණිෂ්ඨ සහකාර ලිපිකරු ලෙස පත්කරන ලදී.
- 2015 වර්ෂයේ ජූලි මස සිට ඊ.එම්. දයාරත්න මහතාගේ සේවය අත්හිටවූ අතර ඔහුට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වාගෙන යනු ලබයි.
- කර්මාන්තශාලා සහකාර නිලධාරී පී.නිශාන්තන් මහතා 2017.09.01 දින සිට සේවයෙන් ඉවත් විය.
- 2017.05.02 දින සිට කේ.ඩබ්ලිව්.ටී.යූ.එස්. ද සිල්වා මහතා ප්‍රධාන කර්මාන්තශාලා නිලධාරී ලෙස පත්කරන ලදී.
- 2017.05.02 දින සිට එස්.එල්. රොද්‍රිගෝ මහතා ක්ෂේත්‍ර නිලධාරී තනතුරට පත් කරන ලදී.
- කේ.සෙල්වරාජ් මහතා රියදුරු 2017.03.13 වන දින සිට සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

## පොදු කරුණු

- මෙතෙක් ශාන්ත කූම්බ්ස් වතුයායෙහි භාරකරුවන් ලෙස කටයුතු කල ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස් පුද්ගලික සමාගම, මෙම වසරෙහිද ශාන්ත කූම්බ්ස් නිම් තේ කොළඹ වෙන්දේසියේ විකිණීමට කටයුතු කරන ලදී.
- ශාන්ත කූම්බ්ස් වතුයායේ නිරීක්ෂක නියෝජිත වන සෙනරත් පහත්කුඹුර මහතා 2017.01.03 දින වතුයාය නිරීක්ෂණය කරන ලදී.

## වත්තේ භූමි පරිහරණය පිළිබඳ විස්තර (හෙක්ටයාර)

| | ශාන්ත කූම්බ්ස් | ලැම්ලියර් | එකතුව |
|---|---|---|---|
| බීජ තේ | 1.10 | 1.00 | 2.10 |
| රිකිලි තේ | 93.55 | 47.82 | 141.37 |
| වතුයායේ තේ වගාකර ඇති මුළු හෙක්ටයාර ප්‍රමාණය | 94.65 | 48.82 | 143.47 |
| ADB ව්‍යාපෘතිය | 4.90 | 1.30 | 6.20 |
| තේ.ප.ආ. පර්යේෂණ සඳහා | 2.50 | | 2.50 |
| තේ තවාන | 1.20 | 0.10 | 1.30 |
| මුළු තේ වගාව | 103.25 | 50.22 | 153.47 |
| නිවාස | 2.09 | | 2.09 |
| ගොඩනැගිලි/පාරවල් | 34.28 | 14.70 | 48.98 |
| කානු/අතහැර ඇති ඉඩම් | 32.16 | 1.0 | 33.16 |
| මුළු බිම් ප්‍රමාණය | 171.78 | 65.92 | 237.70 |

## ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්

2017 වර්ෂයේ පහත දැක්වෙන ක්ෂේත්‍ර වල තේ කප්පාදුව සිදුකරන ලදී.

| කොටස | ක්ෂේත්‍ර අංකය | හෙක්ටයාර ප්‍රමාණය |
|---|---|---|
| ඉහළ | 1B , 4 | 9.70 |
| පහළ | 10 , 13D | 6.42 |
| ලැම්ලියර් | 8A, 10 | 11.60 |

- තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශ අනුව ඇස්තමේන්තු කරන ලද හෙක්ටයාර ප්‍රමාණය නිම කරන ලදී
- තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශ අනුව පොහොර යෙදීම සිදු කරන ලදී.

## ආසියානු සංවර්ධන බැංකු මව්ශාක වගා ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශිත TRI 3000 සහ 4000 ශ්‍රේණිවල රිකිලි තේ අතු 198,391 ක් කුඩා තේ වතු හිමියන් වෙත හා වැවිලි සමාගම් වෙත නිකුත් කරන ලදී.

## අස්වැන්න පිළිබඳ විස්තර

| | 2017 | | 2016 | |
|---|---|---|---|---|
| | **නිමි තේ** | **හෙක්. 1ට කි.ග්‍රෑ** | **නිමි තේ** | **හෙක්.1 ට කි.ග්‍රෑ** |
| ශාන්ත කුම්බිස් | 174,038 | 1848 | 169,852 | 1,937 |
| ලැම්ලියර් | 78,585 | 1623 | 82,005 | 1,740 |
| **එකතුව** | 252,623 | 1771 | 251,857 | 1,869 |
| මිලදී ගත් තේ දළු | 122,271 | - | 106,895 | - |
| මිලදී ගත් තේ දළු (Out Grower) | - | - | - | - |
| **මුළු එකතුව** | **374,893** | **1771** | **358,752** | **1,869** |

ඉහත දක්වා ඇති වගුවට අනුව 2017 වර්ෂයේ අස්වැන්න හෙක්ටයාරයකට නිමි තේ කිලෝ 1,771ක් ලෙස වාර්තා විය.

## තේ කර්මාන්ත ශාලාව හා නිෂ්පාදනය

2017 වසර සඳහා ශාන්ත කුම්බිස් දළ විකුණුම් සාමාන්‍යය රු.680.19 ක් වූ අතර එය බටහිර උස්බිම් වැවිලි කාණ්ඩය යටතේ පිහිටීම අනුව විකුණුම් සාමාන්‍යයට වඩා රු. 58.13ක වර්ධනයකි.

## කාළගුණ තත්වය

2017 වර්ෂයේ  වර්ෂාපතනය මි.මි. 1669.23 සහ දින 167ක් ලෙස වාර්තා විය.

## කාරක ආදායම

ශාන්ත කුම්බිස් වතුයාය  2017 වර්ෂය සඳහා රු.27,443,121.76 ක ශුද්ධ ලාභයක් ලබා ගන්නා ලදී.

# ශාන්ත ජෝකිම් වත්ත - රත්නපුර

## වතු අධිකාරි - ඩී.සී.සී ජයසේකර මහතා

| | නම | තනතුර |
|---|---|---|
| කාර්යාලය | එන්. කෝරළගේ | ප්‍රධාන ලිපිකාරිණි |
| | කේ. එම් .පී .එල් . එල්. ඩයස් | කණිෂ්ඨ සහකාර ලිපිකාරිණි |
| | ඩබ්.කේ. ප්‍රසානිකා | කණිෂ්ඨ සහකාර ලිපිකාරිණි |
| කර්මාන්ත ශාලාව | එස් . කේ එදිරිසිංහ | ප්‍රධාන කර්මාන්තශාලා නිලධාරි |
| | ඒ.පී.ඩී. එච්. කුමාර | ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරි |
| | ජේ. ආර්. යාපා | සහකාර කර්මාන්තශලා නිලධාරි |
| | ඩී.ඒ. ජේ. පුෂ්ප කුමාර | සහකාර කර්මාන්තශලා නිලධාරි |
| | පී.පී. වික්‍රමරත්න | සහකාර කර්මාන්තශලා නිලධාරි |
| | ඩබ්.එන්. ඩබ්. පෙරේරා | කණිෂ්ඨ සහකාර කර්මාන්ත ශාලා නිලධාරි |
| ක්ෂේත්‍රය | වී. අරියරාජ් | කණිෂ්ඨ සහකාර ක්‍ෂෙත්‍ර නිලධාරි |
| | ජේ. සේනාධීර | සහකාර ක්‍ෂෙත්‍ර නිලධාරි |
| ගබඩා අංශය | එම්.ඩබ්. ජයසේකර | ගබඩා භාරකරු/ලිපිකරු |
| ප්‍රවාහන අංශය | එම්.ඒ.ජේ. කුමාර | ලොරි රියදුරු |
| | ජේ.එච්.එස්.එන්. ජයමහ | රියදුරු |
| | ඩබ්.පී.ඩී. අමරසිංහ | රියදුරු |
| | ඒ.එම්.ඒ.එච්. දර්ශන | රියදුරු |
| | ඩබ්.පී.සී පෙරේරා | රියදුරු |
| | ඩී.වී.ඩී. ජගත් | රියදුරු |



**සාමාන්‍ය සටහන්**

ෆෝබ්ස් සහ වෝකර් තැරැව්කාර වෙළඳ සමාගම විසින් ශාන්ත ජෝකිම් තේ වෙළඳ වෙන්දේසි කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යනු ලබයි.

බාහිර පරීක්ෂක නිමල් එම්. අමරසේකර මහතා 2017.07.14 වන දින ශාන්ත ජෝකිම් වත්තේ නිරීක්ෂණ චාරිකාවක නිරත වන ලද අතර තේ ක්ෂේත්‍ර පරීක්ෂා කරන ලදී.

**නිලධාරී මණ්ඩලයේ වෙනස්වීම්**

- අනුරාධ නානායක්කාර මහතා 2016.12.15 දින සිට 2017.02.22 දක්වා වතු අධිකාරී තනතුරෙහි වැඩ ආවරණය කරන ලද අතර 2017.02.22 වන දින සිට ඩී.සී.සී ජයසේකර මහතා නව වතු අධිකාරී ලෙස පත්කරන ලදී.
- ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකාරිණී පී.වී.එස්.සී ගුණරත්න මහත්මිය 2017 ජූලි මස සේවයෙන් ඉල්ලා අස්වන ලදී. 2017.08.01 වන දින සිට කණිෂ්ඨ සහකාර ලිපිකාරිනී ලාංකිකා ඩයස් මහත්මිය ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකරු තනතුරෙහි වැඩ ආවරණය කරනු ලබයි.
- කණිෂ්ඨ සහකාර කර්මාන්ත ශාලා නිලධාරී රෝහණ ප්‍රේමලාල් මහතා 2017.08.08 වන දින සිට සේවයෙන් ඉල්ලා අස් විය.

**සමාජ සුභ සාධන ක්‍රියාකාරකම්**

- ඩෙංගු මර්ධනය උදෙසා අවට ප්‍රදේශයේ පිරිසිදු කිරීමේ ශ්‍රමදාන ව්‍යාපෘතියක් පවත්වන ලදී.
- ශාන්ත ජෝකිම් නිලධාරී මණ්ඩලයට හා සේවක මණ්ඩලයට වාර්ෂික විනෝද චාරිකාව සඳහා කතරගම ප්‍රදේශය නැරඹීමට අවස්ථාව සලසා දෙන ලදී.
- කාන්තා හිංසනය සහ ලිංගික අපචාර වැළැක්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2017 නොවැම්බර් මාසයේ පවත්වන ලදී.

| 2017 දෙසැම්බර් 31 දිනට භූමි ප්‍රමාණය (හෙක්ටයාර්) | භූමි ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|
| රිකිලි තේ වගා භූමි ප්‍රමාණය | 50.65 |
| නොමේරූ තේ වගාව | 7.50 |
| පොල් වගා බිම් (තේ.ප.ආ) | 3.89 |
| වාණිජ පැළ තවාන් බිම් | 1.58 |
| නොමේරූ රබර් වගාව | 3.20 |
| පරිණත රබර් වගා බිම් | 5.12 |
| පරිණත රබර් වගා බිම් (මිශ්‍ර වගාව) | 3.68 |
| කුඹුරු | 8.74 |
| මව් ශාක ව්‍යාපෘති ක්ෂේත්‍ර බිම් | 13.01 |
| ක්ෂේත්‍ර අංක 6 - මැණික් ඉඩම් වෙන්දේසිය සඳහා | 2.00 |
| යෝජිත නිවාස ව්‍යාපෘතිය ක්ෂේත්‍ර අංක 5 | 1.00 |
| ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ගොඩනැගිලි හා පරීක්ෂණ ක්ෂේත්‍ර සහිත බිම් | 12.02 |
| ගොඩනැගිලි මං මාවත් ලඳු කැළෑ සහ පතන | 29.59 |
| එකතුව | 141.98 |

**2015 ඔක්තෝබර් මාසය තුල කරන ලද තේ පැල ගණනයට අනුව ඵලදායී තේ වගාවන් සහිත භූමි ප්‍රමාණය (හෙක්ටයාර්)**

| | |
|---|---|
| රිකිලි තේ වගා භූමි ප්‍රමාණය | 11.14 |
| තේ නෙලීම් කටයුතු සඳහා නිදහස් කරන ලද මව් ශාක ව්‍යාපෘති ක්ෂේත්‍ර බිම් | 8.88 |
| ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයට අයත් ක්ෂේත්‍ර | 6.06 |
| මුළු ඵලදායී තේ වගා භූමි ප්‍රමාණය | **26.08** |

**එලදාව හා අස්වැන්න (නිමි තේ කිලෝ ප්‍රමාණය)**
**පසුගිය වසරට සාපේක්ෂව 2017 වර්ෂයේ නිමි තේ නිෂ්පාදනය හා එලදාව**

| වර්ෂය | ශාන්ත ජෝකිම් තේ වගාවෙන් | මිලදී ගන්නා ලද දළු වලින් |
|---|---|---|
| 2017 | 20,053.00 | 239,935.00 |
| 2016 | 23,059.00 | 179,242.00 |
| වෙනස | -3,006.00 | + 60,693.00 |

වසරෙන් වසර එලදායී තේ වගාවන් ප්‍රමාණයේ අඩුවීම හේතුවෙන් දිගින් දිගටම වතුයායේ තේ අස්වැන්න අඩු වී ඇත. පසුගිය වසරට සාපේක්ෂව කුඩා තේ වතුහිමියන් හා තේ දළු වෙළඳුන් විසින් කර්මාන්ත ශාලාව වෙත සපයන ලද දළු ප්‍රමාණයේ කිලෝ 60,693 ක වැඩිවීමක් දක්නට ලැබුණි.

**රබර් වගාව**

| වර්ෂය | අස්වැන්න (කිලෝ) | හෙක්ටයාර් 1ක අස්වැන්න |
|---|---|---|
| 2016 | - | - |
| 2017 | 9,280 | 1,055 |

**තේ වගා කෘෂිකාර්මික ක්‍රියාකාරකම්**
වතුයාය තුල සාමාන්‍ය කෘෂිකාර්මික කටයුතු සිදුකරනු ලදී.

**ශාන්ත ජෝකිම් පැල තවාන**
2017 වර්ෂය තුල ආයතනයේ තවාන් කරන ලද පැල 52,790 ක් විකුණන ලදී.

**ආසියානු සංවර්ධන මව් ශාක ව්‍යාපෘති වැඩසටහන**
කුඩා තේ වතු හිමියන් හා වැවිලි සමාගම් සඳහා රිකිලි තේ අතු 22,450 නිකුත් කර ඇත.

**කර්මාන්ත ශාලාවේ නඩත්තු කටයුතු**
2017 වර්ෂය තුලදී තේ කර්මාන්ත ශාලාවේ පහත සඳහන් සංවර්ධන කටයුතු සිදුකරන ලදී.

- සී සී සී තේ වියලන යන්ත්‍රයෙහි උෂ්මකයෙහි අලුත් වැඩියාව සිදුකරන ලදී.
- වර්ණ විභේදක යන්ත්‍රය සඳහා තේ වාහක පටිය සවිකරන ලදී.
- කර්මාන්ත ශාලවෙහි ට්‍රොලි අලුත් වැඩියාව සඳහා රෝද මිලදී ගන්නා ලදී.
- ජල සම්පීඩක යන්ත්‍රය සඳහා සම්පීඩක නලයක් මිලදී ගන්නා ලදී.
- රෝල අංක 5,3,9 අලුත් වැඩියාව සිදුකරන ලදී.
- තේ දළු ඇඹරුම් යන්ත්‍ර අංක 1, 2, 8 සහ 7 හි මේස නැවත සවි කිරීම සිදුකරන ලදී.

**කර්මාන්තශාලාවේ නිෂ්පාදන ශුද්ධ මිල ගණන්**
2016 වර්ෂයේදී 483/23 ක් වූ තේ කිලෝවක ශුද්ධ අලෙවි මිල 2017 වර්ෂයේදී 623/10 විය.

**සමස්ත තේ නිෂ්පාදනය**
2016 වර්ෂයට සාපේක්ෂව නිමි තේ නිෂ්පාදනය 2017 වර්ෂය තුළ කිලෝ ග්‍රෑම් 57,687 ක ප්‍රමාණයකින් වර්ධනය වී ඇත.

**කාළගුණය හා වර්ෂාපතනය.**
2017 වර්ෂය තුළ වර්ෂාපතනය මි.මි. 4738.20 ලෙස වාර්තා වූ අතර, දින 174 ක් වැසි සහිත දින ලෙස වාර්තා විය. 2016 වර්ෂයේ වර්ෂාපතනය 3019.90 මි.මි. ලෙස සටහන්ව ඇති අතර වැසි සහිත දින 141ක් ලෙස සටහන්ව ඇත.

**වෙළඳ ප්‍රතිඵල**
වසර 10 කට පසු ශාන්ත ජෝකිම් වත්ත සහ තේ කර්මාන්ත ශාලාව රුපියල් 10,283,396.46 ක ලාභයක් වාර්තා කරන ලදී. 2016 වර්ෂයේ දෙසැම්බර් මස 31 දින වන විට රු 6,934,853/- ක අලාභයක් සටහන් වී තිබුණි.

### විශේෂ කඩඉම්

**මානව සම්පත් සංවර්ධනය සහ කාර්යය මණ්ඩලය සවිබල ගැන්වීම**
**සේවක බලගැන්වීම් හා අභිප්‍රේරණය**

### සේවක බඳවා ගැනීම්

| නම | තනතුර | පත්වීම් ලද දිනය |
|---|---|---|
| ඩී එස් ජයලත් | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 02.05.2017 |
| බී එම් පී කේ ගොඩවිට | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 02.05.2017 |
| එම් පී පී සී එස් ලීලාරත්න | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 02.05.2017 |
| ඩබ් එන් කේ එම් ධනවර්ධන | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 02.05.2017 |
| ටී ඩී සී හසන්ති | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 02.05.2017 |
| අයි එච් ටී චතුරංග | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 02.05.2017 |
| ඒ ඩී අයි යූ ජයවර්ධන | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 02.05.2017 |
| එච් කේ ආර් මනෝරි | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 02.05.2017 |
| ඒ ශිවාප්‍රියදර්ශිනි | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 02.05.2017 |
| ඒ ඒ බී අබයරත්න | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 02.05.2017 |
| ජේ බාලසුබ්‍රමනියම් | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 02.05.2017 |
| පී එච් ආර් කේ විමලසිරි | ඉංජිනේරු සහකාර (විදුලි) | 02.05.2017 |
| එස් ටී එම් එස් එන් තෙන්නකෝන් | තාක්ෂණික නිලධාරී (සිවිල්) | 02.05.2017 |
| ආර් එම් ඩී කේ රාජපක්ෂ | කළමණාකරණ සහකාර (පරිගණක දත්ත) | 02.05.2017 |
| අයි පී එන් ඩී බණ්ඩාර | කළමණාකරණ සහකාර (පරිගණක දත්ත) | 02.05.2017 |
| කේ ඒ ඩී එස් කුමාරතුංග | රියදුරු | 02.05.2017 |
| ඒ පී පී ඒ අන්වාරම | රියදුරු | 02.05.2017 |
| සී පී කරුණානායක | රියදුරු | 02.05.2017 |
| ඩී රත්නකුමාර් | රියදුරු | 02.05.2017 |
| එච් එන් ඩී ඒ පෙරේරා | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | 02.05.2017 |
| කේ පී එන් පී පියසේන | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | 02.05.2017 |
| ටී ඒ එස් අනුරුද්ධ | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | 08.05.2017 |
| එස් කේ වීරතුංග | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 02.10.2017 |
| ඩී ඩී එන් අමේන්ද්‍ර | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 16.10.2017 |
| අයි එස් යාපා බණ්ඩාර | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 01.11.2017 |
| ජේ ඒ පී එස් ජයසිංහ | කළමණාකරණ සහකාර (අයකැමි) | 04.12.2017 |
| එම් පී කරුණාරත්න | දුරකථන ක්‍රියාකරු / පිළිගැනීමේ නිලධාරී | 04.12.2017 |

### සේවයෙන් ඉල්ලා අස්වීම්

| නම | තනතුර | ඉල්ලා අස්වූ දිනය |
|---|---|---|
| ජේ ඒ වයි ආර් ජයකොඩි | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 10.03.2017 |
| එස් එන් ටී ප්‍රනාන්දු | ඉංජිනේරු සහකාර (කාර්මික) | 07.04.2017 |
| කේ එම් මෙවන් | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී | 16.06.2017 |
| එන් එම් පියසේන | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 07.07.2017 |
| කේ පී රණසිංහ | අභ්‍යන්තර විගණක | 16.07.2017 |
| එච් ඒ ඩී නෙරංජන් | රියදුරු | 24.07.2017 |

| | | |
|---|---|---|
| ඩබ් එච් ඩී යූ පුෂ්පකුමාරි | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 31.08.2017 |
| එම් පී එම් ජේ කුමාර | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 07.09.2017 |
| ඩී ඩී පී එස් ජයසිංහ | කළමනාකරණ සහකාර | 09.09.2017 |
| වී පී රණවකගේ | ප්‍රකාශන / ප්‍රචාරණ නිලධාරී | 26.09.2017 |
| ටී ඩී සී හසන්ති | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 04.10.2017 |
| එච් එන් දයානන්ද | ව්‍යාප්ති නිලධාරී | 02.11.2017 |
| කේ පල්ලවි | තාක්ෂණ නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) | 10.11.2017 |

**විශ්‍රාම ගැනීම්**

| **නම** | **තනතුර** | **විශ්‍රාම ලත් දිනය** |
|---|---|---|
| ඩී එල් ජේ වීරසූරිය | කාර්මික | 11.01.2017 |
| එස් ධර්මලිංගම් | කළමනාකරණ සහකාර (ලිපිකරු) | 17.01.2017 |
| ඩබ් සී කේ ප්‍රනාන්දු | ප්‍රධාන ජලනල කාර්මික | 23.01.2017 |
| ජේ ඇන්තනී | පොදු සේවක | 01.02.2017 |
| එච් බී තල්ගහගොඩ | ගිණුම් ලිපිකරු / අයකැමි | 05.04.2017 |
| පී ඒ එස් ගුණසේකර | ගිණුම් ලිපිකරු | 18.06.2017 |
| එච් එස් එන් පීරිස් | අත්හදා බැලීමේ නිලධාරී | 26.07.2017 |
| ඒ නන්දසිරි | තාක්ෂණික නිලධාරී (කාර්මික) | 07.10.2017 |
| පී පී අමරතුංග | රියදුරු | 24.11.2017 |
| පී ටී පෙරේරා | ලිපිකරු / යතුරු ලේඛක | 03.12.2017 |

**උසස්වීම්**

| **නම** | **තනතුර** | **පත්වීම් ලද දිනය** |
|---|---|---|
| කේ පී ජේ පී මහින්දපාල | ජ්‍යේෂ්ඨ උපදෙස් නිලධාරී | 02.05.2017 |
| ටී එල් විජේරත්න | ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිලධාරී | 02.05.2017 |
| ජී බී ජයවර්ධන | අභ්‍යන්තර විගණක | 11.12.2017 |

**විදේශ පුහුණු / සම්මන්ත්‍රණ/සාකච්ඡා**

- 2017 පෙබරවාරි මස 05 වන දින සිට පෙබරවාරි මස 11 වන දින දක්වා ඇමරිකා එක්සත් ජනපදයෙහි පැවැත්වූ **"නව ප්‍රභාසංස්ලේෂණ මීටරය ක්‍රියාකරවීමේ පුහුණුව"** සඳහා ශාක කායික විද්‍යා අංශයේ ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිලධාරී ආචාර්ය ටී එල් විජේරත්න සහ පර්යේෂණ නිලධාරී ඩී එම් එස් නවරත්න යන මහත්මීන් සහභාගි වූහ.
- 2017 පෙබරවාරි මස 3 වන දින සිට මාර්තු මස 3 වන දින දක්වා ඉන්දියාවේ පැවැත්වූ **"ජෛව වෛද්‍ය විද්‍යාත්මක සහ කෘෂිකාර්මික පර්යේෂණ සඳහා අණුක ජෛව විද්‍යා තාක්ෂණයන් යොදා ගැනීමේ පුහුණු වැඩ සටහන"** සඳහා ජෛව රසායන අංශයේ පර්යේෂණ නිලධාරී එස් ඒ ඩී පී එස් ජයවර්ධන මෙනෙවිය සහභාගි විය.
- 2017 මාර්තු මස 26 වන දින සිට අප්‍රේල් මස 1 වන දින දක්වා ජපානයේ **"මූල්‍ය සහ ආර්ථික හුවමාරු සංගමය සංවිධානය කරන ලද තේ කර්මාන්තශාලා/ හන්තාන පුහුණු මධ්‍යස්ථානයේ නවීකරණයන් පිළිබඳ අධ්‍යයන චාරිකාව"** සඳහා පිරිසැකසුම් තාක්ෂණ අංශයේ ජ්‍යේෂ්ඨ පර්යේෂණ නිලධාරී කේ රවීන්ද්‍රන් මහතා සහභාගි විය.
- 2017 මැයි මස 11-12 දෙදින තුල කෙන්යාවේ පවත්වන ලද **"තුන්වන අප්‍රිකානු තේ සම්මේලනය හා ප්‍රදර්ශනය"** සඳහා තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති වෛද්‍ය එම් එම් ජේ පී ගවරම්මාන සහ ශාන්ත කුම්බිස් වතු අධිකාරී එම් එම් එල් ජයතිලක යන මහත්වරුන් සහභාගි වූහ.

- ජෛව රසායන අංශයේ තාක්ෂණ නිලධාරී ඊ එන් යූ එදිරිසිංහ මහතා 2017 මැයි මස 8 වන දින සිට ජූනි 29 දින දක්වා චීනයේදී පැවැත්වූ **"සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහාවූ අපවිත්‍රකරණයෙන් තොරවූ තේ නිෂ්පාදන තාක්ෂණික ක්‍රියාවලින් සම්බන්ධ සම්මන්ත්‍රණය 2017"** යන වැඩමුළුවට සහභාගි විය.
- 2017 අගෝස්තු මස 1 වන දින සිට අගෝස්තු මස 4 වන දින දක්වා සිංගප්පූරුවේ පැවැත්වූ **"HPLC තාක්ෂණයේ භාවිතය යන වැඩමුළුව"** සඳහා ජෛව රසායන අංශයේ පර්යේෂණ නිලධාරී එම් එස් සී ප්‍රනාන්දු සහ තාක්ෂණ නිලධාරී ඊ එන් යූ එදිරිසිංහ යන මහත්ම මහත්මීන් සහභාගි වූහ.
- 2017 අගෝස්තු මස 5 වන දින සිට නොවැම්බර් මස 30 දින දක්වා **"ඕස්ට්‍රේලියාවේ මර්ඩොච් විශ්ව විද්‍යාලයේ, රජයේ කෘෂිකාර්මික ජෛව රසායන මධ්‍යස්ථානයේ පැවැත්වූ විදේශීය අධ්‍යයන පුහුණු සැසිය"** සඳහා කීට විද්‍යා සහ වටපණුවේදී අංශයේ පර්යේෂණ නිලධාරී පී ජී ඩී එස් අමරසේන මහත්මිය සහභාගි විය.
- 2017 අගෝස්තු මස 26 දින සිට (2020 අගෝස්තු 26 දක්වා) ශාක ව්‍යාධිවේදී අංශයේ පර්යේෂණ නිලධාරී එම් නිරංජන් මහතා තම **"පශ්චාත් උපාධි අධ්‍යයන වැඩ සටහන"** කොරියාවේදී ආරම්භ කරන ලදී.
- 2017 සැප්තැම්බර් 28 සිට නොවැම්බර් 11 දක්වා චීනයේ පවත්වන ලද **"සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා තේ ආහාර නිෂ්පාදන තාක්ෂණය 2017"** සම්මන්ත්‍රණයට ශෂ්‍ය විද්‍යා අංශයේ අත්හදා බැලීමේ නිලධාරී එම් ජී එස් ලියනගේ, පාංශු සහ ශාක පෝෂක අංශයේ අත්හදා බැලීමේ නිලධාරී ඕ ජී කේ ඒ ගුණරත්න සහ ජෛව රසායන අංශයේ තාක්ෂණ නිලධාරී එන් සී වීරකෝන් යන මහත්ම මහත්මීන් සහභාගී වූහ.
- 2017 ඔක්තෝම්බර් මස 18 දින සිට 20 දින දක්වා ඉන්දුනීසියාවේ පවත්වන ලද **"ලෝක වැවිලි සම්මේලනය සහ ප්‍රදර්ශනය 2017"** සඳහා තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති වෛද්‍ය එම් එම් ජේ පී ගවරම්මාන සහ තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය අයි එස් බී අබේසිංහ යන මහත්වරුන් සහභාගී වූහ.
- 2017 ඔක්තෝම්බර් මස 16 වන දින සිට 19 දින දක්වා ජර්මනියේ පවත්වන ලද **"FT NIR උපකරණයේ භාවිතය සම්බන්ධ පුහුණු වැඩමුළුවක්"** සඳහා ජෛව රසායන අංශයේ පර්යේෂණ නිලධාරී එම් එස් සී ප්‍රනාන්දු මහත්මිය සහ පර්යේෂණ නිලධාරී එස් ඒ ඩී පී එස් ජයවර්ධන මෙනෙවිය සහභාගී වූහ.
- 2017 ඔක්තෝම්බර් මස 22 දින සිට නොවැම්බර් මස 10 වන දින දක්වා චීනයේ කෘෂිකර්ම විද්‍යාලයේ වුනෑන් ඇකඩමියේ පවත්වන ලද **"දකුණු සහ අග්නිදිග ආසියාතික රටවල් සඳහා තේ අස්වනු සහ තේ පිරිසැකසුම් තාක්ෂණය සම්බන්ධ අන්තර්ජාතික වැඩමුළුව"** සඳහා පාංශු හා ශාක පෝෂක අංශයේ පර්යේෂණ නිලධාරී එස් විජේතුංග සහ ශාක අභිජනන අංශයේ පර්යේෂණ නිලධාරී ජේ එච් එන් පියසුන්දර යන මහත්වරුන් සහභාගී වූහ.
- 2017 නොවැම්බර් මස 2 දින සිට 5 දින දක්වා ඉන්දියාවේ පවත්වන ලද **"STIHL පහසුකම සම්බන්ධ නිෂ්පාදන පුහුණු වැඩමුළුව"** සඳහා උපදෙස් හා ව්‍යාප්ති අංශයේ උපදෙස් නිලධාරී එස් පී රත්නායක සහ ශෂ්‍ය විද්‍යා අංශයේ පර්යේෂණ නිලධාරී එස් ආර් ඩබ් පතිරණගේ යන මහත්වරුන් සහභාගී වූහ.
- තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය අයි එස් බී අබේසිංහ මහතා 2017 නොවැම්බර් මස 6 දින සිට 9 වන දින දක්වා **"පාකිස්ථානයේ කරච්චි නුවර අණුක වෛද්‍ය සහ ඖෂධ පර්යේෂණ විශ්ව විද්‍යාලයේ අන්තර්ජාතික සම්මන්ත්‍රණය සහ පුහුණු පාඨමාලාව"** සඳහා සහභාගි වෙමින් දේශනයක් පවත්වන ලදී.
- 2017 දෙසැම්බර් මස 2 දින සිට 6 දින දක්වා මැලේසියාවේ පවත්වන ලද **"අන්තර්ජාතික නායකත්ව පුහුණු වැඩ සටහන"** සඳහා ගණකාධිකාරී එම් වී මෝහන් පරිපාලන නිලධාරී එම් බස්නාගොඩ සහ ව්‍යාප්ති නිලධාරී එච් ජයවීර යන මහත්වරුන් සහභාගී වූහ.
- තේ පර්යේෂණ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය එල් එස් කේ හෙට්ටිආරච්චි මහතා 2017 දෙසැම්බර් මස 10 දින සිට 16 දින දක්වා තායිලන්තයේ පවත්වන ලද **"ව්‍යවසාය ව්‍යාපෘති සහ සංවිධාන කළමනාකරණය සම්බන්ධ අන්තර්ජාතික පුහුණු සැසිය"** සඳහා සහභාගි වූහ.
- තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය අයි එස් බී අබේසිංහ සහ පිරිසැකසුම් තාක්ෂණ අංශයේ පර්යේෂණ නිලධාරී එම් ඒ චමින්ද යන මහත්වරුන් 2017 දෙසැම්බර් මස 13 දින සිට 15 දින දක්වා එක්සත් රාජධානියේ පවත්වන ලද **"අන්තර්ජාතික ප්‍රමිතිකරණය සඳහා වූ සංවිධානයේ 26 වන සැසිවාරයට"** සහභාගි වූහ.

- 2017 දෙසැම්බර් මස 26 දින සිට 29 දින දක්වා රුසියාවේ පවත්වන ලද **"රුසියාව සඳහා ශ්‍රී ලංකා තේ නියෝජනය සම්බන්ධ සැසිය"** සඳහා තේ පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (නිෂ්පාදන) ආචාර්ය කේ එම් මොහොට්ටි මහතා සහභාගි විය.

## යටිතල පහසුකම් සංවර්ධනය හා නඩත්තුව

### යටිතල පහසුකම් සංවර්ධනය

### නඩත්තු කටයුතු

2017 වසරේදී ඉංජිනේරු අංශය විසින් නඩත්තු කාර්යයන් 298ක් සිදු කරන ලදී. වාර්ෂික තීන්ත ආලේප කිරීම් යටතේ, A මාදිලියේ නිල නිවාස දෙකක්ද, B මාදිලියේ එක් නිල නිවාසයක්ද, C මාදිලියේ නිල නිවාස 16 ක්ද, D මාදිලියේ නිල නිවාස 11 ක්ද, E මාදිලියේ එක් නිල නිවාසයක්ද, කණිෂ්ඨ කාර්යය මණ්ඩල කාන්තා නේවාසිකාගාරයේ කාමර අංක 3 ක්ද, තීන්ත ආලේප කිරීම සහ ඒ හා සම්බන්ධ නඩත්තු කටයුතුද නිම කරන ලදී. ශාක ව්‍යාධිවේදී අංශයේ කොටස් බෙදා වෙන්කිරීම සහ ටයිල් කිරීම, මුර කුටිය නැවත ගොඩනැංවීම, දෙනියාය ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ප්‍රධාන කානු පද්ධතිය සකස් කිරීම, හන්තාන මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ මුර කුටිය සහ ඇතුල්වීමේ දොරටුව ගොඩනැගීමද නිම කරන ලදී. ගාල්ල ව්‍යාප්ති මධ්‍යස්ථානයේ D මාදිලියේ නිල නිවාසයන්හි සිවිලින්වල අලුත්වැඩියාවන් හා කළුතර ව්‍යාප්ති මධ්‍යස්ථානයේ සිවිලින්වල අලුත්වැඩියාවන් සහ බෙදා වෙන් කිරීම්ද සිදු කරන ලදී.

පාංශු හා ශාක පෝෂක අංශයේ ටයිල් කිරීම, ශාක අභිජනන අංශයේ වැසිකිලි දෙකක පිළිසකර කිරීම, සභාපති කාර්යාලය ඇලුමිනියම් සම්බන්ධක මගින් බෙදා වෙන් කිරීම්ද, ගාල්ල ව්‍යාප්ති මධ්‍යස්ථානයේ පිටත හා ඇතුලත තීන්ත ආලේප කිරීම සහ ඒ හා සම්බන්ධ නඩත්තු කටයුතු සිදු කිරීම, කැමිලියා නේවාසිකාගාරයේ නාන කාමර 15ක පිළිසකර කිරීම්ද තේ පර්යේෂණ ආයතන බංගලා සහ නිල නිවාසයන්හි වහලවල් පින්තාරු කිරීම සහ කානු පිළිසකර කිරීමද නිම කරන ලදී.

### ජල සම්පාදනය

2017 වසරේදී ජල සම්පාදන කාර්යයන් 209ක් සිදු කරන ලදී. ජල නල පද්ධතියේ නඩත්තු කටයුතු සිදුකරන ලදී. ජල පෙරනාගාරයේ ප්‍රධාන ටැංකි සහ පවිත්‍ර ජලය ගබඩා කරන ටැංකි, අවසාදන ටැංකි කාලානුරූපව පිරිසිදු කරන ලදී. 15hp ධාරිතාවයකින් යුත් නව ජල පොම්පයක්ද මිලදී ගන්නා ලදී.

### විදුලි අංශය

2017 වර්ෂ තුළ විදුලි අංශයේ කාර්යයන් 252 ක් සිදුකරන ලදී. ඒ අනුව කාර්යය මණ්ඩල නිවාස 95 ක් (A මාදිලියේ නිල නිවාස 18, B මාදිලියේ නිල නිවාස 16, C මාදිලියේ නිල නිවාස 43 හා D මාදිලියේ නිල නිවාස 18), ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩල නේවාසිකාගාර, කණිෂ්ඨ කාර්යය මණ්ඩල කාන්තා නේවාසිකාගාර සහ කණිෂ්ඨ කාර්යය මණ්ඩල කැමිලියා නේවාසිකාගාරය, සංචාරක බංගලා, මෝටර් ගරාජය, යාන්ත්‍රික වැඩපල, කර්මාන්ත ශාලාව සහ ආයතනයේ ආරක්ෂක පද්ධතිය සඳහා නඩත්තු කටයුතු සිදු කිරීම ශාක ව්‍යාධිවේදී අංශය, ශාක අභිජනන අංශය, සභාපති කාර්යාලය සහ ජෛව රසායන අංශය සඳහා නව රැහැන් පද්ධතියක් ස්ථාපනය කිරීම, හන්තාන මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය සහ වලහන්දුව පාංශු හා ශාක පෝෂක විද්‍යාගාරය සඳහා තෙකලා නව විදුලි රැහැන් පද්ධතීන් සවි කිරීමත් සිදු කරන ලදී.

### දුරකථන හුවමාරුව

නව දුරකතන සම්බන්ධතා කාර්යාලවලට සහ නිල නිවාස සඳහා ලබා දෙන ලදී. PABX දුරකතන පද්ධතියේ නඩත්තු සහ දෛනික විසන්ධිවීම්, කටයුතු වලට අදාල කාර්ය පත්‍රිකා 105 ක් සිදුකරන ලදී. ආයතනය සඳහා බහුවිද සේවා සම්ප්‍රවේශ පද්ධතියක් ස්ථාපනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. නව අඛණ්ඩ විදුලි සැපයුම් පද්ධතීන් සඳහා මෙට්‍රොපොලිටන් ආයතනය මගින් සැපයුම් සහ අළුත්වැඩියාවන් සිදු කරන ලද අතර NEC SV 800 අභ්‍යන්තර දුරකථන ජාල පද්ධතිය සහ එම පද්ධතියේ අලුත්වැඩියාවන් සඳහා මෙට්‍රොපොලිටන් ආයතනය මගින් සේවා ගිවිසුම තවදුරටත් දීර්ඝ කර ගන්නා ලදී.

### ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්

### දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන හා සුළු)

රසායනික ද්‍රව්‍ය, වීදුරු බඩු, යන්ත්‍ර, විද්‍යාගාර උපකරණ, තේ වගා කිරීම සඳහා කෘෂි අමුද්‍රව්‍ය, පොත් මුද්‍රණ, වාර සඟරා, යන්ත්‍ර, රසායනාගාර උපකරණ හා වාහන සඳහා අමතර කොටස්, කාර්යාල උපකරණ සහ ලිපි ද්‍රව්‍ය,

ඉන්ධන හා ලිහිසි තෙල්, ගොඩනැගිලි ද්‍රව්‍ය, ජල උපකරණ, විදුලි උපකරණ, පොහොර, සහ කර්මාන්තශාලාවට දර සැපයීම යනාදි දේශීය හා විදේශීය මිලදී ගැනීම් සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (සුළු) රැස්වීම් 23 ක් පවත්වන ලදී.

සූක්ෂම තරංග ඒකකයක් මිලදී ගැනීම ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථානයක් මිලදී ගැනීම N කෙල්ඩාල් ක්‍රමය සම්බන්ධ ඒකකයක් මිලදී ගැනීම පාවිච්චි කළ වාහන 4ක් විකිණීම ගොඩනැගිලිවට සහ වාහන සඳහා රක්ෂණ සේවා ලබා ගැනීම, ප්‍රධාන කාර්යාලයට සහ ප්‍රාදේශිය අතුරු මධ්‍යස්ථාන සඳහා ආරක්ෂක සේවා සැලසීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) රැස්වීම් 6 ක් පවත්වන ලදී.

## ප්‍රවාහන අංශය/මෝටර් ගරාජය

පර්යේෂණ හා සංවර්ධන කටයුතු සාර්ථක කර ගැනීම, සුහසාධන කටයුතු සඳහා අවශ්‍ය දෛනික, ලැයිස්තුගත හා සති අන්ත ප්‍රවාහන පහසුකම් සාර්ථකව සලසා දුන් අතර, වාහන සංචිතයේ සැලසුම්ගත අලුත්වැඩියාවන් හා සේවා කටයුතු සිදු කරන ලදී. එසේම වාහන සංචිතයේ එන්ජින් අලුත්වැඩියාවන් හා සේවා නඩත්තු කටයුතු, ටයර් සහ ටියුබ් ප්‍රතිස්ථාපනය කිරීම් ඇතුළු විවිධ අලුත්වැඩියාවන් සිදුකරන ලදී.

| | |
|---|---|
| සේවා කළ මුළු වාහන සංඛ්‍යාව | 42 |
| මුළු අළුත්වැඩියාවන් ගණන (ප්‍රධාන) | 07 |
| මුළු අළුත්වැඩියාවන් ගණන (සුළු) | 261 |

## භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය

භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් තේ පර්යේෂණ ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ සහ අනෙකුත් උප මධ්‍යස්ථානවල කරන ලද සමීක්ෂණයෙන් හඳුනාගත් භාවිතයෙන් ඉවත්කරන ලද සහ ප්‍රයෝජනයට ගත නොහැකි උපකරණ 2017 සැප්තැම්බර් මස 28 දින ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකුණන ලදී.

## මූල්‍ය කාර්යය සාධනය

**තේ පර්යේෂණ මණ්ඩලය**

**2017 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | ස්ලිප්සාස් 2017 රු. '000 | ස්ලිප්සාස් 2017 රු. '000 | ස්ලිප්සාස් 2016 |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ස්ථාවර වත්කම්** | | | | |
| මූල්‍ය සහ මූල්‍ය සමකයන් | 7 | | 41,592 | 62,593 |
| කෙටිකාලීන ආයෝජන | | | 71,086 | 67,174 |
| වෙළඳ සහ අනෙකුත් ණය ගැතියෝ | 8 | 101,521 | | 83,284 |
| අඩු කලා - අවිනිශ්චිත ලැබීම් සඳහා වෙන් කිරීම් | | 329 | | 150 |
| | | | 101,192 | 83,134 |
| | | | 213,870 | 212,901 |
| පරිලේඛන/තොග | 9 | 23,408 | | 52,150 |
| තැන්පත් හා පූර්ව ගෙවීම් | 10 | 3,598 | | 3,765 |
| අතිරික්තය හා හිඟය | 11 | 12 | | 7 |
| | | | 27,018 | 55,922 |
| **මුළු ජංගම වත්කම්** | | | 240,888 | 268,823 |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| කෙරෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු | 12 | | 8,382 | 17,157 |
| දේපළ පිරියත හා උපකරණ | 13 | 1,346,938 | | 1,238,200 |
| අඩු කලා - සමුච්චිත ක්ෂය | | 820,100 | | 778,291 |
| | | | 526,838 | 459,909 |
| අස්පෘශ්‍ය වත්කම් | 14 | | 2,404 | 2,404 |
| | | | 529,242 | 462,313 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | | 537,624 | 479,470 |
| **මුළු වත්කම්** | | | **778,513** | **748,293** |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| ණය හිමියෝ | 15 | 18,397 | | 19,277 |
| උපචිත වියදම් | 16 | 23,704 | | 18,555 |
| කෙටි කාලීන ණය | 17 | 23,337 | | 49,636 |
| කෙටි කාලීන ප්‍රතිපාදන | 18 | 5,450 | | 7,084 |
| සේවක ප්‍රතිලාභ | 19 | 2,326 | | 2,651 |
| | | | 73,214 | 97,203 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| කෙරෙමින් පවතින ව්‍යාපෘති | 20 | 18,659 | | 2,907 |
| පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන් කිරීම් | 21 | 186,321 | | 174,477 |
| ඉන්ධන සඳහා තැන්පතු | 22 | 16 | | 20 |
| දිගු කාලීන ණය | 23 | 38,925 | | 29,474 |
| | | | 243,921 | 206,878 |

| | | | |
|---|---|---|---|
| **මුළු වගකීම්** | | 317,135 | 304,081 |
| **මුළු ශුද්ධ ආදායම්** | | **461,377** | **444,212** |
| **ශුද්ධ වත්කම් / හිමිකම්** | | | |
| ප්‍රදානයන් හා සංචිත | 24 | 307,949 | 284,950 |
| තේ පර්යේෂණ අරමුදල | | 153,428 | 159,262 |
| **මුළු ශුද්ධ වත්කම් / හිමිකම්** | | **461,377** | **444,212** |

………………..
**සභාපති - තේ පර්යේෂණ මණ්ඩලය**

………………..
**අධ්‍යක්ෂ - තේ පර්යේෂණ ආයතනය**

**සහතික කළේ :-**

**ගණකාධිකාරී**
**ජ්‍යේෂ්ඨ ගණකාධිකාරී වෙනුවට**

**තේ පර්යේෂණ මණ්ඩලය**

**2017 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | ස්ලිප්සාස් 2017 රු. '000 | ස්ලිප්සාස් 2016 රු. '000 |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| රාජ්‍ය ලැබීම් (පුනරාවර්තන) | 25 | 374,867 | 338,000 |
| වෙනත් ආදායම් | | 76,715 | 54,855 |
| විලම්භිත ආදායම් | 26 | 31,950 | 27,440 |
| | | **483,532** | **420,295** |
| එකතු කළා - වතුවලින් ලැබෙන ශුද්ධ ලාභය හෝ අලාභය | 27 | 38,106 | 5,859 |
| | | **521,638** | **426,153** |
| **වියදම්** | 28 | | |
| වැටුප් | | 324,923 | 262,471 |
| ගමන් වියදම් | | 8,027 | 8,457 |
| සැපයුම් හා පරිභෝජන | | 18,143 | 17,307 |
| අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු | | 26,035 | 25,388 |
| කොන්ත්‍රාත් සේවා, ප්‍රවාහන, උපයෝගීතා සේවාවන් | | 45,765 | 33,559 |
| විදුලි පාරිභෝජන | | 15,401 | 15,332 |
| සන්නිවේදන | | 4,581 | 3,713 |
| පර්යේෂණ හා සංවර්ධන | | 42,702 | 31,155 |
| ක්ෂයවීම් | | 37,425 | 31,542 |
| වෙනත් මෙහෙයුම් වියදම් | | 4,328 | 3,438 |
| මූල්‍ය පිරිවැය | | 388 | 390 |
| **මුළු මෙහෙයුම් පිරිවැය** | | **527,717** | **432,752** |
| ගැලපීම්වලට පෙර මුළු අතිරික්තය/ හිගය | | (6,080) | (6,599) |
| පූර්ව වාර්ෂික ගැලපුම් | | 248 | **226** |
| අදාල කාලය තුළ මුළු අතිරික්තය/හිගය | | (5,832) | **(6,373)** |

## තේ පර්යේෂණ මණ්ඩලය
## 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2017<br>රු. '000 | 2017<br>රු. '000 | 2016<br>රු. '000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ලැබීම්/ගලා යෑම්** | | | |
| වර්ෂයට අදාළ අතිරික්තය/ හිඟය | | (6,080.00) | (6,599.00) |
| **ගැලපීම්** | | | |
| පෙර වර්ෂයේ ගැලපීම් | 248 | | 225.00 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 26,516 | | 19,486.00 |
| ක්ෂය වීම් | 46,561 | | 37,131.00 |
| ආයෝජන මත පොළී ආදායම් | (5,469) | | (4,121.00) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය | (1,250) | | (5,196.00) |
| විලම්භිත ලාභ (පුනරාවර්තන හා ප්‍රාග්ධන) | (452,819) | | (394,154.00) |
| | | (386,213) | (346,629.00) |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් මුදල් ලැබීම් /මුදල් ගලා යෑම්** | | **(392,293)** | **(353,228.00)** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | | |
| තොග වැඩිවීම් /අඩු වීම් | 28,742 | | (25,183.00) |
| වානිජ හා වෙනත් ලැබීම්වල වැඩිවීම් /අඩු වීම් | (18,058) | | (15,932.00) |
| අතිරික්ත හා ඌණතාවයන්හි වැඩිවීම් /අඩු වීම් | (5) | | 69.00 |
| ණය හිමියන්ගේ හා අනෙකුත් ගෙවීම්වල වැඩිවීම් /අඩු වීම් | (880) | | 3,940.00 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු වැඩිවීම් /අඩු වීම් | (4) | | 1.00 |
| තැන්පතු හා පෙර ගෙවීම්වල වැඩිවීම් /අඩු වීම් | 167 | | 4,661.00 |
| උපචිත වියදම් වැඩිවීම් /අඩු වීම් | 5,148 | | (311.00) |
| කෙටිකාලීන ප්‍රතිපාදන වැඩිවීම් /අඩු වීම් | (1,634) | | (140.00) |
| සේවක ප්‍රතිලාභ වැඩිවීම්/ අඩු වීම් | (325) | | (438.00) |
| | | 13,151.00 | (33,333.00) |
| | | (379,142.00) | (386,561.00) |
| අඩු කළා - පාරිතෝෂික ගෙවීම් | (14,670) | | (10,726.00) |
| ලැබුණු පොලිය | 5,469 | | 4,121.00 |
| | | (9,201.00) | (6,605.00) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ලැබීම් / ගලා යෑම්** | | **(388,343.00)** | **(393,166.00)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ලැබීම් / ගලා යෑම්** | | | |
| ස්ථාවර වත්කම් විකුණුම් උත්පාදක | 1,250 | | 7,920 |
| ස්ථාවර වත්කම් බැහැර කිරීම | (2,285) | | (2,724) |
| ආයෝජන ක්‍රියාකාරකම්මත පොලිය | (3,912) | | (3,999) |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | (111,207) | | (57,107) |
| කෙරෙමින් පවතින ව්‍යාපෘතිවල අඩු වීම් | 8,775 | | (3,985) |
| කෙරෙමින් පවතින ව්‍යාපෘති වැඩිවීම් | 15,752 | | (3,502) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ලැබීම් / ගලා යෑම්** | | (91,627.00) | (63,397) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ලැබීම් / ගලා යෑම්** | | (479,970.00) | **(456,563)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ලැබීම් / ගලා යෑම්** | | | |

| | | | |
|---|---|---|---|
| භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන | 436,367 | | 455,108 |
| අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ප්‍රදාන | 39,451 | | 1,716 |
| ලද ණය | 37,000 | | 70,032 |
| පියවූ ණය | (53,925) | | (47,016) |
| තැරැව්කරුවන්ගෙන් ලද අත්තිකාරම් | 309,057 | | 228,656 |
| තැරැව්කරුවන්ගෙන් ලද අත්තිකාරම් ආපසු ගෙවීම් | (308,981) | | (212,786) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ලැබීම් / ගලා යෑම්** | | 458,969 | 495,710 |
| **මුදල් හා මුදල් සමාන අයිතමයන්ගේ ශුද්ධ අඩුවීම් / වැඩිවීම්** | | (21,001) | **39,147** |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන අයිතමයන්ගේ ශේෂය** | | **62,593** | **23,446** |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන අයිතමයන්ගේ ශේෂය** | | **41,592** | **62,593** |

**තේ පර්යේෂණ මණ්ඩලය**

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් ප්‍රකාශය**

| | **තේ පර්යේෂණ අරමුදල** | **ප්‍රත්‍යාගණ්‍ය සංචිත** | **ප්‍රදාන හා සංචිත** | **රු,'000 මුළු හිමිකම්** |
|---|---|---|---|---|
| 2017/01/01 දිනට ශේෂය | 159,261 | - | 284,950 | 444,211 |
| පූර්ව වාර්ෂික ගැලපුම් | 248 | - | - | 248 |
| ප්‍රදාන හා සංචිතයන්ට ලද ශේෂ | - | - | 475,818 | 475,818 |
| විලම්භිත ආදායම් වෙත මාරු කළ ශේෂ | - | - | (452,819) | (452,819) |
| වර්ෂය සඳහා අතිරික්තය / ඌණතාවය | (6,080) | - | - | (6,080) |
| 2017/12/31 දිනට ශේෂය | **153,429** | **-** | **307,949** | **461,378** |

*Schedule A*

## තේ පර්යේෂණ මණ්ඩලය

## ශාන්ත කුම්බිස් සහ ලැමිලියර් වතු සඳහා 2017 වර්ෂයේ ජනවාරි 01 වැනි දා සිට දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා කාරක ගිණුම

| 2016 රු. ශත | 2016 කිලෝ ග්‍රෑම් | | 2017 කිලෝ ග්‍රෑම් | 2017 රු. ශත | 2017 රු. ශත |
|---|---|---|---|---|---|
| | | **ආදායම** | | | |
| | | **තේ විකුණුම් දළ ආදායම** | | | |
| 166,002,536.58 | 287,252.20 | තැරැව්කාර ආයතන හරහා විකුණුම් (දළ) | 261,270.75 | 180,752,694.64 | (සටහන 1) |
| 30,930,256.00 | 71,499.80 | දේශිය විකුණුම් සහ නොමිලයේ බෙදා දීම් | 113,622.50 | 59,309,747.61 | |
| **196,932,792.58** | **358,752.00** | | **374,893.25** | | **240,062,442.25** |
| | | | | | 237,444,319.39 |
| | | **එකතු කලා** | | | |
| (709,651.61) | | ඒ.ඩී.බී. ව්‍යාපෘති ලාභය (රිකිලි තේ ලාභය) | | 105,135.98 | |
| - | | දේශිය තේ විකිණුම් (ලාභ/අලාභ) | | (1,195,526.94) | |
| 1,652,354.80 | | විවිධ ආදායම් | | 4,164,803.49 | |
| 381,322.63 | | විලම්භිත ආදායම් | | 381,322.63 | |
| **1,324,025.82** | | **මුළු ආදායම** | | | 3,455,735.16 |
| **198,256,818.40** | | | | | **243,518,177.41** |
| | | **වියදම්** | | | |
| | | අඩු කලා - වතු වියදම් | | | |
| 48,447,832.30 | | පොදු ගාස්තු | | 54,037,861.05 | |
| 15,876,423.90 | | ක්ෂේත්‍ර කටයුතු සහ වගා කිරීම් | | 20,874,643.18 | |
| 61,324,002.43 | | නිෂ්පාදනය | | 63,717,802.97 | |
| 49,619,018.50 | | දළු මිලදී ගැනීම් (ප්‍රවාහන වියදම් ද ඇතුලත්ව) | | 65,974,890.91 | |
| **175,267,277.13** | | | | | **204,605,198.11** |
| | | **පරිපාලන හා මූලය** | | | |
| 4,575,899.68 | | ප්‍රසාද දීමනා හා නිවාඩු | | 4,656,480.90 | |
| 2,642,705.11 | | ක්ෂය වීම් | | 4,196,747.61 | |
| **7,218,604.79** | | | | | **8,853,228.51** |
| | | **විකුණුම් බදු සහ බෙදා හැරීමේ පිරිවැය** | | | |
| 2,446,653.30 | | බ්‍රෝකර් ගාස්තු, පැටවීමේ සහ විකුණුම් වියදම් | | 2,618,122.86 | |
| 2,446,653.30 | | | | | 2,618,122.86 |
| **184,932,535.22** | | **මුළු විකුණුම්** | | | **216,076,549.48** |
| 13,324,283.18 | | **වර්ෂය සඳහා ලාභය /අලාභය** | | | **27,441,627.93** |
| (427,768.66) | | අඩු කලා - නොවිකුණූ තේ සඳහා වැඩිපුර අගය එක් කිරීම 2017 | | | 380,595.66 |
| 12,896,514.52 | | **ගැලපිලිවලට පෙර තේ.ප.ආ. මෙහෙයුම් ගිණුමට මාරු කළ ලාභය/ අලාභය** | | | **27,822,223.59** |

| | | |
|---|---|---|
| 164,175.00 | **පූර්ව වාර්ෂික ගැලපුම්** | |
| **13,060,689.52** | **තේ.ප.ආ. මෙහෙයුම් ගිණුමට මාරු කළ ලාභය/ අලාභය** | **27,822,223.59** |

(සටහන 1) 6774 kg ක නොවිකිණු තේ COP රු. 583.81 ට ගණනය කර ඇත.

*Schedule B*

## තේ පර්යේෂණ මණ්ඩලය

### ශාන්ත ජෝකිම් වත්ත සඳහා 2017 වර්ෂයේ ජනවාරි 01 වැනි දා සිට දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා කාරක ගිණුම

| 2016 රු. ශත | 2016 කිලෝ ග්‍රෑම් | | 2017 කිලෝ ග්‍රෑම් | 2017 රු. ශත | 2017 රු. ශත |
|---|---|---|---|---|---|
| | | **ආදායම** | | | |
| | | **තේ විකුණුම් දළ ආදායම** | | | |
| 94,982,233.05 | 191,714.00 | තැරැව්කාර ආයතන හරහා විකුණුම් (දල) | 252,011.75 | 158,969,274.95 | (සටහන 1) |
| 4,386,850.19 | 10,587.00 | දේශිය විකුණුම් සහ නොමිලයේ බෙදා දීම් | 7,976.25 | 4,667,822.66 | |
| **99,369,083.24** | **202,301.00** | | **259,988.00** | | **163,637,097.61** |
| | | **එකතු කලා** | | | |
| 62,807.06 | | තවාන්වලින් ලද ලාභය/අලාභය | | (828,786.59) | |
| 7,616,974.30 | | දළු විකිණීමෙන් ලද ආදායම | | 8,888,069.64 | |
| 1,260,162.48 | | විවිධ ආදායම් | | 9,561,609.99 | |
| | | රබර් සඳහා වියදම | | 2,577,980.00 | |
| (893,854.00) | | ඒ.ඩි.බී. ව්‍යාපෘති ලාභය (රිකිලි තේ) | | (373,295.00) | |
| 855,719.52 | | විලම්භිත ආදායම් | | 855,719.52 | |
| 8,901,809.36 | | | | | 20,681,297.56 |
| **108,270,892.60** | | **මුළු ආදායම** | | | **184,318,395.17** |
| | | **වියදම්** | | | |
| | | **අඩු කලා - වතු වියදම්** | | | |
| 3,336,914.84 | | පොදු ගාස්තු | | 1,926,464.09 | |
| 3,118,134.34 | | ක්ෂේත්‍ර කටයුතු සහ වගා කිරීම් | | 1,855,082.66 | |
| 4,564,899.54 | | නිෂ්පාදනය | | 4,011,245.24 | |
| 8,634.66 | | රබර් සඳහා වියදම | | 2,620,971.39 | |
| 97,754,469.97 | | දළු මිලදී ගැනීම් | | 156,936,032.46 | |
| **108,783,053.35** | | | | | **167,349,795.84** |
| | | **පරිපාලන හා මූල්‍ය** | | | |
| 1,866,520.48 | | ප්‍රසාද දීමනා හා නිවාඩු | | 1,863,522.53 | |
| 2,946,065.50 | | ක්ෂය වීම් | | 2,260,006.00 | |
| **4,812,585.98** | | | | | **4,123,528.53** |
| | | **විකුණුම් බදු සහ බෙදා හැරීමේ පිරිවැය** | | | |
| 1,611,541.68 | | බ්‍රෝකර් ගාස්තු, පැටවීමේ සහ විකුණුම් වියදම් | | 2,562,061.29 | |
| 1,611,541.68 | | | | | **2,562,061.29** |
| **115,207,181.01** | | **මුළු විකුණුම්** | | | **174,035,385.66** |
| **(6,936,288.41)** | | **වර්ෂය සඳහා ලාභය /අලාභය** | | | **10,283,009.51** |
| (101,432.78) | | අඩු කලා - නොවිකුණු තේ සඳහා වැඩිපුර අගය එක් කිරීම 2017 | | | 386.95 |
| **(7,037,721.19)** | | **ගැලපිලිවලට පෙර තේ.ප.ආ. මෙහෙයුම් ගිණුමට මාරු කළ ලාභය/ අලාභය** | | | 10,283,396.46 |
| 60,641.81 | | **පූර්ව වාර්ෂික ගැලපුම්** | | | - |
| **(6,977,079.38)** | | **තේ.ප.ආ. මෙහෙයුම් ගිණුමට මාරු කල ලාභය/ අලාභය** | | | **10,283,396.46** |

(සටහන 1) 3721.75 kg ක නොවිකිණු තේ NSA Rs. රු. 603.63 ට ගණනය කර ඇත.

## ශාන්ත කූම්බ්ස් - තලවාකැලේ

**(Lat. 6.54'N; Long. 80.42 E; 1394 amsl)**

| මාසය | මධ්‍ය උෂ්ණත්වය ($^{0}$C) | | සෙ. මී. 20 ක ගැඹුරේ දී පාංශු උෂ්ණත්වය ($^{o}$C) | | සාපේක්ෂ ආර්ද්‍රතාවය (%) | | මුළු වාෂ්පීකරණය | මධ්‍ය සූර්යය පතනය | මුළු වර්ෂාපතනය | තෙත් දින ගණන | සුළං ප්‍රවේගය (පැයට කි.මී) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම | අවම | **8.30 පැය** | **15.30 පැය** | **8.30 පැය** | **15.30 පැය** | **(මිමී)** | **(දිනකට පැය)** | **(මිමී)** | | |
| ජනවාරි | 23.7 | 9.9 | 20.6 | 24.4 | 76 | 68 | 84.6 | 6.9 | 48.8 | 8 | 2.4 |
| පෙබරවාරි | 24.9 | 10.3 | 21.1 | 24.9 | 73 | 69 | 100.4 | 7.8 | 16.6 | 6 | 3.0 |
| මාර්තු | 23.8 | 12.3 | 21.2 | 24.0 | 72 | 76 | 94.9 | 7.5 | 291.5 | 19 | 2.2 |
| අප්‍රේල් | 25.7 | 12.4 | 22.4 | 25.3 | 78 | 72 | 99.7 | 8.4 | 162.8 | 8 | 2.1 |
| මැයි | 22.3 | 15.9 | 22.6 | 24.4 | 88 | 87 | 63.7 | 3.8 | 203.8 | 18 | 2.3 |
| ජූනි | 22.6 | 16.9 | 22.0 | 23.6 | 90 | 85 | 42.4 | 1.8 | 110.7 | 17 | 2.7 |
| ජූලි | 23.9 | 16.6 | 22.4 | 24.0 | 89 | 79 | 67.6 | 2.1 | 80.2 | 11 | 2.9 |
| අගෝස්තු | 23.4 | 16.5 | 22.1 | 23.4 | 90 | 86 | 47.7 | 1.8 | 182.0 | 13 | 2.7 |
| සැප්තැම්බර් | 22.4 | 16.5 | 21.9 | 23.2 | 88 | 86 | 42.1 | 0.6 | 102.3 | 12 | 2.3 |
| ඔක්තෝම්බර් | 23.0 | 17.2 | 22.2 | 23.4 | 87 | 87 | 30.1 | 0.6 | 161.5 | 17 | 1.7 |
| නොවැම්බර් | 24.9 | 16.2 | 21.9 | 23.5 | 82 | 79 | 82.4 | 2.2 | 160.5 | 17 | 1.8 |
| දෙසැම්බර් | 24.2 | 13.1 | 21.4 | 23.5 | 82 | 75 | 86.8 | 5.3 | 144.6 | 16 | 2.1 |
| මුළු ප්‍රමාණය | | | | | | | | | **1665.3** | **162.0** | |
| මධ්‍ය අගය | **23.7** | **14.5** | **21.8** | **24.0** | **83** | **79** | **70.2** | **4.1** | | **13.5** | **2.4** |

## පහතරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය - රත්නපුර
**(Lat. 6° 43´ N; Long. 80° 21' E; 29m amsl)**

| මාසය | මධ්‍ය උෂ්ණත්වය ($^0$C) | | සාපේක්ෂ ආර්ද්‍රතාවය (%) | | මධ්‍ය සූර්යය පතනය | මුළු වර්ෂාපතනය (මිමී) | තෙත් දින ගණන | මුළු වාෂ්පීකරණය (මිමී) | සුළං ප්‍රවේගය (පැයට කි.මී) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අවම | උපරිම | **8.30 පැය** | **15.30 පැය** | (දිනකට පැය) | | | | |
| ජනවාරි | 20.3 | 33.3 | 84 | 63 | 5.5 | 44.0 | 6 | 105.77 | 1.26 |
| පෙබරවාරි | 21.5 | 34.2 | 86 | 62 | 6.0 | 37.2 | 4 | | 1.56 |
| මාර්තු | 22.7 | 34.1 | 90 | 61 | 5.6 | 345.1 | 14 | | 1.41 |
| අප්‍රේල් | 22.7 | 34.6 | 89 | 59 | 5.8 | 294.4 | 12 | 78.35 | 1.78 |
| මැයි | 24.2 | 32.7 | 90 | 67 | 3.5 | 912.9 | 22 | 48.22 | 1.23 |
| ජූනි | 24.3 | 31.6 | 88 | 68 | 3.3 | 407.6 | 22 | 53.36 | 1.81 |
| ජූලි | 24.3 | 32.2 | 85 | 67 | 4.7 | 183.3 | 8 | 70.2 | 2.96 |
| අගෝස්තු | 24.0 | 31.5 | 89 | 68 | 3.7 | 430.7 | 18 | 59.75 | 2.12 |
| සැප්තැම්බර් | 23.5 | 31.2 | 91 | 71 | 3.2 | 790.5 | 21 | 37.71 | 1.26 |
| ඔක්තෝම්බර් | 23.5 | 31.5 | 91 | 69 | 2.6 | 544.3 | 23 | 44.37 | 1.39 |
| නොවැම්බර් | 22.9 | 31.6 | 89 | 71 | 3.4 | 533.2 | 15 | 48.04 | 1.31 |
| දෙසැම්බර් | 22.6 | 32.4 | 90 | 67 | 4.9 | 253.7 | 12 | 73.63 | 1.20 |
| මුළු ප්‍රමාණය | | | | | | **4776.9** | **177** | | |
| මධ්‍ය අගය | **23.1** | **32.5** | **89** | **66** | **4.4** | | | **61.94** | **1.06** |

## මැදරට ප්‍රාදේශීය මධ්‍යස්ථානය
**(Elevation 762 m amsl)**

| මාසය | මධ්‍ය උෂ්ණත්වය ($^{0}C$) | | සෙ. මී. 20 ක ගැඹුරේ දී පාංශු උෂ්ණත්වය ($^{0}C$) | | සාපේක්ෂ ආර්ද්‍රතාවය (%) | | මධ්‍ය සූර්යය පතනය | මුළු වාෂ්පීකරණය (මිමී) | මුළු වර්ෂාපතනය (මිමී) | තෙත් දින ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම | අවම | 8.30 පැය | 15.30 පැය | 8.30 පැය | 15.30 පැය | (දිනකට පැය) | | | |
| ජනවාරි | 26.8 | 18.0 | 23.0 | 24.2 | 81 | 66 | 6.0 | 59.9 | 105.1 | 6 |
| පෙබරවාරි | 27.9 | 18.3 | 23.9 | 25.4 | 83 | 63 | 7.3 | 66.5 | 53.3 | 6 |
| මාර්තු | 28.4 | 19.7 | 24.8 | 27.2 | 87 | 71 | 6.5 | 65.5 | 297.6 | 13 |
| අප්‍රේල් | 31.3 | 19.8 | 26.7 | 28.6 | 82 | 71 | 6.4 | 80.2 | 25.8 | 3 |
| මැයි | 28.0 | 21.0 | 26.5 | 27.4 | 87 | 81 | 2.8 | 48.8 | 213.7 | 12 |
| ජූනි | 27.4 | 27.3 | 25.5 | 26.4 | 87 | 84 | 5.3 | 49.6 | 98.2 | 11 |
| ජූලි | 28.1 | 21.3 | 25.8 | 27.8 | 83 | 78 | 5.7 | 67.4 | 45.7 | 7 |
| අගෝස්තු | 27.2 | 20.7 | 25.7 | 27.3 | 87 | 82 | 4.5 | 55.6 | 114.0 | 13 |
| සැප්තැම්බර් | 27.2 | 20.3 | 25.3 | 26.4 | 88 | 83 | 3.7 | 32.7 | 181.5 | 19 |
| ඔක්තෝම්බර් | 27.1 | 20.2 | 25.0 | 26.2 | 87 | 84 | 4.9 | 42.6 | 309.7 | 14 |
| නොවැම්බර් | 26.5 | 19.9 | 24.5 | 25.7 | 88 | 81 | 3.8 | 37.2 | 223.1 | 18 |
| දෙසැම්බර් | 26.7 | 19.0 | 24.1 | 25.2 | 87 | 78 | 5.2 | 52.8 | 128.5 | 10 |
| **මුළු ප්‍රමාණය** | | | | | | | | **658.8** | **1796.2** | **132** |
| **මධ්‍ය අගය** | **27.7** | **20.4** | **25.1** | **26.5** | **86.0** | **77.0** | **5.2** | | | |

## ඌව ව්‍යාප්ති මධ්‍යස්ථානය - පස්සර

**(Lat. 6.57'N; Long. 81.07 E; 1120 amsl)**

| මාසය | මධ්‍ය උෂ්ණත්වය ($^0$C) | | සාපේක්ෂ ආර්ද්‍රතාවය (%) | | මධ්‍ය සූර්යය පතනය | මුළු වර්ෂාපතනය (මිමී) | මුළු වාෂ්පීකරණය (දිනකට මිමී) | සුළං ප්‍රවේගය (පැයට කි.මී) |
|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම | අවම | **8.30 පැය** | **15.30 පැය** | (දිනකට පැය) | | | |
| ජනවාරි | 24.7 | 15.5 | 82 | 75 | 4.8 | 215.8 | 2.18 | 5.05 |
| පෙබරවාරි | 24.8 | 15.4 | 81 | 75 | 5.6 | 130.3 | 2.34 | 2.73 |
| මාර්තු | 26.2 | 17.3 | 80 | 76 | 5.6 | 295.3 | 2.86 | 0.94 |
| අප්‍රේල් | 27.8 | 18.6 | 76 | 72 | 5.8 | 132.9 | 2.80 | 0.36 |
| මැයි | 27.3 | 19.0 | 78 | 76 | 4.6 | 224.7 | 2.51 | 1.53 |
| ජූනි | 27.2 | 19.0 | 78 | 75 | 4.9 | 106.5 | 3.07 | 1.61 |
| ජූලි | 28.3 | 18.8 | 74 | 67 | 5.5 | 156.8 | 2.73 | 0.80 |
| අගෝස්තු | 26.9 | 18.4 | 77 | 75 | 4.4 | 151.8 | 2.31 | |
| සැප්තැම්බර් | 26.3 | 18.1 | 79 | 73 | 4.0 | 102.8 | 2.13 | |
| ඔක්තෝම්බර් | 26.3 | 18.4 | 80 | 82 | 3.0 | 384.0 | 1.57 | |
| නොවැම්බර් | 24.9 | 17.8 | 82 | 79 | 2.9 | 298.0 | 1.87 | |
| දෙසැම්බර් | 24.5 | 16.1 | 87 | 86 | 3.4 | 247.5 | 1.97 | |
| මුළු ප්‍රමාණය | | | | | | **2446.4** | | |
| මධ්‍ය අගය | **26.3** | **17.7** | **80** | **76** | **4.5** | | **2.40** | **1.9** |

## ව්‍යාප්ති මධ්‍යස්ථානය - ගාල්ල
**(Lat. 6.05'N; Long. 80 E; 30 m amsl)**

| මාසය | මධ්‍ය උෂ්ණත්වය ($^0$C) | | සාපේක්ෂ ආර්ද්‍රතාවය (%) | | මධ්‍ය සූර්යය පතනය | මුළු වර්ෂාපතනය (මිමී) | තෙත් දින ගණන | මුළු වාෂ්පීකරණය (දිනකට මිමී) | සුළං ප්‍රවේගය (පැයට කි.මී) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම | අවම | **8.30 පැය** | **15.30 පැය** | (දිනකට පැය) | | | | |
| ජනවාරි | 31.8 | 20.9 | 90 | 69 | 7.0 | 153.5 | 5 | 2.43 | 1.19 |
| පෙබරවාරි | 31.7 | 21.0 | 86 | 71 | 7.1 | 23.4 | 2 | 2.77 | 1.21 |
| මාර්තු | 32.1 | 22.5 | 86 | 70 | 7.1 | 195.8 | 6 | 3.05 | 1.37 |
| අප්‍රේල් | 32.3 | 23.7 | 89 | 71 | 7.2 | 191.9 | 8 | 2.95 | 1.64 |
| මැයි | 31.3 | 24.0 | 89 | 78 | 5.0 | 702.9 | 16 | 2.65 | 2.20 |
| ජූනි | 30.7 | 24.4 | 89 | 75 | 6.5 | 174.4 | 13 | 2.42 | 2.50 |
| ජූලි | 31.0 | 24.5 | 89 | 75 | 6.8 | 169.1 | 12 | 2.59 | 2.48 |
| අගෝස්තු | 30.2 | 24.2 | 90 | 76 | 6.1 | 172.6 | 13 | 2.4 | 2.88 |
| සැප්තැම්බර් | 30.2 | 23.7 | 87 | 78 | 5.4 | 300.7 | 17 | 2.27 | 2.30 |
| ඔක්තෝම්බර් | 30.5 | 23.6 | 90 | 76 | 6.1 | 388.8 | 18 | 2.23 | 2.10 |
| නොවැම්බර් | 30.6 | 23.0 | 91 | 79 | 4.3 | 623.4 | 17 | 1.92 | 1.34 |
| දෙසැම්බර් | 31.4 | 22.3 | 90 | 78 | 6.3 | 155 | 10 | 2.46 | 1.14 |
| මුළු ප්‍රමාණය | | | | | | **3251.5** | **137** | | |
| මධ්‍ය අගය | **31.2** | **23.2** | **89** | **75** | **6.2** | | | **2.51** | **1.86** |

## දෙනියාය ව්‍යාප්ති මධ්‍යස්ථානය

**(LAT 6° 43′ N ; LONG 80°E 33.3; 250m amsl)**

| මාසය | මධ්‍ය උෂ්ණත්වය ($^{0}$C) | | සාපේක්ෂ ආර්ද්‍රතාවය (%) | | මධ්‍ය සූර්යය පතනය | මුළු වර්ෂාපතනය (මිමී) | තෙත් දින ගණන | මුළු වාෂ්පීකරණය (දිනකට මිමී) |
|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම | අවම | 8.30 පැය | 15.30 පැය | (දිනකට පැය) | | | |
| ජනවාරි | 29.5 | 18.1 | 81 | 67 | 7.1 | 207.2 | 11 | 81.0 |
| පෙබරවාරි | 29.9 | 18.1 | 76 | 63 | 7.9 | 33.4 | 5 | 88.8 |
| මාර්තු | 29.7 | 19.5 | 77 | 73 | 7.0 | 482.3 | 16 | 87.1 |
| අප්‍රේල් | 31.0 | 20.7 | 79 | 69 | 7.9 | 261.6 | 9 | 105.6 |
| මැයි | 29.6 | 20.3 | 84 | 79 | 5.7 | 932.4 | 28 | 68.6 |
| ජූනි | 28.5 | 22.3 | 83 | 76 | 5.8 | 138.2 | 22 | 74.3 |
| ජූලි | 29.0 | 21.6 | 81 | 70 | 7.5 | 113.2 | 14 | 103.0 |
| අගෝස්තු | 28.2 | 22.0 | 83 | 77 | 5.5 | 227.4 | 18 | 79.1 |
| සැප්තැම්බර් | 28.3 | 21.6 | 83 | 77 | 5.4 | 345 | 22 | 76.9 |
| ඔක්තෝම්බර් | 28.4 | 21.3 | 80 | 80 | 5.7 | 386.8 | 23 | 71.4 |
| නොවැම්බර් | 28.5 | 20.0 | 82 | 77 | 5.3 | 650.8 | 21 | 65.7 |
| දෙසැම්බර් | 29.2 | 19.1 | 82 | 74 | 6.3 | 270.7 | 23 | 67.0 |
| මුළු ප්‍රමාණය | | | | | | **4049** | **212** | **968.5** |
| මධ්‍ය අගය | **29.2** | **20.4** | **80.9** | **73.5** | **6.4** | | | **80.7** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්ජී/බී/ටීඅර්බී/1/17/2   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2018 සැප්තැම්බර් 20 දින.

සභාපති,

තේ පර්යේෂණ මණ්ඩලය

**තේ පර්යේෂණ මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

තේ පර්යේෂණ මණ්ඩලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 15 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට තේ පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිතයෙහි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 54,850,144 ක්වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂයකර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රමිතියේ 72 ඡේදය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි එකිනෙකින් වෙන් කළ හැකි වත්කම් වන අතර ඒවා වෙන් වෙන්ව වර්ගීකරණය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන පිරිවැය රු. 232,273,791 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් එලෙස වර්ගීකරණය කර ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව යම් නිශ්චිත ගනුදෙනුවක්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කරන ලද ගිණුම්කරණ ක්‍රමයෙන් ආවරණය නොවන්නේ නම් එහිදී වඩාත්ම යෝග්‍ය ආකාරයට කටයුතු කළයුතු අතර, ඒ බව සඳහන් කර ගිණුම්කරණ ප්‍රතිපත්තියක් පිළියෙල කර එය අනුගමනය කළයුතු වුවත්, මණ්ඩලය විසින් පහත සඳහන් ගනුදෙනු ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළියෙල කර නොතිබුණි.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු.2,404,163 ක් වූ අස්පෘශ්‍යා වත්කම් ක්‍රමක්ෂය කර ගිණුම්ගත කිරීම.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු.132,362,100 ක් වූ තේ වගාව මේරූ, නොමේරූ වශයෙන් වර්ග කර වෙන් වෙන්ව හඳුනා ගැනීම හා එම තේ වගාවන් හි ජීව තත්ත්වයන් පිළිබඳ සලකා ගිණුම්ගත කිරීම.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ හා සංවර්ධන වියදම් දැරීම සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.42,973,544 ක් ආදායමට ගෙන තිබුණද ඒ සඳහා දැරූ වියදම රු. 42,701,640 ක් බැවින් රු.271,903 ක් වැඩිපුර ආදායමට ගැනීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මණ්ඩලයේ ඌනතාවය අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) තේ කම්හල්වල වර්ෂය තුළදී නොවිකුණූ නිමි තේ, අවසන් තොගය ලෙස ගිණුම් වලින් අනාවරණය කරනු වෙනුවට ණයට විකුණුම් ලෙස සලකා ගිණුම් ගත කර තිබූ බැවින් වර්ෂයේ තේ විකුණුම් ආදායම හා ණයගැති ශේෂය රු.6,201,289 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මැණික් ගැරීම සඳහා වෙන්දේසි කිරීමට සමාලෝචිත වර්ෂයේදී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත ශාන්ත ජෝකිම් වතුයායේ ඉඩම් නිදහස් කර තිබූ අතර ඒ වෙනුවෙන් අධිකාරියෙන් මණ්ඩලය වෙත ලැබිය යුතු රු.239,591 ක ආදායම ගිණුම්ගත කර නොතිබුණි. තවද එම ඉඩම් නිදහස් කිරීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු අනාවරණය කරද නොතිබුණි.

(ඇ) 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා සේවක අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීමේදී මූලික වැටුපට ජීවන වියදම් දීමනාව එකතුකර දායකය ගණනය නොකිරීම හේතුවෙන් කාර්ය මණ්ඩලය හා කම්කරුවන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය නොකළ රු.37,316,860 ක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රේෂණය කිරීමේදී පෙර වර්ෂ ගැලපීම් ලෙස සටහන් නොකර වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඉ) මණ්ඩලය විසින් ලැමීලියා තේ කම්හලේ යන්ත්‍ර සූත්‍ර 2003 වර්ෂයේදී රු.1,010,100 කට අපහරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එම යන්ත්‍ර වල පිරිවැය ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ඊ) මණ්ඩලයට අයත් ඉඩම්වල ජීව විද්‍යාත්මක වත්කම් ලෙස, ශාක 5654 ක් හඳුනාගෙන ඇතත් වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

(උ) මණ්ඩලයට අයත් බස් රථයක ආසන අලුත්වැඩියාව සඳහා වැයකරන ලද රු.287,200ක් හා එම රථය සඳහා අමතර කොටස් මිලදී ගැනීමට වැයකරනලද රු.252,126 ක් වියදම් ලෙස ගිණුම්ගත නොකර ප්‍රාග්ධනිත ගත කර තිබුණි.

(ඌ) ශාන්ත ජෝකිම් තේ කම්හලේ වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට නොවිකුණු නිමි තේ තොග වටිනාකම රු. 12,866,373 ක් වුවද රු. 2,246,711 ක් ලෙස ගිණුම පිළියෙල කරන දිනට පැවති භෞතික තොග වටිනාකමට ගිණුම්ගතකර තිබුණි.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

ශාන්ත කුම්බ්ස් තේ කම්හලේ ගිණුම් අනුව රු. 1,805,780 ක් තේ මණ්ඩලයෙන් අයවිය යුතු වුවද තේ මණ්ඩලයේ ගිණුම් අනුව ගෙවිය යුතු ශේෂය රු.1,114,630 ක් බැවින් රු.394,630 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගිණුම් විෂයයන්වලට අදාලව, ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| කාර්ය මණ්ඩල ණය | 40,334 | විස්තරාත්මක උපලේඛන/ ශේෂ සනාථ කිරීම් |
| ණයහිමි | 532,872 | විස්තරාත්මක උපලේඛන/ ශේෂ සනාථ කිරීම් |
| කුඩා තේවතු සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ශේෂ | 649,681 | සනාථ කිරීම් ලියවිලි |

2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.6,195,377 ක් වූ විවිධ ණයගැතියන්ගෙන් රු.1,157,574 ක් වසර 05 ඉක්මවා තිබුණු නමුත් එම ශේෂ අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) ශාන්ත කුම්බස් තේ වතුයායේ ගිණුම්හි ඇතුලත් සේවකයින්ගෙන් අයවිය යුතු වර්ෂ 5 ඉක්ම වූ ණය සහ අත්තිකාරම් රු.2,303,788 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක්, තාවකාලික පදනමට වුවත් මණ්ඩලයේ නේවාසික ඉංජිනේරු තනතුර, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී තනතුර සහ අංශ ප්‍රධානී තනතුරු 04ක් සඳහා වර්ෂ 3 සිට වර්ෂ 7 දක්වා වැඩ බැලීමේ පදනම මත පත්කිරීම් කර තිබුණි. පසුගිය වසර 07 තුල එම නිලධාරීන් වෙත මණ්ඩලය විසින් වැඩ බැලීමේ දීමනා ලෙස රු.3,722,297 ක් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ඡේදය | මානව සම්පත් කළමනාකරණය සඳහා නීතිරීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු නමුත් මණ්ඩලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 22 දිනැති අංක 2014/පුස/1/2016 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ චක්‍රලේඛයේ 3.1 ඡේදය | 1978 වර්ෂයේ සිට මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලීය පුස්තකාලයේ පොත් පිළිබඳ භෞතික පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. තවද පසුගිය වසර 32 ක කාලය තුල (1985 – 2017) බැහැර ගෙන යනු ලැබූ පොත් වලින් පොත් 62ක් ආපසු භාර දී නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2000 ජනවාරි 11 දිනැති පීඑෆ්/පීඊ/05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කිසියම් මූල්‍ය ප්‍රතිලාභයක් ගෙවීමට පෙර භාණ්ඩාගාර අනුමැතිය ලබා ගතයුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාම ලැබූ නිලධාරීන් 11 දෙනෙකුට ඉතිරි විවේක නිවාඩු වෙනුවෙන් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු. 419,086 ක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,831,737ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.6,372,746 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.541,009 ක වර්ධනයක් දැක්වුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වියදම රු.94,965,000 කින් වැඩි වුවද ආදායම රු.95,485,000 කින් වැඩිවීම නිසා මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් ඇති වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අඛණ්ඩව ඌනතාවයක් ලබා තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු. 163,722,445 ක් වූ මණ්ඩලයේ දායකත්වය 2017 වර්ෂයේදී රු. 283,946,726 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 මණ්ඩලයට එරෙහිව හෝ මණ්ඩලය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබා පිටරට ගොස් නැවත දිවයිනට නොපැමිණි නිලධාරීන් 05 දෙනෙකු විසින් රු.18,552,991 ක් වූ බැඳුම්කර කඩකිරීම වෙනුවෙන් මණ්ඩලය විසින් වසර 7 කට පෙර සිට නඩු පවරා තිබූ අතර ඒවා සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් විභාග වෙමින් පැවතුණි.

(ආ) බාහිර පාර්ශවයක් විසින් මණ්ඩලය තෙවන විත්තිකරු ලෙස සඳහන් කරමින් ඉඩම් කොටස් අත්පත් කරගැනීම සඳහා 2012 වර්ෂයේදී ද, මණ්ඩලයේ සේවකයකු විසින් කලින් දැරූ තනතුරට නැවත සේවය ලබා ගැනීම සඳහා 2015 වර්ෂයේදී ද මණ්ඩලයට එරෙහිව නඩු දෙකක් ගොනුකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

තේ පර්යේෂණ මණ්ඩලයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ සහ අනෙකුත් කාර්යයන් සම්බන්ධයෙන් කාර්යසාධන ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

(අ) 2013-2017 වර්ෂයන්ට අදාල සංයුක්ත සැලැස්ම අනුව ඉටුකිරීමට අපේක්ෂිත වූ පර්යේෂණ 185 ක් විය. ඉන් භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව ලද පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වූ ප්‍රදානයන්ගෙන් රු.12,472,481ක් වැයකරමින් ආරම්භ කරන ලද පර්යේෂණ 12 ක් අතරමඟ නවතා දමා තිබූ අතර රු.24,350,677ක් වැය කරමින් ආරම්භ කරන ලද පර්යේෂණ 15 ක් කල්දමා තිබුණි. කෙසේ වුවද මෙම පර්යේෂණයන් අත්හැරීම හෝ කල්දැමීම සිදුවී වසර 3ක් පමණ ගත වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක් නැවත ආරම්භ කිරීමට මණ්ඩලය පියවර ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලයේ ජීව රසායන අංශය විසින් පර්යේෂණ නිමකර තිබුණු එකතු කළ වටිනාකම මත තේ නිෂ්පාදන 10ක් (Tea wine, instant black tea, carbonated tea, scented tea, instant milk tea, tea sauce, tea baby soap, tea seed oil, tea protein catching extract) වාණිජකරණය සඳහා වැඩිදියුණු කිරීම වෙනුවෙන් වූ ප්‍රචාරණය, පේටන්ට් බලපත්‍ර ලබාගැනීම වැනි ඉදිරි කටයුතු සිදුකර නොතිබීම නිසා එම පර්යේෂණයන්හි ප්‍රතිඵල ක්ෂේත්‍රයට යෑම සිදු වී නොතිබුණි.

(ඇ) තේ ක්ෂේත්‍රයේ පවතින ප්‍රධාන ගැටළු වන තේ වගාවේ නිෂ්පාදන පිරිවැය අඩුකර ගැනීම, භූමි ඵලදායීතාවය වර්ධනය කර ගැනීම වැනි කරුණු සඳහා පර්යේෂණ සිදුකර තිබුණද එම ගැටළු සඳහා 2018 අගෝස්තු 31 දින වනවිටත් මණ්ඩලය මගින් විසඳුම් ලැබී නොතිබුණි.

(ඈ) උපදෙස් හා ව්‍යාප්ති අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන නව තේ වගා ප්‍රභේදයන්ගෙන් යුතු රිකිලි සැපයීම සඳහා සිදුකරන ලද මවු ශාක වැඩසටහන මගින් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාර්ෂිකව බෙදාහැරීමට ඇස්තමේන්තුගත රිකිලි ප්‍රමාණයෙන් බෙදාදී තිබූ රිකිලි ප්‍රමාණය පිළිවෙලින් සියයට 58 ත් 59 ක් හා 55 ක් වූයෙන් මෙම වැඩසටහනෙහි ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ළඟා වී නොතිබුණි.

(ඉ) මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන ශාන්ත කූම්බ්ස් සහ ශාන්ත ජෝකීම් වතුයායන් හා කම්හල් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

(i) සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ ශාන්ත කූම්බ්ස් සහ ශාන්ත ජෝකිම් යන තේ කර්මාන්තශාලා දෙකෙහි ශ්‍රම ඵලදායීතාවය, දර භාවිතය හා විදුලි ඒකකයන්හි ඵලදායීතාව අපේක්ෂිත මට්ටමට ළඟාවී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය පිළිවෙලින් තේ කිලෝග්‍රෑමයකට රු. 569ක් හා රු. 603ක් වුවද පසුගිය වර්ෂයේ එය රු.509 ක් හා රු.487ක් බැවින් නිෂ්පාදන පිරිවැය පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩි වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ශාන්ත ජෝකීම් කර්මාන්තශාලාවේ තේ නිමවුම් අනුපාතය සියයට 20.92 බැවින් සියයට 21.5ක් වන ප්‍රශස්ත නිමවුම් මට්ටම පවත්වා ගැනීමට අපොහොසත් වීතිබුණි.

(iii) ශාන්ත ජෝකීම් තේ කම්හලේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත අමු තේ දළු යෙදවීම කිලෝග්‍රෑම් 1,824,740 ක් වූ අතර තථ්‍ය යෙදවීම කිලෝග්‍රෑම් 1,242,696 ක් වූයෙන් අහිතකර විචලනය සියයට 32 ක් විය. එම නිසා ඊට අනුරූපීව නිමිතේ ප්‍රමාණය අඩු වී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ ශාන්ත ජෝකිම් වතුයායේ තේ දළු ඵලදායීත්වය ඉකුත් වර්ෂයට සාපේක්ෂව පහත වැටී තිබූ බැවින් තේ වගාව තුලින් රු.3,028,252 ක පාඩු ලබා තිබුණි. තවද එම වතුයායේ රබර් විකිණීමෙන් ලද ආදායම රු.2,556,840ක් වුවද වියදම රු.2,620,973ක් බැවින් පිරිවැය ආවරණය කිරීමට ආදායම ප්‍රමාණවත් වී නොතිබුණි.

(v) පසුගිය වර්ෂයේ රු. 62,807 ක ආදායමක් ඉපයූ ශාන්ත ජෝකිම් වතුයායේ පැල තවාන සමාලෝචිත වර්ෂයේ රු.828,787 ක ආදායම ඉක්මවූ පිරිවැයක් දරා තිබුණි. තවාන් පාලනය නියමිත පරිදි ක්‍රියාත්මක කර නොතිබීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) යම් කාර්යයක් සඳහා බාහිර ආයතනයක් වෙත අත්තිකාරම් මුදලක් නිදහස් කිරීමට පූර්වයෙන් අදාල කාර්යය ඉටුකිරීමට ශක්‍යතාවයක් පවතීද යන්න සනාථ කරගත යුතු වුවත් ඒ පිළිබඳ සැලකිලිමත් නොවී 2011 වර්ෂයේදී මතුගම ප්‍රාදේශීය කාර්යාලය සඳහා ජල ආශ්‍රිත ඒකකයක් මිලදී ගැනීමට පෞද්ගලික ආයතනයකට රු.110,124 ක අත්තිකාරම් ලබාදී තිබුණි. කෙසේවුවද එම ආයතනය වසා දමා ඇති බවට හඳුනාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අත්තිකාරම් මුදල අයකරගෙන නොතිබුණි.

(ආ) ශාන්ත ජෝකිම් වතුයායට අයත් හෙක්ටයාර් 8.74 ක් වූ කුඹුරු ඉඩම් දිගු කාලයක සිට අඳගොවීන් විසින් වගාකරනු ලබන අතර ඉන් මණ්ඩලයට අයවිය යුතු ආදායම් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අස්පෘශ්‍ය වත්කම් යටතේ ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය (ISO) සහතිකය ලෙස රු.2,382,613 ක් දක්වා තිබුණද එය 2014 වර්ෂයේ සිට කල් ඉකුත් වී තිබූ අතර එම අගය පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ දෙනියාය සහ කොට්ටව ප්‍රාදේශීය කාර්යාලයන් පිහිටි ඉඩම්වල හා තේ පර්යේෂණ මණ්ඩලයේ දක්ෂිණ මධ්‍යස්ථානය ඉදිකර තිබූ ඉඩමේ අයිතිය මණ්ඩලය වෙත පවරා ගැනීමට 2018 ජූනි 30 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

## 4.3 දූෂණ අක්‍රමිකතා

අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකගේ වාර්තාව අනුව ශාන්ත කූම්බ්ස් තේ කම්හලේ දේශීය තේ අලෙවිහලේ තේ විකුණුම් මුදල් බැංකුගත කිරීම සම්බන්ධයෙන් පැවති අභ්‍යන්තර පාලන දුර්වලතා හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අලෙවිසැලේ භාරකරු විසින් රු.8,085,212 ක මුදල් අක්‍රමිකතාවයක් සිදුකර ඇති බව අනාවරණය වී තිබුණි.

## 4.4 අරමුදල් උපයෝජනය

තේ නැවත වගාව සඳහා ඉකුත් වර්ෂයේදී තේ මණ්ඩලයෙන් ලැබී තිබුණු රු.359,975 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාල කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය සතු නිල නිවාස අතරින් 'ඩී' කාණ්ඩයේ නිල නිවාස 13 ක් හා 'සී' කාණ්ඩයේ නිල නිවාස 1 ක් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතිණි.

(ආ) ශාන්ත කූම්බ්ස් වතුයායේ හා ශාන්ත ජෝකිම් වතුයායේ යන්ත්‍ර ධාරිතාවය දිනකට පිළිවෙලින් අමු තේ දළු කිලෝ ග්‍රෑම් 8,000 ක් හා කිලෝ ග්‍රෑම් 15,000 ක් විය. එසේ වුවද එම යන්ත්‍රවල තථ්‍ය සාමාන්‍ය උපයෝජනය පිළිවෙලින් දිනකට කිලෝග්‍රෑම් 5,000 ක් සහ කිලෝ ග්‍රෑම් 6,253 ක් වූයෙන් එම යන්ත්‍ර ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) ශාන්ත ජෝකිම් කම්හලේ දර භාවිතයෙන් තේ දළු වියලන යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනීම හේතුවෙන් ඉන්ධන භාවිතයෙන් තේ දළු වියලන යන්ත්‍රය නිෂ්කාර්යව පැවතුණි. තවද එම කම්හලේ පැවති ස්ටෝක්ස් එස්ට්‍රැක්ටරය යන්ත්‍රය ද වසර 04 ක සිට භාවිතායට ගෙන නොතිබුණි.

(ඈ) තේ සැකසුම් කිරීම සඳහා ආයතනය විසින් 1982 වර්ෂයේදී රු.4,142,173 ක් වැය කර ආනයනය කරන ලද යන්ත්‍ර අදාල ව්‍යාපෘතිය සඳහා යොදාගෙන නොතිබුණු අතර වර්ෂ ගණනාවක සිට නිෂ්කාර්යව පැවතුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

2017 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 443 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 257 ක් වීමෙන් තනතුරු 186 ක් පුරප්පාඩු වී පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධායක නොවන මට්ටමේ තනතුරු 94 ක් පුරප්පාඩුව පැවති අතර ඊට ඇතුළත් පර්යේෂණ හා සංවර්ධන තාක්ෂණ නිලධාරින්ගේ සහ ව්‍යාප්ති නිලධාරීන්ගේ තනතුරු පිළිවෙලින් 26 ක් සහ 18 ක් පුරප්පාඩුව පැවතීම මණ්ඩලයේ පර්යේෂණ හා ව්‍යාප්ති කටයුතු සැලසුම් අනුව ඉටු කිරීමට බාධාවක් වී තිබුණි.

(ආ) මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ ස්ථාන භාර නිලධාරී (ඕ.අයි.සී) තනතුර සඳහා නිලධාරීන් 06 දෙනෙකු, වැඩ බැලීමේ පදනම මත බඳවාගෙන දීමනා ලෙස 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු. 1,241,371 ක් ගෙවා තිබුණි.

(ඇ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි තාවකාලික හෝ අනියම් පදනම මත බඳවා ගෙන ඒ වන විටත් සේවයේ යෙදී සිටි සේවකයින් 112 දෙනෙකුට (ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 105 ක් හා කළමනාකරණ සහකාර තනතුරු 07ක් ) 2014 ඔක්තෝබර් 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර පත්වීම් ලබා දී තිබුණද මෙම තනතුරු ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර නොතිබුණි.

## 4.7 වාහන පාලනය

සමාලෝචිත වර්ෂයේදී රු.404,965ක් වැයකර මණ්ඩලය සතු ලොරිරථයේ එන්ජිම සම්පූර්ණයෙන් අලුත්වැඩියා කර තිබූ අතර එම කාර්යයෙන් පසු කිලෝමීටර 5000 ක ධාවන පදම් කාලයක් ගතකළයුතු නමුත් කිලෝමීටර 3237ක් පමණක් ධාවනයකර භාවිතයෙන් ඉවත්කර තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසාර ඉලක්ක කරා ළඟා වීම සඳහා ආයතන විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂිකව අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම්වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කරා ළඟාවීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්ත්වයක් පැවති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 ප්‍රසම්පාදනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 සැප්තැම්බර් 06 දිනැති අංක 19 දරන ප්‍රසම්පාදන අතිරේකය ප්‍රකාරව රු.200,000 ක ඉක්මවන වාහන අළුත්වැඩියාවන් සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගතයුතු නමුත් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී සිදුකරන ලද රු.2,235,424ක් වූ අළුත්වැඩියා 05ක් සඳහා ඒ අනුව කටයුතුකර නොතිබුණි.

### 6.2 අයවැය පාලනය

අයවැය ලේඛනයේ අයවැයගත හා තථ්‍ය ආදායම්, වියදම් අතර සියයට 11 සිට සියයට 741 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 6.3 නොවිසඳී ඇති විගනණ ඡේද

මණ්ඩලය විසින් ඒ ඒ විෂයයන්ට අදාල චක්‍රලේඛ නියමයන් හා අනෙකුත් සමාන ආයතන අභිබවා කාර්ය මණ්ඩලය වෙත ලබා දෙනු ලබන නිවාඩු, නිලනිවාස හා ඒවායේ පරිභෝජනය කරනු ලබන ජලය, විදුලිය වෙනුවෙන් ගාස්තු අය නොකිරීම වැනි වරප්‍රසාද සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන සම්බන්ධයෙන් වූ අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු වියයුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත නොකිරීම. |
| (ආ) | වත්කම් පාලනය | වාහන අයිතිය පවරාගැනීමට කටයුතු නොකිරීම හා අළුත්වැඩියා කටයුතු නිසි පරිදි සිදු නොකිරීම. |
| (ඇ) | පොත් පත් ලේඛන පවත්වා ගැනීම | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම, කුවිතාන්සි පොත් සම්බන්ධව ජී.ඒ. ඇන් 20 ප්‍රකාරව ලේඛනයක් නඩත්තු නොකිරීම, සුරක්ෂිත භාරයේ තැන්පත් කරනු ලබන ද්‍රව්‍ය පිළිබඳ ලේඛන හා වාර්තා නඩත්තු නොකිරීම. |
| (ඈ) | පර්යේෂණ කටයුතු | පර්යේෂණ කටයුතු නිසි පරිදි කළමනාකරණය නොකිරීම හා අවසන් කරන ලද පර්යේෂණයන්ගේ ප්‍රතිඵල ක්ෂේත්‍රයට ලබා නොදීම. |
| (ඉ) | මෙහෙයුම් පාලනය | රබර් හා පොල් වතුවල ඇති ගස් ප්‍රමාණය ගණනය කර ලේඛනගත කිරීමට කටයුතු නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති



ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
තලවාකැලේ
ශ්‍රී ලංකාව

ISSN : 1012 - 3954